272 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 272 - இல. 2
Volume 272 - No. 2

2019 ජූනි 19 වන බදාදා
2019 யூன் 19, புதன்கிழமை
Wednesday, 19th June, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**
හොරණ, මිල්ලෑව වත්ත කම්කරුවන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சபாநாயகரது சான்றுரை

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
ஹொரண, மில்லாவ தோட்டத் தொழிலாளர்களின் வாழ்க்கைத் தரத்தைப் பாதுகாத்தல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker’s Certificate

AUDITOR-GENERAL’S REPORT

ORAL ANSWERS TO QUESTIONS

SRI LANKA LAND RECLAMATION AND DEVELOPMENT CORPORATION (AMENDMENT) BILL:
Read a Second and the Third time, and passed

ADJOURNMENT MOTION:
Securing the Standard of Living of Labourers in Horana Millewa Estate

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2019 ජූනි 19 වන බදාදා***
*2019 ஜூன் 19, புதன்கிழமை*
*Wednesday, 19th June, 2019*

**අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා]**
**මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய]
தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2019 ජූනි 18වැනි දින ම'විසින් "තේ පර්යේෂණ මණ්ඩල (සංශෝධන)" සහ "ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2011 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XIX කොටස;
- 2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXV කොටස;
- 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVIII කොටස;
- 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XII කොටස; සහ
- 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XIV, XV, XVI හා XVII කොටස් සහ නවවැනි කාණ්ඩයේ III කොටස

මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2018 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2018 වර්ෂය සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2018 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;

(ii) 2018 වර්ෂය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව; සහ

(iii) 2018 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, 2018.02.23 සිට 2018.10.12 දක්වා කාලයට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.04.04 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ දෙවැනි වාර්තාවේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා *[සභා ගර්භය තුළ නැත.]*

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා *[සභා ගර්භය තුළ නැත.]*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ධීවර ක්ෂේත්‍රයට වෙන් කළ මුදල්: විස්තර
### கடற்றொழில் துறைக்காக ஒதுக்கப்பட்ட தொகை: விபரம்
### MONEY ALLOCATED FOR FISHERIES SECTOR: DETAILS

30/'18

**1. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) 2005 සිට 2017 වර්ෂය දක්වා ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කරන ලද මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ වෙන් කරන ලද මුදල් එම එක් එක් වර්ෂ සඳහා ප්‍රමාණවත් වූයේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) இலங்கையில் கடற்றொழில் துறையின் அபிவிருத்திக்காக இதுவரை மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(ii) 2005 தொடக்கம் 2017 ஆம் ஆண்டு வரை கடற்றொழில் துறைக்காக ஒதுக்கப்பட்ட தொகை வருடாந்தம் வெவ்வேறாக எவ்வளவு;

(iii) அவ்வாறு ஒதுக்கப்பட்ட தொகை அந்தந்த ஆண்டுகளுக்குப் போதுமானதாக இருந்ததா;

என்பதை அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House -

(i) the measures taken to develop the fisheries industry of Sri Lanka, so far;

(ii) the amounts of money allocated to the fisheries sector from 2005 to 2017 in relation to each year, separately; and

(iii) whether the amounts of money so allocated were sufficient for each year?

(b) If not, why?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2018 වසරේ ප්‍රතිපාදන තුළින් ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මකව පවතී. මිරිස්ස, ගාල්ල ධීවර වරාය සංවර්ධනය හා කලමැටිය, වෙල්ලමන්කර, මයිලිඩ්ඩි ධීවර වරාය ඉදිකිරීම, පැරැලිය නැංගුරම්පොළ හා සාම්පොලාඩි, වෙල්ලමන්කර, අරිප්පු තුරෙයියූර් තොටුපොළවල් සංවර්ධනය, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම, ධීවර කර්මාන්තය සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම, ධීවර ප්‍රජාව බලගැන්වීම සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධනය, ධීවර නිවාස ඉදි කිරීම, අලුත්වැඩියාව හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යටතේ වෙරළ පුනරුත්ථාපනය හා සම්පත් කළමනාකරණය, මත්ස්‍ය අභිජනනාගාර ඉදි කිරීම හා වැඩිදියුණු කිරීම, ධීවර ගම්මාන වැඩිදියුණු කිරීම, සමෝධානිය මිරිදිය ධීවර ගම්මාන පිහිටුවීම, කලපු 10ක් පවිත්‍රකරණය, බහුදින යාත්‍රාවල මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හා අඩි 55ට වඩා දිගැති බහුදින යාත්‍රා නිෂ්පාදනය සඳහා සියයට 50ක සහනාධාර මුදලක් ලබා දීම යන ව්‍යාපෘති මේ අතරින් ප්‍රමුඛ වේ.

[ගරු පී. හැරිසන් මහතා]

එසේම, ධීවර අංශය හා සම්බන්ධ ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සමඟ වන විට එකඟතාවන්ට අනුගත වෙමින් නීති විරෝධී, වාර්තා නොවන, විධිවිධාන සලසා නොමැති ධීවර කටයුතු - IUU fishing - වැළැක්වීමඋදෙසා අවශ්‍ය දේශීය නීති සංශෝධනයට හා නීති විරෝධී ධීවර කටයුතුවලට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග දැඩි කිරීමට පියවර ගෙන ඇත. එසේම, ඉන්දීය ධීවරයන් ශ්‍රී ලංකාවේ උතුරු මුහුදු සීමාව උල්ලංඝනය කරමින් නීති විරෝධී ලෙස මත්ස්‍ය අස්වැන්න නෙළා ගැනීම දෙරට අතර අඛණ්ඩව පවත්නා සාකච්ඡා මත ක්‍රමිකව අඩු කර ගැනීමට හැකියාවක් ලැබී ඇත. එසේම, ශ්‍රී ලංකා රජය විසින් අත්අඩංගුවට ගන්නා ලද විදෙස් රටවල ධීවරයන් නිදහස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම මෙන්ම වෙනත් රටවල් මඟින් අත්අඩංගුවට ගන්නා ලද ශ්‍රී ලාංකික ධීවරයන් නිදහස් කර ගැනීමට හැකියාව ලැබී ඇත. එසේම යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය හරහා සියලු බහුදින යාත්‍රා සුපරීක්ෂණය කිරීමද සිදු කරනු ලබයි.

ඒ වාගේම, ගරු කථානායකතුමනි, මේ වන විට පිට රටවල අත්අඩංගුවේ සිටි ශ්‍රී ලංකා ධීවරයන් සියලුදෙනා නිදහස් කරගෙන තිබෙන බවත් මා ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

(ii)

| වර්ෂය | වෙන් කරන ලද මුදල (රුපියල් බිලියන) |
|---|---|
| 2005 | 4.9 |
| 2006 | 5.0 |
| 2007 | 6.1 |
| 2008 | 4.3 |
| 2009 | 8.8 |
| 2010 | 6.3 |
| 2011 | 3.7 |
| 2012 | 2.7 |
| 2013 | 2.3 |
| 2014 | 3.9 |
| 2015 | 4.5 |
| 2016 | 5.7 |
| 2017 | 6.2 |
| **එකතුව** | **64.4** |

(iii) වාර්ෂිකව භාණ්ඩාගාරය හරහා ලබා දී ඇති ප්‍රතිපාදන සංවර්ධන ව්‍යාපෘති සඳහා කළමනාකරණය කර ගන්නා ලදී.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, සාර්ථක විස්තරාත්මක පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ ධීවර කර්මාන්තය කියන්නේ විශාල කර්මාන්තයක්; විශාල පිරිසක් යැපෙන කර්මාන්තයක්. ධීවර කර්මාන්තය වෙනුවෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය ගැන කථා කළා. උදාහරණයක් වශයෙන් 2013 වර්ෂය ගත්තොත්, රුපියල් බිලියන 2.3ක් -රුපියල් මිලියන 2,300ක්- වෙන් කර තිබෙනවා. අද වනකොටත් වෙන්කර තිබෙන්නේ රුපියල් බිලියන 6.2ක මුදලක්. ඒ අනුව යම් වැඩි වීමක් තිබෙනවා.

මේ සා විශාල වශයෙන් පැතිරිලා තිබෙන, විශාල පිරිසකට රැකියා අවස්ථා, ආදායම් අවස්ථා දෙන ධීවර කර්මාන්තය වෙනුවෙන් මේ රටේ වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය ප්‍රමාණවත්ද කියලා මම දැනගන්න කැමැතියි. ප්‍රශ්නයෙනුත් එය අහලා තිබුණා. එම මුදල ප්‍රමාණවත්ද? මේ අතරින් විශේෂයෙන් කරදිය කර්මාන්තයට එහා ගිහිල්ලා මිරිදිය කර්මාන්තය තුළ ඒකාධිකාරයක් ගොඩනැඟිලා තිබෙනවා. මම නියෝජනය කරන ප්‍රදේශය උදාහරණයට ගත්තොත්, උඩවලව ජලාශය ආශ්‍රිතව විශාල මිරිදිය කර්මාන්ත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. නමුත් පසු ගිය වසර ගණනාවක ඉඳන් මේවායේ ඒකාධිකාරයක් ගොඩනැඟිලා තිබෙනවා. සාමාන්‍ය ප්‍රදේශවල සාමාන්‍ය ධීවරයෙකුට මේකට ඇතුළු වෙන්න බැහැ. එක ධීවරයෙක්, දෙන්නෙක් නැත්නම් ව්‍යාපාරිකයෝ දෙන්නෙක් මේ බෝට්ටු 50ක්, 60ක් දාලා, ඔරු 50ක්, 60ක් දාලා එම ව්‍යාපෘතිය තමන්ගේ අතට ගන්නවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අමාත්‍යාංශය විධියට සාමාන්‍ය මිනිසුන්ටත් මේ හරහා යැපෙන්න පුළුවන් වටපිටාවක් හදන්න කියලා. ඒ වාගේම මේ ව්‍යාපෘති තවදුරටත් පාරම්පරික ක්‍රමයෙන් ඔබ්බට ගිහිල්ලා ලෝකයේ ඉදිරියට ගිහිල්ලා තිබෙන නව තාක්ෂණය අනුව ධීවර කර්මාන්තය ඉස්සරහට ගෙන යන්න යම් කිසි ක්‍රමවේදයක් සඳහා අමාත්‍යාංශය පියවර තබා තිබෙනවාද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. රජය මඟින් ලබා දෙන ප්‍රතිපාදන තුළින් විතරක් ධීවර කර්මාන්තය නඟා සිටුවන්න බැහැ. එහෙත් මේ වන විට ලෝක බැංකු ආධාර යටතේ, ඒ වාගේම නෝර්වේ රජය මැදිහත් වෙලා ලංකාවේ ධීවර කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය උපදෙස්, තාක්ෂණය, ඒ වාගේම සහනාධාර ලබා දීමේ වැඩසටහන් නෝර්වේ ඇතුළු තවත් රජයන් ගණනාවකින් ක්‍රියාත්මක වෙනවා. ඒ තුළින් රටේ ධීවර අංශයේ ප්‍රගතියක් ඇති කර ගන්නටත්, ඒ වාගේම නව තාක්ෂණය අනුව අලුත් මත්ස්‍ය වගාවට ධීවර ජනතාව හුරු කරන්නටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම එතුමා ඇහුවා, අභ්‍යන්තර ධීවර ජලාශවල පුද්ගලයන් කිහිප දෙනෙක් විතරක් බෝට්ටු යොදාගෙන එම කර්මාන්තයේ යෙදෙනවාද කියලා. මම හිතන විධියට එතුමාට ඒ සම්බන්ධයෙන් තිබෙන්නේ වැරැදි වැටහීමක්. විශේෂයෙන්ම අභ්‍යන්තර ධීවර ජලාශවල අය ධීවර සමිති පිහිටුවා තිබෙනවා.

ඒ සමිති සමාගම් හරහා තමයි ඒ අවශ්‍ය උපකරණ රජය මඟින් ලබාදීම් කටයුතු කෙරෙන්නේ. ඒක නිසා කොහේ හරි ඒ වාගේ තැනක ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපට ඒකට මැදිහත්වෙලා කටයුතු කරන්න පුළුවන්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු ඇමතිතුමනි, සමිති තිබෙන බව මම දන්නවා. නමුත් ඒ සමිතිය ක්‍රියාත්මක වෙන්නේ එක පුද්ගලයෙක් වටා කියන කාරණය පිළිබඳ තොරතුරු මම ඔබතුමාට පෞද්ගලිකව ලබා දෙන්නම්.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඉතිහාසය පුරාම අපි දන්නවා, ධීවර වරායන්වල බලඅධිකාරය දේශපාලනඥයන් අතේ තියාගෙන ඉන්නවා කියන කාරණය. එහි ඉතිහාසය ගත්තාම සමහර වරායවල ධීවර බෝට්ටුවට තෙල් ගහනකොටත් රුපියලක්, ශත පනහක් ඒ ප්‍රදේශයේ අදාළ දේශපාලනඥයාට එන විධියේ ක්‍රමවේදයක් තිබුණා. අදටත් සමහර තැන්වල ඒ දේශපාලන බලඅධිකාරය තුළ ධීවරයන් යම්කිසි හිරවීම්වල ඉන්නවා. ආණ්ඩු පෙරළෙනකොට මේ තත්ත්වය අඩු වැඩි වශයෙන් වෙනස් වෙනවා. නමුත් මේ කිසිම ආයතනයකට දැඩි සම්බන්ධයක් යොදවා, දේශපාලන හයිය පෙන්වන්නේ නැති ඇමතිවරයෙක් විධියට ඔබතුමා මේ තියෙන තත්ත්වයෙන් ධීවර ජනතාව ගලවාගෙන ඔවුන්ට රැකියාව කරගෙන යන්න පුළුවන් වටපිටාවක් හදන්න. මොකද, අපි දන්නවා වරායේ තෙල් ගහන්න ඕනෑ, ඒ අදාළ ඇමතිවරයාට තිබෙන filling station එකෙන් බව. එහිදීත් බෝට්ටුවකින් රුපියලක් වැඩිපුර ගන්නවා. මෙක මහ විශාල මුදලක්. මෙය ඉතිහාසය පුරාවට තිබුණා.

ගරු ඇමතිතුමනි, සැමන් ටින් එකක quality එක ගැන අපට තව අවුරුදු ගණනාවක් යනතුරු බලාපොරොත්තු තබා ගන්න බැහැ. මිනිසුන්ට කන්න පුළුවන් වන විධියේ ආනයනික සැමන් ටින් එකක quality එක තිබෙන සැමන් ටින් එකක් අපට හදා ගන්න තවම බැරි වෙලා තිබෙනවා. අපි කිහිපයක් හැදුවා. නමුත් ජනතාව ඒවා ප්‍රතික්ෂේප කරන තැනට ඇවිල්ලා තිබෙනවා. ඒවා අඩු මුදලට දුන්නාට, ඒක වැඩක් වෙන්නේ නැහැ. ඇත්තම කථාව ඒකයි. ප්‍රමිතියේ ප්‍රශ්නයක් තිබෙනවා. මම ඔබතුමාගෙන් අහනවා, මෙන්න මේ ගැටලු ටික නැතුව ඉදිරියට යන්න පුළුවන් වැඩසටහනක් හදන්න පුළුවන්ද කියා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එතුමා අසන ලද ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්න තුනක් ගොනු වෙලා තිබෙනවා. එකක් තමයි මිරිදිය ධීවර කර්මාන්තයේ බෝට්ටු සහ ඒ අයගේ සමිති සමාගම්වල ඒකාධිකාරයක් තිබුණා කියන කාරණය. ඒක ඇත්ත කථාව. ඒවායේ වෙනස්වීමක් වෙලා තිබුණේ නැහැ.

ඒ ව්‍යවස්ථාව අනුවම සමහර අය අවුරුදු 10, 12 ඒ සමිති සමාගම්වල නිලධාරීන් හැටියට ඉන්නවා. අපි ඒ ව්‍යවස්ථාව සංශෝධනය කරලා තිබෙනවා. දැන් වසර 2කට වැඩිය ඒ සමිතිවල එක නිලධාරියෙකුට ඉන්න බැහැ. ඒ අනුව, වාර්ෂිකව ඒ සමිතිවල නිලධාරීන් වෙනස්වීමේ ක්‍රමවේදයක් හදලා තිබෙනවා.

ඒ වාගේම එතුමා අපේ ධීවර අංශයේ සැමන් කර්මාන්තය ගැන ඇහුවා. ඇත්ත වශයෙන්ම දැනටමත් ශ්‍රී ලංකාවේ දේශීය වශයෙන් කර්මාන්ත කිහිපයක්ම ක්‍රියාත්මක වෙනවා, කමල් අද්දරආරච්චි මහත්මයාගේ කර්මාන්තය ඇතුළුව. එතුමාත් දේශීය වශයෙන් ටින් මාළු නිෂ්පාදනය කරනවා. ඒ වාගේ, තවත් කිහිප දෙනෙකු ඉන්නවා. එම නිසා ප්‍රායෝගිකව ප්‍රශ්න තිබුණත්, රසයේ සහ ගුණාත්මක භාවයේ පොඩි පොඩි අඩු පාඩුකම් තිබුණත් අපි දේශීය දේ අගය කරන්නට ඕනෑ. මොකද, රට වටේටම ධීවර වරායන් තිබෙනවා. ඒ අය සුළුවෙන් හෝ ඒ කර්මාන්තය පටන් අරගෙන තිබෙනවා, හොඳ තත්ත්වයකට ඇවිල්ලාත් තිබෙනවා. සාමාන්‍යයෙන් දේශීය අවශ්‍යතාවෙන් සියයට 10ක් 15ක් පමණ ඒ අය සපුරාලනවා. අපි ඒ අය ශක්තිමත් කරන්නට අමාත්‍යාංශයක් හැටියට සම්පූර්ණ සහයෝගය ලබා දීමට කටයුතු කරනවා කියන එකත් ඔබතුමාට කියන්නට ඕනෑ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කිරීමට අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්න සූදානම්ද ?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔව්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ ඇමතිතුමාටත් වඩා, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා කියපු කාරණයක් සම්බන්ධවයි. දිගටම අමාත්‍යවරුන්ගේ filling stations වලින් තෙල් ගහන්න වෙනවා, ධීවර වරායන්වල තවමත් එම දේශපාලන බල අධිකාරිය ක්‍රියාත්මක වෙනවා වාගේ කාරණයක් එතුමා සඳහන් කළා. ගරු කථානායකතුමනි, මමත් ධීවර විෂය භාර අමාත්‍යවරයා විධියට හිටියා. එහෙම දෙයක් කොහේ හරි සිදු වෙනවා නම් ගරු මන්ත්‍රීතුමා, කියන්න. මට filling stations ඇත්තෙත් නැහැ, මගේ කට්ටිය එහෙම වරායන්වලට දාලාත් නැහැ. ඒ වාගේ දෙයක් කොහේ හරි සිදු වෙනවා නම් තමුන්නාන්සේ කියන්න. මොකද, කලින් හිටපු ධීවර අමාත්‍යවරු කියලා පොදුවේ කිව්වාම, අපටත් ඒක වදිනවා. [බාධා කිරීමක්]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
කලින් එහෙම සිද්ධියක් සිදු වෙලා තිබෙනවා, හොයලා බලන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මම පිළිතුරක් දෙන්නට ඕනෑ.

ගරු මහින්ද අමරවීර මන්ත්‍රීතුමා ධීවර ඇමතිවරයා හැටියට ඉඳලා තිබුණාට, මෙතුමාට ධීවර වරායන් නැහැ; එතුමාට ධීවර වරායන්හි petrol sheds නැහැ කියලාත් මම දන්නවා. ඒ නිසා ඒ කියපු කාරණය එතුමාට අදාළ වන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳ සහතිකයක්. [බාධා කිරීමක්] ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාටත් මේ පිළිබඳව කථා කරන්න තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
මම එවැනි චෝදනාවක් පළමුවැනි වතාවටයි ඇහුවේ. මම නම් හිතන්නේ නැහැ, කිසිම ධීවරයෙක් දේශපාලනඥයකුට එවැනි ආකාරයට සල්ලි ගෙවනවා කියා. මොකද, එහෙම ගෙවන්න විධියක් නැහැ. ඒ වෙනුවෙන් දෙන්නේ රිසිට් එකක්. ඒ තුණ්ඩුව තමයි ගිහිල්ලා දෙන්නේ; petrol shedsවලට සල්ලි දෙන්නේ නැහැ. ඒක කථාවක් මිසක් කවදාකවත් එහෙම වෙන්නේ නැහැ.

දෙවැනි කාරණය, සැමන් ටින් කර්මාන්තය. ගරු කථානායකතුමනි, සැමන් ටින් කර්මාන්තය 1970 බණ්ඩාරනායක

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

මැතිනියගේ කාලයේ ඉඳලා කළා. නමුත්, ඒක කරන්න දුන්නේ නැහැ. පිට රටින් සැමන් ගෙනෙන නිසා මෙතැන ලොකු මාෆියාවක් තිබෙනවා. ඊට පස්සේ මම කර්මාන්තශාලා 4ක් ආරම්භ කළා. ඊට පස්සේ ඒකටත් බොහොම අමාරුකම් තිබුණා. නමුත් ඒක දැන් යනවා. ඔය කියන විධියට රසයේ අඩුවයි, ගුණාත්මකභාවයේ අඩුවයි කියන එක මම නම් පිළිගන්නේ නැහැ. ලංකාවේ සමහර නිෂ්පාදන ඒ ගොල්ලෝ අපනයනය කරනවා, පිට රටවලටත් යවනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන කර්මාන්තශාලාවක තමන්ගේ නිෂ්පාදනවලින් කොටසක් ඒ ගොල්ලෝ අපනයනයත් කරනවා. ඒ නිසා රසයේ අඩුවයි, අරවයි මේවයි ඔක්කෝම කියන්නේ ඔය පිට රටින් ටින් මාළු ගෙනෙන උදවියයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 - 86/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 - 145/'18 - (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ගාල්ල, ලබුදූව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය: නේවාසිකාගාරය
### காலி, லபுதூவ இலங்கை உயர் தொழில்நுட்பவியல் கல்வி நிறுவகம்: விடுதி
### SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION IN LABUDUWA, GALLE: HOSTEL

210/'18

**4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල, ලබුදූව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මේ වන විට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ස්ථානයකද;

(iv) ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(v) එම නේවාසිකාගාරය ඉදිකර නිම කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல், நீர்வழங்கல் மற்றும் உயர்கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) காலி, லபுதூவ இலங்கை உயர் தொழில்நுட்பவியல் கல்வி நிறுவகத்தில் தற்போது பயில்கின்ற மாணவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அந்த மாணவர்களுக்காக விடுதியொன்றை நிர்மாணிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், அது எந்த இடத்தில் என்பதையும்;

(iv) அதற்காக ஒதுக்கப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(v) மேற்படி விடுதியை நிர்மாணித்து முடிப்பதற்கு எடுக்கப்படும் காலம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning, Water Supply and Higher Education :

(a) Will he inform this House -

(i) the number of students studying in Sri Lanka Institute of Advanced Technological Education in Labuduwa, Galle;

(ii) whether action will be taken to build a hostel for those students;

(iii) if so, the place in which the hostel will be built;

(iv) the amount of money that has been allocated for that; and

(v) the time that will be taken to complete the construction of that hostel?

(b) If not, why?

**ගරු ලකී ජයවර්ධන මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்கி ஜயவர்தன - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lucky Jayawardana - State Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මේ වන විට සිසුන් 4,553ක් ඉගෙනුම ලබයි.

(ii) ඔව්.

(iii) ගාල්ල, ලබුදූව, මොරිස් පාර, අංක 275හි පිහිටා ඇති රුපියල් 70,000,000ක් වටිනා පර්චස් 154.76ක් වූ ඉඩමෙහි.

(iv) 2019 අය වැයෙන් මේ සඳහා මුදල් වෙන් කර නොමැති අතර, 2020 අය වැය මඟින් මුදල් ඉල්ලුම් කිරීමට අපේක්ෂිතය.

(v) 2020 අය වැයෙන් මුදල් අනුමත කර ලැබීමෙන් අනතුරුව, ඉඩම මිලදී ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹුණු පසු, වසර දෙකක පමණ කාලයක් ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වනු ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගාල්ල, ලබුදූව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ නේවාසිකාගාරය පිළිබඳ ප්‍රශ්නය අද ඊයේ ඇති වූවක් නොවෙයි, කාලයක් තිස්සේ ඒ ශිෂ්‍යයන් මෙම ඉල්ලීම කරනවා.

එහෙම ඉල්ලීම් කිරීමෙන් පසු තමයි අමාත්‍යාංශයට දැනුම් දීලා තිබෙන්නේ. ඔබතුමා කියන ආකාරයට 2020 අය වැයෙන් තමයි මුදල් වෙන් කර ගන්න බලාපොරොත්තු වන්නේ. ඒක හදලා ඉවරවෙනකොට තවත් අවුරුදු 3ක්, 4ක් ගත වෙයි. මම හිතන්නේ තාක්ෂණ විෂය සම්බන්ධයෙන් අපි ප්‍රමුඛතාව දිය යුතුයි කියායි. එහි සිසුන් 4000ක් පමණ සිටිනවා. එම නේවාසිකාගාරය හැදීම සඳහා ඉඩමක් තිබෙනවා නම් එය කඩිනම් කරන්න කියා ඉල්ලනවා. මොකද, මම හිතන්නේ ඒ ප්‍රදේශයේ රජයේ ඉඩම් තිබෙනවා. ඒ පිළිබඳව හොයා බලන්න පුළුවන්. මගේ පළමු අතුරු ප්‍රශ්නය හැටියට මම ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. අපේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාගෙන් ලබුදූව hostel එක හදන්න ඉඩමක් ඉල්ලා ගන්නත් පුළුවන්.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු මන්ත්‍රීතුමාගේ පළමු වෙනි අතුරු ප්‍රශ්නය විධියට ගෙන ආ යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක් කියා මම හිතනවා. මේ සඳහා මුදල් ලබා ගන්න බලාපොරොත්තු වන්නේ 2020 වසරේදීයි. මේ සඳහා රුපියල් ලක්ෂ 700ක් වෙන් කරනවාට වඩා, රජයේ ඉඩමක් ලබා ගෙන එම නේවාසිකාගාරය ඉදි කළොත් කඩිනමින් කරන්න පුළුවන්. එම නිසා අපි ඉඩම් ඇමතිතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරනවා. විශේෂයෙන්ම එතුමා ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන නිසා ඉඩමක් ලබා දෙනවා නම්, ඉතා කඩිනමින් මේ කටයුත්ත ආරම්භ කරන්න පුළුවන් කියන එකත් කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඉඩම් ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ පිළිබඳව ඉල්ලීමක් කරන්න. ඕනෑම වෙලාවක දෙන්නම්.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

එහෙම නම් එම ඉල්ලීම මම මේ අවස්ථාවේ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මෙය තාක්ෂණ විෂය හා සම්බන්ධ ප්‍රශ්නයක්. විශ්වවිද්‍යාලවලට අනුබද්ධ කර අලුතින් තාක්ෂණ පීඨ පටන් අරගෙන තිබෙනවා. එම තාක්ෂණ පීඨ පටන් අරගෙන වැඩ කටයුතු කරගෙන ගියත්, ඇත්තටම ඒ දරුවන්ට ලබා දෙන උපාධිය පිළිබඳව තවම නිශ්චිතභාවයක් නැහැ. BTech උපාධියද දෙන්නේ, BSc උපාධියද දෙන්නේ කියන එක පිළිබඳව ඒ ශිෂ්‍යයෝ දන්නේ නැහැ. ඒ වාගේම තවමත් විෂය නිර්දේශ සකස් කර තිබෙනවාද කියන අදහසකුත් ඔවුන් තුළ නැහැ. ආචාර්යවරුන්ගේ හිඟයකුත් තිබෙනවා. තාක්ෂණ විෂය ආරම්භ කිරීම හොඳයි. එහි ලොකු අවශ්‍යතාවක් තිබෙනවා. තාක්ෂණ පීඨ ආරම්භ කරනවා වාගේම, ඒ හා සමානව ඒවාට අවශ්‍ය කරන සැලසුම්, යටිතල පහසුකම්, ආචාර්යවරු, අනධ්‍යයන සේවකයන් ලබා දීම ඉතාම වටිනවා. ඔබතුමාට තව කොපමණ කාලයක් ඔය තනතුරේ ඉන්න පුළුවන් වෙයිද කියා මම දන්නේ නැහැ. සිටින කාලය තුළදී මැදිහත් වෙලා හෝ මෙම ප්‍රශ්නයටත් විසඳුමක් ලබා දෙන්න කියා ඉල්ලනවා.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඇත්ත වශයෙන්ම ඉතාම වැදගත් යෝජනාවක්. මේ පිළිබඳව මම සිටින කාලය තුළ කරන්න පුළුවන් උපරිම වශයෙන් කර ඒ අවශ්‍ය පහසුකම් සපයන්න අපේක්ෂා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 5 -263/'18- (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## උපාධිධාරී ගුරු පත්වීම්: විෂයයන් වෙන් කිරීමේ ගැටලු

### பட்டதாரி ஆசிரியர் நியமனங்கள்: பாட ஒதுக்கீட்டிலுள்ள பிரச்சினை

### GRADUATE TEACHER APPOINTMENTS: ISSUES IN ALLOCATION OF SUBJECTS

344/'18

6. **ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උපාධිධාරී ගුරු පත්වීම් ලබා දීමේදී උපාධිධාරීන්ගේ විෂයට අදාළ නොවන පත්වීම් ප්‍රදානය කිරීම හේතුවෙන් එම ගුරුවරුන් පාසලේදී තමන්ට ලැබෙන විෂය ඉගැන්වීමේදී අසීරුතාවන්ට පත්වී ඇති බව දන්නේද;

(ii) මේ වනවිට පත්වීම් ලබාදී ඇති ගුරුවරයන්ගේ විෂයයන් මාරු කිරීමට කිසියම් ක්‍රමවේදයක් තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා ලබා දිය හැකි විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) பட்டதாரி ஆசிரியர் நியமனங்களின்போது பட்டதாரிகளின் பாட விடயப்பரப்புக்கு ஏற்புடையதல்லாத நியமனங்கள் வழங்கப் படுவதால் மேற்படி ஆசிரியர்கள் பாடசாலையில் தமக்கு கிடைக்கும் பாடத்தை கற்பிப்பதில் சிரமங்களை எதிர்கொள்கின்றார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(ii) இன்றளவில் நியமனங்கள் வழங்கப்பட்டுள்ள ஆசிரியர்களின் பாடங்களை மாற்றுவதற்கு யாதேனுமொரு நடைமுறை உள்ளதா என்பதையும்;

(iii) இன்றேல், அதற்கு வழங்கக்கூடிய தீர்வு யாதென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) whether he is aware of the fact that teachers find it difficult to teach the subjects assigned to them at school as a result of granting appointments not relevant to the subjects of the graduates when graduate teaching appointments are granted;

(ii) whether there is any method to change the subjects of the teachers who have been granted appointments by now; and

(iii) if not, the possible solution for that situation?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මීට වසර කිහිපයකට පෙර ඇතැම් පළාත් සභා විසින් ශ්‍රී ලංකා ගුරු සේවයට ගුරවරුන් බඳවා ගැනීමේදී පහත පරිදි කටයුතු කර ඇති බව නිරීක්ෂණය කර ඇත.

- උපාධියට හැදෑරූ විෂයට අදාළ නොවන වෙනත් විෂයයන් සඳහා පත්වීම් ප්‍රදානය කර තිබීම.
- ඉගැන්වීමට අපේක්ෂිත විෂය සඳහා උපාධියට අදාළ විෂය ඒකක ප්‍රමාණයන් තුනෙන් එකක් සම්පූර්ණ කර තිබිය යුතු වුවද, එසේ නොමැති අයවලුන්ට පත්වීම් ප්‍රදානය කර තිබීම.

තවද, එසේ පත්වීම් ලැබූ ගුරුවරුන් පෙර සූදානමකින් තොරව තමන්ට ලැබෙන විෂයය ඉගැන්වීමේදී අසීරුතාවන්ට පත් වී ඇති බවද නිරීක්ෂණය වී ඇත.

එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ III පරිශිෂ්ටයේ දක්වා ඇති පරිදි ගුරුවරුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම" යන මැයෙන් ඉදිරිපත් කළ අංක 2017/ED/E/27 හා 2017.07.20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙන්,

- පත්වීම් ලබා දීමට නියමිත විෂයයට අදාළ උපාධිලාභීන් පමණක් ගුරු සේවයට බඳවා ගැනීමට හා
- ඉගැන්වීමට නියමිත විෂයය උපාධියට හදාරනු ලැබූ මුළු විෂයය සංධාරයෙන් 1/3 සම්පූර්ණ කළ අයවලුන් උපාධිධාරී ගුරුවරුන් ලෙස බඳවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.

ඒ සඳහා අංක අමප/17/1597/742/027 හා 2017.09.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව, ඉගැන්වීමට නියමිත විෂයයට අදාළ අධ්‍යාපන සුදුසුකම් මත පත්වීම් ලබා දීමට කටයුතු කරන බැවින් මෙම ගැටලුව ඇති නොවේ.

(ii) ප්‍රතිපත්තිමය තීරණයක් වශයෙන් ගුරුවරුන්ගේ පත්වීම් විෂයය පසුව වෙනස් නොකෙරේ.

අංක ED/02/29/10/0/8/II හා 2019.02.25 දිනැති ලිපියෙන් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 07/2019 මඟින්, ගුරු භවතුන්ගේ පත්වීම් ලිපියේ සඳහන් විෂයය

ප්‍රතිපත්තිමය වශයෙන් කිසිසේත් වෙනස් නොකරන බව දැනුම් දී ඇත. එම ලිපිය ඇමුණුම ලෙස ඉදිරිපත් කොට **සභාගත*** කරමි.

(iii) අදාළ නොවේ.

(ආ) උක්ත (අ) (i) ප්‍රශ්නය සඳහා ලබා දී ඇති පිළිතුර අනුව එම ගැටලුව පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
තිබෙනවා, ගරු කථානායකතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැම්පස්වලින් පිට වුණු දරුවෝ ඉන්නවා. ඒ අයට තවම රැකියා නැහැ. ඒ වාගේම පාසල්වල ගණිතය, විද්‍යාව විෂයයන්වලට ගුරුවරුන්ගේ පුරප්පාඩු තිබෙනවා. ඉක්මනින් කැබිනට් එකේ approval එක අරගෙන කැම්පස්වලින් පිට වුණු අයට එම අවස්ථාව ලබා දුන්නොත් හොඳයි කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේක කොච්චර කාලයක සිට අපි කිය කිය සිටිය දෙයක්ද? රස්සාවකට යනකොට හැම එක්කෙනාගෙන්ම අහන්නේ, ගණිතය හා විද්‍යාව ගැන. අපේ දිස්ත්‍රික්කයේ සිංහල, මුස්ලිම් හා දෙමළ හැම පාසලකම එම අඩු පාඩුව තිබෙනවා, ගරු කථානායකතුමනි. අධ්‍යාපන ඇමතිතුමාට කියනවා, ඉතා ඉක්මනින් මෙය විසඳා දෙන්න කියලා. කැම්පස් ගිහින් ඉගෙන ගත්තු අය නැත්නම් කමක් නැහැ. කැම්පස් ගිහින් ඉගෙන ගත්ත අය ඉන්න නිසා ඒ අයට ඉක්මනින් රැකියාව දීලා, මේ ප්‍රශ්නය විසඳන්න කියලා තමයි මට කියන්න තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
තව අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

"ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කය වෙනුවෙන් මුදල් බර ගණනක් වෙන් කළා. නමුත්, අවශ්‍ය පාසල්වලට මුදල් ලබා දුන්නේ නැහැ. මම දන්න විධියට පළාත් සභාව හරහා තමයි ඒක සිද්ධ වුණේ. පළාත් සභාවේ හිටපු මහ ඇමතිතුමාගේ යුගයේදී ඒවා හරියට කෙරුණේ නැහැ. "ළඟම පාසල-හොඳම පාසල" කිව්වාට හැම පාසලකම අඩු පාඩු තිබෙනවා. ඒවාත් නිවැරදි කරන්න කියලා ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමනි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ අතුරු ප්‍රශ්න ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හොඳමයි.

## දුම්රිය ස්ථාන සංවර්ධනය : විස්තර
## புகையிரத நிலையங்களின் அபிவிருத்தி: விபரம்
## DEVELOPMENT OF RAILWAY STATIONS : DETAILS

430/'19

**7. ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය සේවය සතු දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් සංවර්ධනය කළ යුතු තත්ත්වයේ පවතින දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා සංවර්ධනය කරන ලද දුම්රිය ස්ථාන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iv) ඉදිරියේදී සංවර්ධනය කිරීමට නියමිත දුම්රිය ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) இலங்கை புகையிரத சேவைக்கு உரித்தான புகையிரத நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அவற்றில் அபிவிருத்தி செய்ய வேண்டிய நிலையில் உள்ள புகையிரத நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) 2015 ஆம் ஆண்டு முதல் இதுவரையில், அபிவிருத்தி செய்யப்பட்டுள்ள புகையிரத நிலையங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

(iv) எதிர்காலத்தில் அபிவிருத்தி செய்யப்படவுள்ள புகையிரத நிலையங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) the number of railway stations belonging to the Sri Lanka Railways;

(ii) out of them, the number of railway stations that need to be developed;

(iii) the number of railway stations developed since 2015 and their names; and

(iv) the railway stations that are to be developed in future?

(b) If not, why?

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - State Minister of Transport and Civil Aviation)
ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 334යි.

(ii) 134යි.

(iii) 58යි.

| | | |
|---|---|---|
| (1) කොළඹ කොටුව | (21) ගල්ඔය | (41) ගල්කිස්ස |
| (2) මරදාන | (22) කන්තලේ | (42) රත්මලාන |
| (3) රාගම (කොටසක්) | (23) තඹලගමුව | (43) පානදුර |
| (4) ගම්පහ | (24) කැකිරාව | (44) වාද්දුව |
| (5) වැල්ලව | (25) මොරගොල්ලාගම | (45) නාරාහේන්පිට |
| (6) ජා-ඇළ (කොටසක්) | (26) කළාවැව | (46) නුගේගොඩ |
| (7) බෙම්මුල්ල | (27) අවුකන | (47) පන්නිපිටිය |
| (8) ලියනගේමුල්ල | (28) මිරිස්ස | (48) කොට්ටාව |
| (9) කඳාන | (29) අහංගම | (49) මාලපල්ල |
| (10) පොතුහැර | (30) හබරාදූව | (50) හෝමාගම |
| (11) කුරුණෑගල | (31) කටුගොඩ | (51) පාදුක්ක |
| (12) මුත්තෙට්ටුගල | (32) උතුරු කළුතර | (52) බදුල්ල |
| (13) කැලණිය (කොටසක්) | (33) දකුණු කළුතර | (53) ඇල්ල |
| (14) ගල්ගමුව | (34) කටුකුරුන්ද | (54) නානුඔය |
| (15) අඹන්පොළ | (35) උතුරු පයාගල | (55) නාවලපිටිය |
| (16) තඹුත්තේගම | (36) දකුණු පයාගල | (56) ගමපොල |
| (17) මඩකලපුව | (37) කොල්ලුපිටිය | (57) පේරාදෙණිය |
| (18) එරාවූර් | (38) බම්බලපිටිය | (58) මහනුවර |
| (19) පොළොන්නරුව | (39) වැල්ලවත්ත | |
| (20) හිඟුරක්ගොඩ | (40) දෙහිවල | |

(iv) ඔව්.

| | | |
|---|---|---|
| (1) දෙමටගොඩ | (21) පොරපොල | (41) පුනානි |
| (2) හුණුපිටිය | (22) මහව | (42) කෝන්වැව |
| (3) වේයන්ගොඩ | (23) රන්දෙනිගම | (43) වැලිකන්ද |
| (4) හීන්දෙණිය පට්ටිගොඩ | (24) අඹන්පොළ | (44) පළුගස්වැව |
| (5) පොල්ගහවෙල | (25) ගල්ගමුව | (45) කල්කුඩා |
| (6) කපුවත්ත | (26) සෙනරත්ගම | (46) තල්පේ |
| (7) කට්ටුව | (27) තඹුත්තේගම | (47) පානදුර |
| (8) කැළණිය | (28) තලාව | (48) අහුලාන |
| (9) රාගම | (29) ශ්‍රාවස්තිපුර | (49) ගල්කිස්ස |
| (10) කිනවල | (30) අනුරාධපුර නව නගරය | (50) බම්බලපිටිය |

[ගරු අශෝක් අබේසිංහ මහතා]

| | | |
|---|---|---|
| (11) දාරළුව | (31) පරසන්ගස්වැය | (51) හාලිඇළ |
| (12) අලව්ව | (32) මැදගම | (52) දෙමෝදර |
| (13) ජා ඇළ | (33) මැදවච්චිය | (53) බණ්ඩාරවෙළ |
| (14) හලාවත | (34) පූනෑව | (54) හපුතලේ |
| (15) වනවාසල | (35) වව්නියාව | (55) දියතලාව |
| (16) බෙම්මුල්ල | (36) තාන්ඩිකුලම | (56) ඔහිය |
| (17) මගලෙගොඩ | (37) ත්‍රිකුණාමලය | (57) පට්ටිපොළ |
| (18) වළකුඹුර | (38) චීන වරාය | (58) හැටන් |
| (19) පොතුහැර | (39) වාලච්චේන | (59) මාතලේ |
| (20) මීගමුව | (40) මනම්පිටිය | |

(ආ) අදාළ නොවේ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. අලුතෙන් ඉදි වෙමින් පවතින, නැවත සංවර්ධන කරන මහව-ඕමන්ත මාර්ගයේ signals අලුතෙන් සංවර්ධනය කරනවා. මම දන්න විධියට එම දුම්රිය මාර්ගයේ තිබෙන දුම්රිය ස්ථාන වැඩි දියුණු කරන්නේ නැහැ. ඒ දුම්රිය ස්ථාන වැඩි දියුණු කිරීම මේ වේලාවේම කළා නම්, ඒක ජනතාවටත් පහසුවක් වෙනවා. ඒ කියන්නේ ඒ තුළින් ජනතාවට පහසුකම් ලබා දීමට හැකියාව ලැබෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

සංවර්ධනය කළ යුතු දුම්රිය ස්ථාන ලැයිස්තුවේ ඒ මාර්ගයේ තිබෙන දුම්රිය ස්ථානත් තිබෙනවා. විශේෂයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ප්‍රතිපාදන නොමැතිකම, අඩුකම තමයි මෙයට ප්‍රධාන හේතුව. ඒ සඳහා ගරු ඇමතිතුමා සහ මම දැන් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. අපි පුද්ගලික අංශයට ආරාධනා කරලා තිබෙනවා, දුම්රිය ස්ථාන නවීකරණය කිරීම සඳහා ඔවුන්ගේ සහයෝගය ලබා දෙන්න කියලා. ඔවුන් අපට කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා, සම්පූර්ණ වියදම කරලා අවශ්‍ය දුම්රිය ස්ථාන ප්‍රමාණය නවීකරණය කර දීමට.

ඒ අවස්ථාව ලබා දෙන්න අපි දැන් තීන්දු කරලා තිබෙනවා. එහිදී අපේ රජයට ශතයක්වත් වියදම් වෙන්නේ නැහැ. ඔවුන් ඒ සඳහා සියලුම ප්‍රතිපාදන ලබා දීලා, දුම්රිය ස්ථාන නවීකරණය කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, සංවර්ධනය කර, අලුත්වැඩියා කර තිබෙන සමහර දුම්රිය ස්ථානවල තවමත් ගැටලුවක් තිබෙනවා. විශේෂ අවශ්‍යතා ඇති - disabled - මගීන් සඳහා පහසුකම් ලබා දීම සඳහා ඒවා සංවර්ධනය වෙලා නැහැ. මම හිතන විධියට ඔබතුමා ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කළොත් හොඳයි. ඒ වාගේම සංවර්ධනය කර තිබෙන දුම්රිය ස්ථාන පිළිබඳව සොයා බලා, ඒගොල්ලන්ට පහසුකම් ලබා දීමට කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. ඒ වාගේම තව කාරණයක් තිබෙනවා. මම හිතන විධියට කාලයක් තිස්සේ සංචාරකයින් වෙනුවෙන් විශේෂ කුටියක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දැන් කොටුව දුම්රිය ස්ථානයේ සංචාරකයින්ට පමණක් භාවිත කරන්න පුළුවන් වැසිකිළි තිබෙනවා. ඒවා මුදල් ගෙවා හෝ අනෙක් අයටත් භාවිත කරන්න හැකියාවක් තිබෙනවා නම් හොඳයි. මොකද, මම හිතන විධියට ලංකාවේ පමණයි සංචාරකයින්ට මේ වාගේ පහසුකම් ලබා දී තිබෙන්නේ. සංචාරකයින්ට පහසුකම් ලබා දෙන්න ඕනෑ. අපි වෙනත් රටවලට ගියාම ඔවුන් තමන්ගේ රටේ අයට වැඩිපුර සලකන ආකාරය පෙනී යනවා. නමුත් අපේ රටේදී සංචාරකයින්ට පමණක් සලකනවා කියන එක ගැන බොහෝ දෙනෙක් කථා කරනවා. ඒ නිසා මුදලක් ගෙවා හෝ එම වැසිකිළි දේශීය අයටත් භාවිත කරන්න අවස්ථාව ලබා දීමට කටයුතු කරන්න පුළුවන් නම් හොඳයි කියලා මා යෝජනා කරනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

2019 -මෙවර- අය වැයෙන් විශේෂයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා, දුම්රිය ස්ථානවල වැසිකිළි නවීකරණය කරන්න. එම වැසිකිළි නවීකරණය කිරීමේදී, අපි ජාත්‍යන්තර මට්ටමේ වැසිකිළි තමයි සකස් කරන්නේ. ඒවා ලංකාවේ අයටත්, විදේශිකයන්ටත් කියන දෙගොල්ලන්ටම විවෘත කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ඉදිරියේදී පෞද්ගලික අංශය සමඟ එකතු වෙලා සංවර්ධනය කරන දුම්රිය ස්ථානවලත් ඒ දෙපාර්ශ්වයටම -දේශීය සංචාරකයන්ට සහ විදේශීය ජනතාවට- එකම වැසිකිළි සකස් කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 8-540/'19-(2), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9-568/'19-(1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය: සේවක වැටුප්

தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை: ஊழியர் சம்பளம்

NATIONAL WATER SUPPLY AND DRAINAGE BOARD: WORKERS' SALARY

600/'18

**10. ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, පිළියන්දල ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කරන මැන්පවර් සේවකයන්ට ගෙවනු ලබන වැටුප කොපමණද;

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන්ට ගෙවනු ලබන වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මැන්පවර් සේවකයන්ගේ සේවය අවශ්‍ය වී තිබියදී ඔවුන් අඩු වැටුපකට සේවයේ යෙදවීම අයුතු ලෙස ශ්‍රමය ලබා ගැනීමක් නොවන්නේද;

(ii) මෙම මැන්පවර් සේවකයන්ගෙන් අය කර ගනු ලබන සේවක අර්ථසාධක හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් සඳහා ඔවුන්ට ගිණුම් වාර්තා ලබා නොදෙන්නේ මන්ද;

(iii) මෙම සේවකයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට බඳවා ගැනීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் பிலியந்தலையில் பிராந்திய அலுவலகத்தில் சேவையாற்றிவருகின்ற மேன்பவர் ஊழியர்களுக்கு செலுத்தப்படுகின்ற சம்பளம் எவ்வளவு என்பதையும்;

(ii) தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையின் ஊழியர்களுக்கு செலுத்தப்படுகின்ற சம்பளம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேன்பவர் ஊழியர்களின் சேவை அவசியமாக உள்ள நிலையில் அவர்கள் குறைந்த சம்பளத்திற்கு சேவையில் ஈடுபடுத்தப்படுவது முறையற்ற விதத்தில் ஊழியத்தைப் பெற்றுக் கொள்வதாக இருக்காதா என்பதையும்;

(ii) மேற்படி மேன்பவர் ஊழியர்களிடமிருந்து அறவிட்டுக் கொள்ளப்படுகின்ற ஊழியர் சேமலாப நிதி மற்றும் ஊழியர் நம்பிக்கை நிதி தொடர்பில் அவர்களுக்கு கணக்கு அறிக்கைகள் ஏன் பெற்றுக் கொடுக்கப்படுவதில்லை என்பதையும்;

(iii) மேற்படி ஊழியர்களை தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்கு ஆட்சேர்ப்புச் செய்ய நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning, Water Supply and Higher Education:

(a) Will he inform this House-

(i) the amount of the salary that is paid to the manpower workers of the Piliyandala Regional Office of the National Water Supply and Drainage Board; and

(ii) the amount of the salary that is paid to the workers of the National Water Supply and Drainage Board?

(b) Will he also inform this House-

(i) whether employing manpower workers paying a lower salary is not a way of obtaining labour in an unfair manner whereas the Board requires the service of the manpower workers;

(ii) as to why account details are not given to those manpower workers on the Employees' Trust Fund (ETF) and Employees' Provident Fund (EPF) contributions charged from those workers; and

(iii) whether steps will be taken to recruit these manpower workers to the National Water Supply and Drainage Board?

(c) If not, why?

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ලියාපදිංචි මැන්පවර් ආයතනවලින් සේවක පිරිස් සේවයේ යොදවා නොමැති අතර, මණ්ඩලය යටතේ හෝ මණ්ඩලයට අනුබද්ධ එවැනි ආයතන නොමැත.

මණ්ඩලය මඟින් අවස්ථානුකූලව විවිධ වැඩ හා සේවාවන් බාහිර කොන්ත්‍රාත්කරුවන් මඟින් කොන්ත්‍රාත් පදනම මත ඉටු කරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාළ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කරන අතර, එම කොන්ත්‍රාත්කරුවන් විසින් සේවකයින්ට කරනු ලබන ගෙවීම් කොපමණද යන්න මණ්ඩලය නොදනී.

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයින්ට මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරනු ලබන වැටුප් පරිමාණයන්ට වැටුප් ගෙවනු ලැබේ. අවම වැටුප් තලය මණ්ඩල ශ්‍රේණිය G 15 - වැටුප් කේතය PL 1 - 2018.01.01 දින සිට ක්‍රියාත්මක වැටුප් පරිමාණය 41,034 - 270 x 20 - 46,434කි.

(ආ) (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මැන්පවර් ආයතන මඟින් සේවකයින් සේවයේ යොදවා ගෙන නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේදී ඔබතුමා කිව්වා, අපි වැඩ භාර දෙන්නේ කොන්ත්‍රාත්කරුවන්ට, ඒ කොන්ත්‍රාත්කරුවන් පුද්ගලයින් සේවයේ යොදවනවා කියලා. ඕක තමයි "මැන්පවර්" කියන්නේ. මැන්පවර් කියන්නේ කොන්ත්‍රාත්කරුවෙක් සේවකයන්ව ගෙන්වා දෙන එකයි. මෙන්න මේ වැඩය කරන්න කියලා ඔබතුමන්ලා කොන්ත්‍රාත් එකක් දෙනවා නම්, කවුරු සේවයේ යොදවා ගෙන ඒක කරනවාද කියා බලන එක ඔබතුමන්ලාගේ වැඩක් නොවෙයි. කොන්ත්‍රාත් එක කෙරෙනවාද කියන එක විතරයි ඔබතුමන්ලාට බලන්න තිබෙන්නේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පිළියන්දල ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කරන මැන්පවර් සේවකයින්ගෙන් මට ලැබෙන තොරතුරු අනුවයි මම මේ ප්‍රශ්න අහන්නේ. එතැන මැන්පවර් සේවකයන් නැහැයි කියලා ඔබතුමා කියනවා නම්, -ඒ "මැන්පවර්" වචනය පැත්තකින් තබන්න- කොන්ත්‍රාත්කරුවෙක් විසින් සපයන වෙනත් සේවක පිරිසක් එම ආයතනයේ ඉන්නවාද? ඒකයි මේ "මැන්පවර්" කියලා කියන්නේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ යම් යම් කටයුතු සඳහා යම් කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවකයින් සපයනවාද? ඒකයි මගේ පළමුවෙනි ප්‍රශ්නය.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු මන්ත්‍රීතුමාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. මම හිතන්නේ පසුගිය කාලයේ රටේ විශාල වශයෙන් මැන්පවර් ආයතන තිබුණා. විශේෂයෙන්ම ලියා පදිංචි වූ මැන්පවර් ආයතන තිබෙනවා. ඒ වාගේ ආයතන තමයි, මහා පරිමාණයෙන්ම ඒ කටයුත්ත කළේ. උදාහරණයක් විධියට විදුලිබල මණ්ඩලය වාගේ තැන්වල, ටෙලිකොම් ආයතනය වාගේ තැන්වල මැන්පවර් විධියට විශාල පිරිසක් රැකියාවේ නියැළුණා. නමුත්, මෙතැනදී එවැන්නක් ඒ වාගේ ආයතනයකින් නොකෙරුණාය කියන එකයි මම කියන්නේ. නමුත්, සමහර වැඩවලට -ඉතා කුඩා හා මධ්‍ය පරිමාණයේ වැඩවලට- කොන්ත්‍රාත් පදනම මත ඒ කටයුත්ත භාර දෙනවා. ඒ දෙන්නේත් වැඩ නියම කරලායි. පුද්ගලයෝ විධියට ගන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවෙනි අතුරු ප්‍රශ්නය.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කොන්ත්‍රාත් ගිවිසුමක පිටපතක් මට දෙනවාද? මොකද, මේ කොන්ත්‍රාත් දෙන්නේ කොහොමද කියලා අපට තේරුම් ගන්න. සේවක සැපයුමටද, නැත්නම් කාර්යයක් ඉටු කිරීමටද මේ කොන්ත්‍රාත් දෙන්නේ කියලා අපට දැනගන්න ඕනෑ.

**ගරු ලකී ජයවර්ධන මහතා**
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මම ඒ පිටපතක් ඔබතුමාට ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

## ජල හිඟය හේතුවෙන් වගා නොකළ කුඹුරු ඉඩම් : අම්පාර දිස්ත්‍රික්කය
## நீர்ப்பற்றாக்குறை காரணமாக நெற்செய்கை மேற்கொள்ளப்படாத காணிகள்: அம்பாறை மாவட்டம்
## UNCULTIVATED PADDY LANDS DUE TO SHORTAGE OF WATER: AMPARA DISTRICT

628/'18

**11. ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2018 වර්ෂයේ යල කන්නයේ ජල හිඟය හේතුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ වී වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;
(ii) එසේ වී වගා කිරීමට නොහැකි වූ ඉඩම් හිමි ගොවි පවුල් සඳහා වන්දි ගෙවන්නේද;
(iii) නොඑසේ නම්, එම ගොවි පවුල් සඳහා සාධාරණ වෙනත් සහනයක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப் பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) 2018 ஆம் ஆண்டு சிறுபோகத்தில் நீர்ப் பற்றாக்குறை காரணமாக அம்பாறை மாவட் டத்தில் நெற்பயிர்ச்செய்கை மேற்கொள்ளப் படாத காணிகளின் பரப்பளவு யாது;
(ii) அவ்வாறு நெற் பயிர்ச்செய்கை மேற்கொள்ள முடியாதுபோன காணிகளைக் கொண்ட விவசாய குடும்பங்களுக்கு நஷ்டஈடு வழங்கப் படுமா;
(iii) இன்றேல், மேற்படி விவசாய குடும்பங்களுக்கு நியாயமான பிறிதொரு நிவாரணத்தை வழங்கு வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-
(i) the extent of paddy land in Ampara District which was not cultivated due to the shortage of water which prevailed during the Yala season of 2018;
(ii) whether compensation will be paid to paddy land owners who were unable to cultivate due to the above reason;
(iii) if not, whether some other reasonable means of relief will be arranged for the benefit of the aforementioned farmer families?

(b) If not, why?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) හෙක්ටයාර් 22,215.18කි.
(ii) නැත.
(iii) නියඟය නිසා හානි වූ අක්කර 703.8ක් සඳහා වන්දි ගෙවීමට කටයුතු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, ඇමතිවරයෙක් විධියට එතුමා දෙන සංඛ්‍යාව මම පිළිගන්න ඕනෑද කියලාත් ප්‍රශ්නයක් තිබෙනවා. හෙක්ටයාර් 703ට වැඩි ප්‍රමාණයකට හානි සිදු වුණා කියලායි මම දන්නේ. ඒක හෙක්ටයාර් දහස් ගණනක් වෙනවා. වතුර දුන්නේ නැහැ. ඒ වාගේම, වතුර දීලා වැඩ ආරම්භ කළ කුඹුරුවලට අවසන් මොහොතේ වතුර නොදීම නිසා ඒවා වේලිලා, විනාශ වෙලා ගියා. ඒ වාගේ තත්ත්වයක් තුළ මේ සංඛ්‍යාව මම පිළිගන්නේ නැහැ.

කොහොම නමුත්, 2018 යල කන්නයේ සිද්ධ වෙච්ච හානියට 2019 යල කන්නය වෙනකොටත් වන්දි ලැබිලා නැහැ, ගරු ඇමතිතුමනි. ඒක තමයි තිබෙන බරපතළම ප්‍රශ්නය. මේ හෙක්ටයාර් 703ට හෝ වන්දි ලබා දෙන්නේ කවදාද කියා දැනගන්න කැමැතියි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 22,215ක් නියඟය නිසා වගා කටයුතු කරගන්න බැරි වෙලා තිබෙනවා. ඒකෙනුත් වගා කරලා වගා විනාශ වුණු ප්‍රමාණය හෙක්ටයාර් 703ක් කියලායි තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමා ඇහුවා, ඒවාට වන්දි ගෙවන්නේ කවදාද කියලා. දැනටමත් අපි ඒ විස්තර සොයා ගෙන, සමහර ස්ථානවල කොටස් වශයෙන් ගෙවාගෙන එනවා. අම්පාර දිස්ත්‍රික්කයටත් අපි ඉදිරියේදී වන්දි ගෙවීමට කටයුතු කරනවා.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

හෙක්ටයාර් විසිදෙදහස් ගණනකින් හෙක්ටයාර් 703කට විතරයි ගෙවන්නේ. නමුත්, වගා - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මම කියනකල් හිටියොත් හොඳයි.

ප්‍රශ්නය තිබෙන්නේ, නියඟය නිසා වගා කිරීමට නොහැකි වූ, වගාවෙන්ම ජීවත් වූ, වෙනත් කිසිදු ආදායම් මාර්ගයක් නැත්තා වූ ඒ අහිංසක ගොවීන් සම්බන්ධයෙන් ඔබතුමන්ලා කිසිදු පියවරක් ගත්තේ නැත.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, අම්පාරේ විතරක් නොවෙයි, අනුරාධපුර, කුරුණෑගල වැනි දිස්ත්‍රික්කවලත්, උතුරේ දිස්ත්‍රික්ක ගණනාවකත්, පසුගිය වර්ෂ ගණනාවකදී වර්ෂාව නැති නිසා නියඟයෙන් වගා හානි වුණා.

හැබැයි, ඒ ගොවීන් සඳහා සහ ඒ නියඟයට මුහුණ දුන් ජනතාව වෙනුවෙන් අපි කෝටි ගණනක සහනාධාර ලබා දුන්නා. එතුමා කියන විධියට අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර් විසිදෙදහස් ගණනක් වගා කරන්න බැරි වුණා, ජලය නැති නිසා. හැබැයි, වගා කිරීමෙන් පසු, වගාවේ හානි වූ හෙක්ටෙයාර් හත්සිය ගණනක් වෙනුවෙන් මුදල් ගෙවීමට කටයුතු කරනවා.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු ඇමතිතුමනි, ඒ මිනිසුන්ගෙන් දවස් 10ක් වැඩ අරගෙන - උදලු ගාන්න දීලා- රුපියල් 2,500ක බඩු මල්ලක් දෙනවා. වගාවත් නැහැ, ආදායමත් නැහැ. කුලී වැඩ කරනවා වාගේ දවස් 10ක් කොහේ හරි සුද්ද කරගෙන රුපියල් 2,500ක බඩු මල්ලක් දෙනවා. ඒක තමයි ඔබතුමන්ලා කරන්නේ. අක්කරයකට රුපියල් 40,000ක රක්ෂණයක් තිබෙනවා කියනවානේ. ඒ රක්ෂණය කවුරු කළාද කියලා දන්නෙත් නැහැ. ඔබතුමන්ලාගේ පැත්තෙන් හැම දාම ඒක කිව්වා. නමුත්, අන්තිමට රක්ෂණයත් නැහැ, වන්දියත් නැහැ, ඒ රුපියල් 2,500න් ඔක්කෝම ෂේප්. ජය වේවා!

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, වගා රක්ෂණය සඳහා දැන් ගොවීන්ගෙන් මුදලක් අය කරන්නේ නැහැ. ඒ කටයුතුත් භාණ්ඩාගාරය හරහා තමයි සිද්ධ වෙන්නේ. එතුමා කියපු රුපියල් 2,500 බඩු මල්ල ලබා දීම අද ඊයේ පටන් ගත් දෙයක් නොවෙයි. වගා කටයුතු කර තිබියදී නියඟය ආවාම සහනාධාර ලබා දීමක් වශයෙන් තමයි 1970 ගණන්වලත් එම වැඩ කටයුත්ත කළේ. වැඩ ගන්නවා කියලා ඒ ගොවීන්ගෙන් රජයේ වෙනත් වැඩක් ගන්නේ නැහැ. ඒ ගොවීන්ටම අදාළ වන වැව් සහ ඇළවල් සුද්ධ කිරීමක් තමයි ඒ අය ලවා කරන්නේ. මම හිතන්නේ නැහැ, ඒකෙන් එච්චර හානියක් වෙනවා කියලා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 12 -630/'18- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13 -638/'18- (1), ගරු සුසන්ත පුංචිනිලමේ මහතා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, මම ඊයේත් ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඒකටත් සති දෙකකින් පිළිතුරු දෙනවා කිව්වා. ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට මට සති දෙකෙන් පිළිතුර ලබා දීමේ හැකියාව තිබෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පළමුවැනි වතාවට නේද, මේ ප්‍රශ්නය අහන්නේ?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

පළමුවැනි වතාවට අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා පළමුවැනි වතාවටයි මේ ප්‍රශ්නය අහන්නේ. අපි තුන් වතාවකට වැඩිය allow කරන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 -674/'18- (1), ගරු චන්දිම ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 15 -945/'19- (1), ගරු මුජිබුර් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවැනි වටය.

## හෙද නිලධාරින් : පුරප්පාඩු
### தாதி உத்தியோகத்தர்கள்: வெற்றிடங்கள்
### NURSING OFFICERS: VACANCIES

86/'18

**2. ගරු ඩී. වී. චානක මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு டி.வீ. சானக - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. D. V. Chanaka on behalf of the Hon. Dayasiri Jayasekara)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල සේවය කරන හෙද නිලධාරින් සංඛ්‍යාව කොපමණද;
(ii) හෙද නිලධාරි පුරප්පාඩු ඇති රෝහල් කවරේද;
(iii) මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;
(iv) එම පුරප්පාඩු ඇති වීමට හේතු කවරේද;
(v) රෝහල්වල පවතින හෙද නිලධාරි පුරප්පාඩු හේතුවෙන් රෝගීන් මුහුණ දෙන අපහසුතා අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමට මේ වන විට ගැසට් නිවේදන නිකුත් කර තිබේද;
(ii) හෙද නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;
(iii) මේ වන විට පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොමැති නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) இலங்கையில் அரச மருத்துவமனைகளில் பணியாற்றும் தாதி உத்தியோகத்தர் களின் எண்ணிக்கை யாதென்பதையும்;
(ii) தாதி உத்தியோகத்தர் பற்றாக்குறை நிலவும் மருத்துவமனைகள் யாதென்பதையும்;
(iii) தற்போது நிலவும் வெற்றிடங்களின் எண்ணிக் கை யாதென்பதையும்;
(iv) அவ்வெற்றிடங்கள் ஏற்படுவதற்கான காரணங் கள் யாவையென்பதையும்;
(v) மருத்துவமனைகளில் நிலவும் தாதி உத்தியோகத்தர் பற்றாக்குறை காரணமாக நோயாளர்கள் அசௌகரியத்திற்கு உள்ளாவதை இயன்றளவு குறைப்பதற்கு தற்போது மேற் கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சம்பந்தப்பட்ட வெற்றிடங்களுக்கு விண்ணப்பங் களைக் கோருவதற்கு ஏற்கெனவே வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டுள்ளதா என் பதையும்;
(ii) தாதி உத்தியோகத்தர் பதவிக்கான ஆட்சேர்ப்புத் தகைமைகள் யாவையென்பதையும்;
(iii) வெற்றிடங்களை நிரப்புவதற்கு ஏற்கெனவே நடவடிக்கை மேற்கொள்ளப்படாமல் இருப்பின் அவ்வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை மேற்கொள்ளும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-
(i) the number of nurses serving in government hospitals in Sri Lanka;
(ii) the hospitals that have nursing vacancies;
(iii) the number of prevailing vacancies;
(iv) the reasons for the creation of such vacancies; and
(v) the measures that have been taken to minimize the difficulties faced by patients due to the prevailing nursing vacancies in hospitals?

(b) Will he also inform this House-
(i) whether Gazette notifications have been issued calling for applications to fill the relevant vacancies;
(ii) the recruitment qualifications for the post of nursing officer; and
(iii) the date when the vacancies will be filled, if measures are yet to be taken to fill them?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 36,402කි. (තිස්හයදහස් හාරසීය දෙක)
(ii) ඇමුණුම 01හි දක්වා ඇත. (ඇමුණුම සභාගත** කරමි.)
(iii) 5,461කි. (පන්දහස් හාරසීය හැටඑක)
(iv) · පසුගිය කාල වකවානු තුළ රෝහල් පද්ධතිය පුළුල් කර සේවා සැපයීම් වැඩිදියුණු කිරීමට සමානව සෞඛ්‍ය මානව සම්පත්වල අවශ්‍යතාව වැඩිවීම මඟින් රෝහල් අනුමත හෙද කාර්ය මණ්ඩලවල සංඛ්‍යාව ඉහළ යෑම.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

- කළමනාකරණ දෙපාර්තමේන්තුව, පළාත් අනුව රෝහල්වල කාර්ය මණ්ඩල අවශ්‍යතා නැවත සමාලෝචන කිරීම මත අනුමත හෙද කාර්ය මණ්ඩල වැඩිවීම.
- 2016 වසරේ සිට මහජන සෞඛ්‍ය හෙද නිලධාරි වශයෙන් නව තනතුරක් ඇති කර, ක්ෂේත්‍රයේ සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීම තුළ හෙද කාර්ය මණ්ඩලවල අවශ්‍යතාව ඉහළ යෑම.
- බොහෝ දුරට සමාන වයස් සීමාවල පිරිස් කණ්ඩායම් වශයෙන් හෙද පුහුණුවට බඳවා ගැනීම සිදු වන බැවින්, විශ්‍රාම යෑමත් කණ්ඩායම් වශයෙන් සිදු වීම.
- සේවය හැරයෑම, ඉල්ලා අස්වීම වැනි හේතුන්ද හෙද නිලධාරි පුරප්පාඩු සඳහා බලපානු ලබයි.

(v) හෙද නිලධාරින් අතිකාල සේවයේ යෙදවීම හා විශ්‍රාම ගිය නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම මඟින් රෝගී සත්කාර සේවාව අඛණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් රෝගීන් අපහසුතාවට පත් වී නොමැත.

(ආ) (i) ඔව්.

(ii) 1. අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ජෛවීය විද්‍යාව හා භෞතික විද්‍යාව විෂය ධාරාවන්හි විෂයයන් 3ක් සමත් වීම සහ සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 4ටම සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාස 36ක පූර්ණ කාලීන හෙද ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කර තිබීම.

2. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාස හයක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සම්පූර්ණ කරන ලද විද්‍යාවේදී හෙද උපාධිධාරීන් වීම.

(iii) මේ වන විට හෙද විද්‍යාල්වල 7,023ක් පුහුණුව ලබමින් සිටින අතර, පුහුණුව අවසන් වූ විගස පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

## නායයෑමේ අවදානම් සහිත ස්ථාන : ජීවිත සුරක්ෂිතතාව
## மண்சரிவு ஆபத்துக்குள்ளாகும் இடங்கள்: உயிர் பாதுகாப்பு
## PLACES VULNERABLE TO LANDSLIDES: SECURITY OF LIVES

145/'18

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ නායයෑමේ අවදානමට ලක්විය හැකි යැයි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) එම අවදානම් ස්ථානවල ජීවත්වන ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, அனர்த்த முகாமைத்துவம் மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சரைக் கேட்டவினா:

(அ)(i) பதுளை மாவட்டத்தில் மண்சரிவு ஆபத்துக்கு உள்ளாகக்கூடியதென தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவகத்தினால் இனங்காணப்பட்டுள்ள இடங் களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவ்விடங்களின் பெயர்கள் யாவையென் பதையும்;

(iii) அந்த ஆபத்தான இடங்களில் வாழும் மக்களின் உயிர்களைப் பாதுகாப்பதற்காக அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கை யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Disaster Management and Rural Economic Affairs:

(a) Will he inform this House -

(i) the number of places identified by the National Building Research Organization within Badulla distrct as landslide prone areas;

(ii) the names of those places; and

(iii) the steps taken by the Ministry to safeguard the lives of the people residing in those risky places?

(b) If not, why?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிருவாக, அனர்த்த முகாமைத்துவம் மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration, Disaster Management and Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත කරනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි,-

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

පිළිතුර කියවන්න අවශ්‍යද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, පිළිතුර සභාගත කරන්න. ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් දෙවැනි වටයේදී පිළිතුර සභාගත කරනවා. දෙවැනි වටයේදී සභාගත කරන චාරිත්‍රය වෙනස් කරන්න එපා. ඒක හොඳ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මම පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අභියෝගයට ලක් කරන්නේ නැහැ ගරු කථානායකතුමනි. අපි සාධාරණ ලෙස හැම දාම ප්‍රශ්න අහනවා. මගේ පෞද්ගලික කටයුත්තක් නිසා පළමු වටයේදී ප්‍රශ්නය අහන්න එන්න ප්‍රමාද වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට තේරෙනවා. හැබැයි, මේ සම්ප්‍රදාය වෙනස් කළොත්, ඒක හොඳ මදි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේක වැදගත් ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක දවසක් අවස්ථාව දුන්නොත්, මට දිගටම ඒක කරන්න වෙනවා. සභාගත කළත් ඔබතුමාට උත්තරය ගන්න පුළුවන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට අතුරු ප්‍රශ්නයක් තිබෙනවා, අහන්න. ඒකයි කාරණය. නාය යෑම් වෙලා බරපතළ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම කරන්න අමාරුයි. පාර්ලිමේන්තුව වාගේ තැනක එක් දෙයක් කළාම ඊට පසුව දිගටම එහෙම කරගෙන යන්න වෙනවා. කරුණාකර ඒක තේරුම් ගන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
හොඳයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාගේ උනන්දුව අගය කරනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, අපි දිගින් දිගටම ප්‍රශ්න අහන හින්දා පොඩි අවස්ථාවක් එකක් දෙන්න. ඒකයි ඉල්ලීමක් කළේ ඔබතුමාගෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට නීති කඩන්න බැහැ නේ. ඒක වැරැදියි නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හඳුනාගෙන ඇති ස්ථාන සංඛ්‍යාව 1,593කි.

(ii)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හඳුනාගත් නායයෑම් අවදානම් ස්ථාන සංඛ්‍යාව |
|---|---|---|
| 1 | හාලිඇල | 264 |
| 2 | බදුල්ල | 235 |
| 3 | කන්දෙකැටිය | 43 |
| 4 | ලුණුගල | 44 |
| 5 | සොරණාතොට | 79 |
| 6 | බණ්ඩාරවෙල | 220 |
| 7 | හල්දුම්මුල්ල | 77 |
| 8 | හපුතලේ | 52 |
| 9 | ඇල්ල | 184 |
| 10 | වැලිමඩ | 216 |
| 11 | පස්සර | 107 |
| 12 | ඌව පරණගම | 72 |
| | එකතුව | 1593 |

(iii)

- Ø බදුල්ල දිස්ත්‍රික්කයේ මීරියබැද්ද නායයෑමෙන් අවතැන් වූ පවුල් 70ක් දැනටමත් වෙනත් ස්ථානයන්හි නැවත පදිංචි කර ඇති අතර, එම දිස්ත්‍රික්කයේ ඉහත හඳුනා ගත් අධි අවදානම් සහිත ප්‍රදේශයන්හි ජීවත් වන වතු පවුල් 729ක් සහ ගම්මාන ආශ්‍රිතව ජීවත් වන පවුල් 1,508ක් ආරක්ෂිත ස්ථානයන්හි නැවත පදිංචි කිරීමේ කටයුතු සැලසුම් කර ඇත.
- Ø නායයෑම් අවම කරන ක්‍රමෝපායයන් භාවිතා කර, නායයෑම් හා අස්ථාවර බෑවුම් ස්ථායී කටයුතු පසුගිය වසර තුළ ප්‍රමුඛතා පදනම මත ඉටු කර තිබේ. මේ සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 200ක රාජ්‍ය ප්‍රතිපාදන හා විදේශාධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතිද අඩංගුය. නායයෑම් අවමකරණ ව්‍යාපෘති තව දුරටත් ක්‍රියාත්මක අතර, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය මඟින් ස්ථාන 19ක අවමකරණ කටයුතු සැලසුම් කර තිබේ.
- Ø ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් පහත සඳහන් ක්‍රියාකාරකම් මඟින්ද ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමට පියවර ගෙන ඇත.
  - නායයෑම් ආපදා කලාප සිතියම් සහ විශේෂ භූ සමීක්ෂණ මඟින් නායයෑම් ප්‍රවණතාවක් සහිත ස්ථාන හා අවදානමට ලක්වන ප්‍රජාව හඳුනා ගැනීම.
  - තත්කාලීන නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් දීම.
  - ඉදිකිරීම් සහ සංවර්ධන ව්‍යාපෘතිවලදී නායයෑම් අවදානම අවම වන පරිදි සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන නිර්දේශ ලබා දීම.
  - ව්‍යුහාත්මක හා වෙනත් ක්‍රමවේදයන් මඟින් නායයෑම් ආපදා අවමකරණය.
  - පාසල් ශිෂ්‍ය / ශිෂ්‍යාවන්, ජනතාව සහ අදාළ ආයතන දැනුවත් කිරීම.

(ආ) පැන නොනඟී.

## ප්‍රතිසංස්කරණය කළ වාරිමාර්ග: කුරුණෑගල දිස්ත්‍රික්කය
புனரமைக்கப்பட்ட நீர்ப்பாசனத் திட்டங்கள்: குருணாகல் மாவட்டம்
RENOVATED IRRIGATION SCHEMES: KURUNEGALA DISTRICT

263/'18

**5. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக )
(The Hon. (Dr.) Bandula Gunawardane on behalf of the Hon. Padma Udhayashantha Gunasekera)

කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்டவினா:

(அ) (i ) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் குருணாகல் மாவட்டத்தில் புனரமைக்கப்பட்ட சிறிய, மத்திய மற்றும் பாரிய அளவிலான நீர்ப்பாசனத் திட்டங்கள் யாவையென்பதையும்;

(ii) ஒவ்வொரு புனரமைப்புப் பணிக்காகவும் மதிப்பிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii ) மேற்படி புனரமைப்புப் பணிகளுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(iv ) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டியலொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு வருடத்துக்கும் ஏற்புடையதான புனரமைப்புப் பணிகளின் பௌதீக மற்றும் நிதிசார் முன்னேற்றம் தனித்தனியாக யாதென்பதையும்;

(vi) மேற்படி புனரமைப்புப் பணிகளுக்கான சாத்தியக்கூறு ஆய்வு, சுற்றாடல் மற்றும் பொறியியல் அறிக்கைகளை சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி புனரமைப்புப் பணிகளின் போது அகற்றப்பட்ட வண்டல் படிவு, மண் அல்லது மணலுக்காக கேள்விப் பத்திரங்கள் கோரப் பட்டனவா என்பதையும்;

(viii) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களை பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டியலொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the minor, medium and major scale irrigation schemes renovated in Kurunegala district in the years 2015, 2016 and 2017;

(ii) the estimated amount for each renovation work, separately;

(iii) whether tenders were called for the said renovation work;

(iv) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted;

(v) the physical and financial progress of the renovation work of that contract with relevance to each of the aforesaid years;

(vi) whether the feasibility study, environmental and engineering reports relevant to that renovation work will be submitted;

(vii) whether tenders were called for the silt, soil or sand removed in renovation work; and

(viii) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග |
|---|---|
| 2015 | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය |
| | නිර්මිත ඉදිකිරීම් |
| | වාරි ඇළ ප්‍රතිසංස්කරණය |
| | කෙත් ඇළ ප්‍රතිසංස්කරණය |
| | එල්ලංගා ප්‍රතිසංස්කරණය |
| | අමුණ ප්‍රතිසංස්කරණය |
| | ගං වතුර හානි |
| 2017 | නව අමුණු ඉදි කිරීම |
| | වැව් ප්‍රතිසංස්කරණය |

**මධ්‍යම පරිමාණ වාරිමාර්ග** - කුරුණෑගල දිස්ත්‍රික්කයේ 2015, 2016 හා 2017 වසරවල මධ්‍ය වාරිමාර්ග ව්‍යාපාර ලෙස මාකඳුර, කිණියම, වෙල්ලන්ගිරිය, මදුල්ල, නිකපිටිය, පහළ දැදුරු ඔය, මැද්දෙකැටිය, දියතුරේ, මොරතිඹිය, කළුගල්ල, මොරගොඩ, වෙන්නරුවැව, වැලිකුඹුර, කොස්පොතුඔය, මැඩියාව, මහනාන්නේරිය, මහ සියඹලන්ගමුව, මහගල්ගමුව යන මධ්‍ය වාරිමාර්ග ව්‍යාපාරවල වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායී වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු, ඇළ මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු, දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම, ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත.

**මහා පරිමාණ වාරිමාර්ග** - 2015, 2016 හා 2017 වසරවලදී දැදුරු ඔය, බතලගොඩ, හක්වටුනාඔය, කිඹුල්වානාඔය, මාගල්ල, අඹකොලවැව, පාලුකඩවල, අතරගල්ල, උස්ගල සියඹලන්ගමුව යන මහා වාරිමාර්ග ව්‍යාපාරවල වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායී වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු, ඇළ මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු, දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම, ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත.

(ii)

| වර්ෂය | සුළු පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|
| 2015 | සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය | 41,813,000.00 | 41,813,000.00 |
| 2016 | වැව් ප්‍රතිසංස්කරණය | 48,978,000.00 | 291,016,000.00 |
| | නිර්මිත ඉදිකිරීම | 10,020,000.00 | |
| | වාරි ඇළ ප්‍රතිසංස්කරණය | 2,100,000.00 | |
| | කෙත් ඇළ ප්‍රතිසංස්කරණය | 16,944,000.00 | |
| | එල්ලංගා ප්‍රතිසංස්කරණය | 59,691,000.00 | |
| | අමුණ ප්‍රතිසංස්කරණය | 30,722,000.00 | |
| | ගං වතුර හානි | 122,561,000.00 | |
| 2017 | නව අමුණු ඉදි කිරීම | 173,000.00 | 406,787,644.84 |
| | වැව් ප්‍රතිසංස්කරණය | 406,614,644.84 | |
| **2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.)** | | | **739,616,644.84** |

| වර්ෂය හා වාරි ව්‍යාපාරය | | මධ්‍යම පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|---|
| 2015 | මාකඳුර<br>කිණියම<br>වෙල්ලන්ගිරිය<br>මදුල්ල<br>නිකපිටිය<br>පහල දැදුරු ඔය<br>මැද්දෙකැටිය<br>දියතුරේ<br>මොරතිඹය<br>කළුගල්ල<br>මොරගොඩ<br>වෙනනරුවැව<br>වැලිකුඹුර<br>කොස්පොතුඔය<br>මැඩියාව<br>මහනාන්නේරිය<br>මහ සියඹලන්ගමුව<br>මහගල්ගමුව | මෙහෙයුම් හා නඩත්තු | 6,508,000.00 | 54,758,666.70 |
| | | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 10,954,010.79 | |
| | | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 961,340.00 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු(දෙපාර්තමේන්තු වැය ශීර්ෂය) | 30,319,278.71 | |
| | | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 1,171,000.00 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 4,845,037.20 | |
| 2016 | මාකඳුර<br>කිණියම<br>වෙල්ලන්ගිරිය<br>මදුල්ල<br>නිකපිටිය<br>පහල දැදුරු ඔය<br>මැද්දෙකැටිය<br>දියතුරේ<br>මොරතිඹය<br>කළුගල්ල<br>මොරගොඩ<br>වෙනනරුවැව<br>වැලිකුඹුර<br>කොස්පොතුඔය<br>මැඩියාව<br>මහනාන්නේරිය<br>මහ සියඹලන්ගමුව<br>මහගල්ගමුව | මෙහෙයුම් හා නඩත්තු | 5,373,063.00 | 57,661,233.01 |
| | | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 1,920,659.48 | |
| | | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 80,000.00 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු(දෙපාර්තමේන්තු වැය ශීර්ෂය) | 44,218,028.24 | |
| | | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 138,000.00 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 3,116,081.49 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (අමාත්‍යාංශ වැය ශීර්ෂය) | 2,815,400.80 | |
| 2017 | මාකඳුර | මෙහෙයුම් හා නඩත්තු | 6,210,345.38 | 123,007,059.11 |

| | | | | |
|---|---|---|---|---|
| | කිණියම<br>වෙල්ලන්ගිරිය<br>මදුල්ල<br>නිකපිටිය<br>පහල දැදුරු ඔය<br>මැද්දෙකැටිය<br>දියතුරේ<br>මොරතිඔය<br>කළුගල්ල<br>මොරගොඩ<br>වෙනතරුවැව<br>වැලිකුඹුර<br>කොස්පොතුඔය<br>මැඩියාව<br>මහනාන්නේරිය<br>මහ සියඹලන්ගමුව<br>මහගල්ගමුව | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 4,078,273.76 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු(දෙපාර්තමේන්තු වැය ශීර්ෂය) | 91,245,250.92 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 3,219,100.00 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු (අමාත්‍යංශ වැය ශීර්ෂය) | 18,254,089.05 | |
| **2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.)** | | | | **235,426,958.82** |

| වර්ෂය හා වාරි ව්‍යාපාරය | | මහා පරිමාණ වාරිමාර්ග | ඇස්තමේන්තු මුදල (රු.) | මුළු ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|---|
| **2015** | දැදුරු ඔය<br>බතලගොඩ<br>හක්වටුනාඔය<br>කිඹුල්වානාඔය<br>මාගල්ල<br>අඹකොලවැව<br>පාලුකඩවල<br>අතරගල්ල<br>උස්ගල<br>සියඹලන්ගමුව | මෙහෙයුම් හා නඩත්තු | 21,692,217.35 | 313,772,362.36 |
| | | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 15,677,432.61 | |
| | | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 2,312,000.00 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු(දෙපාර්තමේන්තු වැය ශීර්ෂය) | 15,322,025.97 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 224,411,772.54 | |
| | | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 34,356,913.89 | |
| **2016** | දැදුරු ඔය<br>බතලගොඩ<br>හක්වටුනාඔය<br>කිඹුල්වානාඔය<br>මාගල්ල<br>අඹකොලවැව<br>පාලුකඩවල<br>අතරගල්ල<br>උස්ගල<br>සියඹලන්ගමුව | මෙහෙයුම් හා නඩත්තු | 20,004,560.00 | 145,602,105.77 |
| | | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 5,303,176.07 | |
| | | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 2,696,622.70 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු(දෙපාර්තමේන්තු වැය ශීර්ෂය) | 33,414,801.66 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 61,046,837.26 | |
| | | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 23,136,108.08 | |
| **2017** | දැදුරු ඔය<br>බතලගොඩ<br>හක්වටුනාඔය<br>කිඹුල්වානාඔය<br>මාගල්ල<br>අඹකොලවැව<br>පාලුකඩවල<br>අතරගල්ල<br>උස්ගල<br>සියඹලන්ගමුව | මෙහෙයුම් හා නඩත්තු | 22,714,341.00 | 169,570,028.43 |
| | | ගංවතුරහානි අලුත්වැඩියාවන් | 54,488,777.43 | |
| | | දෙපාර්තමේන්තු රක්ෂිත හා ඉඩම් ආරක්ෂා කිරීම | 5,656,558.10 | |
| | | ප්‍රධාන සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු(දෙපාර්තමේන්තු වැය ශීර්ෂය) | 44,581,761.98 | |
| | | නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම | 5,000,000.00 | |
| | | කෘෂි මාර්ග නඩත්තු කිරීම | 37,128,589.92 | |
| **2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.)** | | | | **628,944,496.56** |

(iii) **සුළු පරිමාණ වාරිමාර්ග -** ක්‍රියාත්මක කරන ලද රුපියල් මිලියන 05ට අඩු ව්‍යාපෘති සෘජු කොන්ත්‍රාත් ලෙස අදාළ ගොවි සංවිධාන වෙත පවරා ඉටු කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික්ක වෙත ලබා දෙන අතර දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් විසින් අදාළ කොන්ත්‍රාත් පිරිනමනු ලැබේ.

**මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග -** ටෙන්ඩර් කැඳවීමෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලද ව්‍යාපෘති ද ඇති බව සඳහන් කරමි.

(iv) **සුළු පරිමාණ වාරිමාර්ග -** ඉදිරිපත් කළ හැක.

**මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග -** ඔව්.

| වර්ෂය | කොන්ත්‍රාත්කරුගේ නම |
|---|---|
| 2015 | ඒ.එම්.ආර්. සෙනවිරත්න |
| | ආදම් බාවා සහ පුත්‍රයෝ |
| | පර්ල් කන්ස්ට්‍රක්ෂන්ස් |
| 2017 | මහින්ද කන්ට්‍රැක්ටර්ස් |
| | ආදම් බාවා සහ පුත්‍රයෝ |
| | ධම්මික එන්ටර්ප්‍රයිසස් |
| | ජී.ජී.එස්. කන්ස්ට්‍රක්ෂන්ස් |
| | ලියනගේ කන්ස්ට්‍රක්ෂන්ස් |

(v) **සුළු පරිමාණ වාරිමාර්ග**

| වර්ෂය | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | වැඩ අවසන් | අවිච්ඡේද |
| 2015 | 89.93 | 42 | - |
| 2016 | 97.03 | 163 | - |
| 2017 | 83.58 | 158 | - |

**මහා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග -** සියලුම කාර්යයන් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ අවසන් කර ඇති අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% වේ.

(vi) **සුළු පරිමාණ වාරිමාර්ග -** අදාළ නොවේ.

**මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග -** දැනට පවතින ව්‍යාපාරවල ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා අලුත්වැඩියා කිරීම් කටයුතු සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කිරීම අවශ්‍ය නොවන බව කාරුණිකව සඳහන් කරමි. සියලු කාර්යයන් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කර සැලසුම් කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු සකස් කර ඇත.

(vii) නැත.

(viii) අදාළ නොවේ

(ආ) අදාළ නොවේ.

---

***[මෙම පිළිතුර පුස්තකාලයේද තබා ඇත.]***
*[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]*
*[This Answer is also placed in the Library.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -540/'19- (2), ගරු බිමල් රත්නායක මහතා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නියඟයෙන් පීඩාවට පත් පවුල්: සහන
## வறட்சியால் பாதிக்கப்பட்டுள்ள குடும்பங்கள்: நிவாரணம்
## DROUGHT-AFFECTED FAMILIES: RELIEF

568/'19

**9. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)**
(மாண்புமிகு சமிந்த விஜேசிறி - துஷார இந்துனில் அமரசேன சார்பாக)
(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. Thushara Indunil Amarasena)
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නියඟයෙන් පීඩාවට පත් පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) බවුසර් මඟින් ජලය සපයා දුන් හා නියං ආධාර ලබාදුන් පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවතින දැඩි නියඟය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට තවදුරටත් සහන ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிருவாகம், அனர்த்த முகாமைத்துவம் மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) குருணாகல் மாவட்டத்தில் வறட்சியால் பாதிக்கப் பட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிற்கேற்ப தனித்தனியே எவ்வளவென்பதையும்;

(ii) பவுசர் மூலம் நீர் வழங்கப்பட்ட மற்றும் வறட்சி நிதியுதவி பெற்றுக்கொடுக்கப்பட்ட குடும்பங் களின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிற்கேற்ப தனித்தனியே எவ்வளவென்பதையும்;

(iii) குருணாகல் மாவட்டத்தில் நிலவும் கடும் வறட்சியால் பாதிக்கப்பட்ட மக்களுக்கு தொடர்ந்தும் நிவாரணம் வழங்க அமைச்சு மேற்கொள்ளவுள்ள வழிமுறைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Disaster Management and Rural Economic Affairs:

(a) Will he inform this House-

(i) separately, in terms of each Divisional Secretary's Division, the number of families affected due to the drought in Kurunegala District;

(ii) separately, in terms of each Divisional Secretary's Division, the number of families for which the drought relief was provided and the water was supplied by using bowsers;

(iii) of the measures that would be taken by the Ministry to provide further relief to the people affected by the drought that is prevalent in Kurunegala district;

(b) If not, why?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පීඩාවට පත්ව ඇති පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | කුරුණෑගල | 703 |
| 2. | ගල්ගමුව | 9589 |
| 3. | ඇහැටුවැව | 5165 |
| 4. | ගිරිබාව | 4214 |
| 5. | නිකවැරටිය | 4714 |
| 6. | කොටවෙහෙර | 4259 |
| 7. | රිදීගම | 249 |
| 8. | මාවතගම | - |
| 9. | මල්ලවපිටිය | 3236 |
| 10. | මාස්පොත | 145 |
| 11. | මහව | 6127 |
| 12. | අඹන්පොල | 4522 |
| 13. | පොල්පිතිගම | 15931 |
| 14. | පොල්ගහවෙල | 22 |
| 15. | වීරඹුගෙදර | - |
| 16. | බමුණාකොටුව | 1872 |
| 17. | රස්නායකපුර | 3784 |
| 18. | බිංගිරිය | 8816 |
| 19. | ඉබ්බාගමුව | 1696 |
| 20. | ගනේවත්ත | 3740 |
| 21. | වාරියපොල | 8355 |
| 22. | නාරම්මල | 92 |
| 23. | පඬුවස්නුවර - බ | 8624 |
| 24. | පඬුවස්නුවර - නැ | 3220 |
| 25. | කුලියාපිටිය- බ | 4392 |
| 26. | කුලියාපිටිය - නැ | 5650 |
| 27. | අලව්ව | 119 |
| 28. | පන්නල | 110 |
| 29. | උඩුබද්දාව | - |
| 30. | කොබෙයිගනේ | 3863 |
| | එකතුව | 113209 |

(ii)

| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | නියං ආධාර ලබා දුන් පවුල් සංඛ්‍යාව2018 (I) | පානීය ජලය ලබාදුන් පවුල් සංඛ්‍යාව | නියං ආධාර ලබාදුන් පවුල් සංඛ්‍යාව 2018(II) |
|---|---|---|---|---|
| 1. | කුරුණෑගල | 703 | - | - |
| 2. | ගල්ගමුව | 9589 | 1169 | 12816 |
| 3. | ඇහැටුවැව | 5165 | 1335 | 4615 |
| 4. | ගිරිබාව | 4214 | 2523 | 3794 |
| 5. | නිකවැරටිය | 4714 | 2413 | 4203 |
| 6. | කොටවෙහෙර | 4259 | 2485 | 4492 |
| 7. | රිදීගම | 249 | - | - |
| 8. | මාවතගම | - | - | - |
| 9. | මල්ලවපිටිය | 3236 | 15 | - |
| 10. | මාස්පොත | 145 | 151 | - |
| 11. | මහව | 6127 | 2177 | 11190 |
| 12. | අඹන්පොල | 4522 | 2390 | 5607 |
| 13. | පොල්පිතිගම | 15931 | 8198 | - |
| 14. | පොල්ගහවෙල | 22 | 216 | - |
| 15. | වීරඹුගෙදර | - | 490 | - |
| 16. | බමුණාකොටුව | 1872 | 1351 | - |
| 17. | රස්නායකපුර | 3784 | 2696 | 4933 |
| 18. | බිංගිරිය | 8816 | 2786 | - |
| 19. | ඉබ්බාගමුව | 1696 | - | 1027 |
| 20. | ගනේවත්ත | 3740 | - | 5860 |
| 21. | වාරියපොල | 8355 | - | - |
| 22. | නාරම්මල | 92 | 491 | - |
| 23. | පඩුවස්නුවර - බ | 8624 | 1656 | 7852 |
| 24. | පඩුවස්නුවර - නැ | 3220 | 629 | - |
| 25. | කුලියාපිටිය- බ | 4392 | 720 | - |
| 26. | කුලියාපිටිය - නැ | 5650 | 2351 | - |
| 27. | අලව්ව | 119 | 280 | - |
| 28. | පන්නල | 110 | 605 | - |
| 29. | උඩුබද්දාව | - | 210 | - |
| 30. | කොබෙයිගනේ | 3863 | 1531 | 6405 |
| | එකතුව | 113209 | 38543 | 72794 |

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මේ වන විට පවතින නියඟය හේතුවෙන් අවශ්‍යතාව මත ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීම පරිදි ට්‍රැක්ටර් බවුසර් හා ලොරි බවුසර් මඟින් පානීය ජලය බෙදා දීම සිදු කරයි.

තවද වියළි කාලගුණික තත්ත්වය නිසා වගාව සඳහා ජලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2016/2017 මහ, 2017 යල, 2017/2018 මහ යන වගා කන්න තුනම අඛණ්ඩව වගා කිරීමට නොහැකි වූ වී වගා කරන පවුල් හා කන්න තුනම අඛණ්ඩව අතුරු බෝග වගා කිරීමට නොහැකි වූ අතුරු බෝග වගා කරන ගොවි පවුල්, වියළි කාලගුණය හේතුවෙන් ජීවනෝපාය මාර්ග අවහිර වූ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන පවුල් හා ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සිදු නොවීම හේතුවෙන් තම ජීවනෝපාය මාර්ග අවහිර වූ කෘෂි කම්කරු පවුල් සඳහා නියං සහනාධාර වැඩසටහනක් 2018.09.20 දින සිට ක්‍රියාත්මක කිරීමට මේ වන විට අමාත්‍යාංශය පියවර ගෙන ඇති අතර නියං සහනාධාර පළමු වාරිකය පවුල් 86,085ක් සඳහා ගෙවීමට අවශ්‍ය රු.137,680,787.96ක ප්‍රතිපාදන කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කර ඇත.

(ආ) පැන නොනඟී.

***[* මෙම පිළිතුර පුස්තකාලයේද තබා ඇත.]***
*[* இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]*
*[This answer is also placed in the Library.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 12 -630/'18- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14 -674/'18- (1), ගරු චන්දිම ගමගේ මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 15 -945/'19- (1), ගරු මුහම්මදු නසීර් මහතා. ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට. එතුමා වෙනුවෙන් කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් එම ප්‍රශ්නය අසනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

කවුරුවත් අහන්නේ නැහැ වාගෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා මගෙන් අවස්ථාවක් ඉල්ලුවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. විශේෂයෙන් මා මේ කාරණය මතු කරන්නේ, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු වාර්තාවක් සම්බන්ධවයි. මා එය ඉදිරිපත් කළේ, ජනවාරි මාසයේ 24වන දායි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 (4) අනුව, අදාළ විෂයය භාර අමාත්‍යවරුන් විසින් එම වාර්තා පිළිබඳව ගන්නා ක්‍රියා මාර්ග ගැන සති 8ක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, නමුත් ඒ කටයුත්ත අමතක කරපු ආයතන

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කීපයක්ම තිබෙනවා. අපි ස්ථාවර නියෝග බලවත් කළාට වැඩක් නැහැ, ගරු අමාත්‍යවරුන් ඒ ප්‍රතිචාරය දක්වන්නේ නැත්නම්. මා මේ කරුණ මතු කරන්නේ ඒ නිසායි. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවසරය ඉල්ලනවා, එකී ආයතන මොනවාද කියලා කියන්න. කෘෂිකර්ම අමාත්‍යතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. වී අළෙවි මණ්ඩලය අපට ඒ වාර්තා ඉදිරිපත් කර තිබෙනවා. නමුත්, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ ආයතනය කරුණු ඉදිරිපත් කරලා නැහැ. තවත් එකක් තමයි වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික ආධුනිකත්ව මණ්ඩලය. ඒකත් කරුණු ඉදිරිපත් කරලා නැහැ. අපි සෞඛ්‍ය අමාත්‍යතුමා යටතේ තිබෙන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ඖෂධ නිෂ්පාදන සංස්ථාව කියන ආයතන තුනම කාරක සභාවට කැඳෙව්වා. ඒ ආයතනත් මේ වන තෙක් පාර්ලිමේන්තුවට කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැහැ. ඒ වාගේමයි, මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහ ශ්‍රීලංකන් ගුවන් සමාගම ප්‍රතිචාර දක්වා නැහැ. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අර්බුද ගණනාවක් තිබෙනවා.

නමුත්, ප්‍රතිචාරයක් දක්වා නැහැ. ඒ නිසා අද දිනයේත් පාර්ලිමේන්තුවට කැඳවනවා. ඒ වාගේම, මේ වාර්තාවට ප්‍රතිචාර දක්වපු ආයතනත් තිබෙනවා. මම ඒ අයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ තමයි මාර්ග සංවර්ධන අධිකාරිය, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, වී අළෙවි මණ්ඩලය, මිල්කෝ ආයතනය, පශු සම්පත් මණ්ඩලය සහ ගමනාගමන මණ්ඩලය. මේ කාරණාව මතු කළේ ඇයි කියලා මම කියන්නම්. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් විශාල මහන්සියක් දරලා අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ කාලය වැය කරලා, නිලධාරින් පාර්ලිමේන්තුවට කැඳවා මේ පරීක්ෂණ කරනවා. ඒවා වැඩක් නැති තත්ත්වයට පත් වන නිසා තමයි ඔබතුමාගේ මැදිහත් වීමෙන් මේ ස්ථාවර නියෝග බලවත් කළේ, සති අටක් ඇතුළත කාරක සභාව මතු කරන කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කරන්න කියලා. ජනවාරි මාසයේ අපේ කාරක සභාව වාර්තාවක් ඉදිරිපත් කළා, පාර්ලිමේන්තුවට. මාර්තු මාසයේදී ඊට ප්‍රතිචාර දක්වන්න තිබෙනවා. මේ ජුනි මාසය. එතකොට සති 08ක් නොවෙයි, සති 16ක් ගත වෙලාත් පාර්ලිමේන්තුවට ඒ ආයතනවලින් ප්‍රතිචාරයක් දක්වා නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මෙය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේක පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට විතරක් බලපාන කාරණයක් නොවෙයි. ස්ථාවර නියෝග බලවත් කිරීම පාර්ලිමේන්තුවේ වගකීමක්. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, එතුමා මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය ගැන කිව්වා. මම සති දෙකක් ඇතුළත ඒ අවශ්‍ය වාර්තා ටික සපයා දෙන්න කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. දැන් පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයක් තිබෙනවා, ගිණුම් වර්ෂය ඉවර වුණාට පස්සේ මාස 06ත්, 09ත් ඇතුළත සියලු ගිණුම් පාර්ලිමේන්තුවට එවන්න ඕනෑය කියලා. ඒක විශාල දියුණු වීමක්. ඒ විධියට අපි කරගෙන යන්න ඕනෑ. එතකොට තමයි එහි වටිනාකම තිබෙන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා එහි වැදගත්කම, අවශ්‍යතාව ඒ අයට පහදා දෙන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාව මෙවර රාජ්‍ය අය වැයෙන් වෙන් කරපු මුදල්වලින් ප්‍රාග්ධන වියදම් සියයට 15ක් කපා හැරිය යුතුයි කියා ගිය සතියේ අපේ ගරු මුදල් අමාත්‍යතුමා විසින් යෝජනා කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මතු කරන කාරණයට පිළිතුරක් දෙන්න ඔබතුමා සූදානම්ද? ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය මට කල් තියා දැනුම් දීලා ඇහුවා නම් හොඳයි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මේක හදිසියේ ගත්ත තීරණයක් නිසා-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සාමාන්‍යයෙන් ප්‍රශ්නයක් අහනවා නම්, ව්‍යවස්ථානුකූලව කල් තියා දැනුම් දීලා අහන්න ඕනෑ.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරක් දෙන්න සූදානම්ද?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)

හොඳයි-

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මේ වර්ෂයට අදාළ අය වැය ලේඛනයේ ප්‍රාග්ධන වියදම්වලින් සියයට15ක් කපා හැරිය යුතුයි කියා මුදල් අමාත්‍යාංශය විසින් උපදෙස් දීපු බව වාර්තා වී තිබෙනවා. එතකොට, වැඩ පටන් ගත්ත කොන්ත්‍රාත්කරුවන්ට ඒ මුදල් ලැබීම් යනාදිය පිළිබඳ ප්‍රශ්න මතු වන නිසා අය වැය ලේඛනයේ සඳහන් ප්‍රාග්ධන වියදම් කපා හැරීමක් කර තිබෙනවා නම්, මේ ගරු සභාවට ඔබතුමන්ලා ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරනවාද කියා මම දැන ගන්න කැමැතියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)

ගරු මන්ත්‍රීතුමනි, අපි යම්කිසි වෙනස් කිරීම් කරනවා නම් කරන්නේ, ඒ පටන් ගත් ව්‍යාපෘතිවලට කිසිම හානියක් වෙන්නේ නැති විධියටයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ඊළඟට ප්‍රධාන වැඩ කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනිවර කියවීම.

ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, ඊයේ ගරු සභානායකතුමා පාර්ලිමේන්තුවට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා, පසුව ඒක ඉල්ලා අස්කර ගත්තා. ඉන් අනතුරුව, සන්ධ්‍යා භාගයේදී එතුමා විසින් ඉල්ලා අස්කර ගැනීම ඉල්ලා අස්කර ගන්නවාය කියලා ප්‍රකාශයක් කළා. ඒ වන විට මූලාසනයේ හිටපු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඔබතුමාගේ නියෝගයක් සඳහා ඒ යෝජනාව ඔබතුමාට යොමු කළා. නමුත් මේ වන තෙක් ඔබතුමා ඒ සම්බන්ධයෙන් නියෝගයක් දුන්නේ නැහැ. අපේ මතය වන්නේ, සභානායකතුමාට හිතෙන වෙලාවට පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත්, පසුව එය ඉල්ලා අස්කර ගැනීමත්, මාධ්‍ය සහ මන්ත්‍රීවරුන් නැති වෙලාවට ඒ ඉල්ලා අස්කර ගත් පරිපූරක ඇස්තමේන්තුව නැවත ඉදිරිපත් කිරීමත් සුදුසු නැහැයි කියන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා පිළිතුරක් දෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல )
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව එය කරන්න පුළුවන්. පාර්ලිමේන්තුව පවතින අවස්ථාවකයි මා එය නැවත ඉදිරිපත් කළේ. මා එය මූලාසනයට ඉදිරිපත් කළා. මූලාසනයෙන් ඔබතුමාට යොමු කළා. ඔබතුමා තීරණයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොහොම වුණත් ඒ අවස්ථාවේදී ගැටලු කිහිපයක් තිබුණා. ඔබතුමාම කිව්වා, ඔබතුමා දන්නේවත් නැහැයි කියලා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, නියෝගයක් සඳහා එම කාරණය මූලාසනය විසින් ඔබතුමාට යොමු කරනු ලැබුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊට පස්සේ නේ ඉදිරිපත් කළේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, මොන ස්ථාවර නියෝගය යටතේද ඔබතුමා මේ ඉල්ලීම කරන්නේ?

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු සභානායකතුමනි,ඔබතුමා ම එ් පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා, ඔබතුමා ම කියනවා ඒ ගැන දන්නේ නැහැයි කියලා. ඔබතුමා එහෙම කියන්නේ මොන ස්ථාවර නියෝගය යටතේද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමා තමයි ඒ ප්‍රශ්නය ඊයේ ඇහුවේ. මා හිතන හැටියට ඔබතුමා ඒ ගැන සෑහීමකට පත්වෙලායි ගියේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, the Hon. Member who raised the point of Order is here.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභානායකතුමනි, මෙයට ඇහුම්කන් දෙන්නකෝ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමානේ ඒ ප්‍රශ්නය ඇහුවේ. ඒ නිසා එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මමයි ඊයේ උදේ ස්ථාවර නියෝග 26(3) යටතේ එම ප්‍රශ්නය ඇහුවේ. ඊට පසුව ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා පරිපූරක

[ගරු බිමල් රත්නායක මහතා]

ඇස්තමේන්තුව ඉල්ලා අස්කර ගත්තා. ගරු කථානායකතුමනි, ඊට පසුව මම මූලාසනයේ සිටින වෙලාවක දී ගරු සභානායකතුමා එම ඉල්ලා අස්කිරීමේ ප්‍රකාශය ඉල්ලා අස්කර ගත්තා, රුපියල් මිලියන 19ක් අලුත්වැඩියා සඳහා වෙන් කරලා තිබෙන්නේ එතුමා සිටින නිවසට නොවෙයි, වෙනත් ඇමතිවරයෙකුගේ නිවසටය කියලා. නමුත් මා විසින්ම මතු කරපු ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මම මූලාසනයේ සිටිය දී එතුමා සමඟ වාදයකට යන එක නොගැළපෙන නිසා මා එය සභාකාර මහලේකම්තුමිය වෙත යොමු කළා, මේ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරන්නය කියලා. ගරු කථානායකතුමනි, මගේ අදහස තිබෙන්නේත් සභානායකතුමාට විශේෂ බලයක් නැහැ කියලා. මේක එතුමාගේ අමාත්‍යාංශ ලියවිල්ලක් නොවෙයි. මේක ඇමතිවරයෙකුගේ ලියවිල්ලක් නොවෙයි. මේක අමාත්‍යාංශ ප්‍රකාශයක් නොවෙයි. මේක සහමුලින්ම මුදල් පිළිබඳ කාරක සභාව වග කියන පාර්ලිමේන්තුවේ ඉතා ප්‍රධාන ලියවිල්ලක්. එවැන්නක් ඉදිරිපත් කරද්දීත් වගකීමක් තිබෙන්න ඕනෑ. ඉල්ලා අස් කර ගනිද්දීත් වග කීමක් තිබෙන්නට ඕනෑ; ක්‍රමවේදයක් තිබෙන්නට ඕනෑ. ඒක නිසා චන්දිම වීරක්කොඩි මහතා හිටපු නියෝජ්‍ය කථානායකතුමකු වශයෙනුත්, මන්ත්‍රීවරයෙකු වශයෙනුත් ඉදිරිපත් කරන කරුණ හරි කියලා මම විශ්වාස කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ඒ අදහස් ඉදිරිපත් කරන්න ඕනෑ ස්ථාවර නියෝග අනුව. ස්ථාවර නියෝගවලින් බාධාවක් නැහැ, මම කරපු වැඩේ කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ මේකේ ගැටලුවක් තිබුණා නේ. ඒකේ වැරැදීමක් තිබුණා. වැරැදීමක් තිබුණු නිසා නේ correct කළේ.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලන්සා මැතිතුමා, මේ ගැන නැවත ප්‍රශ්න අහන්න බැහැ. මොකක්ද ඔබතුමාගේ ප්‍රශ්නය?

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, මම කතෝලික මන්ත්‍රීවරයෙක් විධියට මේ ප්‍රශ්නය අහන්නේ. අමාත්‍ය තනතුරෙන් ඉවත් වෙලා පරීක්ෂණවලට මාසයක කාලයක් දෙනවා කියලා කබීර් හෂීම් හිටපු අමාත්‍යතුමා කියලා තිබෙනවා. මට දැන ගන්න ඕනෑ එකම දෙයයි. මාසයක කාලය ඉවරද? පරීක්ෂණ අවසන්ද? ගරු සභානායකතුමනි, ඒත් එක්කම අද news alert එකක් දැක්කා, ඉල්ලා අස් වූ ඇමතිවරුන් නැවත දිවුරුම් දීලා තිබෙනවා කියලා. ඒ අය දිවුරුම් දෙන එක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. අපට දැන ගන්න ඕනෑ, පරීක්ෂණ ඉවරද, එහෙම නැත්නම් මාසයක කාලය ඉවරද කියන එකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ජනාධිපතිතුමා ඉදිරියේ දිවුරුම් දීලා තිබෙන්නේ. ඒ ප්‍රශ්නය අවශ්‍ය තැනට යොමු කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මින් පසුව ඔවැනි ප්‍රශ්න අහනවා නම් කල් තියා notice දීලා අහන්න. එහෙමයි අපේ ස්ථාවර නියෝගවල තිබෙන්නේ.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
මේ දැන් news alert එකක් ආවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
News alert එන හැම අවස්ථාවකම ප්‍රශ්න අහන්න ගත්තොත් අපට පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන යන්න අමාරුයි.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අමාත්‍යවරුන් දිවුරුම් දීමේ කටයුත්තට පාර්ලිමේන්තුවේ සම්බන්ධයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත, ගරු චම්පික රණවක අමාත්‍යවරයා.

# ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත
## இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம் (திருத்தம்) சட்டமூலம்
## SRI LANKA LAND RECLAMATION AND DEVELOPMENT CORPORATION (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 1.55]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

ගරු කථානායකතුමනි, "ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියැවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සංශෝධනය කිරීමට තමයි අපි මේ පනත් කෙටුම්පත ගරු පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ප්‍රධාන වශයෙන්ම මෙහි අරමුණ වෙලා තිබෙන්නේ, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යන නාමය වෙනුවට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව යන වදන එකතු කිරීමයි.

මොකද, මේ සංස්ථාව බිහි කරපු කාලවකවානුව තුළ පහත් බිම් ගොඩ කිරීමේ අවශ්‍යතාව හා ඒවා සංවර්ධනයට යොදා ගැනීමේ අවශ්‍යතාව තමයි මුල්වෙලා තිබුණේ. නමුත් දැන් තිබෙන මේ පරිසර තත්ත්වයන්, ඒ වාගේම පහත්බිම් සහ ඊට අදාළ ප්‍රදේශවලින් කරන පරිසර කාර්ය භාරයන්, ඒ එක්කම නාගරික සංවර්ධනය සමඟ තිබෙන කාරණා ගැන කල්පනා කර බලා මේ නාමය මේ ආයතනයට සුදුසු නැහැ කියලා අපි කල්පනා කළා. ඒ අනුව ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙනුවට ඉඩම් සංවර්ධන සංස්ථාව නමින් නව නාමකරණයක් කිරීම තමයි මේ පනත් කෙටුම්පතේ අරමුණ වෙන්නේ. මේ ආයතනය ප්‍රධාන වශයෙන් කරුණු කිහිපයක් නිසා මේ රටේ ඉංජිනේරුමය කාර්යන් සඳහා වැදගත් වනවා. පළමුවෙන්ම පාරිසරික පැත්ත. අපි කවුරුත් දන්නවා, මේ දේශගුණ විපර්යාස, කාලගුණ විපර්යාස තත්ත්වයන් නිසා විශේෂයෙන්ම පහත් බිම් ප්‍රදේශයක්, තෙත් බිම් ප්‍රදේශයක් හැටියට බස්නාහිර පළාත ඇතුළු ප්‍රදේශ ඉතාම අධික වර්ෂා තත්ත්වයන්වලට මුහුණ දෙන බව. එම ප්‍රදේශවල ගංවතුර පාලනය කියන එක අද අත්‍යවශ්‍ය කාරණයක් බවට පරිවර්තනය වෙලා තියෙනවා. අපි දැක්කා, 2010 ඇති වෙච්ච වර්ෂා තත්ත්වයත් එක්ක අපේ පාර්ලිමේන්තුවත් ගංවතුරට යට වුණු බව. ඉතින් මේ තත්ත්වය පැති දෙකකින් පාලනය කරන්න අපට අවශ්‍ය කරලා තිබෙනවා. එක පැත්තකින් වතුර රඳවා ගැනීමේ ශක්තිය වැඩිදියුණු කරන්න; ඒ වතුර මුහුදට ගලා යන ක්‍රියාමාර්ග වේගවත් කරන්න; ඒ වාගේම මුහුදට හෝ ඇළ මාර්ගවලට හෝ කැලණි ගඟට හෝ යන මාර්ගවල තිබෙන බාධක ඉවත් කිරීම සඳහා වෙච්ච සංවර්ධන ක්‍රියාදාමයකට යොමු කිරීම අවශ්‍යයි. අනෙක් පැත්තෙන් ගංවතුර පිළිබඳව නිවැරදි පුරෝකථනයන් අවශ්‍යයි. අද අපි මේ දෙක සම්බන්ධයෙන්ම පියවර අරගෙන තිබෙනවා. අපි real-time prediction centre එකක් ඇති කරගෙන යනවා. ඒ මඟින් අපට හැකියාව ලැබෙනවා, ඕනෑම ගංවතුර තත්ත්වයක් පිළිබඳව පැය 18කට, ඒ වාගේම පැය 3කට කලින් නිරවද්‍ය අනාවැකි පළ කරන්නට. ඔබතුමාත් ප්‍රායෝගිකව දන්නවා, පාර්ලිමේන්තුවට හෝ ඒ අවට තිබෙන ගොඩනැගිලිවලට හෝ වෙනත් ගොඩනැගිලිවලට අනතුරක් තිබෙනවා නම්, අද ඒ බව අපට දැනුම් දෙන්න පුළුවන් බව. පසුගිය කාලයේ එවැනි අනතුරක් පාර්ලිමේන්තුවට ඇති නොවුණේ ඒ පුරෝකථනයන්ගේ විද්‍යාත්මකභාවය ඇති කර ගත් නිසා. ලබන වසර වෙනකොට අපි සම්පූර්ණයෙන්ම ඒ පිළිබඳවම වෙච්ච විශේෂ මධ්‍යස්ථානයක් ඉදි කරලා පවත්වාගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

අනෙක් පැත්තෙන් අපේ තෙත් බිම් ප්‍රදේශ ආරක්ෂා කරගෙන, එහි කෙරෙන පරිසර කාර්ය භාරය වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වෙනවා. අපේ ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව ගත් පියවර නිසා කොළඹ ඇතුළු අග නගර ප්‍රදේශය රම්සා තෙත් කලාපයක් ලෙස අන්තර් ජාතික පිළිගැනීමකට ලක් වුණා. එසේ පිළිගැනීමට ලක් වුණු අග නගර ප්‍රදේශ තිබෙන්නේ බොහොම අතළොස්සක්. එම නිසා අපි ඒක අඛණ්ඩව ආරක්ෂා කර ගත යුතු වෙනවා. මෑතකදී ජාත්‍යන්තර Animal Planet නාලිකාව තුළ අපේ පාර්ලිමේන්තුව අවට ප්‍රදේශයේ අපි හඳුනා ගන්නා wildcatsලා 48 දෙනෙකුගේ පැවැත්ම පිළිබඳව තහවුරු කරලා තිබෙනවා. අද අපි පාර්ලිමේන්තුවට නුදුරු භූමියේ "දිය සරු උයන" නමින් විධිමත් ජීව විද්‍යාත්මක, ජීවීන්ට ජීවත් විය හැකි භෞතික පරිසරයක් ඉදි කිරීමේ කටයුතුත්, ගංවතුර පාලනය සඳහා කටයුතුත් කරගෙන යනවා. ඒ එක පැත්තක්.

අනෙක් පැත්ත තමයි, නාගරිකරණයත් සමඟ සංවර්ධනය සඳහා විධිමත් ඉඩම් අවශ්‍යතාවක් තිබෙනවා. ඒ විධිමත් ඉඩම් අවශ්‍යතාව සඳහා ඉඩම් සංවර්ධනය කිරීමත්, ගංවතුර පාලනයත් විධිමත්ව සිදු විය යුතුයි. අද එය සිදු වන්නේ අවිධිමත්ව. කුඹුරු ඉඩමක් තිබෙනවා නම්, පහත් බිමක් තිබෙනවා නම්, තෙත් බිමක් තිබෙනවා නම් කැළි කසළ ගෙනැල්ලා දාලා, එහෙම නැත්නම් ඉවත් කරන ලද ගොඩනැඟිලි අප ද්‍රව්‍ය ගෙනැල්ලා දාලා ඒවා ගොඩ කරලා ගොඩනැඟිලි ඉදි කිරීමේ අවිධිමත් ක්‍රියාදාමයක් තිබෙන්නේ. විධිමත් ජල බස්නා ක්‍රමවේදයකට අනුව ඉඩම් විධිමත්ව සංවර්ධනය කිරීමේ වැඩසටහනක් අපි දියත් කරලා තිබෙනවා, මේ සංස්ථාව යටතේ. ඒ තුළින් අපි විධිමත් නාගරිකරණයකට පියවර තබලා තිබෙන බව ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගංවතුර පාලනය ගැන කථා කරනවා නම්, අපි දැනටමත් ලෝක බැංකු ආධාර යටතේ කොළඹ නරගයේ නව උමං මාර්ග දෙකක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. එකක් උතුරු කොළඹ, අනෙක නිදහස් චතුරශ්‍රයේ සිට බම්බලපිටිය දක්වා. ඒ වාගේම පොළොව යටින් සහ උඩින් යන ඇළ මාර්ග දෙකක කටයුතු අපි දැනටමත් අවසන් කරලා තිබෙනවා. එකක් කිංසි පාර පැත්තෙන්, අනෙක දේවි බාලිකා විද්‍යාලය අසලින් බොරැල්ල කනත්ත හරහා යන ජල ප්‍රවාහය.

ඒ වාගේම, අපි පොම්පාගාර කිහිපයක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කරගෙන යනවා. කැලණි ගඟේ ජල මට්ටම ඉහළ ගියාට පසුව ජලය පොම්ප කිරීම සඳහා පොම්පාගාර තුනක් ඉදි කිරීමේ කටයුතු සිදු වෙනවා. ඉන් එකක් නාගලගම්වීදියේ, අනෙක ශාන්ත බස්තියමේ සහ තවත් එකක් කඩුවෙල ප්‍රදේශයේ ඉදිකෙරෙනවා. ඊට අමතරව අපි වෙනත් ආයතන සමඟත් කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් මේ කටයුත්තට සම්බන්ධ කරගෙන තිබෙනවා. අපි දැනටමත් නුගේගොඩ සිට කැස්බෑව දෙසට ජල ප්‍රවාහන පද්ධතිය විධිමත් කිරීමේ ක්‍රියාවලිය කරගෙන යනවා.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

ඒ ක්‍රියාවලියෙන් විපුල ප්‍රතිඵල ලැබිලා තිබෙනවා. අද පිළියන්දල, බොරලැස්ගමුව ප්‍රදේශ ප්‍රධාන ගංවතුරවලට යට නොවෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එහි දෙවැනි ව්‍යාපෘතිය හැටියට දැන් අපි කොළොන්නාව තෝරාගෙන, ගංවතුර උවදුර පාලනය කිරීම සඳහා කොළොන්නාව කිත්තම්පහුව ඇළ සහ අනෙකුත් දේවල් ප්‍රතිසංස්කරණය කරගෙන යනවා. එහි තුන්වැනි පියවර හැටියට පැලියගොඩ, වත්තල ප්‍රදේශය ආශ්‍රිත ගංවතුර පාලන වැඩ පිළිවෙළ රජයේ අරමුදල්වලින් අපි කරගෙන යනවා. ඊට අමතරව මේ රටේ බොහෝ දෙනෙක් ප්‍රශ්න නඟපු බේරේ වැව සහ ඒ අවට කලාපය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අපි කරගෙන යනවා. එහි ජීවත් වුණු ඉතාම අන්ත දුගී පැල්පත්වාසී පිරිස්වලට ඒ අයගෙත් කැමැත්ත ඇතිව කිසිම විරෝධයකින් තොරව අපි විධිමත් නිවාස ලබා දීලා තිබෙනවා. ඊළඟට, අපි ඒ බේරේ වැව වටේට පෙත්මඟක් ඉදි කිරීමේ කටයුතු දැන් සිදු කරගෙන යනවා. ඒ වාගේම, බේරේ වැවේ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු දැන් සිදුවෙමින් යනවා. ලබන වසර වන විට අපට පුළුවන් වෙනවා, අලුත් පොම්පාගාරයක් ජනාධිපති කාර්යාලය ගාව ඇති කර මේ බේරේ වැව විටින් විට පිරිසිදු කර එළියට දැමීමේ කටයුතුවලට අවශ්‍ය කරන කටයුත්තත් කරන්න. මේක සම්පූර්ණයෙන්ම දේශීය ශිල්ප ඥානය මත, දේශීය ඉංජිනේරුවන්ගේ කටයුතු මත සිදු කරන දෙයක් බව අපි බොහොම ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා.

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයිති නැති වුණත්, 2017දී කොළඹ නගරයේ මීතොටමුල්ලේ කසළ කන්ද කඩා වැටීමෙන් ඇති වුණු ඛේදවාචකයෙන් පස්සේ කොළඹ නගරයේ කසළ කළමනාකරණය පිළිබඳ විධිමත් වැඩ පිළිවෙළක් යොදන්න කියා ජූලි මාසයේ අපෙන් ඉල්ලා සිටියා. ඒ අනුව ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් කසළ අංගණය කෙරවලපිටිය ප්‍රදේශයේ පවත්වාගෙන ගියා, අදටත් පවත්වා ගෙන යනවා. අපි නම් කිව්වේ, "කොළඹ නගර සභාවට වසරක් ඇතුළත විසඳුමක් සොයා ගන්න. එතකන් අපි මේක කරන්නම්." කියායි. නමුත් දැන් වසර දෙකකටත් වැඩි කාලයක් ගෙවිලා තිබෙනවා. තවම කොළඹ නගර සභාවට එවැනි විසඳුමක් සොයා ගන්න බැරි වෙලා තිබෙනවා. නමුත්, ඒ අතරේදී කසළින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘති දෙකකට අපි අවස්ථාව ලබා දීලා තිබෙනවා. එයින් එක ව්‍යාපෘතියක් මේ වසරේ ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක වෙන්න නියමිතයි. අනෙක් ව්‍යාපෘතිය ලබන වසරේ ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, පුත්තලම සේරක්කුලි ප්‍රදේශයේ විද්‍යාත්මක කසළ අංගණයක් සම්පූර්ණ දේශීය අරමුදල්වලින් මේ වන විට ඉදිවෙලා තිබෙනවා. මම ඉල්ලීමක් කරනවා දේශපාලන උද්ඝෝෂණවලට බිය නොවී, තැන් තැන්වල විශාල ව්‍යසනයක් සිදු නොකර මේ කසළ අංගණයට කරුණාකරලා කසළ බාර දෙන්න කියා. ඒ වාගේම කොළඹ නගර සභාවෙන් අපි ඉල්ලා සිටිනවා, නැවත වතාවක් ඉතාම සරල, සැහැල්ලු ආකාරයට මේ ප්‍රශ්නය ගන්නේ නැතිව බැරෑරුම්ව තමන්ගේ වගකීම වටහාගෙන කසළ කළමනාකරණය සඳහා පියවර ගන්න කියා. ඒ වාගේම, වැලි සැපයීම ගැනත් කියන්න ඕනෑ. රටේ ගංගා වැලි සැපයීම පිළිබඳව සීමාකාරී තත්ත්වයන් තිබෙන නිසා ඒ වැලි සැපයීමේ කටයුත්තට අපි අත ගහලා තිබෙනවා. 2014දී ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් මුහුදු වැලි කියුබ් 33,000කට ආසන්න ප්‍රමාණයක් තමයි සෝදලා බාර දුන්නේ.

2018 වෙනකොට වැලි ප්‍රමාණය කියුබ් 255,000 දක්වා අපි වැඩි කර තිබෙනවා. අපේ ඉලක්කය, 2020 වන විට වැලි ප්‍රමාණය කියුබ් 500,000 දක්වා වැඩි කරන්නයි. ඒ මඟින් ගංගා වැලි වෙනුවට බොහොම පැහැදිලිව සෝදා පිරිපහදු කරන ලද වැලි ලබා දීම තමයි අපේ අරමුණ වන්නේ. ඒ වාගේම අපි වරාය නගරය සම්බන්ධ වුණු ඒ ක්‍රියාදාමය තුළ දේශීය ඉංජිනේරුවන් ඉංජිනේරුමය දැනුමක් ලබා ගත්තා මේ මුහුදු බාදනයත් අනෙක් පැත්තෙන් ගංගාවලින් මුහුදට යන වැලිත් විධිමත්ව පාවිච්චි කර, මුහුද ගොඩකර කිසියම් ආකාරයකට අපේ ගොඩබිම් ප්‍රදේශය ආරක්ෂා කර ගන්නේ කොහොමද කියා. පරිසරවේදීන්, සමාජවේදීන් නොයෙක් දෙනෙක් ප්‍රශ්න නගලා තිබුණත්, භිය පළ කර තිබුණත් අද අපි අක්කර 700ක් කිසිම ගැටලුවක් නැතිව ඒ වරාය නගරයේ ඉංජිනේරුමය වශයෙන් ඉදි කර අවසන් කර තිබෙනවා. අපේ ඊළඟ පියවර, කොල්ලුපිටියේ සිට දෙහිවලට තවත් හෙක්ටෙයාර 160ක් මේ ආකාරයටම මුහුද ගොඩ කර ලබා ගැනීමටයි.

ගරු කථානායකතුමනි, වසර 200ක් කළු ගඟෙන් මුහුදට ගලා ගෙන ගිය දැවැන්ත පස් කන්ද දැන් විධිමත් සංවර්ධන භූමියක් බවට පසු ගිය වසර තුනේදී පත් වෙලා තිබෙන බව අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ නිසා අනාගතයේ දී අපේ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවත් මැදිහත් කරගෙන විදේශ ආයෝජනයකින් මුහුදු නගර ව්‍යාපාරයක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඊට අමතර වශයෙන් මේ රටේ ඉංජිනේරු ආයතන බොහොමයක් පාඩුවට දුවන, දේශපාලන වුවමනාවන් මත දුවන, දේශපාලකයින්ට රැකියා උත්පාදනය කරන ස්ථාන බවට පත් වෙද්දී අපේ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ඉංජිනේරුමය වශයෙන් ශක්තිමත් බලගතු ආයතනයක් බවට පත් කර තිබෙනවා. 2014දී අපේ ආදායම තිබුණේ මිලියන 2,500යි. අපේ ආදායම මිලියන 8,000කට අවුරුදු 3ක් ඇතුළත ගෙනැල්ලා තිබෙනවා. අපේ වත්කම් ප්‍රමාණය අපි බිලියන 18 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම මම 2015දී මේ අමාත්‍යාංශය භාර ගන්නකොට මිලියන 155ක පාඩු ලබන ආයතනයක් හැටියටයි භාර ගත්තේ. අද අපි විවිධ දේශපාලන ප්‍රශ්නත් සමඟ පසු ගිය වසරේ මිලියන 2,800ක ලාභයක් වාර්තා කර තිබෙනවා. ඒ අනුව රාජ්‍ය ආයතන හදන්න බැහැ, රාජ්‍ය ආයතන පාඩු ලබනවා, රාජ්‍ය ආයතන කියන්නේ මහජනයාගේ සල්ලි කන බහිරවයෝ කියා මතයක් තිබෙනවා. නමුත්, අවශ්‍ය නම් රාජ්‍ය ආයතනවලට විශේෂයෙන්ම ඉංජිනේරු ආයතනවලට මේ ක්ෂේත්‍රයේ කටයුතු කරන්න පුළුවන් කියන එක අපි මේ අරමුදල් පාලනය කිරීම පැත්තෙනුත් පෙන්වා දීලා තිබෙනවා. ඒ අනුව මම ස්තුතිවන්ත වනවා විවිධ අභියෝග පැමිණි වෙලාවේදී, විශේෂයෙන්ම මීතොටමුල්ල කසළ කන්ද කඩා වැටුණු වෙලාවේදී විදේශ විද්‍යාඥයන් නැතිව, විදේශ ඉංජිනේරුවරු නැතිව මේක කරන්න බැහැ කියා කිව්වා. අද දේශීය ඉංජිනේරුවන් ලවා අපි කසළ කන්ද අවට අක්කර 35ක ප්‍රදේශයක් ප්‍රතිසංවර්ධනයට ලැහැස්ති කර තිබෙනවා.

එයින් මීතොටමුල්ල, කොළොන්නාව ප්‍රදේශයේ අක්කර 24ක් නාගරික උද්‍යානයක් බවට පත් කිරීමට අවශ්‍ය කරන පියවර තබලා තියෙනවා. මේ කිසිම තැනක විදේශීය විශේෂඥ භාවයක් හෝ විදේශීය ආකාරයක් නැහැ. මේ රටේ කසළ ක්‍රියාවලියට මේක ලොකු ආදර්ශයක්. ඇත්තටම මේ කුණු කඳු නිවැරැදි ආකාරයට පාවිච්චි කර විධිමත් ආකාරයට පවත්වාගෙන යන්න දේශීය වශයෙන් පුළුවන්. "මේකට ලෝක බැංකුවේ උපදෙස් ගන්න. ජපානයේ උපදෙස් ගන්න. කොරියාවේ උපදෙස් ගන්න." කියා තමයි හුඟක් දෙනෙකු කිව්වේ. අපි ඒ හැම කෙනාගේම උපදෙස් ලබා ගත්තා. අපට හොඳ උපදෙස් ලැබුණා. නමුත් දේශීය වශයෙන් මේ කටයුත්ත කරන්න අපේ ඉංජිනේරුවරු අද සමත් වෙලා තිබෙන බවත් මා ප්‍රකාශ කරන්න ඕනෑ.

බේරේ වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කාලාන්තරයක් තිස්සේ විවිධ විදේශ ආයතනවලින් නොයෙකුත් යෝජනා ඉදිරිපත් වෙලා තිබුණත්, අපි අද රාජ්‍ය අරමුදල් පාවිච්චි කර ඒ කටයුතු සිදු කරනවා. එහි කොටසක් වූ පෙත්මඟ ඉදිකිරීමේ කටයුතු ලෝක බැංකු ආධාර යටතේ සිදු කළා. අනික් කොටස් රාජ්‍ය අරමුදල් පාවිච්චි කර, අපේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ඉටු කරන බව මා ප්‍රකාශ කරන්න ඕනෑ.

අපේ ඊළඟ ඉලක්කය මෙයයි. වත්තල, පෑලියගොඩ ප්‍රදේශයේ අධිවේගී මාර්ග පද්ධතිය ඇවිල්ලා වැටෙන තැන මාර්ගය කෙරවලපිටිය දක්වා ලබන වසර වනකොට ක්‍රියාත්මකයි. ඒ අනුව එම මාර්ගය ප්‍රධාන මං සන්ධියක් - ප්‍රධාන උපනගරයක් - බවට පත් වනවා. විශේෂයෙන්ම කොළඹ නගරයේ තිබෙන මැනිං වෙළෙඳ සැල අද පෑලියගොඩට ගෙන යන්න අවශ්‍ය කරන ගොඩනැඟිලි සංකීර්ණය ඉදි වෙමින් තිබෙන බව ඔබතුමන්ලා සියලු දෙනාටම පෙනෙනවා. ලබන වසරේ සිට මැනිං වෙළෙඳ සැල එතැනට ගෙනෙනවා.

ඊළඟට, කොළඹ නගරයේ සියලුම තොග වෙළෙඳාම් පෑලියගොඩ ප්‍රදේශයට ගෙනෙන්න ඉදිරියේදී අපි සැලසුම් කර තිබෙනවා. ඒ වාගේම කෙරවලපිටියේ නව ප්‍රවර්ධන නගරයක් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ඇති කළා. ඇත්තටම එදා විශාල ව්‍යසනයක්ව තිබුණු මුතුරාජවෙල පරිසර ව්‍යසනය වෙනුවට මුතුරාජවෙල කලාපකරණයකට ලක් කළා සංරක්ෂිත ප්‍රදේශය, buffer zone එක වාගේම සංවර්ධන ප්‍රදේශය. අද ඒ සංවර්ධන ප්‍රදේශයේ අක්කර 400ක් විධිමත් සංවර්ධනයකට අපි යොමු කර තිබෙනවා. එහි විදුලි බලාගාර තිබෙනවා, ෂෙල් සමාගම තිබෙනවා. ඒ වාගේම තමයි, මේ රටේ ප්‍රධාන ප්‍රවර්ධන ක්‍රියාවලිය - logistic operation එක - කරන ප්‍රධාන ආයතන සියල්ලම එතැනට ගෙනැල්ලා, අද ඒ ප්‍රවර්ධන නගරය -logistic city එක - එතැන ස්ථාපිත කරගෙන යනවා. අපට ඒක විශාල ශක්තියක්. මොකද, වරායත්, ගුවන් තොටුපොළත් අතර සිදු කරන මේ ව්‍යාපාරයේදී කෙරවලපිටිය ඉතාම බලගතු ස්ථානයක් බවට පත් කරන්න පුළුවන් වුණා. ඒ කටයුත්ත කරන්න පුළුවන් වුණේම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව පසු ගිය කාලයේ ඉංජිනේරුමය හැකියාව ළඟා කර ගත් නිසයි.

අපේ ඊළඟ ඉලක්කය මෙයයි. විදේශවලට අතිවිශාල ධනයක් දිනපතාම ගමන් කරනවා. වැලි ගොඩ දමන්න ගියාමත්, අපේ වෙරළ තීරය සංරක්ෂණය කරන්න ගියාමත් -මේ හැම අවස්ථාවකදීම- අපට dredger යන්ත්‍ර අවශ්‍ය වනවා. නමුත් අපට dredger යන්ත්‍රයක් නැහැ. ඒ නිසා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඊළඟ ක්‍රියාදාමය හැටියට අපි උපයලා තිබෙන ලාභ පාවිච්චි කර, dredger යන්ත්‍රයක් අරගෙන, වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා වූ ක්‍රියාවලියට අනාගතයේදී අවශ්‍ය කරන ඉඩම් මුහුදෙන් ලබා ගන්නත් බලාපොරොත්තු වනවා. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරන ඒ ක්‍රියාවලියට අවශ්‍ය කරන තාක්ෂණික ශක්තිය ලබා ගැනීමටත් අපි කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ කටයුතු කරන්න අපට රජයෙන් කිසිම මුදලක් අවශ්‍ය වෙන්නේ නැහැ. රජයෙන් අරමුදල් ගන්නේ නැතුව අපේ ආයතනය අපේම ශක්තියෙන් කටයුතු කරලා තිබෙනවා. අපේ ආයතනවල ප්‍රශ්න, දූෂණ හා වංචා තිබෙන බවට කථා ගොඩක් පැතිරිලා තිබුණා. අපි අපේ දෙමාපියන් හෝ අපේ ඥාතීන් වෙනුවෙන් නොවෙයි කටයුතු කරන්නේ. මේ රටේ පොදු ජනතාව වෙනුවෙන් රටට අවශ්‍ය කරන සංවර්ධනය ඉලක්ක කර මේ ආයතනය නැවත ප්‍රති නිර්මාණය කර තිබෙන බව මා ප්‍රකාශ කරන්නට ඕනෑ. විශේෂයෙන්ම දේශගුණික විපර්යාස විසින් ඇති කරන හදිසි වර්ෂාමය තත්ත්වයන්, ගංවතුර තත්ත්වයන්, නියං තත්ත්වයන් කියන මේ හැම තත්ත්වයකටම ඔරොත්තු දෙන ක්‍රියාවලියක් ඉදිරි කාලයේදී මේ මුළු රටේම ඇති කිරීම අත්‍යවශ්‍යයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මේ ලෝකයේ ශිෂ්ටාචාර බොහොමයක, විශේෂයෙන්ම නාගරික ශිෂ්ටාචාරවල නගර ගොඩනැඟීමට මුල් වුණේ ප්‍රධාන ගංගාවන් බව. ලන්ඩනය නමැති වාණිජ නගරය ගොඩ නැඟුණේ, තේම්ස් නදියෙන්. පැරීසිය ගොඩනැඟුණේ, ෂේන් නදියෙන්. බර්ලිනය ගොඩනැඟුණේ, රයින් නදියෙන්. ඩැනියුබ් නදිය හරහා වියානා නගරය සහ නැඟෙනහිර යුරෝපීය රටවල් ගොඩනැඟී තිබෙනවා. අද චීනයේ ප්‍රධාන නාගරික සංවර්ධනය වුණේ, පර්ල් ඩෙල්ටාවෙන්. එදා ඉතාමත්ම කාලකණ්ණි අඳුරේ තිබුණු ඒ පර්ල් ඩෙල්ටාව අද ලෝකයේ කාර්මික නිෂ්පාදනයෙන් සියයට 36ක් නිෂ්පාදනය කරන ෂෙන්ෂෙන්-ගොන්ෂූ කියන දැවැන්ත වාණිජ කලාපයට ගිහින් තිබෙනවා. ඒ වාගේ ලෝකයේ ප්‍රධාන ගංගා හරහා නගර ගොඩනැඟිලා තිබෙනවා. නමුත්, අවාසනාවකට අපේ කැලණි ගඟ සම්බන්ධයෙන් එවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුණේ නැහැ. අපි මහවැලි ගඟට ව්‍යාපෘතියක් ගෙනගියා. නමුත් කැලණි ගඟ කියන්නේ, අපේ කසළ ගෙන ගිහින් දමන, අපජලය ගෙන ගිහින් දමන ගංගාවක්. ගංවතුරෙන් බැටකන, අපට හානියක් වන දෙයක් හැටියට තමයි කැලණි ගංගා තීරය තිබෙන්නේ. ඒ නිසා අපි යෝජනා කර තිබෙනවා, පර්ල් නදිය චීනයට ආර්ථික බලයක් වුණා වාගේ, කැලණි ගංගාවත් ඒ තත්ත්වයට ගෙනෙන්න. කැලණි ගඟ විධිමත් ජල කළමනාකරණයකට යොමු කරලා, ප්‍රවාහන ක්‍රියාවලියකට යොමු කරලා, එම ප්‍රදේශයේ නාගරික සංවර්ධනයක් ඇති වන විධියට ක්‍රියා කළ යුතුයි. කැලණි ගඟ පිළිබඳ බහු කාර්ය යෝජනා ක්‍රමයක් ලංකාවට ඉදිරියේදී අත්‍යවශ්‍යයි. අඩුතරමේ මෝදර සිට කඩුවෙල පාලම දක්වා ප්‍රදේශයට හෝ අවශ්‍යයි. ඒ සඳහා අපේ වාරි මාර්ග දෙපාර්තමේන්තුව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. එයට අපේ අමාත්‍යාංශයත් දායක වෙලා තිබෙනවා. මේ රට බල ගන්වන්න, මේ රට බලගතු ආර්ථිකයක් දක්වා ඔසවා තබන්න ඉතාම අත්‍යවශ්‍ය යෝජනා ක්‍රමයක් තමයි, බහු කාර්ය කැලණි ගඟ යෝජනා ක්‍රමය. ඒකට අවශ්‍ය කරන ඉංජිනේරුමය ශක්තිය, ඉංජිනේරුමය දැනුම, ඒකට අවශ්‍ය කරන ජල කළමනාකරණයේ දැනුම් පද්ධතිය ළඟා කර ගැනීම සඳහා අපි අපගේ ආයතනය අනුක්‍රමයෙන් ඉහළට ගෙන යනවා.

එහි එක පියවරක් හැටියට තමයි අපි කාලීන වශයෙන් ජල කළමනාකරණය, ජල තත්ත්වයන් පුරෝකථනය කළ හැකි විද්‍යුත් මධ්‍යස්ථානය ඉදිකරලා තිබෙන්නේ. ඒ අනුව මේ ආයතනය හුදු ඉඩම් ගොඩ කරලා සංවර්ධනය කරන ක්‍රියාවලියක් පමණක් කරන ආයතනයක් නොවෙයි. පරිසර සංරක්ෂිත ආයතනයක් බවට, නාගරික සංරක්ෂිත ආයතනයක් හැටියට, ආර්ථිකය ඉදිරියට ගෙන යන ප්‍රධාන ජවන එංජිමක් බවට මේ ආයතනය පරිවර්තනය කිරීම තමයි අපේ පරමාර්ථය. ඒ සඳහා යම් පහළ මට්ටමක තිබුණු එම ආයතනය අපි ඉහළ ගණයේ ආයතනයක් බවට පරිවර්තනය කරලා තිබෙනවා. ඒ සඳහා කැපවීමෙන් කටයුතු කරපු එහි සභාපතිතුමා, උපසභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලවලට අපගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා. නාමය වෙනස් කිරීම පමණක් නොවෙයි, මෙහි ක්‍රියාදාමය වෙනස් කිරීම මඟින් මේ ආයතනයේ ගමන් මඟ වෙනස් කිරීම පැත්තෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමෙන් මේ ආයතනය මේ රටේ ආර්ථිකයට, සමාජයට ශක්තිය දෙන බලගතු ඉංජිනේරුමය ආයතනයක්, බලගතු පරිසර සංරක්ෂණ ආයතනයක්, බලගතු නාගරීකරණ මෙහෙයුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට සියලුදෙනාගේ සහාය ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

ඊළඟට, ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා. ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[අ.භා. 2.15]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රජයේ සිටින ඉතාම කාර්යක්ෂම ඇමතිවරයා හැටියට පාඨලී චම්පික රණවක ඇමතිතුමා අපට හඳුන්වා දෙන්න පුළුවන්. පාඨලී චම්පික රණවක ඇමතිතුමාගේ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නම වෙනස් කිරීමට කරන මේ යෝජනාව සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම ඉතා සන්තෝෂ වෙනවා.

ඇමතිතුමා ප්‍රකාශ කළ පරිදි අපේ රටේ සංවර්ධනය ගැන කථා කරනකොට අනිවාර්යයෙන් අපට - [බාධා කිරීමක්] මම කිව්වා. මේ රජයේ ඉන්න වඩාත් කාර්යක්ෂම ඇමතිතුමා තමයි පාඨලී චම්පික රණවක ඇමතිතුමා. අපි ඒවා අවංකව පිළිගන්න ඕනෑ. මේ අවස්ථාවේ එතුමා ඉදිරිපත් කළ එක කාරණයක් ගැන කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

අද ලෝකයේම සංවර්ධනය ගැන කථා කරනකොට පැහැදිලි කාරණාවක් තමයි නාගරීකරණය. ග්‍රාමීය සමාජයක් තිබුණු ලෝකය වර්ෂයෙන් වර්ෂය දවසෙන් දවස නාගරීකරණය වීම අද ප්‍රධාන කාරණයක් බවට පත් වී තිබෙනවා. ඒ නාගරීකරණය තුළ ඇති වන ප්‍රශ්න, පරිසරය පිළිබඳ ප්‍රශ්න, ජල සැපයුම් පිළිබඳ ප්‍රශ්න, ගංවතුර පිළිබඳ ප්‍රශ්න, නව ඉදිකිරීම් ප්‍රදේශ ඇති කිරීමේ ප්‍රශ්න වැනි ඉතාම වැදගත්, රටේ අනාගතයට අතිශයින්ම බලපාන කරුණු ගැන තමයි අද අපි කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පළමුවෙන්ම කථා කරන්නට ඕනෑ, කොළඹ "Port City" එක ගැන. කොළඹ වරාය නගරය ගැන මේ රටේ නොයෙක් විධියේ වැරදි මත ප්‍රචාරය කර තිබෙනවා. මේ රටේ අනාගතය ගැන කල්පනා කරනකොට පෙනෙනවා, මෑත කාලයේ ගත් ඉතාමත් වැදගත් සහ අවශ්‍ය තීරණයක් තමයි මේ "Port City" එක ඉදිකිරීම කියලා. මේ රජයට එරෙහි විවේචනයක් තමයි අවුරුද්දක් දෙකක් ඒ ගැන තීරණයක් ගන්නේ නැතිව අර මුලින් තිබුණු ජවය සම්පූර්ණයෙන්ම කඩා බිඳ දමා ඒ තිබුණු කාලසටහන සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම. ඒ කාලසටහන වෙනස් නොකරන්නට අද වෙනකොට අපේ ආර්ථිකයට මේ කොළඹ "Port City" එකෙන් ආර්ථික වශයෙන් මීට වඩා විශාල වාසි ලබා ගන්නට පුළුවන්ව තිබුණායයි කියන්නට පුළුවන්. ඒ කෙසේ නමුත් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ, ඒ වැඩ නැවත ආරම්භ කළාට පස්සේ මෙය නියමානුකූලව ඉදිරියට ගෙන යන්නට හැකි පරිදි කටයුතු කිරීම ගැන.

කොළඹ "Port City" එකේ තිබෙන විශාල යන්ත්‍ර සූත්‍ර දැක තිබෙනවා දැයි මම දන්නේ නැහැ. ඒවාට කියන්නේ cranes කියායි. සාමාන්‍යයෙන් නාගරික සංවර්ධනය ගැන කථා කරනකොට මේ විශාල යන්ත්‍ර සූත්‍ර පොඩි රටක දකින්නට තිබෙන එකම ස්ථානය තමයි මේ "Port City" එක. මට මතකයි, ඉස්සර harbour එකට crane එකක් නැත්නම් දෙකක් ගත්තාම ඒක මුළු ලංකාවම හොල්ලන සිද්ධියක් හැටියටයි කථා කළේ කියලා. අද cranes විස්සක් තිහක් මේ "Port City" එකේ වැඩ කරනවා. නමුත් අපේ රටේ මාධ්‍යය හෝ අධ්‍යාපන ක්ෂේත්‍රය හෝ මේ කිසිම කෙනෙකු මේකේ තිබෙන වැදගත්කම අපේ රටට පෙන්වා දී නැහැ.

විශේෂයෙන් අලුත් ඉසව්වලට අපේ සංවර්ධනය ගෙන යනවා නම්, අපේ වරායන් දියුණු කරන්න, ගුවන් තොටුපොළවල් දියුණු කරන්න අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මේ රටට ඇවිත් ඒවා ක්‍රියාත්මක වෙනවා නම් කොච්චර ලොකු දෙයක්ද? වෙන රටක නම් එය හැම දෙනාම ආඩම්බර වෙන ලොකු දෙයක් බවට පත් වෙනවා. නමුත් අපට ඒ ගැන එලෙස ක්‍රියාත්මක වෙන්නට බැරි වෙලා තිබෙනවා.

එක පැත්තකින් අපි ඉතාමත් සන්තෝෂ වෙන්නට ඕනෑ, මේ රටේ ඉතිහාසය වෙනස් වෙන තීන්දුවක් ගැනීම ගැන, මේ "Port City" එක සම්බන්ධයෙන්. ගරු හිටපු කථානායකතුමනි, මට මතකයි, එතකොට ඔබතුමා තමයි වරාය භාර ඇමතිවරයා වශයෙන් සිටියේ. චීනයේ ජනාධිපතිතුමා ඇවිත් තමයි ඒකට මුල්ගල තිබ්බේ. ඒක අපේ ඉතිහාසයේ එක සන්ධිස්ථානයක්. අපරාදේ! ඒක අවුරුදු දෙකක් කල් දැම්මා. ඒ කෙසේ නමුත්, දැන් ඒකෙන් අපි උපරිම ප්‍රයෝජනය ගන්නට ඕනෑ. විශේෂයෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේක පසුපස ජනතා මතයක් ඇති කර ගන්න කියලා, "මේක හොඳ දෙයක්, අපේ රටේ සංවර්ධනයට අවශ්‍ය දෙයක්"ය කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙවන කාරණය වශයෙන් මම මෙය මතක් කරන්නට කැමැතියි. මේ නොයෙක් දේවල් ක්‍රියාත්මක වුවත්, මා දැක්කා, ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ තවත් කාරණයක්. ඔබතුමාගේ සංස්ථාවේ අන්තිම වාර්ෂික වාර්තාව, 2015 වර්ෂය සඳහා තිබෙන වාර්තාවයි. සංස්ථාවේ සභාපතිතුමා එහි පරමාර්ථය ගැන මෙසේ සඳහන් කොට තිබෙනවා, "සංස්ථාවේ දැක්ම වන ගංවතුරෙන් තොර පරිසර හිතකාමී වටපිටාවක් සහ පිරිසිදු දූෂණයෙන් තොර ජලාශ ඇති කිරීම සහ නඩත්තු කිරිම සාක්ෂාත් කර ගැනීම උදෙසා වැඩ කටයුතු කිරීම" කියලා.

මේක තමයි මේ සංස්ථාවේ පරමාර්ථයක් හැටියට සලකන්නේ. මෙතැනදී අපි එකක් කියන්න ඕනෑ. මේ සංවර්ධන කටයුතුවලදී මේ සැලැස්ම මොකක්ද; කොයි කොයි තැන්වලද, ගොඩ කරන්නේ; කොයි තැන්වලද, ජලය හසුරුවන්නේ; කොයි කොයි තැන්වලද, නව පරිසරාත්මක වෙනස්කම් කරන්නේ ආදී වශයෙන් අඩු ගණනේ ඒ ප්‍රදේශවල අයට දැනුමක් ලබා දෙන්න ඕනෑ. වෙන රටවල දැවැන්ත දැන්වීම් දමා "මෙන්න මේ විධියට තමයි මෙතැන පාර හදන්නේ; මේ විධියට තමයි අපි මෙතැන කුඩා වනයක් ඇති කරන්නේ; මෙතැන තමයි අපි වාහන තදබදය නැති කරන්න වෙන අතිරේක පාරක් හදන්නේ" ආදී වශයෙන් ඒ පළාතේ ඉන්නා අයටත්, රටේ ඉන්නා ජනතාවටත් දැනගන්නට කටයුතු කරන ආකාරය අපි දැක තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව දැනුවත් කිරීමට මීට වඩා මහන්සි ගත යුතුයි කියලා මා යෝජනා කරනවා. මේ කරනා වැඩ කටයුතු ඒවා බලපාන ජනතාවට ප්‍රචාරක අංශය තුළින් මීට වඩා හඳුන්වා දෙන්න ඕනෑ. ඒක ඉතාම අවශ්‍ය දෙයක්.

මට මතකයි, මේ සංස්ථාව ආරම්භ කරන වේලාවේ, මහවැලි ව්‍යාපාරයට ගත් උපකරණවලින් තමයි මේ සංස්ථාවේ කටයුතු මුලින් ආරම්භ කළේ කියන එක. මම හිතන විධියට ගාමිණී දිසානායක මැතිතුමා ඒ කාලයේ ඇමතිවරයා හැටියට කටයුතු කළා. දාබරේ මාවත නිවාස සංකීර්ණය, ලේක් ඩ්‍රයිව් නිවාස සංකීර්ණය වැනි දේවල් මුලින්ම ආරම්භ කළේ, මේ සංස්ථාව තුළින්. ඒක තමයි මගේ ඊළඟ ප්‍රශ්නය. දැන් ඉතාම හොඳින් පරිසර සංරක්ෂණය සඳහා සහ ගංවතුර පාලනය කිරීම සඳහා අවධානය

යොමු වෙනවා. නමුත් වෙන රටවල් දිහා බැලුවාම, මෙකේ තව අංශයක් තිබෙනවා. ඒ කියන්නේ නගරය තුළ නිවාසවලට ලබා ගන්නට පුළුවන් ඉඩම් සංරක්ෂණය කිරීම සහ විකිණීම. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ සංස්ථාවේ 2015 වාර්ෂික වාර්තාවේ, ආදායම් මාර්ග දිහා බලන්න. මම අවධානය යොමු කරනවා, මේ වාර්තාවට. වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2015, 100වැනි පිටුවේ සඳහන් ආදායම් ප්‍රකාශනයේ කියනවා, ඔබතුමන්ලාගේ බලාපොරොත්තු අනුව සංවර්ධනය කර ස්වකීය ඉඩම් විකිණීම ගැන. ඊට අමතරව තව දේවල් තිබෙනවා. මුහුදු වැලි විකිණීම, ඉඩම් කල්බදු දීම වැනි දේවල් ගැන සඳහන් කර තිබෙනවා. නමුත් මීට වඩා අවධානය යොමු කරන්න පුළුවන් පැත්තක් ගැන මම කියන්න කැමැතියි. නගරයේ අලුත් ඉඩම් ඇති කරලා විශේෂයෙන්ම නිවාස සැදීමේදී තිබෙන මේ තදබදය අඩු කිරීමට ඔබතුමාගේ සංස්ථාවේ අවධානය මීට වඩා යොමු කළ යුතුයි කියලා මා යෝජනා කරන්න කැමැතියි.

දැන් ඔබතුමා ඉතාම හොඳ දෙයක් කිව්වා, විශේෂයෙන් නාගරික ගොඩනැඟිලි ඉදිකිරීමේදී අවශ්‍ය කරන වැලි සම්බන්ධව. කොළඹ නගරය අවට තිබෙන හෝමාගම ආසනය, මහරගම ආසනය, කෝට්ටේ ආසනය වැනි තැන්වල තිබෙන වැව් අවට අනවසර පදිංචිවීම් ඉවත් කර, ඒවා සංරක්ෂණය කිරීමේදී හුඟාක් දුරට වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්ක සම්බන්ධීකරණය කළ යුතු බව අපට පෙනෙනවා. නමුත් මීට අදාළ තවත් දෙපාර්තමේන්තු තිබෙනවා. ඒ නිසා මම යෝජනාවක් කරන්න කැමැතියි. එම කාර්යය මෙම සංස්ථාවට විතරක් පවරන්නේ නැතුව, විශේෂයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව, නගර සභාව වැනි ඒවාත් සම්බන්ධ කරගෙන ඒකාබද්ධ මණ්ඩලයක් හැටියට මේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යා යුතුයි කියලා මා කල්පනා කරනවා.

ඊළඟට, තව වැදගත් ප්‍රශ්නයක් තමයි, ජලබස්නා ප්‍රදේශ. ගංවතුර ඇතිවීමේදී සහ අධික වර්ෂාපතන අවස්ථාවලදී ජලය බැසයාම සඳහා අපි තෙත් කලාපයක් ඉතුරු කරගන්න ඕනෑ; තෙත් කලාපයක් තියා ගන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ ගංවතුර ඊට වඩා භයානක තත්ත්වයකින් ඇති වෙනවා. අද මේ ආසනවල විශේෂයෙන් පෙනෙන්න තිබෙන්නේ ඒ අත්‍යවශ්‍ය තෙත් බිම් අනවසර පදිංචිකරුවන් අල්ලා ගෙන ඉන්නා බවයි. ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

ඒ නිසා ඒ ගොල්ලන්ට විකල්ප ඉඩම් දීලා හෝ එම තෙත් බිම් රැකගැනීමේ යම් කිසි ව්‍යාපාරයක් අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, මම වාරිමාර්ග ඇමති වශයෙන් කටයුතු කළ කාලයේ මැලේසියාවට ගියා. ඒ අවස්ථාවේදී මම දැක්කා, තෙත් බිම් සහිත කලාපවල කොයි විධියට ජලය සංරක්ෂණය කළ යුතුද, කොයි විධියට ඉඩම් ඇති කරගත යුතුද ආදී ප්‍රශ්න හොයා බලා පර්යේෂණ කර වැඩ කරන ආයතන තිබෙන බව. ඒ ආයතනත් එක්ක සම්බන්ධ වෙලා අපි වැඩ කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානය උඩරට ප්‍රදේශවලට ඉතාමත් වැදගත් වන කරුණකට යොමු කරවනවා. අද ඒ ප්‍රදේශවල විශාල කුඹුරු තිබෙනවා. නමුත්, විවිධ හේතුන් නිසා අද ඒවා සංවර්ධනය වෙන්නේ නැහැ. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මේ පිළිබඳව හොඳින් දන්නවා. මහනුවර දිස්ත්‍රික්කයේ 50ට 50 වාගේ කුඹුරු ඉඩම් තිබෙනවා. නමුත්, ඒවා පුරන් වෙලා. එම නිසා ඒ ඉඩම් අත්හැර දමා තිබෙන්නේ. ඒ ඇයි? මොකද, ඒ කුඩා ඒකකවලින් ආර්ථික නිෂ්පාදනයක් ගන්න බැහැ. ඒක එක හේතුවක්.

අනික් කරුණ මෙයයි. අපි ගොඩක් මහන්සි වුණත්, ඒ පළාතේ වී බුසලකින් වැඩිම අස්වැන්නක් වශයෙන් ගන්න පුළුවන් වන්නේ බුසල් 30ක් හෝ 40ක්. පොළොන්නරුව, අනුරාධපුරය දිස්ත්‍රික්කවල වාගේ බුසල් 80, 90 අස්වැන්නක් ගන්න බැහැ. එතකොට ඒක අපේ ප්‍රදේශවලට ආර්ථික වශයෙන් සාර්ථක ක්‍රියාවලියක් නොවෙයි.

ඊළඟ කාරණාව, පාරම්පරික සම්බන්ධතා. අපේ හිතවත් ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් මේ සම්බන්ධයෙන් දන්නවා. අද ගොවියෝ අද එන්න කැමැති නැහැ. කුඹුරු පනත තිබුණත්, විවිධ සමාජ හා වෙනත් හේතු නිසා අද ගොවියෝ අද කුඹුරු කරන්න කැමැති නැහැ. ඉඩම් හිමියා ඇවිල්ලා කුඹුරු කරන්නේත් නැහැ. ඒකට හේතුවක් වන්නේ අපේ සමාජ පරිණාමයේ විවිධ දේවල් සිද්ධ වීම. බොහෝදුරට අද උඩරට ප්‍රදේශවල මිනිසුන්ට ඉඩම් නැහැ. විශේෂයෙන් මැද පන්තියට. අද ඒ ප්‍රදේශවල ගෙයක් හදා ගන්න ඉඩමක් දෙන්න හරිම අමාරුයි. එහෙම නේද, ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි? ඒ සඳහා එක්කෝ තේ වතුවලින් දෙන්න ඕනෑ. නමුත්, ඒ ඉඩම් දුර වැඩියි. එම නිසා ඒවාට මිනිසුන් කැමැති නැහැ. දැන් හන්තානේ අපේ ව්‍යාපාරයක් තිබෙනවා. ඒක තව දීර්ඝ කරන්න කියලා ලොකු ඉල්ලීමක් තිබෙනවා. මොකද, මැද පන්තියට ඉන්න තැන් නැහැ; ඉඩම් නැහැ. නමුත්, ඔවුන්ට ඉහළට යන්නත් අවශ්‍යයි. ගරු චමල් රාජපක්ෂ මැතිතුමනි, මේ ප්‍රදේශයේ සියයට 30ක් 40ක් තිබෙන්නේ පුරන් වූ ඉඩම්. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මේ ගැන මොනවා හරි කරන්න ඕනෑ. දැනට තමුන්නාන්සේලා පිළිගන්නා ප්‍රතිපත්තිය තමයි, පර්චස් 10. ගෙයක් හදා ගන්න පර්චස් 10කට ඉඩ දෙනවා. නමුත්, ඒක යල් පැනපු ක්‍රමයක්. ඊට වඩා හොඳයි, මේවා ගැන සොයා බලා එක්කෝ ඒ මිනිසුන්ට සංවර්ධන කටයුතු සඳහා විශාල වශයෙන් ඉඩම් ලබා දෙනවා නම්. එහෙම නැත්නම්, තමුන්නාන්සේලා මේවා භාර ගෙන යම් කිසි ශාස්ත්‍රීය ක්‍රමයකට ඒවා දියුණු කරන්න ඕනෑ. එහෙමත් නැත්නම්, පෞද්ගලික අංශයට ඒවා මිලදී ගෙන දියුණු කරන්න ඉඩ දෙන්න. මොනවා වුණත් අද මේ සම්බන්ධයෙන් අර්බුදයක් තිබෙනවා. විශේෂයෙන් උඩරට ප්‍රදේශවල ජීවත් වන බොහෝ ජනතාවට - වැඩියෙන්ම නැඟී එන මැද පන්තියට- ගෙවල් නැහැ. එතකොට ඉතිරි වෙලා තිබෙන ඉඩකඩම්වල මිල අහස උසට නඟිනවා. එම නිසා අද පොඩි මිනිහෙකුට ඉඩමක් ගන්න බැහැ. ඒ හින්දා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම උඩරට ප්‍රදේශයේ තිබෙන කුඹුරු ඉඩම්වල අනාගතය ගැන මොකක් හරි තීරණයක් ගන්න කියලා.

අද අපි සංවර්ධනය ගැන කොම්පණ කථා කළත්, factory එකක් හදන්න ඉඩම් නැත්නම්, ගෙයක් හදා ගන්න ඉඩම් නැත්නම්, මිනිසුන්ට ගොවි සමුපකාරයක් හදා ගෙවල් ටිකක් හදා ගන්න විධියක් නැත්නම් සංවර්ධනය ගැන කථා කරලා වැඩක් නැහැ. ඒ හින්දා මහනුවර දිස්ත්‍රික්කයේ ජීවත්වන පුරවැසියකු හැටියට විශේෂයෙන් මම, ඒ වාගේම අපි ඔක්කෝම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා, නිෂ්පාදනය අතින් ඉතාම පහළ මට්ටමේ තිබෙන උඩරට ප්‍රදේශයේ ඉඩම් භාර ගෙන මේ සඳහා මොකක් හරි වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා.

අවසාන වශයෙන් මම මේ කරුණ කියන්න කැමැතියි. අපේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඓතිහාසික වශයෙන් වියළි කලාපයේ -dry zone එකේ- තමයි බොහෝදුරට වැඩ කළේ. වැව් හැදුවා, මිනිසුන් ගෙන ගිහින් පදිංචි කළා. ඒ කටයුතු සියයට 100ක්ම වාගේ තිබෙන්නේ වියළි කලාපයේ. නමුත්, වෙන රටවල වාරිමාර්ග දෙපාර්තමේන්තු තෙත් කාලපයේ කටයුතුත් කරන්න ඕනෑ. ඒ තැන්වලත් වැව් ටික හදා, ඒ තැන්වලත් නිෂ්පාදනය වැඩි කරලා, බෝග වගාව විවිධාංගීකරණය කරලා අලුත් විධියකට මේ දිහා බලන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ හින්දා ඔබතුමා වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්කත් මේ සංවාදයේ යෙදී සාමූහික ව්‍යාපාරයක් හැටියට මේ අගනා කටයුත්ත ඉදිරියට ගෙන යන්න කියලා මම යෝජනා කරනවා. මේක ඉතාමත්ම වැදගත්, ඒ වාගේම අපට සතුටුවන්න පුළුවන් අංශයක්.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

කොළඹ අවට ප්‍රදේශවලට ගියාම, තදාසන්න ප්‍රදේශවලට ගියාම අපි දන්නවා යම් කිසි වැඩක් සිද්ධ වෙන බව. නමුත්, එක ප්‍රශ්නයක් තිබෙනවා ගරු ඇමතිතුමනි. හුඟක් දෙනෙක් බට දැමීම වැනි දේවලට පාරවල් කඩනවා; පාරවල් හදනවා; කාණු හදනවා. නමුත්, ඒ බට ටික දැම්මාට පස්සේ, ඒ වැඩ ටික කෙරුණාට පස්සේ එහෙමම දමලා යනවා. එහෙම නැත්නම්, ඉතාම ප්‍රාථමික විධියට තමයි ඒවා නැවත පුරවලා යන්නේ. ඒ නිසා පුරවැසියන් තුළ ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ ගොල්ලන්ගේ ගෙවල් ඉස්සරහ තිබෙන පාරවල් මේ විධියට කඩලා දමනවා. නමුත්, ඉහළම මට්ටමින් ඒවා නැවත ප්‍රතිසංස්කරණය කරලා දෙන්නේ නැහැ. ඒ නිසා ඒ කරුණ දෙසත් අවධානය යොමු කරන්න. තමුන්නාන්සේලාගේ වැඩේ කරගත්තාට පස්සේ ඒ විධියට වැඩ කරලා යන්න එපා. අවට ඉන්න මිනිසුන්ටයි, ඒ ගම්මුන්ටයි ඒ තැන් කලින් තිබුණු විධියටම හදලා දෙන්න.

ගරු ඇමතිතුමනි, නැවත වරක් ඔබතුමාට මම ස්තුති වන්ත වෙනවා. අපට සතුටු වෙන්න පුළුවන් අමාත්‍යාංශයක් වාගේම, කාර්යක්ෂම නිලධාරි මණ්ඩලයක් ඔබතුමාට ඉන්නවා. ඒ නිසා, විරුද්ධ පක්ෂයේ හිටියත් ඔබතුමාට ස්තුතිය පුදකිරීමේ යුතුකමක් අපට තිබෙනවා. ස්තුතියි.

[අ.භා. 2.32]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொதுவழங்கல் அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Non Cabinet Minister of Economic Reforms and Public Distribution)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා විසින් මෙහෙයවන අමාත්‍යාංශය යටතේ තිබෙන, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඒ නම, "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" හැටියට වෙනස් කිරීම සම්බන්ධයෙන් අපේ කිසිම විවාදයක් නැහැ. අපේ ආචාර්ය සරත් අමුණුගම මන්ත්‍රීතුමා කිව්වා, "නම විතරක් නොවෙයි, වැඩ පිළිවෙළ සම්බන්ධයෙනුත් යම් කිසි වෙනසක්ම සිද්ධ වෙන්න ඕනෑය" කියලා.

ගරු සරත් අමුණුගම මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ අපි කවුරුත් පිළිගන්නවා, පාඨලී චම්පික රණවක ඇමතිතුමා අපේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්න කාර්යක්ෂම ඇමතිවරයෙක් කියලා. එතුමා පැහැදිලි කර දීපු විධියට පාඩු ලබන ආයතන ලාභ ලබන ආයතන බවට පරිවර්තනය කරලා ඒ වැඩ කටයුතු කරගෙන යන්නේ කොහොමද කියන එක එතුමා පෙන්වා දීලා තිබෙනවා. එතුමා මීට කලිනුත් ලංකා විදුලිබල මණ්ඩලය ලාභ ලැබූ ආයතනයක් බවට පත්කර පෙන්වා දී තිබෙනවා. ඒ නිසා, එතුමාගේ දැක්ම පිළිබඳව අපට සන්තෝෂ වෙන්න පුළුවන්. එතුමාගේ දැනගැනීම පිණිස කාරණා කිහිපයක් පැහැදිලි කළේ නැත්නම්, ඒ කරුණු වෙනස් කළ යුත්තේ කොහොමද කියන එක කිව්වේ නැත්නම් ඒක මගේ අතින් සිදු වන වැරැද්දක් හැටියට මා විශ්වාස කරනවා.

මම මේ ආයතනයේ දැක්ම මොකක්ද කියලා ඒ website එකෙන් බැලුවාම එහි තිබෙන්නේ, "ගංවතුරෙන් තොර වූ වාසස්ථාන ඇති කිරීමට වග බලා ගැනීම වස් කාර්යක්ෂම සහ ඵලදායී ජලාපවහන පද්ධතිවලින් යුක්ත පහත් ඉඩම් පිළිබඳ අභිවර්ධනයක් සහ ප්‍රවර්ධනයක් ඇති කිරීම සඳහා විශිෂ්ට වූද, වේගශීලී වූ ද ඉංජිනේරුමය සංවිධානයක් වශයෙන් පිළිගනු ලැබීම" කියලා.

මෙතැනදී වෙන්නේ, මිනිස්සු ඉන්න තැන් ගංවතුරින් යට නොවන විධියට, ජලය කාර්යක්ෂමව බැස යන ආකාරයට පහත් බිම් සංවර්ධනය සඳහා දායක වන ඉංජිනේරු ආයතනයක් බවට ඉදිරියට ඒමයි. ඒක තමයි බලාපොරොත්තුව. ඒක හොඳ දැක්මක්. ගොඩක් මහන්සි වෙලා, බොහෝ දෙනෙක් එකතු වෙලා, "මේ වාගේ සේවයක් තමයි මේ ආයතනයෙන් වෙන්න ඕනෑ" කියලා හොඳින් හිතලා මේ දැක්ම අනිවාර්යයෙන්ම හදන්න ඇති.

හැබැයි ගරු ඇමතිතුමනි, මේ ආයතනයේ සමහර අය වැඩ කරන්නේ මේ දැක්මට අනුව නොවෙයි, තමන්ගේ දැක්මකට අනුවයි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපි හොයලා බලන්න ඕනෑ; ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේ අවස්ථාවේදී මම ඒ සම්බන්ධව දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, මා ළඟ සාක්ෂි තිබෙනවා, අවශ්‍ය නම්, ගම් තිබෙනවා. ඒ කෙසේ වෙතත්, මේ පිළිබඳව මම කාරණා තුනක් ඉදිරිපත් කරන්නම්. මේ ඉදිරිපත් කරන්නේ බොහෝ කාරණාවලින් කිහිපයක් පමණයි. කරුණාකරලා මේ පිළිබඳව සොයා බලන්න.

පළමුවැනි කරුණ මෙයයි. මේ තෙත් බිම්, එහෙමත් නැත්නම් ජල රක්ෂිත අපට ඒ ආකාරයෙන් තියාගන්න අවශ්‍ය නම්, මිනිසුන්ගේ ගෙවල්වලට ගංවතුර ගලන්නේ නැති විධියට ඒ පහත් බිම් සංවර්ධනය කරන්න ඕනෑ නම් ඒ වැඩ පිළිවෙළ මොකක්ද කියලා මේ ඉංජිනේරුවරු හොඳට දන්නවා.

උදාහරණයක් හැටියට කිව්වොත්, මේ පාර්ලිමේන්තුව අසල නිවාස සංකීර්ණයක් ඉදි කරනවා. ඒ ඉදි කරන නිවාස සංකීර්ණය සඳහා වන ඉඩම පුරවන්න අවසර දීලා තිබෙන්නේ සියයට 40යි. ඉතිරි සියයට 60 පුරවන්න අවසර දීලා නැහැ. මුහුදු වැලිවලින් තාවකාලිකව පුරවන්න කියලා තිබෙනවා, වාහන හරවන්න සහ යකඩ කූරු store කරන්න. නමුත්, ඇත්ත තත්ත්වය මේකයි. එම ඉඩම සියයට 100ක්ම පුරවලා තිබෙනවා. සියයට 40ක් පුරවලා බිල්ඩිම හදලා තිබෙනවා. ඊට අදාළ lab test report එක මට ඇවිල්ලා තිබෙනවා, සියයට 90ක් compact කරලා තිබෙනවා කියලා. තාවකාලිකව පාවිච්චි කරන්න දුන් කොටස මුහුදු වැලි දමලා සියයට 90ක් compact කළාම, ජල රක්ෂිතයකින් වෙන්න ඕනෑ දේ වෙන්නේ නැහැ. ඒ හරහා වෙන්නේ, වැසි ජලය කළමනාකරණය කර ගන්න බැරිව අහල පහළ ගෙවල් ගංවතුරින් යට වන එකයි. මේ ආයතනයේ දැක්ම එය නොවන බව අපි දන්නා නිසා, මෙය කාගේ දැක්මද කියන එක සොයා බලන්න ඕනෑය කියලා ගරු ඇමතිතුමාට මා මේ වෙලාවේ මතක් කරනවා.

තවත් උදාහරණයක් තමයි, ඇළ මාර්ග. ඇළ මාර්ග කපලා, සුද්ද කරලා යථා තත්ත්වයට පත්කර ගන්නා අවස්ථාවේදී පාර්ලිමේන්තුව කිට්ටුවම තිබෙන ඇළ මාර්ගයක් බලෙන් පුරවලා තිබෙනවා. මේ පිළිබඳව මම මීට කලිනුත් කථා කළා. එම ඇළ පුරවන්න කලින් තිබුණේ කොහොමද, පිරෙව්වාට පස්සේ තිබෙන්නේ කොහොමද කියලා බලන්න එම ඇළේ පින්තූරත් තිබෙනවා. මේ ගැන සොයා බලනකොට මුලින්ම අපට කිව්වා, "අපට මායිම සොයා ගන්න බැහැ" කියලා. ඊට පස්සේ කිව්වා, "නැහැ, නැහැ, වැරදිලා කැපුණා. එම නිසා gabion දාලා හදාගන්න කිව්වා" කියලා. ඊට පස්සේ, තුන්වැනි වතාවට අපට ලියුමක් එවලා කියනවා, "නැහැ, ඇත්ත වශයෙන්ම එහෙම නොවෙයි වුණේ, අපට මේකේ මායිම සොයා ගන්න බැහැ. මායිම සොයා දෙන්න කියලා Survey Department එකට කිව්වා" කියලා. සමහර නිලධාරින් එවැනි ක්‍රියා කරන නිසා ජනතාව තුළ එම ආයතනය පිළිබඳව තිබෙන විශ්වාසය පලුදු වෙනවා. එම නිසා මම ගරු ඇමතිතුමාට කියනවා, කරුණාකර මේ පිළිබඳව සොයා බලා ඒවා යථා තත්ත්වයට පත් කරන්න කියලා. මේ ආයතනයේ නම වෙනස් කරනවා වාගේම, සමහරුන්ගේ ඒ ක්‍රියා කලාපයත් වෙනස් වෙන්න ඕනෑ.

අනිත් කාරණය මේකයි. දැන් කටුඇළ සම්බන්ධයෙන් කථා කළා. නුගේගොඩ ප්‍රදේශයේ තිබෙන කටු ඇළ ගැන කථා කරනකොට, එහි සමහර තැන් හොඳට සංවර්ධනය වෙලා ඉදිරියට ගියාට, එසේ නොවන තවත් සමහර තැන් තිබෙනවා. උදාහරණයක් හැටියට ගරු ඇමතිතුමාට මම පෙන්වා දෙන්න කැමැතියි, කෝට්ටේ එදිරිසිංහ මාවතේ ඉඳලා කට්ටිය හන්දිය දක්වා කොටස. වසර ගණනාවක් තිස්සේ අපි උත්සාහ කරනවා මේ වැඩේ කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හොඳයි.

නමුත්, ඒක කරන්න යනකොට අපට නොයෙකුත් බාධක පැමිණ තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපි හිරවෙලා ඉන්නේ. ඒ සඳහා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න පුළුවන් නම්, අපට ඒ කටයුත්ත අවසන් කරන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා.

ගරු සරත් අමුණුගම මන්ත්‍රීතුමා වරාය නගරය ගැන කථා කළා. ඒක හොඳ දෙයක් කියලාත් කිව්වා. අපි සියලුදෙනා ඒක පිළිගන්නවා. එහි වැඩ කටයුතු යම් කිසි කාල පරිච්ඡේදයක් ප්‍රමාද වුණාය කියලා එතුමා කිව්වා. ඔව්, එහෙම වුණා. ඒකට හේතුව තමයි, කලින් අත්සන් කර තිබුණු ගිවිසුමට අනුව එහි අක්කර 50ක කොටසක් විදේශීය කොම්පැනියකට සින්නක්කරයට දෙන්න එකඟ වෙලා තිබුණ එක. අපි විපක්ෂයේ ඉන්නකොට ඡන්ද පොරොන්දුවක් හැටියට කියපු දෙයක් තමයි, අපේ ඉඩම් විදේශිකයන්ට විකුණන්න සූදානම් නැහැ කියන එක.

ඒ නිසා තමයි ඒ ගිවිසුම පිළිබඳව නැවත සාකච්ඡා කරලා, සින්නක්කරයට විකුණන්න එකඟ වෙලා තිබුණු Port City එකේ අක්කර 50 එසේ නොවිකිණීම සඳහා නැවත ගිවිසුම්ගත වුණේ. ඒක යම්කිසි හේතුවක් නිසා වසරකින් පරක්කු වූ බව පිළිගන්නවා. නමුත්, එසේ අවුරුද්දක වාගේ කාලයකින් වූ ප්‍රමාදයට වඩා රට වෙනුවෙන් ඉදිරියේ දී -අනාගතයේ දී- අපට කරන්න පුළුවන් වන කාර්ය භාරය ඉතා ඉහළයි කියා මා විශ්වාස කරනවා. ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා වරාය නගරය ඉදි කිරීම සම්බන්ධ කටයුතු ඉතා විශිෂ්ට ලෙස ඉදිරියට ගෙන ගොස් තිබෙනවා. කලට වේලාවට අනුව ඒ වැඩේ අවසන් කර තිබෙනවා. දැන් අපට ඉතිරි වෙලා තිබෙන්නේ ඊට අදාළ නීති සම්පාදනය කිරීමයි. ඒක ගරු අගමැතිතුමාගේ අධීක්ෂණය යටතේ සිද්ධ වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මා ඔබතුමාට කියන්න සන්තෝෂයි, ඉතාම හොඳ තැනකට අප ඇවිත් සිටින බව. අපි විශ්වාස කරනවා, වරාය නගරයට අදාළ නීතිය පනත් කෙටුම්පතක් හැටියට තවත් සති කිහිපයකින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න පුළුවන් වන තත්ත්වයක අප සිටින බව. දැනට භෞතික වශයෙන් සම්පූර්ණ කර තිබෙන වරාය නගරයේ වැඩ කටයුතු ආරම්භ කරන්න ඒ හරහා අපට පුළුවන් වේවි. අදාළ නීතිය සහ රජයේ අනෙක් බදු ප්‍රතිපත්ති හරහා ආයෝජකයන් එතැනට රැගෙන ඇවිත් වරාය නගරය මූල්‍ය, තාක්ෂණික, සංචාරක නගරයක් හැටියට නිර්මාණය කර ගන්න අපට පුළුවන් වේවි. මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.2.43]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දිනයේ ඉදිරිපත් කර තිබෙන්නේ, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව කියන නමෙහි "ගොඩ කිරීමේ සහ" කියන කොටස ඉවත් කරලා එය "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" බවට පත් කිරීම සඳහා වන යෝජනාව ඇතුළත් සංශෝධන පනත් කෙටුම්පතයි. ඒ යෝජනාව සම්බන්ධයෙන් මෙහිදී අපට ගරු ඇමතිතුමාගෙන් මූලික වශයෙන් පැහැදිලි කර ගන්න තිබෙන්නේ, පහත් බිම් සහ ඉඩම් ගොඩ කිරීමේ ක්‍රියාවලියට අනුමැතිය, අවසරය ලබා දෙන කටයුත්ත මීට පසුව කෙරෙන්නේ කොහොමද කියන එක ගැනයි. එක්කෝ, ඒ කටයුත්තත් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ කාර්ය භාරයක් හැටියටම කරනවාද? මෙතැන ගැටලුව තිබෙන්නේ "ගොඩ කිරීමේ සහ" කියන වචනවල නොවෙයි. ගොඩ කිරීමේ ක්‍රියාවලියේයි ගැටලුව තිබෙන්නේ. එතුමාගේ කතාවේ දී පහත් බිම් ගොඩ කිරීම වාගේ දේවල් පරිසර හානි සිදු වන ආකාරයට සිදු කරන්නේ නැහැ කියා කිව්වා වුණත්, එතුමාම පිළිගත්තා අවිධිමත් ක්‍රියාවලියක් සිද්ධ වනවා කියන එක. ආණ්ඩුවේම සාමාජිකයකු වන ගරු හර්ෂ ද සිල්වා අමාත්‍යතුමා ඒ අවිධිමත් ක්‍රියාවලිය පිළිබඳව උදාහරණ ප්‍රමාණයක් එතුමාට පුළුවන් හැටියට ඉදිරිපත් කළා. ඒක තමයි යථාර්ථය. කෝට්ටේ නගර සභා සීමාවේම උදාහරණයක් ගැන මා කියන්නම්. ගරු හර්ෂ ද සිල්වා අමාත්‍යතුමාත් අවස්ථා ගණනාවකදීම පාර්ලිමේන්තුවේ දී මේ කාරණය මතු කළා. කෝට්ටේ නගර සභා සීමාවේ විශාල apartments අවසර ගත් ප්‍රමාණයට වඩා වැඩියෙන් ඉදි කරනවා, විශාල piling කරලා. ඒ නිසා පරම්පරා ගණනක් තිස්සේ සින්නක්කර ඉඩම් තිබෙන සාමාන්‍ය මිනිසුන්ගේ ඉඩම් ඉරි තළා ගිහින්, ඒ මිනිසුන්ට ඉන්න හිටින්න තැන් නැති, කර කියා ගන්න දෙයක් නැති තත්ත්වයට පත් වී තිබෙනවා. කෝට්ටේ ප්‍රදේශයේම සිද්ධ වන එවැනි ඉදි කිරීම් තිබෙනවා. ඒවාට කවුද අවසර දෙන්නේ? ඒවා සම්බන්ධයෙන් අවසර ගත් සීමාවේ නොවෙයි - කොළවල තිබෙන දේවල් නොවෙයි- යථාර්ථය ලෙස සිද්ධ වන්නේ. එහෙම නම්, දැන් ඉඩම් ගොඩ කිරීමේ කටයුත්තට අවසර දෙන ආයතනත් සමහර වෙලාවට ඉතාම දූෂිත ආයතන බවට පත් වෙලා තිබෙනවා. සමහර විට අවසර ගන්නා ප්‍රමාණය නොවෙයි ගොඩ කරන්නේ. ඒක බරපතළ ප්‍රශ්නයක්. පුංචි මිනිසුන් UDA එකට හෝ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයට හෝ ගිහිල්ලා කරුණු කිව්වාට ගණන් ගන්නේ නැහැ. මොකද, ලොකු ආයතන තිබෙනවා; ලොකු ව්‍යාපෘති තිබෙනවා. සමහර අය, මහා සමාගම් අයිති අයයි. සමහර අය විදේශික සමාගම්වල අයයි. එතකොට සාමාන්‍ය මිනිසුන්ට යන එන මං නැති වෙනවා. මා උදාහරණයක් හැටියට ගත්තොත්, ඔබතුමාත් දන්නවා දැනටම දෙල්කඳ ප්‍රදේශයේ අක්කර තුනක් ප්‍රමිතියකින් තොරව ගොඩ කර තිබෙන බව. එතකොට ඒවා සම්බන්ධයෙන් වග කියන්නේ කවුද? ඒවා ඔහේ සිද්ධ වෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ වාගේම වෙනත් ආයතන ඉදි කිරීමක් කරනවා නම් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන නාගරික සංවර්ධන අධිකාරියෙන් - UDA එකෙන් - තමයි අවසර ගන්න ඕනෑ. වෙනත් ආයතන ඉදි කිරීම් කරනවා නම්, සැලසුම් අනුමත කරන්න ඕනෑ UDA එකෙන්. හැබැයි, UDA එක සකස් කරන සැලසුම් අනුමත කරන්නේ කවුද?

UDA එකම කරන ව්‍යාපෘති තිබෙනවා. ඉතින් ඒවායේ සැලැස්මත් ඒ විධියට අනුමත කරගෙන තිබෙනවාද, නැද්ද කියලා කොහොමද දැන ගන්නේ? උදාහරණයක් විධියට ගත්තොත්, කොලොන්නාවේ, සාලමුල්ල ව්‍යාපෘති කරනවා, UDA එකෙන්. හේනමුල්ලේ, තොටළඟ ව්‍යාපෘති කරනවා. එතකොට ඒ ව්‍යාපෘතිවලට අනුමැතිය දෙන්නේ කවුද? ඒ සැලසුම් අනුමත කර

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගත්තාද, නැද්ද කියලා හොයන්න කෙනෙක් නැහැ. දැන් තිබෙන මූලික ප්‍රශ්නය තමයි ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ඓතිහාසික වශයෙන් යම් කාර්ය භාරයක් කළා නම් නීතිමය වශයෙන් ඒ කාර්ය භාරය ඉදිරියටත් කරන්නේ කවුද කියන එකයි. ඒ කාර්ය භාරයේ කොටස අඩු කරලා තිබෙනවාද, නැද්ද කියන එක දැන් පැහැදිලි කර ගන්න ඕනෑකම තිබෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

කාර්ය භාරයේ කිසිම වෙනසක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. "ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය" කිව්වාම, වැරදි අර්ථ නිරූපණයක් එනවා ඉඩම් ගොඩ කරන්නයි කටයුතු කරන්නේ කියලා. අපි හැකිතාක් දුරට ඉදිරි කාලයේ දී යම් නිශ්චිත hydrological plan එකකට අනුකූල වන පරිද්දෙන් ඒ සංවර්ධන කටයුතු විධිමත් කිරීමයි සිද්ධ කරන්නේ. නාගරික සංවර්ධන අධිකාරිය කරන සෑම ඉදි කිරීමක්ම නාගරික සංවර්ධන අධිකාරියේ නීති රීතිවලට අනුකූලවයි කෙරෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක තමයි. දැන් මෙතැන තිබෙන මූලික ප්‍රශ්නය මෙයයි. ඔබතුමා ඒ සහතිකය පාර්ලිමේන්තුවට දෙනවා. දැන් මේ ආයතනයේ නම වෙනස් කිරීමක් කෙරෙනවා. නම වෙනස් කිරීම වාගේම දැන් මේ ආයතනයේ කාර්ය භාරය පිළිබඳව යම් සහතිකයක්, වගකීමක්, විධිමත් ක්‍රමවේදයක අවශ්‍යතාවක් ඔබතුමාත් දකිනවා. ඒක තමයි මෙතැන තිබෙන ගැටලුව. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම දැනට නාගරික සංවර්ධන ප්‍රදේශවල පාරම්පරිකව, සාම්ප්‍රදායිකව ඉඩම් අයිතිය සහිතව ජීවත් වන සාමාන්‍ය ජනතාවක් ඉන්නවා. එතකොට මහා පරිමාණ ව්‍යාපෘති හදලා ඒවායින් apartment හදන කොට අර pilingවලින් වන බලපෑම ඒ සාමාන්‍ය ජනතාවට සිද්ධ වෙනවා. හැබැයි, ඒ apartment අවට ජීවත් වෙන කොට ඒක ඒ ගොල්ලන්ගේ අයිතියක් නොවන හැටියටයි සැලකිලා තිබෙන්නේ. ඒ ගොල්ලන් එක්කෝ සාමාන්‍ය විධියට වන්දියක් අරගෙන යන්න ඕනෑ. යන්න අකමැති අය ඕනෑ තරම් ඉන්නවා. ඒ ගොල්ලන්ට කරකියා ගන්න දෙයක් නැහැ. ඒ ගොල්ලන්ට අභියෝග කරන්න බැහැ. හේතුව, සැලසුමට අනුව කටයුතු සිදු නොවීමයි. ඒ සැලසුමට අනුව කටයුතු සිද්ධ වෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. එතැනදි ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා ඇමතිතුමාත් කිව්වා වාගේ සැලසුම අනුමත කර ගැනීම පමණයි එතැනදි සිදු වන්නේ. සැලසුමෙන් එහා ගිහිල්ලා ගොඩ කිරීම්, ඉදි කිරීම්, piling, ඒවායින් වන හානි විශාල පරිමාණයෙන් සිද්ධ වෙනවා. ඔබතුමා පාර්ලිමේන්තුවේ ඒ සම්බන්ධ රැස්වීමක් කැඳවනවා නම්, සාක්ෂි සහිතව, ඡායා රූප සහිතව, වීඩියෝ දර්ශන සහිතව ගෙනැල්ලා ඔබතුමාට පෙන්වන්න පුළුවන් . දැන් ඒ මිනිස්සු අන්ත අසරණ වෙලා ඉන්නේ. මොකද, සමහර ඉදිකිරීම් කරන සමාගම්වල වැඩ කරන්නේ විදේශිකයෝ. ඒ ගොල්ලන් මෙහේ ඇවිල්ලා වෙනම වැඩ කරනවා. ඒ අයට අපේ භාෂාව තේරෙන්නෙත් නැහැ. එක්කෝ ඔබතුමන්ලාගේ නිලධාරින් ප්‍රමාණවත් නැහැ. එහෙම නැත්නම් ඒ නිලධාරින් ඇවිල්ලා බලලා, අර ගොල්ලන්ගෙන් දත්ත අරගෙන යනවා. මෙන්න මේ ගැටලුව තදට තිබෙනවා. ඔබතුමා කියන එක ඇත්ත. ඉතිහාසයේ ඉඩම් ගොඩ කිරීමේ ක්‍රියාවලිය පුංචියට සිද්ධ වුණු තත්ත්වයක් යටතේ, ඒක අද වචනයෙන් ගොඩ කිරීමේ කටයුත්ත නොවුණාට, අද තිබෙන තත්ත්වය වෙන එකක්. අද ඉතා කුඩා ඉඩම් කොටසක අහස් මාළිගා හැදෙනවා, අහස් මාළිගා යට ඉන්න පුංචි මිනිස්සු ගැන තඹ ශතයකවත් හෙවිල්ලක් නැතිව. අන්න ඒ ප්‍රශ්නයට උත්තරයක් ඔබතුමන්ලා හොයා ගන්න ඕනෑ. ඒ ගොල්ලන්ගේ ආරක්ෂාව, රැකවරණය ගැන හොයන්න ඕනෑ. විදේශ රටවල මහා පරිමාණ ව්‍යාපෘති කරනවා, apartment හදනවා, ඉදිකිරීම් කරනවා. නමුත්, ඒවා කරද්දී පළමුවෙන්ම තැන දෙන්නේ ජනතාවගේ ආරක්ෂාවටයි. සමහර buildingsවල තිබෙන සංස්කෘතිකමය වටිනාකම්වලට වාගේම ඒ ඒ ප්‍රදේශවල සිටින අනෙක් අයගේ ආරක්ෂාව ගැන අදාළ ඉදිකිරීම් සමාගම් වැඩිපුරම සැලකිලිමත් වෙනවා. අඩු තරමින් dust එකවත් යන්නේ නැති වෙන්න ආවරණ සකස් කර ගෙන තිබෙනවා අපි දැකලා තිබෙනවා. නමුත්, මේක එහෙම නොවෙයි. ඒවා ගැන ශතයකට මායිම් කරන්නේ නැහැ. ඒ මිනිස්සු ඉදිරිපත් කරන පැමිණිලි ගැන වග විභාගයක් නැහැ. අන්න ඒ තත්ත්වය ඉතාම බරපතළයි. ඒක තමයි ඔබතුමාට කියන්න තිබෙන මූලිකම කාරණාව. දැනටත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ගැන බලන්න කියලා. දෙල්කඳ ප්‍රදේශයේත් අක්කර 3ක් විතර ගොඩ කරලා තිබෙනවා. ප්‍රමිතියෙන් තොරයි. ඒවා කොහොම කළාද කියලා කවුරුවත් දන්නේ නැහැ. ඒ වාගේ තැන් තිබෙනවා.

ඊළඟට, ඔබතුමාම කිව්වා SLRDC එකෙන් පාර්ලිමේන්තුව ළඟ කරපු වැඩ කටයුත්ත ගැන. අපි වාගේම ඔබතුමාත් දැක්කා, ඒකට යට කරපු මුදල් ප්‍රමාණය, සැලසුම් ගැන හිතුවොත් කොපමණ දුරට ඒ කටයුත්ත සාර්ථකද කියන එක. එක වෙලාවක ඒක පාවෙන්න හැදුවා. යට වුණා.

ඊට පස්සේ ගල් පිරෙව්වා. දැන් තව විධියකට හදනවා. මා හිතන හැටියට දැන් තුන් වතාවක් පමණ හදලා තිබෙනවා. නමුත් ඒක එක වතාවේම හදන්න තිබුණු දෙයක්. එතැන සැලසුමක, ශක්‍යතා අධ්‍යයනයක මොකක් හෝ ගැටලුවක් තිබෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඒක පෞද්ගලික අංශයෙන් කළ නිර්මාණයක්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

පෞද්ගලික අංශයෙන් නිර්මාණය කරන දේ සඳහා වියදම දරන්නේ පෞද්ගලික අංශයෙන් නම්, SLLRDC එකට ප්‍රශ්නයක් නැහැ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඒක දෙවන වතාවේ කරද්දී අමාත්‍යාංශයෙන් බිම සකස් කර දුන්නා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මා හිතන හැටියට එතැන තිබෙන විශාලම කටයුත්ත බිම සකස් කර දෙන එකයි. මොකද, වතුරේ නේ හදන්නේ. උඩ පාවෙන තත්ත්වයෙන් එහාට ගිහින් බිම සකස් කර ස්ථාවර තත්ත්වයට හදලා දුන්නාට පස්සේ, පෞද්ගලික අංශයට වීදුරු රාමුව ගහන එක නම් එපමණ අමාරු වන එකක් නැහැ. එහි පවතින තාක්ෂණික තත්ත්වය ගැන මා දන්නේ නැහැ. නමුත් බැලූ බැල්මට පෙනෙන දේ තමයි, මොළය පාවිච්චි කර කරපු වැඩක් නොවෙයි කියන එක. පෞද්ගලික අංශය මොළය පාවිච්චි කළේ නැද්ද, රාජ්‍ය අංශය මොළය පාවිච්චි කළේ නැද්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. බැලූ බැල්මට පෙනෙන දේ තමයි මා ඔබතුමාට කිව්වේ.

විශේෂයෙන්ම වෙරළසංගහ ව්‍යාපෘතිය ගැන ඔබතුමා දන්නවා. එය අවශ්‍ය දෙයක්. ඒකේ යම් ප්‍රමාදයක් ඇතිවෙලා තිබෙනවා. ඒ කටයුතු ඉක්මන් කරන්න, කඩිනම් කරන්න කියාත්, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියාත් මා ඉල්ලීමක් කරනවා.

විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ UDA එක යටතේ සිද්ධවන බොහෝ විවෘත කිරීම් තිබෙනවා. මට අධීක්ෂණය වුණු දේවල් තමයි මා මේ ඉදිරිපත් කරන්නේ. Blocks තුනක් විවෘත කරනවා නම්, ඒ blocks තුන තුන් වතාවකට විවෘත කරනවා. ප්‍රචාරක වැඩසටහන් තමයි තිබෙන්නේ. ඒ පිළිබඳව ඔබතුමා සොයා බලන්න. අපේ රටේ තිබෙන ආර්ථික තත්ත්වයත් සමඟ, අපේ රට යන තත්ත්වයත් සමඟ එහෙම කරන එක කොපමණ දුරට ගැළපෙනවාද කියන එක ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මේ ආයතනයට තිබෙන රාජකාරිය, කාර්ය භාරය අහෝසිවෙලා නැහැ. ඒ කාරණය මා නැවතත් අවධාරණය කරන්න ඕනෑ. මහා පරිමාණ වශයෙන් සිද්ධ කරන දේවල් තුළින් අපේ සාමාන්‍ය ජනතාවගේ ඉඩම්වලට සිදුවන හානිය, ඔවුන්ගේ පැවැත්මට සිදුවන හානිය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

[பி.ப. 2.54]

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்திலே உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமையையிட்டு மகிழ்ச்சியடைகின்ற அதேவேளையில், இந்தக் காணி மீட்டல் எனும்போது, "யாரிடமிருந்து யார் காணியை மீட்பது?" என்றவொரு கேள்வியை வடக்கு, கிழக்குப் பகுதிகளை மையமாகக்கொண்டு கேட்கவேண்டியிருக்கின்றது. ஏனெனில், அங்கு மக்களுக்குச் சொந்தமான காணிகள் பல்வேறு அதிகாரசபைகளால், திணைக்களங்களால் கையகப்படுத்தப்பட்டிருக்கின்றன. ஆகவே, இந்தக் காணிகளை மீட்டல் தொடர்பான ஒரு விவாதத்தை இங்கு முன்வைக்க வேண்டியிருக்கின்றது. பல்வேறு விதமாக, பல கோணங்களிலே ஆராய்கின்றபொழுது முதலாவதாக, முல்லைத்தீவு மாவட்டத்தில் கேப்பாப்புலவு காணி மீட்டலானது சர்வதேசப் பிரசித்திபெற்ற ஒரு போராட்டமாக இப்பொழுது பரிணமித்திருக்கின்றது. அந்தக் காணிகளுக்குரிய ஆவணங்களை அந்த மக்கள் வைத்திருந்தும் யுத்த காலத்திலே அங்கு இராணுவம் கையகப்படுத்திய காணிகளை மீட்டெடுப்பதற்காக அந்த மக்கள் 2 வருடங்களுக்கு மேலாகப் போராடிக்கொண்டிருக்கிறார்கள். ஆகவே, இந்தக் காணி மீட்டல் சட்டமூலமானது இதற்குப் பொருத்தமானதாக அமைய வேண்டும். இது தொடர்பாக ஆக்கபூர்வமான நடவடிக்கையெடுக்கப்பட வேண்டும்.

அடுத்து, மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழ் கையகப்படுத்தப்பட்ட காணிகளை மீட்டல் தொடர்பான விடயத்தை முன்வைக்க வேண்டியிருக்கின்றது. மகாவலி 'எல்' வலய அபிவிருத்தி என்ற போர்வையில் யுத்தகாலத்திலே கள்ளத்தனமாக, கபடத்தனமாக வெளியிடப்பட்ட வர்த்தமானி அறிவித்தல்கள்மூலம் எங்களது மக்களுக்குச் சொந்தமான ஆயிரம் ஏக்கருக்கு மேற்பட்ட காணிகள் கையகப் படுத்தப்பட்டிருக்கின்றன. எமது மக்கள் பூர்வீகமாக வாழ்ந்த காணிகள் - அந்த விளைநிலங்கள் மகாவலி அபிவிருத்தித் திட்டத்தின்கீழ் கையகப்படுத்தப்பட்டுச் சிங்கள மக்களுக்குப் பகிர்ந்தளிக்கப்பட்டிருக்கின்றன. எனவே, இந்தக் காணிகளை மீட்டெடுக்கவேண்டிய போராட்டங்களை நடாத்தவேண் டியிருக்கின்றது. வனவளத் திணைக்களத்தினால் கையகப் படுத்தப்பட்ட காணிகளையும் மீட்டெடுக்க வேண்டியுள்ளது. இது சம்பந்தமாகவும் காணி மீட்டல் என்ற தலைப்பின்கீழ் கதைப்பது பொருத்தமாக அமையும்.

அங்கு குளங்கள் அபிவிருத்தி செய்யப்படுகின்றன. ஆனால், அந்தக் குளங்கள்மூலம் நீர்ப்பாசனம் செய்யப்பட வேண்டிய காணிகள் வனவளத் திணைக்களத்தினால் கையகப்படுத்தப்பட்டிருக்கின்றது. இந்த நிலையில் எவ்வாறு எமது மக்கள் விவசாயத்திலே முன்னேறுவார்கள்? அவ்வாறே, கால்நடை வளர்ப்பு என்பது யுத்தத்தின் பின்னர் அங்கு சிறந்த வருமானம் தருகின்ற ஒரு தொழிலாக இருந்தாலும், அந்தக் கால்நடைகளைச் சிறந்த முறையிலே பராமரிப்பதற்கு மேய்ச்சல் தரைகளை ஒதுக்குமாறு நாங்கள் கேட்கின் றபோதிலும், அவை சம்பந்தப்பட்டவர்களால் கையகப்படுத் தப்பட்டிருக்கின்றன. இவற்றை மீட்டெடுக்க வேண்டிய தேவையிருக்கின்றது. இவ்வாறான பல்வேறு விதமான மீட்டல் செயற்பாடுகள் அங்கு செய்யப்பட வேண்டியிருக்கின்ற வேளையிலே, இந்தச் சட்டமூலம் இன்று கொண்டுவரப் பட்டிருக்கின்றது. இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்தி கூட்டுத்தாபனம் (திருத்தம்) சட்டமூலம் என்பது அபிவிருத்திக்கான ஒரு தலைப்பாக இருந்தாலும் யுத்தத்திலே பாதிக்கப்பட்ட எமது வடக்கு, கிழக்குப் பிரதேசத்திலே ஆக்கிரமிக்கப்பட்ட காணிகளை அந்த ஆக்கிரமிப்பிலிருந்து நாம் மீட்டெடுக்க வேண்டிய ஒரு நிலையிலே இருக்கின்றோம்.

கௌரவ பிரதி அமைச்சர் புத்திக பதிரண அவர்கள் இப்பொழுது இங்கு இல்லாதபோதிலும், நான் ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். கௌரவ பிரதி அமைச்சர் அவர்கள் முல்லைத்தீவு மாவட்டத்திற்கு வருகை தந்திருந்தபொழுது முல்லைத்தீவு மாவட்டத்தின் அளம்பில் கிராமத்திற்கும் அவர் சென்றிருந்தார். அங்கு ஒரு பெண் 10 பெண்களை வைத்து தையல் தொழில் நிலையத்தை நடாத்திக்கொண்டிருக்கின்றார். தன்னுடைய தையல் தொழிலகத்தை விசாலமாக்குவதற்காக 4 அடி நிலத்தில் கொட்டகையை அமைப்பதற்கு எண்ணியிருந்தபோதிலும், சட்டம், சுற்றுநிருபம் என்பன அவருக்கு இடம் கொடுக்கவில்லை. ஆனால், இந்த மக்களுக்குச் சொந்தமான 1,000 ஏக்கர்களுக்கும் அதிகமான பாரம்பரிய காணிகள் எவ்வாறாகக் கையகப்படுத்தப்பட்டதென்பது கேள்விக்குரிய ஒரு விடயமாக இருக்கின்றது.

முக்கியமாக, முல்லைத்தீவு மாவட்டத்தில் அமைந்துள்ள செம்மலை நீராவியடிப் பிள்ளையார் கோவில் பிணக்குச் சம்பந்தான விடயம் இப்பொழுது பேசுபொருளாக இருக்கின்றது. அங்கே அமைச்சர்கள் பலர் வருகின்றார்கள்; இராஜதந்திரிகள் வருகின்றார்கள். அந்தப் பிள்ளையார் கோவில் பரம்பரையாகத் தமிழ் மக்களாலே வழிபாடு மேற்கொள்ளப்பட்ட கோவில் ஆகும். இந்தக் கோவிலின் அருகாமையில் ஒரு சிங்கள பௌத்த குடும்பங்கூட இல்லாத நிலையில், இந்தக் கோவிலின் அபிவிருத்தி வேலைகளை நடாத்தவிடாது அங்கு புத்தர் சிலை அமைக்கப்பட்டிருக்கின்றது. இது ஒரு பொருத்தமற்ற வேலை என்றும் இது இன முரண்பாட்டை, மத முரண்பாட்டைத் தோற்றுவிக்கின்ற செயற்பாடெனவும் இந்தச் சிலை அமைக்கப்படுகின்றபொழுதிலிருந்தே ஜனாதிபதி மட்டம்வரை நாங்கள் எத்தனையோ தடவை முறைப்பாடு செய்திருந்தோம். ஆனால், இவை எல்லாவற்றையும் மீறி அந்தப் புத்தர் சிலை அமைக்கப்பட்டது. இதற்கான நீதி கேட்டு அந்த மக்கள்

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

நீதிமன்றம் சென்றார்கள். இரு பகுதியினரும் ஒருவருக் கொருவர் முரண்பாடு ஏற்படாத வகையில் வழிபாடுகளை மேற்கொள்ள வேண்டுமென்று அங்கே தீர்ப்புக் கொடுக்கப்பட்டிருக்கின்றது. அதன் பின்பு அனுராதபுரத் திலிருந்து வலுக்கட்டாயமாகச் சிங்கள மக்களை பஸ்ஸிலே ஏற்றிக்கொண்டுவந்து தேரர்களும் இணைந்து அங்கு ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருக்கின்றார்கள். இவ்வாறான ஒரு நிலைமையை ஏன் தோற்றுவிக்கின்றீர்கள்? இந்த நாட்டிலே நீதி நியாயத்திற்குக் கட்டுப்படாது, எங்களுடைய பூர்வீகமான வழிபாட்டு முறைகளைச் சீரழிக்கின்ற, மழுங்கடிக்கின்ற வகையிலே இந்த மண்ணிலே அசௌகரியங்களை ஏற்படுத்துகின்ற இவ்வாறான செயற்பாடுகளில் ஈடுபடுவதென்பது சட்டத்துக்கு முரணான ஒரு விடயமாகவிருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களிடம் நான் மேலும் ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். A-9 வீதியில் அமைந்துள்ள மாங்குளம் பிரதேசத்தை நகர அபிவிருத்தித் திட்டத்தின்கீழ் கொண்டுவரப்போகின்றோம் என்று 'மாங்குளம் நகர அபிவிருத்தித்திட்டம்' தொடர்பில் கூட்டங்கள் நடாத்தப்பட்டு, வரைபடங்கள் தயாரிக்கப்பட்டு, செயற்றிட் டங்கள் முன்னெடுக்கப்பட்டு, பல்வேறுவிதமான முனைப் புக்கள் மேற்கொள்ளப்பட்டன. ஆனால், அது இன்று தூங்குகின்ற ஒரு செயற்பாடாகக் காணப்படுகின்றது. ஆகவே, யுத்தத்திலே பாதிக்கப்பட்ட எமது மக்களுக்கான ஒரு விசேட ஏற்பாடாக மாங்குளம் பிரதேச அபிவிருத்தியை முன்னெடுத்து, விரைவுபடுத்துமாறு தயவுடன் கேட்டுக்கொள்கின்றேன்.

கல்முனை வடக்குப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்துமாறு இனம், மதம் கடந்து எல்லோரும் ஒன்றுசேர்ந்து அங்கு உண்ணாவிரதம் இருப்பதைத் தாங்கள் அனைவரும் அறிவீர்கள். உரிய சட்டங்களை, உரிய நியதிகளை, உரிய சுற்றுநிருபங்களை நடைமுறைப்படுத்தாது, உங்களது அரசியல் செயற்பாடுகளுக்காக மக்களிடையே மேலும் வக்கிரங்களையும் மோதல் தன்மைகளையும் ஏற்படுத்துகின்ற வகையில் வாய்மூடி மௌனிகளாகத் தொடர்ந்தும் நீங்கள் இருப்பதால் இந்த நாட்டிலே நல்லிணக்கம் ஏற்படுமா? நல்ல காரியங்கள் நடைபெறுவதற்கு இந்தச் செயற்பாடுகள் சாதகமாக அமையுமா? என்ற கேள்விகள் எங்கள் மக்களிடையே எழுந்துள்ளன.

வனவளத் திணைக்களத்தினுடைய காணி கையகப்படுத்தல் செயற்பாடு வடக்கு, கிழக்கிலே தலைவிரித்தாடுகின்றது. வெளியிடப்பட்ட சுற்றுநிருபங்கள் எங்களது மக்களின் குடிமனைகள், படுக்கையறைகளில்கூட வனவளத் திணைக் களம் தனது எல்லைக் கல்லைப்போடுகின்ற ஒரு நிலைமையைக் கொண்டுவந்து விட்டிருப்பது மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும். விவசாயப் பயிர் விளைகின்ற அந்தப் பூமியிலே, யுத்தத்தின் பின்னர் அரச, அரச சார்பற்ற நிறுவனங்களினூடாக அபிவிருத்தி செய்யப்பட்ட குளங்கள் எந்தவிதமான நீர்ப்பாய்ச்சலும் இன்றி, வெறுமனே கிடப்பதோடு, அபிவிருத்தி வேலைகளைச் செய்வதற்கு இயலாத வகையிலே வனவளத் திணைக்களத்தினால் அந்தப் பூமி கையகப்படுத்தப்பட்டும் இருக்கின்றது. இவ்வாறானதொரு நிலைமை காணப்படுகின்றபொழுது, 'பசுமையை நோக்கிய இலங்கை', 'அபிவிருத்தியை நோக்கிய இலங்கை' என்பது வெறுமனே வெற்றுத்தாளில் எழுதப்பட்ட எழுத்தாக இருக்குமே தவிர, அதை நடைமுறையில் செயற்படுத்துவதென்பது சாத்தியமற்ற ஒன்றாகவே அமையும். இவ்வாறான செயற்பாடுகளை நிறுத்தி, யுத்தத்திலே பாதிக்கப்பட்ட அந்த மக்களுக்கு ஓர் இயல்பு வாழ்க்கையை ஏற்படுத்துகின்ற வகையிலே கையகப்படுத்தப்பட்ட காணிகள் விடுவிக்கப்பட வேண்டும். இவ்வாறாக பொருத்தமற்ற முறையிலே கையகப்படுத்தப்பட்ட காணிகளை மீட்டெடுப்பதற்கான எங்களது மக்களின் போராட்டங்களில் கரிசனை செலுத்தி, இதனுடைய உண்மைத் தன்மைகளை ஆராய்ந்து, இதற்கொரு சாதகமான நடவடிக்கையை எடுக்காது விட்டீர்களானால், இந்த 'பசுமை அபிவிருத்தி' என்பது சாத்தியப்படாத ஒரு விடயமாகவே இருக்கும்.

வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களமானது நந்திக்கடல் ஏரி, நாயாறு போன்ற இடங்களிலே இருக்கின்ற காணிகளைத் தன்னுடைய திணைக்களத்தின்கீழ் கையகப்படுத்தியிருப்பதால் 2,000க்கும் மேற்பட்ட குடும்பங்கள் பாதிக்கப்பட்டிருக்கின்றன.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

மாண்புமிகு உறுப்பினர் அவர்களே, உங்களுடைய பேச்சை நிறைவுசெய்யுங்கள்!

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

எனவே, இவ்வாறாகக் கையகப்படுத்தப்பட்ட காணிகளை மீட்டுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுங்கள் என்று கேட்டு, நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 3.04]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - State Minister of Mahaweli Development and Environment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා අවස්ථාව දීම ගැන. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ විවාදයට සහභාගි වීමට ලැබීම ගැන සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය කාලය දිහා බැලුවොත් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව බොහොම මත භේදයට තුඩු දීපු ආයතනයක් බවට පත් වුණු බව පෙනෙනවා. මගේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මම නියෝජනය කරන ප්‍රදේශයේ මාකවිට කියන ගම්මානයේ අක්කර හතරක ඉඩමක් අරගෙන ගොඩ කළා. රජයේ සල්ලි ලක්ෂ 200ක් වියදම් කරලා තිබෙනවා. රජයේ සල්ලි ලක්ෂ 200ක් ඒ සඳහා වියදම් කළාට ඉඩමේ අයිතිය පවරාගෙන නැහැ. SLLRDC එකෙන් වගුරු ඉඩමක් අරගෙන වගුරු ඉඩම ගොඩ කළේ කිසිම අනුමැතියක් නැතුව, බලහත්කාරයෙන්. වර්තමානය වන කොට අවුරුදු හතරක් අපේ රජය තිබුණත් මේ ප්‍රශ්නය අපට විසඳා ගන්න බැරි වෙලා තිබෙනවා. රජයෙන් වියදම් කරපු ලක්ෂ 200කින් පස් පුරවලා තිබෙනවා. ඒ වාගේ විවිධ දේශපාලන හස්ත ක්‍රියාත්මක වෙලා එක පැත් පාරෙන් අත්සන ගහලා රටේ මහජන මුදල් අවභාවිත වුණු අවස්ථා මේ ආයතනයේ බොහොමයක් සිද්ධ වුණා.

පසුගිය කාලයේ නුගේගොඩ දෙල්කඳ පොළත් ඒ වාගේමයි. අත්පත් කරගැනීම් කරන්නේ නැතුව ඔය වාගේම ගොඩකරලා සංවර්ධනය කරන්න ගිහිල්ලා අන්තිමට valuation කරන්න යන කොට -වටිනාකම කීයද බලන්න යන කොට,- අර ගොඩ කරපු

ඉඩමට තමයි රජයට වටිනාකම් ගෙවන්න සිදු වුණේ. අත්පත් කර ගත්තාට පස්සේ නේ, valuation කරන්න යන්නේ. මිලියන ගණනක්, කෝටි ගණනක් වැඩිපුර මේ ඉඩමට ගෙවන්න වුණා. ඒ, මේ අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය -procedure එක- ක්‍රියාත්මක නොකරපු හින්දා. අපි දකිනවා, වර්තමානය වන විට ඊට වඩා යහපත් ක්‍රියාමාර්ගයකින් එහි කටයුතු සිදු වෙන බව. එදා මීතොටමුල්ල කුණු කන්ද ගැහුවා වාගේ, එක පැත්තක සංවර්ධනය කියලා කියාගත්තත් අනෙක් පැත්තෙන් ලොකු හානියක් රටට කළා. මේ ලොකු හානිය කරපු එක ආයතනයක් තමයි මේ ඉඩම් ගොඩකිරීමේ ආයතනය. ලොකු හානියක් සිදු කළත් එදා මේවා මාධ්‍යයට විවෘත කර ගන්න බැරුව ගියා. මාධ්‍යයට විවෘත කර ගන්න බැහැ. මාධ්‍යයට විවෘත කළොත් මාධ්‍යවේදියා වෙඩි තියලා මරනවා. මාධ්‍ය ආයතනයක -TV ආයතනයක- මේක telecast කළොත්, ප්‍රවෘත්තිවලට කිව්වොත් ඒ ප්‍රවෘත්ති ආයතනයට බෝම්බ ගහලා ඒ TV ආයතනය කුඩු කරනවා; එහෙම නැත්නම් මාධ්‍යවේදියා අතුරුදහන් කරනවා. අන්න ඒ වාගේ තත්ත්වයක් තිබුණු රටක් තමයි අපි හැදුවේ. හැබැයි, අපට මේ වාගේ වැඩ කරන්න බැරි වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ ගමේ තිබෙන මහජන මුදල් ලක්ෂ 200ක් වියදම් කරලා පස් දාලා ගොඩකරපු ඉඩමේ නීත්‍යානුකූල තත්ත්වය මොකක්ද කියලා හොයන්න කියලා මේ ගරු පාර්ලිමේන්තුවෙන් මා ඉල්ලීමක් කරනවා. ඒ සඳහා මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරන්න. ඒ සම්බන්ධයෙන් වැරදි කරපු මිනිසුන්ට දඬුවම් දෙන්න. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න. ජනතා මුදල් තමයි එදා අවභාවිත වුණේ. සමහර විට අපට ඇඟිල්ල දික් කරනවා, "මේ රජය ආවා. වැඩ බොහොම slow" කියලා. නීතියට අනුවයි අපි වැඩ කළේ. එතකොට ගමන් මාර්ගය හිමින්. තිරසාර සංවර්ධනයක් මේ රජය කරගෙන ආවා. ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා නායකත්වය අරගෙන වර්තමානය වන විට ඒ වැඩ කටයුතු ක්‍රමානුකූලව කරගෙන යනවා. පොඩ්ඩක් ප්‍රමාද වෙනවා තමයි. මොකද, එදා වාගේ බලහත්කාරයෙන් කරන ක්‍රමයක් අද නැහැ. එදා වාගේ ලක්ෂ 100ක් වැය වන එකට කෝටි 100ක් ගෙවන ක්‍රමයක් අද නැහැ. එදා වාගේ ඉඩම්වල අයිතියක් නැත්නම් පවරාගෙන කටයුතු කරන්නේ නැහැ.

මගේ ගමේ, මාකවිට තිබෙනවා, අක්කර හතරහමාරක ඉඩමක්. ඒ ඉඩම සම්පූර්ණයෙන් ගොඩකරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අද අපි සියලු දෙනා අතරමං වෙලා තිබෙනවා. මොකද, මේ සල්ලි ටික ආපහු ගන්නත් බැහැ; මේ ඉඩම රජයට අයිති කරගෙනත් නැහැ. ඒ වාගේ ලොකු ප්‍රශ්නයක අපි පැටලිලා තිබෙනවා. වර්තමානය වන විට මේ ආයතනයේ වැඩ කටයුතු ක්‍රමානුකූලව සිදු වෙනවා. නමුත් එදා මුදල් අවභාවිත වුණා. එදා ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ අත්සනින් තමයි මේ වාගේ සිදුවීම්, මේ වාගේ මුදල් හානි, බලහත්කාරකම් කරලා මේ රටේ ජනතා මුදල් හානි කළේ. මට ඒ බව දැන ගන්න ලැබුණේ නාගරික සංවර්ධනය අධිකාරියත් එක්ක මේ ඉඩමට මොකද කරන්නේ කියලා සාකච්ඡා කරපු අවස්ථාවේයි.

ඒ වාගේම අපට තව වැඩක් තියෙනවා, අපේ ශ්‍රී ලංකාවේ ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ආයතනයට ගමක තිබෙන ඉඩමක plan එක අනුමත කර ගන්න ගියාම,- ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, මුළු ගම්පහ දිස්ත්‍රික්කයම නාගරික සංවර්ධන අධිකාරියට යටත් වනවා. මෙගාපොලිස් අමාත්‍යාංශය යටතට ඇවිල්ලා තිබෙනවා, බස්නාහිර පළාතට අයත් නිසා.- පහත් බිමක් වාගේ තියෙනවා දැක්කොත් කියනවා, ගිහිල්ලා ඉඩම් ගොඩ කිරීමේ අධිකාරියෙනුත් නිර්දේශය අරගෙන එන්න කියලා. මේ අයට නැවත plan එක අනුමත කරන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, අර මනුෂ්‍යයාට ගමේම වතුර පාලනය කරන්න කාණුව දාන්න ඕනෑ විධියට ඒ ඉඩමේ plan එක ඇඳලා දෙනවා. අර මනුෂ්‍යයා, "plan එක අනුමත කරන්න ඕනෑ නැහැ, ගමේ ප්‍රශ්න විසඳන්න මට බැහැ කියලා" යනවා. ඒ නිසා මම විශේෂයෙන්ම යෝජනා කරනවා, එක් කෙනෙකුගේ plan එක අනුමත කරන්න යද්දී, එහෙම එක මිනිහෙකුගෙන්ම plan ඇඳලා මුළු ගමේම ප්‍රශ්න විසඳන්න යන්නේ නැතුව, ඒ හැම කෙනෙකුගෙන්ම ටික ටික එකතු කරලා අරමුදලක් හදාගෙන හරි කමක් නැහැ ඒ ප්‍රශ්න විසඳා ගත හැකි පරිදි වැඩ පිළිවෙළක් නිර්මාණය කර ගන්න කියලා. මොකද, ඒක වැරදි වැඩක් නොවෙයි. ගමේ ප්‍රශ්න විසඳන්න ඕනෑ; අනාගත ජල ප්‍රශ්න විසඳන්න ඕනෑ. නමුත් අර plan එක අනුමත කරන්න ගිය මිනිහාගෙන් තමයි ඔක්කෝම කර ගන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ වේලාව අවස්ථාවක් කර ගන්නවා, තවත් කාරණයක් කියන්නට. මේ වෙලාව වෙනකොට මාධ්‍යයේ ගොඩක් ප්‍රචාරය වෙනවා, වධු කර්මාන්තය සඳහා භාවිත කරන, දැව කර්මාන්තය සඳහා භාවිත කරන විදුලි කියත් තහනම් කරලා කියලා. මේ වෙනකොට ලංකාවේ විදුලි කියත් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් තියෙනවා. දැනට වඩු කර්මාන්තය සඳහා යොදා ගන්නා විදුලි කියත් 85,000ක් විතර තිබෙනවා. වෙනත් කර්මාන්ත සඳහාත් විදුලි කියත් යොදා ගන්නවා. අයිස් කැපීම, මාළු කැපීම ආදී කටයුතු සඳහාත් විදුලි කියත් භාවිත වෙනවා. වෙළඳපොළෙත් විදුලි කියත් තියෙනවා. වර්තමානයේ තීන්දුවක් අරගෙන තිබෙනවා, මේ වන භායනය අවම කිරීම උදෙසා තාවකාලිකව විදුලි කියත් ආනයනය කිරීම නවත්වන්න කියලා. එහෙම මිසක් විදුලි කියත් තහනම් කරලා නැහැ. ආනයනය කිරීම තාවකාලිකව නතර කර තිබෙනවා. නමුත් කඩේ තියෙන විදුලි කියත් විකුණන්න පුළුවන්; තමුන් ළඟ තියෙන විදුලි කියත් විකුණන්න පුළුවන්. ඒවායෙන් වැඩ කරන්න පුළුවන්. ඒවා තහනම් කරලා නැහැ. විදුලි කියත් ආනයනය කිරීම පමණක් තාවකාලිකව තහනම් කරලා තියෙනවා, යම් ක්‍රියාමාර්ගයක්, යම් වැඩපිළිවෙළක් නිර්මාණය වෙනතුරු. මම දැක්කා, සමහර මාධ්‍යවලින් මේක විකෘති කරලා ප්‍රකාශ කරන අවස්ථා. ඒ නිසා ඒක නිවැරදි කර ගැනීම සඳහා ගරු පාර්ලිමේන්තුවේ මම ඒ ගැන ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මම කලින් කිව්වා වාගේ අද SLLRDC එකෙන් විතරක් නොවෙයි, අපට plan එකක් අනුමත කර ගන්න වුණාම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අවසරය ගන්න වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු රාජ්‍ය ඇමතිතුමා, කාලය අවසානයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

රටේ සංවර්ධන කටයුතු කරන්න ගියාම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ගන්න තියෙනවා; පරිසර අධිකාරියෙන් අනුමැතිය ගන්න තියෙනවා. Joint committee එකක් මේකට තිබුණත්, එකතු වෙලා සංවර්ධනය කඩිනම් කරන්න අවශ්‍ය අවසරය දෙන්න තිබුණත්, මේ joint committee එක එකතු වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. Joint committee කියලා නමට තිබුණාට එක්කෙනෙක් එක පැත්තක, තව කෙනෙක් තව පැත්තක. එකට ඇවිල්ලා තීන්දු කරලා මේ කටයුතු ඉවර කරන්නේ නැහැ. ඒ නිසා මේ කාරණයත් අපේ රටේ සංවර්ධනයට බලපාලා තිබෙනවා. සමහර ප්‍රදේශවල තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ශාඛාවලින් approval එක ගන්න ගියාම, මුළු ලංකාවේම තියෙන approvals ටික කොළඹට එවන්න ඕනෑ. ඒ නිසා ඒවා ප්‍රමාද වෙන්න ඒක හේතු වෙලා තිබෙනවා. ඒ නිසා මේ joint committee කියන දේ SLLRDC එක, UDA එක, පරිසර අමාත්‍යාංශය වාගේ ආයතන

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

joint committee තියන එක යම් ආයතනයක් කරා මෙහෙයවන වැඩපිළිවෙළක් දිස්ත්‍රික්ක තුළ නිර්මාණය කළොත් අපට සංවර්ධන කටයුතු නිවැරදි ආකාරයට ඉස්සරහට ගන්න පුළුවන් කියන එක කියමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.13]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 'காணி மீட்டல்' என்ற விடயத்தைப் பார்க்கின்றபோது, குறிப்பாக 'சதுப்பு நிலங்களை நிரப்புதல்' என்றே கூறப்படுகின்றது. சதுப்பு நிலங்கள் மனித வாழ்க்கைக்கு மிகவும் அத்தியாவசியமானவை என்பதற்கு இணங்கவே, பாழாகிப் போகின்ற அல்லது அழிக்கப்படுகின்ற சதுப்பு நிலங்களைப் பாதுகாக்கின்ற வகையில், ஈரான் நாட்டின் ராம்சார் நகரில் 1971ஆம் ஆண்டு பெப்ருவரி மாதம் 02ஆம் திகதி சர்வதேச மகாநாடு ஒன்று நடத்தப்பட்டது. இந்த மகாநாட்டின் இறுதியில் உலகம் முழுவதிலுமுள்ள சதுப்பு நிலங்களைப் பாதுகாப்பதன் அவசியம் குறித்த அறிவை மக்களிடம் பரப்புவது என்ற முடிவு எடுக்கப்பட்டு, இதற்கென உள்ளூர் மாநில, தேசிய, சர்வதேச அளவில் திட்டங்களை உருவாக்கி, சதுப்பு நிலங்களைப் பாதுகாப்பதை வலியுறுத்துகின்ற ஒரு பிரகடனம் வெளியிடப்பட்டது. 'ராம்சார் பிரகடனம்' என்கின்ற இந்த உடன்படிக்கையை இலங்கை உட்படச் சுமார் 168 நாடுகள் ஏற்றுக்கொண்டன. அத்தகைய சதுப்பு நிலங்களை நிரப்புகின்றமையானது, சில நேரங்களில் தவிர்க்க முடியாது என்றபோதிலும், அதுவே பாரியதொரு இழப்பாகவும் அமைந்துவிடுகின்றது. பராமரிப்பின்றி மாசடைதல், குப்பைகளைக் கொட்டுதல், ஒழுங்கான திட்டமிடல் இன்மை காரணமாகக் கழிவுநீர் கலத்தல், கடல் நீர் உட்புகுதல், அதிகரிக்கின்ற குடியிருப்புக்கள் காரணமாகச் சதுப்பு நிலங்கள் மாசடைகின்ற அதேவேளை, இது மனித சமூகத்திற்கு மிகவும் அச்சுறுத்தலாகவும் அமைந்துவிடுகின்றது.

இத்தகைய சதுப்பு நில மாசடைவுகள் திட்டமிடப்படாமலும், வெகுவாகத் திட்டமிட்டும் நிகழ்த்தப்படுவதையும் நாம் காணக்கூடியதாக இருக்கின்றது. அதாவது, இந்தக் காணி மீட்டல் என்பதைத் தமக்கான காணி மீட்டலாகக் கருத்திற்கொள்கின்ற சில அரசியல்வாதிகள் உள்ளிட்டவர்கள் திட்டமிட்டே அதனை மாசடையச்செய்து, அதனை நிரப்பி, பின்னர் படிப்படியாகக் கையகப்படுத்துகின்ற சம்பவங்களையும் நாம் கண்டு வருகின்றோம். உதாரணத்திற்கு கொழும்பை அண்டிய முத்துராஜவெல சதுப்பு நிலப் பகுதியைக் கூறலாம். கொழும்பு நகரைப் பொறுத்தவரையில், தற்போது சுமார் 19 கிலோ மீற்றர் சதுப்பு நிலங்கள் காணப்படுவதாகக் கூறப்படுகின்றது. 1980களில் காணப்பட்ட சதுப்பு நிலங்களில் இன்று வரையில் சுமார் 60 வீதமான சதுப்பு நிலங்கள் அழிக்கப்பட்டுள்ளதாகவே தெரியவருகின்றது. இந்தச் சதுப்பு நிலங்களின் ஒரு முக்கிய அம்சம் என்னவென்றால், அதிக மழை வீழ்ச்சியின்போது பெறப்படுகின்ற நீரை உள்வாங்கி வெள்ளம் வராமல் தடுக்கிறது. அவ்வாறு உள்வாங்குகின்ற நீரை, நன்னீராக - பயன்பாட்டுக்குக்குரிய நிலக்கீழ் நீராகத் தருகின்றது. காற்றின் வெப்பநிலையைக் கட்டுப்படுத்துகின்றது; உலக வெப்பநிலைச் சீர்பாட்டுக்கான காபனைச் சேமிக்கின்றது. இப்படி இன்னும் பல நன்மைகள் இதன்மூலம் கிட்டுகின்றன. மேற்படி சதுப்பு நில அழிப்புக் காரணமாக கொழும்பு நகரில் கடும் மழை பொழிவுகளின்போது, நகரமே மூழ்கிப்போகின்ற நிலைமையை இன்றும்கூட கண்டு வருகின்றோம். இன்றுகூட எஞ்சி இருக்கின்ற சதுப்பு நிலங்கள் தரம் குன்றி வருவதால், அவற்றினால்கூட நாளடைவில் நாம் எவ்வித நன்மையையும் எதிர்பார்க்க முடியாது என்றே கருத வேண்டி இருக்கின்றது. இந்த வகையில், இயற்கையை எதிர்த்து வாழ்வதற்கான வசதிகளைச் செயற்கையாகவே ஏற்படுத்திக்கொள்கின்ற கொழும்பு நகரையும், இயற்கையோடு ஒன்றிணைந்து வாழ நினைக்கின்ற வடக்கின் நிலைமையையும் ஒப்பிட்டுப் பார்ப்பது கடினமாகும்.

வடக்கில் காணி மீட்டல் என்கின்றபோது, முதலில் எமது மக்களின் சொந்தக் காணி நிலங்களை மீட்பது என்றே பொருள்படுகின்றது. வலிகாமம் வடக்கு, கேப்பாப்புலவு, நாச்சிக்குடா எனப் பல இடங்களிலும் எமது மக்கள் தங்களது சொந்தக் காணி, நில மீட்புக்காகப் போராடி வருகின்றனர். யாழ்ப்பாணத்திலே சாந்தபுரம் தொடக்கம் தெல்லிப்பளை வரையில், 'எமது நிலம் எமக்கே வேண்டும்' என எமது மக்கள் போராட்டத்தில் இறங்கியிருக்கின்றனர். இதனிடையே வடமராட்சி கிழக்கில் 700 ஏக்கர், மண்டைதீவில் 600 ஏக்கர் என யாழ். மாவட்டத்திலும், உத்தரவேங்கை ஆலயக் காணிகளைக் கிளிநொச்சி மாவட்டத்திலும், முல்லைத்தீவு கேப்பாப்புலவில் 526 ஏக்கர் காணிகளையும் சுவீகரிக்க ஏற்பாடுகள் மேற்கொள்ளப்பட்டு வருவதாகத் தெரியவருகின்றது. வலிகாமம் வடக்கு - தெல்லிப்பளை, வலிகாமம் கிழக்கு - கோப்பாய் ஆகிய இரு பிரதேச செயலகப் பிரிவுகளிலுள்ள 11 கிராம சேவையாளர் பிரிவுகளைச் சார்ந்த சுமார் 6,381 ஏக்கர் 38.91 பேர்ச் தனியார் காணிகள் சுவீகரிக்கப்படவுள்ளதாகவும் தெரியவருகின்றது. கிளிநொச்சி, பூநகரி பகுதியைச் சேர்ந்த பள்ளிக்குடா, பல்லவராயன்கட்டு, மண்கும்பான், பொன்னாவெளி, அரசபுரம், முழங்காவில் உள்ளிட்ட சுமார் 800 ஏக்கர் காணி எமது மக்கள் பயன்பாட்டிற்கு விடுபடாத நிலை தொடர்கின்றது.

மாதகலில் இருந்து காங்கேசன்துறை வரையிலான கடற்கரையை அண்டிய பகுதிகள் காற்றாலை மற்றும் சூரிய ஒளி மின்னுற்பத்திச் செயற்பாடுகளுக்காக, சீனாவுடன் தொடர்பினைக் கொண்டிருக்கின்ற மலேசிய நிறுவனமொன்றுக்கு வழங்கப்படவுள்ளதாகக் கூறப்படுகின்ற நிலையில், மாதகல் பகுதியிலிருந்து சுமார் 25 வருடங்களாக வெளியேறியிருக்கின்ற சுமார் 279 குடும்பங்களின் நிலை கண்டுகொள்ளப்படவில்லை. இவை எல்லாம் சதுப்பு நிலங்கள் அல்ல. எமது மக்கள் வாழ்ந்திருந்த வரலாற்றுக் காணி நிலங்கள்! போகிற போக்கைப் பார்த்தால், மீளக் குடியேற வேண்டிய எமது மக்களை ஒருபுறமாக ஒதுக்கித்தள்ளிவிட்டு சீன, மலேசிய நாட்டுப் பிரஜைகள் நாளடைவில் வந்து குடிகொண்டு விடுகின்ற நிலை ஏற்படுமோ என எமது மக்கள் அஞ்சுகின்றனர். அம்பாந்தோட்டையை விற்று, கொழும்பை விற்று, காலியை விற்று - தெற்கையே விற்று, இப்போது வடக்கையும் வெளிநாடுகளுக்கு விற்கப்போகின்ற நிலைமை உருவாகிவிட்டது. எமது மக்கள் முகங்கொடுத்து வருகின்ற இத்தகைய மிகப் பாரதூரமான விடயங்களைத் தடுத்து நிறுத்த வேண்டியவர்களான, இந்த அரசாங்கத்தைத் தாமே கொண்டுவந்ததாகக் கூறிக்கொள்கின்ற தமிழ்த் தரப்பினர், இதைப்பற்றி எல்லாம் வாயே திறப்பதில்லை. அவர்களது தேவை மக்கள் மாண்டாலும் மக்களது வாக்குகள் மட்டும் தேர்தல்களின்போது தமக்குக் கிடைக்க வேண்டும் என்பதே! இன்று வடக்கிலே இருக்கின்ற எமது மக்கள் அப்பகுதியிலிருந்து ஓரங்கட்டப்பட்டு, நாளை சீன மக்களோ மலேசிய மக்களோ குடியேறி விடுகின்ற நிலை

ஏற்பட்டால்கூட அந்தத் தமிழ்த் தரப்பினருக்கு அது பிரச்சினை இல்லை. உடனேயே தங்களது கட்சியின் பெயரை சீன தேசியம் என்றோ, மலேசிய தேசியம் என்றோ மாற்றிக்கொண்டு, வாக்கு கேட்கப் புறப்பட்டுவிடுவார்கள். அதுதான் அவர்களது நிலைப்பாடாக இருக்கின்றது.

தெற்கிலே காணிகள் சுவீகரிக்கப்படுகின்றபோது, வெளிநாடுகளுக்கு விற்கப்படுகின்றபோது தென்னிலங்கை அரசியல் கட்சிகள் எத்தனையோ போராட்டங்களை நடத்துகின்றன; வெகுசனப் போராட்டங்களை ஏற்பாடு செய்கின்றன; மக்களை விழிப்பூட்டுகின்ற நடவடிக்கைகளை முன்னெடுக்கின்றன; அவற்றில் வெற்றியும் பெறுகின்றன. ஆனால், வடக்கிலோ நிலைமை தலைகீழாகவே இருக்கின்றது. எமது மக்கள் தனியாகப் போராடுகின்றார்கள். அதை வைத்து இந்த அரசியல் தரப்பினர் அரசாங்கத்துடன் பேசி, எமது மக்களது பிரச்சினைகளைத் தீர்க்காமல் இருப்பதற்காகவே சலுகைகளைப் பெறுவதால், எமது மக்களது போராட்டங்கள் இன்னமும் வெற்றி பெறாமலேயே தொடர்கின்றன. அடிக்கடி எமது மக்கள் பல்வேறு பிரச்சினைகளுக்குள் தள்ளப்பட்டு வரும் நிலையில், அவர்கள் அடிக்கல் நாட்டும் விழாக்களிலேயே காட்சி கொடுக்கின்றார்கள். எமது மக்கள் பல்வேறு சவால்களை வெற்றிகொள்ள வேண்டியிருக்கின்ற நிலையில், அவர்கள் 'சவள்'களை ஏந்திக்கொண்டிருக்கின்றார்கள். இவை எல்லாமே அண்மித்து வருகின்ற தேர்தல் காலகட்ட நாடகங்கள் அன்றி, வேறேதும் இல்லை!

இந்த அரசாங்கத்தைக் கொண்டுவந்தவர்கள் தாமே என்கின்றவர்கள், இந்த அரசுக்கு முட்டுக்கொடுத்து, அதனைத் தாங்கிப் பிடித்துக்கொண்டிருப்பவர்கள், இந்த அரசாங்கத்துக்கு ஒத்துழைப்பு வழங்குவதாகக் கையொப்பமிட்டுக் கொடுத் தவர்கள், இவர்களது ஒத்துழைப்பு இல்லையென்றால் இந்த அரசாங்கமே கவிழ்ந்துவிடுகின்ற நிலையில் இருக்கின்றபோது, "எமது மக்களின் பிரச்சினைகளைத் தீருங்கள். இல்லாவிட்டால், அரசாங்கத்துக்குக் கொடுக்கும் ஆதரவை நாங்கள் நீக்கிக் கொள்வோம்" என ஏன் இவர்களால் எமது மக்களுக்காகப் பேரம் பேச முடியாதிருந்தது? எனக் கேட்க விரும்புகின்றேன். இத்தகையதொரு நிலையில் நாங்கள் இருக்கவில்லை. நாங்கள் இணக்க அரசியலை மேற்கொண்டிருந்தாலும், தென்னிலங்கை அரசுகளில் மேலதிகமாகவே இணைந்திருந்தோம். அவ்வாறு மேலதிகமாக இருந்துகொண்டே, பேரம் பேசுவதற்குக்கூட இயலாத நிலையில் நாங்கள் இருந்தாலும், எமது மக்களுக்கும் எமது பகுதிகளுக்கும் அரசாங்கங்களுடனான புரிந்துணர்வு அடிப்படையில் நிறையவே பணிகளை மேற்கொண்டிருக் கின்றோம் என்பதை வரலாறு சான்று பகரும்.

மறுபக்கத்தில், 'நல்லிணக்கம்', 'தேசிய ஒருமைப்பாடு', "இனங்களுக்கிடையே பாலம் அமைப்போம்!" எனச் சொல்லிக்கொள்கின்ற இந்த அரசு, சுய சிந்தனையில் ஒரு முடிவை எடுத்து, எமது மக்களின் இத்தகைய காணிப் பிரச்சினை உள்ளடங்கலான அத்தனை பிரச்சினைகளையும் ஓரளவிலாவது தீர்க்கும் எனப் பார்த்தால், அதுவும் நடக்கின்ற பாடில்லை. ஒரு காலத்தில் செழிப்பான ஈரவலய நிலமாக இருந்துள்ள, அக்கால மன்னருக்கு முத்துப் போன்ற சம்பா நெல்லை வழங்கியதாக வரலாற்று ரீதியில் கூறப்பட்டு வருகின்ற கொழும்பை அண்டிய முத்துராஜவெல பகுதியையே காப்பாற்ற முடியாத இவர்களால், எமது மக்களின் காணி நிலங்கள் காப்பாற்றிக் கொடுக்கப்படும் என எப்படி நம்ப முடியும்? என்ற கேள்வியுடன் விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 3.23]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැදගත් අංශ ගණනාවක් පිළිබඳ සාකච්ඡාවකට විවරවන සංශෝධන පනත් කෙටුම්පතක් තමයි අද සාකච්ඡාවට ගැනෙන්නේ. සංශෝධනයේ වටිනාම වෙනම ගත්තොත් ඉතා සුළුයි. නමුත්, අපට තිබෙන පළමුවෙනි කාරණය මෙයයි. මේ රාජ්‍ය අංශය කියන එක පරංගි හැදුණු ලෙඩ්ඩු වාගේ අයින් කරමින් තිබුණු තත්ත්වයක් තමයි පසුගිය කාලයේම තිබුණේ. නියෝ ලිබරල් ආර්ථිකය ආපු දවසේ ඉඳලා රාජ්‍ය අංශය කියන එක කාලකණ්ණි අංශයක්, යක්කුන්ගේ අංශයක්, මේක මේ රටම කනවාය කියලා තහවුරු කළ අදහස ආපිට හරවමින්, reverse කරවමින්, අපේ ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව - SLLRDC -, සාර්ථක, ලාභ ලැබිය හැකි, ව්‍යවසායක තත්ත්වයකට ගෙනාපු එක මේ රටේ මතවාදී ජයග්‍රහණයක් බව මා මේ වෙලාවේ සඳහන් කරන්නට කැමැතියි.

හර්ෂ ද සිල්වා ඇමතිතුමා එතුමාගේ කුට්ටු දෙක එකතු කරමින් කිව්වා, අපි විදේශිකයන්ට සිත්නක්කර දීපු නිසාය එතුමන්ලා Port City එකේ වැඩේ කල් දැම්මේ කියලා. එතුමාට අමතකයි විදේශිකයන්ට මේ රටේ දේපොළ, ඉඩකඩම් අයිතිය ගන්න බැහැයි කියලා තිබුණු නීතිය අයින් කරන්නට කටයුතු කළේ මේ ආණ්ඩුව බව, එතුමාගේ උපදෙස් අනුව. එතුමා නොමමර එකේ නියෝ ලිබරල්වාදියෙක්. අපි එදා විශේෂ බද්දක් දාලා තිබුණා, විදේශිකයෙකු වුණත් බද්දට ඉඩමක් ගන්නකොට ඒ බද්ද මත බද්දක් තිබුණා. ඒ විධියට විදේශිකයන්ට මේ රටේ ඉඩම් අයිතිය මාරු වී යෑම වළක්වන්නට අපි පුළුවන් පියවර අරගෙන තිබුණා.

අපට විදේශිකයෝ ඕනෑ ආයෝජනයට පමණයි. අයෝජනය කරන්නට එන අයට මේ රටේ අයිතියේ වුවමනාවක් නැහැ. ආයෝජනය කළා, ඒ ආයෝජනයෙන් ඔවුන්ගේ ලාභය හම්බ කර ගත්තා, අපට වුවමනා ලාභය අපි හම්බ කර ගත්තා, එතැනින් ඉවරයි. නමුත් මේ රටේ ඔක්කොම දේපොළ, ඉඩ කඩම් සල්ලි තිබෙන පළියට ඇවිල්ලා ඒ අයට අයිති කර ගන්න පුළුවන් වුණොත්, මේ රටේ අපට පිට දේශක්කාරයන්ගේ තත්ත්වයට වැටෙන්නට වෙනවා. ඒ නිසා, ඉඩම් පිළිබඳව යම්කිසි වගකීමක් ඇති අංශයක් හැටියට මා විශ්වාස කරනවා, පාඨලී චම්පික රණවක ඇමතිතුමාගේ මහන්සිය මං කරන යෝජනාවට ප්‍රයෝජනවත් දායකත්වයක් ලබාදෙයි කියලා.

අපි විදේශිකයන් සමඟ ගිවිසුම් ගහනවා විවිධ කාරණා සම්බන්ධව. ඒවායින් පංගුවක් ඒවා ජාත්‍යන්තර ප්‍රඥප්තීන් අනුව එන ඒවා. පංගුවක් ඒවා යම් යම් කාරණා ඉටු කර ගැනීම සඳහා රාජ්‍යයන් අතර ඇතිවන ගිවිසුම්. මේ ගිවිසුම් අන්තර් ජාතික ගිවිසුම්. මේ ගිවිසුම් හැම එකක්ම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි කියලා කියන්න ඕනෑය කියලා මම කල්පනා කළා. හැම අමාත්‍යාංශයක්ම, හැම දෙපාර්තමේන්තුවක්ම ගිවිසුම්වලට බැඳෙනකොට ඒවා පාර්ලිමේන්තුවේ යම්කිසි කමිටුවක විමසුමකට ලක් විය යුතුයි කියන අදහසේයි මම ඉන්නේ.

දැන් බලන්න, මේ පිටු 4කට තිබුණු ACSA එක දැන් පිටු 83කට ගිහිල්ලා. ඒකේ මොනවාද තිබෙන්නේ කියලා අපි කවුරුත් දන්නේ නැහැ. මම දන්නේ නැහැ කැබිනට් මණ්ඩලයේ ඉන්න ඔබතුමන්ලා කොයි ප්‍රමාණයට ඒ ගැන දන්නවාද කියලා. ඇයි ඉතින් ඔබතුමන්ලා විතරක් ඒ ගැන දැන ගන්නේ? ඇයි පාර්ලිමේන්තුවේ සිටින මහජන නියෝජිතයෝ ඒවා දැන ගත යුතු නැද්ද? මේ රටේ මහ ජනයා දැනගත යුතු නැද්ද? මේ පිළිබඳව අලුත් විධියකට බැලීමට ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් කවුරුත් යොමු වෙයි කියලා මම විශ්වාස කරනවා.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදයට කෙළින්ම අදාළ නොවුණත් මේ රටේ සම්පතක් ගැන මම කියන්නට ඕනෑ. මහ බැංකුවේ සම්පත් පැහැර ගත්ත හොරු රංචුවට විරුද්ධව නඩු දමන්නට ඇටර්නි ජෙනරාල්තුමා ක්‍රියා කරලා තිබෙනවා. ඒකට අවශ්‍ය අවසරය අග්‍ර විනිශ්චයකාරතුමා දීලා තිබෙනවා.

ඒ නිසා මා හිතුවා, Attorney Generalතුමාට ලියුමක් ලියන්න ඕනෑය කියලා. මා එතුමාට ලියුමක් ලියා තිබෙනවා, ඇමුණුම් ගණනාවක් සමඟ. නඩු තීන්දු, ඒ වාගේම මා මේ පාර්ලිමේන්තුවේදී අගමැතිගෙන් විමසූ ප්‍රශ්න මේ ඇමුණුම්වලට ඇතුළත් වෙනවා. මා මේ ලිපිය කියවන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මෙය සභාගත කරන්න ඔබතුමාගෙන් අවසරය ඉල්ලනවා. මා මේ ලිපියෙන් අසා තිබෙන්නේ, රනිල් වික්‍රමසිංහට විරුද්ධව මේ නඩුව පවරන්නේ නැත්තේ ඇයි කියන කාරණයයි. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳව රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට තිබෙන සම්බන්ධය හැම පැත්තකින්ම තහවුරු වෙලා තිබියදී, මේ විත්තිකරුවන්ගේ නම් අතර එතුමාගේ නම නැත්තේ ඇයි කියන ප්‍රශ්නය විමසමින් තමයි මා නීතිපතිතුමාටත්, අග්‍ර විනිශ්චයකාරතුමාටත් මේ ලියුම ලියා තිබෙන්නේ. ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිමින් මේ ලිපිය සහ ඊට අදාළ ඇමුණුම් මා **සභාගත*** කරනවා.

ඊළඟට, නාගරිකකරණය ගැන කියන්න මා කැමැතියි. වරාන් සිං නමැති කෘෂිකාර්මික, ආර්ථික දාර්ශනිකයෙක් හිටියා, ඉන්දියාවේ. ඔහුගේ ලියවිලි ඉතා වටිනවා. ඔහු ඉතාම හොඳින් පර්යේෂණාත්මක තොරතුරු එකතු කරමින් ලිපි ලියපු කෙනෙක්, දේශපාලනඥයෙක්. ජේම්ස් ස්කොට් කියා තිබෙන්නේ, "High Modernism is a form of imperialism." කියලායි. ජේම්ස් ස්කොට් තමයි මේක කිව්වේ. "ඉහළ මායිමකට නවීකරණය ගෙන යනකොට එය එක්තරා විධියක අධිරාජ්‍යවාදයක් බවට පත් වෙනවා"ය කියන එකයි ඔහු කියා තිබෙන්නේ. ජේම්ස් ස්කොට් තමයි ඒ වචන යොදා ගත්තේ. වරාන් සිං ඒ වචන දිගටම පාවිච්චි කර තිබෙනවා, නාගරිකකරණය පිළිබඳව කියන නිසා.

මට මතකයි, ඇහැලියගොඩ එක්තරා ගම්මානයකට අපි ගියා. ඒක සුන්දර ගම්මානයක්, කැලෑබද ප්‍රදේශයක්. අපේ හිටපු ජනාධිපතිතුමාත් ප්‍රධාන අමුත්තා හැටියට එතැනට ගිහිල්ලා හිටියා. ඒ වෙලාවේ මම එතුමාට දායක වුණා, එතුමාගේ අදහස ප්‍රකාශයට පත් කරන්න. අපට ඕනෑ මේ ගම්මාන ඔක්කෝම නගර කරන්න නොවෙයි. අපි නාගරික පහසුකම් තිබෙන ගම්මාන රකින්න ඕනෑ. ඒ වාගේම, නගරවලට අපේ ගම්මානවල තිබෙන පරිසරයේ සුන්දරත්වය ගෙනෙන්න ඕනෑ. මෙන්න මේ කාරණාව ඉටු කරනවා වෙනුවට මුළු රටම නාගරීකරණයට යට කිරීම කියන ඒ අලුත් සංකල්පය අපි ප්‍රතික්ෂේප කළ යුතුයි. අපි අපේ ගම රැක ගත යුතුයි. ගමේ පහසුකම් නාගරික තත්ත්වයට ගත යුතුයි. ගමක තිබෙන්නාවූ ගැමි සබඳතා පවත්වාගෙන යන්නේ එක්තරා ආර්ථික රටාවකට අනුවයි. ඒ ආර්ථික රටාව තමයි කෘෂිකාර්මික ආර්ථික රටාව. මූලික වශයෙන් සුළු ව්‍යාපාර - සුළු ව්‍යවසාය - රටාව. ඒ රටාව අපි හැකිතාක් දුරට අපේ ආර්ථිකය ගොඩනැඟීමේදී ඇතුළත් කර ගන්න ඕනෑය කියන එක අපි මතක තබා ගත යුතුයි.

ඊළඟට, තව එකක් තමයි "gigantomania". විශාලත්වය පිළිබඳව තිබෙන මේනියාව තමයි "gigantomania" කියන්නේ. "තව තවත් ලොකු ඒවා ඕනෑ, තව තවත් විශාල ඒවා ඕනෑ" කියන මේ විශාලත්වයේ මේනියාව අපේ රටවල්වල තිබෙන සමාජ සම්බන්ධතාවන්ට විශාල හානියක් සිදු කරන බව දැන් වන විට,-

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ගරු ඇමතිතුමනි, නගර සභාවල බලය ඔබතුමා නාගරික සංවර්ධන අධිකාරියට ඇදලා ගන්න යනවයි කියලා පැමිණිල්ලක් තිබුණා. මේ ගැන ඔබතුමා ප්‍රකාශයක් කරයි කියලා මම හිතනවා. මමත් කිව්වා, ඒක වැරැදි දෙයක් කියලා. කාර්යක්ෂමතාව වටිනා දෙයක්. නමුත්, මහජන නියෝජිතයන්ගේ බලය අපි නැති කරන කාර්යක්ෂමතාව නම්, එක්තරා විධියක ප්‍රජාතන්ත්‍ර විරෝධී කාර්යක්ෂමතාවක් බවට පත් වෙනවා. අපට ඕනෑ කාර්යක්ෂමතාව කියන එක විතරක් නොවෙයි. අපට වුවමනා වන්නේ මහජන නියෝජිතයන්ගේ බලයක් සහිත කාර්යක්ෂමතාවක්. අධිකාරිවාදී ඉලක්කයකට යනවා වෙනුවට අන්න එබඳු ඉලක්කයකටයි අපි යන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම මේ ගැනත් කියන්න ඕනෑ. මේ "The Big Land Grab" කියන ලිපිය ඔබතුමාත් දකින්න ඇති. මේක 14වැනි දා "DaillyMirror" පත්තරේ තිබුණේ. මේ ලිපිය ලියලා තිබෙන්නේ මුතුරාජවෙල කෙරවලපිටිය ප්‍රදේශය පිළිබඳව දැනට කෙරීගෙන යන නීති විරෝධී ඉඩම් ගොඩ කිරීම් ගැනයි. මෙයට යම් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු දෙදෙනෙකුත් එකතු වෙලා තිබෙනවා. මේ පිළිබඳව LLRDC එකත් ඇතුළත්ව කියන්න ඕනෑ හැම තැනටම පැමිණිලි කරලා තිබෙනවා. නමුත් ඒ අය කියනවා, තවමත් ඒකට ප්‍රතිකර්මයක් යෙදී නැහැ කියලා. පසුගිය 14වැනි දා "DaillyMirror" පත්තරේ පළ වී තිබුණු තිබෙන මේ ලිපියේ, ලියුම්කරු තිස්ස කොටින්කඩුව.

ඊළඟට, මම ඔබතුමාට කියන්න කැමැතියි, නාගරික ජල ගැල්ම පාලනය පිළිබඳ විශේෂඥයෙක්, විද්‍යාඥයෙක් වන ඇන්ටන් නානායක්කාර ගැන. මගේ මතකයේ හැටියට එතුමා ඊයේ "The Island" පත්තරයට ලිපියක් ලියලා තිබුණා, කොළඹ නගරයේ මේ ජල ගැල්ම ප්‍රශ්නය ගැන. එතුමා කියනවා, "මුහුදට වතුර ගලා යන්නා වූ තැන් ගණනාවක් දැන් හිර කරලා තිබෙනවා; ඒවා විවෘත කරන්න ඕනෑ" කියලා. මම මේ කෙටියෙන් කියන්නේ. එතුමා කියලා තිබෙනවා, "මේ හදලා තිබෙන නැඟෙනහිර වේල්ල, බටහිර වේල්ල වැනි වේලි වැරැදි තැන්වලයි හදලා තිබෙන්නේ. මේ නිසා ඇත්තටම කොළඹ ජල ගැල්ම පාලනයට දැන් ඉදිරිපත් කරලා තිබෙන යෝජනා, දැන් ඉදිරිපත් කරලා තිබෙන්නාවූ ඒ සැලැස්ම අසාර්ථක සැලැස්මක්." කියලා මේ ඇන්ටන් නානායක්කාර කියන විද්‍යාඥයා කියනවා. ඔහු දිග ලිපියක් ලියලා තිබෙනවා. මම ඔබතුමාගේ අවධානය ඒ ලිපියටත් යොමු කරවනවා. ඊයේ "The Island" පත්තරයේ ඒ ගැන ලියලා තිබුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කථාව අවසන් කරනවා. ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ මේ රාජ්‍ය අංශය වර්ධනය කරමින් නව සංකල්පයක් උඩ නාගරීකරණය සිදු

කළ යුතුයි. අපේ ගැමි සමාජය නොදියුණු සමාජයක් කියන වැරැදි මතයෙන් අපි තුරන් විය යුතුයි. දියුණු වෙන සමාජයක් සහිත නාගරීකරණයකට අවශ්‍ය නිසි සබඳතාවන් ගොඩනැඟෙන සංවර්ධනයකට අපි මේ රට ගෙන යා යුතුයි කියමින් මා නිහඬ වෙනවා.

[අ.භා.3.34]

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஷிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයේදී අදහස් දැක්වීම සඳහා මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන් ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම පහත් බිම් ගොඩ කර සංවර්ධනය කිරීම පිළිබඳව කථා කිරීමේ දී ගං වතුරින් ආපදාවට පත් වෙන ප්‍රදේශයක ජීවත් වෙන මහජන නියෝජිතයෙක් විධියට මට බලපාන ප්‍රධානම කරුණක් තමයි කැලණි ගඟත්, සීතාවක ගඟත් තුළ ඇති වෙන ගං වතුර තත්ත්වය යටතේ තල්දූව නගරයේ ජනතාව විපතට පත් වීම. මම මේ අවස්ථාවේ දී ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරන්න කැමැතියි, කැලණි ගඟේ ඇති වන ගං වතුර තත්ත්වය ගැන වග කිව යුතු ආයතන ගණනාවක් තිබෙන බව. මේ ආයතන තුළ මනා සම්බන්ධීකරණයක් නොමැතිකම නිසා, ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් තල්දූව පොළ භූමිය තුළ කරපු සංවර්ධනයත් එක්ක ඉදිරියේ දී විශාල කරදරයකට පත් වීමේ අවදානමක් තිබෙනවා කියලා මා හිතනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ වනවා. ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ තල්දූව පොළ භූමිය ගොඩ කරන්න රුපියල් මිලියන 45.7ක් නාගරික සංවර්ධන අධිකාරියට ලබා දුන් බව. VAT මුදලත් එක්ක රුපියල් මිලියන 52.56ක් වනවා. 2008.07.26 වැනිදා එම ව්‍යාපෘතිය ආරම්භ කරනකොට ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව තමයි අවශ්‍ය උපදේශනයන් ලබා දුන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කියන්න කනගාටුයි. ඒ ප්‍රදේශයේ සහ ඒ අවට ජීවත් වෙන ජනතාවගේ කිසිම අදහසක්වත් නැතිව තමයි මෙම ව්‍යාපෘතිය පටන් ගෙන තිබෙන්නේ. මේ ව්‍යාපෘතිය කුමක්ද කියලාවත් ඔවුන්ව දැනුවත් කරලා නැහැ. අද වනවිට එම ව්‍යාපෘතිය නිම කරලා තිබෙනවා. ආරම්භ කරපු දවසක් නැහැ. ව්‍යාපෘතියේ නමක් නැහැ. ව්‍යාපෘතියට වෙන් කරපු මුදලක් නැහැ. ව්‍යාපෘතිය නිම කරලා දීලා තිබෙනවා. හැබැයි, අද තිබෙන ප්‍රධානම ගැටලුව මෙයයි. මේ ව්‍යාපෘතිය නිසි ආකාරයට නිම කරලා නැති නිසා අද මේ ප්‍රදේශයේ ජීවත් වෙන ජනතාව ලොකු භීතියකින් පසු වෙනවා, ඉදිරි කාලය තුළදී ගං වතුරක් ආවොත් මේ ජනතාව පෙර තිබුණු තත්ත්වයට වඩා වැඩි ආපදා තත්ත්වයකට පත් වෙයි කියලා. මම මේ කරුණු කාරණා අපේ කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී නාගරික සංවර්ධන අධිකාරියෙන් පැමිණි නිලධාරීන් වෙත ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් නිසි පිළිතුරක් නැහැ. මේ ව්‍යාපෘතිය නිම කරලා 2019.03.24 වෙනිදා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට භාර දුන්නා. , අපි දකින දෙයක් තමයි එම ව්‍යාපෘතියේ දී ඇළ සීතාවක ගඟට සම්බන්ධ කරන්න ඕනෑය කියන කාරණය. ඒ වුණාට ඇළ ගඟට සම්බන්ධීකරණයක් කරන්නේ නැතිව මේ ව්‍යාපෘතියේ වැඩ අවසන් කරලා තිබෙනවා. මේ නිසා හැමදාමත් මැයි මාසයේ ගං වතුර ආපදාවට ලක් වෙන කැලණි ගං මිටියාවතේ සීතාවක ගඟ නිසා ඉදිරියේ දී අපට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා. වාසනාවකට පසුගිය මැයි මාසයේ අපට ගං වතුරක් ආවේ නැහැ. ඒ නිසා මේ ගැන විශේෂ අවධානය යොමු කරවනවා. ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව අත්තනෝමතික විධියට, කිසිම දැනුම්දීමක් නැතිව නිම කරලා තිබෙන ව්‍යාපෘතිය ගැන ඒ ප්‍රදේශයේ ජීවත් වෙන ජනතාව වාගේම, ඒ ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතවරිය විධියට ඇත්තටම මට සෑහීමටක පත් වෙන්න බැහැ. එම නිසා මේ ගැන විමර්ශනයක් කරලා, ඉදිරියේ දී මේ පිළිබඳව සොයා බලන්න කියන කාරණය ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ දී කැලණි ගඟ ආශ්‍රිතව තිබෙන අපේ කැලණිවැලි ක්‍රීඩාංගනය ගැනත් කථා කරන්න කැමතියි. මෙම ක්‍රීඩාංගනය නාගරික සංවර්ධන අධිකාරිය සතු ක්‍රීඩාංගනයක්. හැබැයි, පසුගිය කාලය තුළ එම ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු කළේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන්. රුපියල් මිලියන 8ක පමණ මුදලක් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් වෙන් කරලා ක්‍රීඩා පිටිය සංවර්ධනය කළා. හැබැයි, නාගරික සංවර්ධන අධිකාරිය සතු ක්‍රීඩා පිටියක් වුණාට කිසිම නඩත්තු කටයුත්තක් සිදු වෙන්නේ නැහැ.

මේ ක්‍රීඩාංගණය බොහොම ඉපැරැණි, ඓතිහාසික ක්‍රීඩාංගණයක්. මා හිතන්නේ අපේ බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාත් මේ ක්‍රීඩාංගණය ගැන දන්නවා. සීතාවක ගැන කථා කරනකොට, කැලණිවැලි තිරික්කල් රේස් තිබුණු ක්‍රීඩාංගණය තමයි මේ ක්‍රීඩාංගණය. ඒ ක්‍රීඩා භූමියේ සංවර්ධන කටයුතු නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගෙන තිබෙනවා. ඒ ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු කෙරෙහි ගරු අමාත්‍යතුමාගේ අවධානය මා යොමු කරනවා. වටිනා නිජ බිම් විධියට සීතාවක රාජධානිය හා බැඳුණු ඓතිහාසික පුරවරයක්. ඒ නිසා මේ අවස්ථාවේදී මෙම ක්‍රියාවලියන් දෙක ගැනම මා ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නිම කරපු මේ ව්‍යාපෘතිය ආරම්භ කළේ කවදාද, නිම කළේ කවදාද, ඒ වෙනුවෙන් වෙන් කරපු මුදල ගැනවත් සඳහන් වෙලා නැහැ කියන කාරණය මා මේ අවස්ථාවේදී මේ ගරු සභාවට දන්වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. ඊළඟට, ගරු ෂෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.40]

**ගරු ෂෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ලැබීම ගැන මා සතුටු වනවා. පාඨලී චම්පික රණවක ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ සිටින නිසා මා මේ කාරණය කියන්න කැමතියි. අවිධිමත් සංවර්ධනය හා මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය හරහා ලංකාවේ තෙත් බිම් සහ වගුරු බිම් සියයට 65ක් පමණ බරපතළ තර්ජනයකට ලක් වෙලා තිබෙනවාය කියා අද විශේෂයෙන්ම වාර්තා වනවා. ඒ වාගේම හෙක්ටෙයාර 5,000කට ආසන්න කඩොලාන ප්‍රමාණයක් මේ වනකොට තර්ජනයකට ලක් වෙලා තිබෙනවා. ඒ ගැන නැවත සමීක්ෂණයක් කර, කඩිනමින් මේ විනාශය නවත්වන්න අවශ්‍ය පියවර ආණ්ඩුව ගනීවි කියා අපි විශ්වාස කරනවා. ඒ වාගේම කළපු සහ තෙත් බිම් අද තවදුරටත් තර්ජනයකට ලක් වෙලා තිබෙනවා. පුත්තලම, බූන්දල, මුතුරාජවෙල, කෝකිලායි, පූනරීන් වැනි කළපු සහ තෙත් බිම් අද අනවසර ගොඩකිරීම් සහ අත්පත් කර ගැනීම් නිසා තර්ජනයකට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා මාදු ගඟ, බොල්ගොඩ වැනි තෙත් බිම් මේ වනකොට විනාශ වෙමින් පවතිනවා. අනවසර අත්පත් කර ගැනීම් සිදු වන නිසා ඒ තෙත් බිම් විනාශයට පත් වෙමින් පවතිනවා. එක් පැත්තකින් මේ තෙත් බිම් සහ වගුරු බිම් විනාශය බරපතළ පරිසර හානියක් වනවා වාගේම ජලජ ජීවීන් සහ ජලජ

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

පැළෑටි විනාශ වීමේ බරපතළ තර්ජනයක්ද තිබෙනවා. මේ ආශ්‍රිත පැම්ණිලි රාශියක් ලැබිලා තිබෙනවා. ඒ නිසා අද තිබෙන මේ තත්ත්වය සම්බන්ධයෙන් කරුණාකරලා විමර්ශනයක් කරන්න කියා අපි ආණ්ඩුවට යෝජනා කරනවා. නිලධාරින්ගේ අඩුවක් තිබෙනවා නම් නිලධාරින් බඳවා ගෙන, එහෙම නැත්නම් වෙනත් විමර්ශන නිලධාරින් තමන්ගේ අමාත්‍යාංශයට අනුයුක්ත කර, මේ සම්බන්ධයෙන් හොයා බැලීමක් කරන්න කියාත් අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. සමහර ප්‍රදේශවල පහත් බිම් ගොඩ කිරීමේදී රජය නීතිරීති උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක වන ආකාරය අපි දකිනවා. හැබැයි, සාමාන්‍ය පුරවැසියන්ට ඒ නීතිය ක්‍රියාත්මක වනවා. සාමාන්‍ය පුරවැසියන්ට නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ නැහැ කියන කාරණය නොවෙයි අපි කියන්නේ. නමුත් සාමාන්‍ය පුරවැසියෙකු යටත් විය යුතු නීතිය, අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, රජයේ ඉදිකිරීමක් සිදු කිරීමේදීත් ඒ ආකාරයෙන්ම ඉටු විය යුතුයි කියන කාරණය තමයි අපි කියන්නේ. මොකද, එහෙම නැති වුණොත් මේ රටේ ඉතුරු වෙලා තිබෙන වගුරු බිම් හා තෙත් බිම් අපට ආරක්ෂා කර ගැනීමේ හැකියාව නැති වනවා. ඒ නිසා ඉස්සෙල්ලාම රජය ඒ සම්බන්ධයෙන් ආදර්ශයක් ලබා දීලා, ඒ කටයුතු සිදු කළොත් හොඳයි කියන යෝජනාව අපි ඇමතිතුමාට ඉදිරිපත් කරනවා.

මේ අමාත්‍යාංශය යටතේ Port City ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව අපි දැක්කා. අපි ඒ සම්බන්ධයෙන් සතුටු වනවා. එක් පැත්තකින් මේ ආණ්ඩුව බලයට පත් වෙලා, අවුරුදු දෙකකදී Port City ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නැවතුණා. ඒ සඳහා චීනයත්, කොන්ත්‍රාත් සමාගම් සමඟත් ආණ්ඩුව අදාළ සාකච්ඡා කරමින් පැවතුණා. වර්තමාන ආණ්ඩුව බලයට එද්දී ඔවුන්ගේ ප්‍රධානම තර්කය බවට පත් වුණේ බලයට ආ වහාම Port City ව්‍යාපෘතිය නතර කිරීමට අවශ්‍ය වැඩ කටයුතු කරනවාය කියායි. හැබැයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජය ඉදිරිය ගැන කල්පනා කර, මේ ආරම්භ කරපු Port City ව්‍යාපෘතිය අවුරුදු දෙකක් වැඩ නැවතිලා, ඊට පස්සේ ඒ සඳහා යම් යම් එකඟතාවන්ට ඇවිල්ලා, නැවත ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් අපි සතුටු වනවා. අපි ඊට වඩා සතුටු වනවා මෙය අපේ රටේ අනාගතය වෙනුවෙන් ඉදි වුණු ව්‍යාපෘතියක්, එය අපේ රටේ අනාගත ආර්ථික මර්මස්ථානය හැටියට හැඳින්වීමට ගරු අග්‍රාමාත්‍යතුමාත්, පාඨලී චම්පික රණවක ඇමතිතුමාත් කටයුතු කිරීම ගැන. ඒ ව්‍යාපෘතිය හරහා ලංකාවට ලැබෙන වාසි ප්‍රමාණය සහ රටක් හැටියට ආර්ථික මර්මස්ථානයක් අපේ රජය යටතේ ඉදිකිරීම ගැන එදා විවේචනාත්මකව බැලුවාට, අද එහි යථාර්ථය සම්බන්ධයෙන් කටයුතු කිරීම ගැන අපි එක් පැත්තකින් සතුටු වනවා.

අපේ අනිකුත් ව්‍යාපෘතිවලටත් ඔය චෝදනාම තමයි තිබුණේ. ඉදි කරපු සෑම ව්‍යාපෘතියක් ගැනම විපක්ෂයේ හිටපු කණ්ඩායම් චෝදනා මුඛයෙන් කථා කළාට, ආණ්ඩුවට ආවාට පස්සේ ඔවුන් ඒ ව්‍යාපෘති ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාම සිදු කරනවා. මොකද, ඊළඟ ශත වර්ෂයට මුහුණ දීම සඳහා එවැනි ව්‍යාපෘතිවල දැඩි අවශ්‍යතාවක් තිබුණා. රටක් හැටියට අපි තරගකාරීත්වයට මුහුණ දෙන්න ඕනෑ. කලාපයේ බලවතුන් සමඟ තරගකාරීව ඉදිරියට යෑමේ අවශ්‍යතාවක් තිබුණා. ඒ සියල්ල ගැන සලකා බලලා තමයි, ඒ ව්‍යාපෘති සියල්ල ක්‍රියාත්මක කිරීම සිදු වුණේ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම 'කේබල් කාර් ව්‍යාපෘතිය' යටතේ ඒ හරහා ඉඩම් අත්පත් කර ගැනීම් සිදු කර තිබෙනවාද? ඒ ඉඩම් අත්පත් කර ගැනීම් හරහා ගොඩ කිරීම් සිදු කර තිබෙනවාද? ඒ සඳහා නිසි අනුමැතියක් -අවසරයක්- ඒ අදාළ අමාත්‍යාංශයෙන් ලැබිලා තිබෙනවාද? අමාත්‍යාංශ හා ඒ ආයතන සමඟ සම්බන්ධීකරණයක් සිදු වෙලා තිබෙනවාද? මේ වාගේ කාරණා සම්බන්ධයෙනුත් ඔබතුමා පැහැදිලි කිරීමක් කරයි කියා අපි බලාපොරොත්තු වනවා. මොකද, ඒ සම්බන්ධයෙනුත් විවිධ මත අද ප්‍රචාරය වෙමින් පවතිනවා. ඒ ගැන කිසියම් සැකයක් ජනතාවටත් තිබෙනවා. අපි දැක්කා ව්‍යාපෘති ලංකාවට එද්දී, මේ රජය තුළ තිබෙන වංචා හා දූෂණ ඒ ව්‍යාපෘති නතර කිරීමට හේතුවක් බවට පත් වුණ බව. ඒ ගැන විවිධ කණ්ඩායම් ප්‍රසිද්ධියේ ඇවිත් අදහස් දැක්වීම් සිදු කළා. ඒ නිසා අපි හිතනවා, ඔබතුමා අපට ඒ ගැන පැහැදිලි කිරීමක් සිදු කරයි කියා.

මේ වනකොට වත්මන් ආණ්ඩුව අවුරුදු හතරහමාරකට-පහකට ආසන්න කාලයක් මේ රට පාලනය කර තිබෙනවා. අනෙක් පැත්තෙන් ජනාධිපතිතුමා ධුර කාලයේ අවසාන භාගයට ඇවිත් තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබෙද්දී පසු ගිය අප්‍රේල් මාසයේ 21 වන දින පාස්කු ඉරු දිනයේ අවාසනාවන්ත සිදුවීමක් වුණා. ඒ සම්බන්ධයෙන් සාධාරණ විනිශ්චයක්, සාධාරණව පරීක්ෂණයක් සිදු වන බව අද වන තුරු අපි දකින්නේ නැහැ. එකම එක කාරණාවයි ආණ්ඩුව සිදු කළේ. ඒ රිසාඩ් බදියුදීන් ඇමතිතුමාට විරුද්ධව තිබුණු විශ්වාස භංග යෝජනාවේදී අනිවාර්යයෙන්ම ආණ්ඩුව පරාජයට ලක් වන නිසා ඒ විශ්වාස භංග යෝජනාව ඉවත් කර ගැනීමට උපක්‍රමශීලීව කටයුතු කළා. ජාතිවාදය පදනම් කරගෙන සම්පූර්ණයෙන් බෙදුම් රේඛාවක් ගහලා, මුස්ලිම් සහ අනෙක් ජාතීන් හැටියට බෙදිලා, ඔවුන් ඉල්ලා අස්වීමක් සිදු වුණා. හැබැයි, ඉල්ලා අස්වීම සිදු වෙද්දී අපි නිරන්තරයෙන්ම කිව්වා, මේ ඉල්ලා අස්වීම ජනතා මනස වෙනතකට යොමු කිරීම සඳහා කරනවා වාගේම, මේ විශ්වාස භංග යෝජනාවේදී රජය ආරක්ෂා වීම සඳහා ගත්ත පියවරක් බව. හැබැයි, ඒ රංගනය අද වනකොට එළි දැක්විලා තිබෙනවා. ඒ ඇමතිවරු දිවුරුම් දීම වැරදි කාරණයක් කියා අපි කියන්නේ නැහැ. හැබැයි අපි එදා කිව්වේ, ඒ ඇමතිවරුන් ඉල්ලා අස්වීම වැරදි කාරණයක් කියා. ඒ ඇමතිවරු ඉල්ලා අස්වෙලා ලබා දුන්නේ ඉතාම බරපතළ, භයානක සහ වැරදි පූර්වාදර්ශයක්. හැබැයි, අද වනකොට කබීර් හෂීම් ඇමතිතුමාත්, අබ්දුල් හලීම් ඇමතිතුමාත් දිවුරුම් දීලා තිබෙනවා. අබ්දුල් හලීම් ඇමතිතුමාගේ සහෝදරයා සම්බන්ධයෙන්, කොහොමද ඒ අවසර ලබා දීම් සිදු වෙලා තිබෙන්නේ කියා, අප්‍රේල් 21 වන දා සිදුවීම පිළිබඳව විමර්ශනය කරන කාරක සභාවේදී විවිධ කාරණා හෙළි වෙලා තිබෙනවා. අපට ආරංචි විධියට හෙට දිනයේ හෝ නුදුරු දිනයකදී රිසාඩ් බදියුදීන් ඇමතිතුමා හැර ඉවත් වුණු අනෙකුත් සියලුම ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් නැවත දිවුරුම් දීමක් සිදු කරනවා. හැබැයි, අපි කියන්නේ ඔවුන් කළ යුතුව තිබුණේ මේ පරීක්ෂණ සඳහා සහයෝගය ලබා දීම මිස, මේ ආකාරයට ආණ්ඩුව අපහසුතාවට පත් වෙද්දී ජාතිවාදය පදනම් කරගෙන ඉල්ලා අස්වීමක් සිදු කිරීම නොවෙයි.

අද වනකොට මාසයක් ඉක්ම ගිහින් නැහැ. ඔවුන් මාසයක කාලයක් ලබා දුන්නා. අපි මේ රටේ පළමු වතාවට දැක්කේ, චෝදනාවට ලක් වුණු පුද්ගලයන් රජයට සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට -පොලීසියට- මාසයක කාලයක් ලබා දෙනවා; නිශ්චිත කාලයක් ලබා දෙනවා. හැබැයි ඉල්ලා අස්වීම සිදු වෙද්දී, ලබා දුන් නිශ්චිත කාල පරිච්ඡේදය අවසන් වෙලා නැහැ. ඒ නිසා අපට කියන්න තිබෙන කාරණාව මේකයි. අද රටක් හැටියට එක් පැත්තකින් අපි මූල්‍ය අර්බුදයකට මුහුණ දෙනවා. අනෙක් පැත්තෙන් සමාජයීය අර්බුදයකට මුහුණ දෙනවා. අද දේශපාලන අර්බුදයකට ගමන් කර තිබෙනවා. මෙය සිදු වුණේ, ආණ්ඩුව විසින් විවිධ අවස්ථාවල රංගන ඉදිරිපත් කරපු නිසයි. ඒ එක රංගනයක්, ඒ එක නාටකයක් තමයි අපි දින 14කට කලින් දැක්කේ. ඒ නිසා අපි ආණ්ඩුවට නිතරම අවධාරණය කරන්නේ මේකයි. රජය ආරක්ෂා කර ගැනීම, රජයේ මන්ත්‍රීවරුන්ගේ වග කීමක්. ඒකට අපි අභියෝග කරන්නේ නැහැ.

රටේ ජනතාව ආරක්ෂා කර ගැනීමත් රජයේ වගකීමක් කියන කාරණාව අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. රජය තව කොපමණ කල් මේ ආකාරයට රටේ ජනතාව රවටමින් ඉදිරියට යන්නද කටයුතු කරන්නේ? අද මූල්‍ය අර්බුදය සම්බන්ධයෙන් මුදල්

ඇමතිතුමාම චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. දැන් ආණ්ඩුව කථා කරන ප්‍රාග්ධන වියදම්, එන ආයෝජන කරන්නේ කොහොමද? මොකද, ප්‍රාග්ධන වියදම් සියයට 15ක් කපා හැරීමට රජය චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. ප්‍රාග්ධන වියදම්වලින් සියයට 15ක් කපා හැරියාම, මෙතෙක් කල් රජයේ වියදම් දරපු කණ්ඩායම්වලට ඉදිරි කාලයේදී ගෙවීම් සිදු කරන්නේ කොහොමද? [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තත්පර 30ක කාලයක් ලබා දෙන්න.

රජයට ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවා කියා අපි දකින්නේ නැහැ. රජය අද දවසේ කල්පනා කරන්නේ හෙට දවස ගැන පමණයි. හෙට දිනයේ තමන්ගේ පරමාර්ථය ඉටු කර ගන්න පුළුවන් නම්, රජය හෙට දවස දක්වා පවත්වාගෙන යන්න පුළුවන් නම් ඔන්න අද දවසේ තීන්දුවක් ගන්නවා. රටේ බරපතළ මූල්‍ය අර්බුදයක් ඇති වී තිබෙන අවස්ථාවක නාගරික සංවර්ධන අධිකාරිය හරහා මේ කියන කාරණා ඉටු කර ගන්නේ කොහොමද කියන සැකය අපට තිබෙනවා.

මේ ගරු සභාවේ කථා කළ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන් නිතරම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විවේචනයට ලක් කළා. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ ලේකම්තුමා නාගරික සංවර්ධන අධිකාරියේ කරපු කාර්ය භාරයත් 2015 සිට යහ පාලන ආණ්ඩුව කරපු කාර්ය භාරයත් අතර පරතරය අතිවිශාලයි. මහ විශාල පරතරයක් තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ සාධාරණ කාරණා හැර, විවේචනය කිරීම සුදුසු නැහැ කියන කාරණාව ඉදිරිපත් කරමින්, විශේෂයෙන්ම අනවසර ගොඩකිරීම්, ඉදිකිරීම් සහ තෙත් බිම් හා වගුරු බිම් විනාශ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න කියා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.50]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 1968ஆம் ஆண்டின் 15ஆம் இலக்க, இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனச் சட்டத்தைத் திருத்துவதற்கான சட்டமூல விவாதத்திலே உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக உங்களுக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். குறிப்பாக, இந்தச் சட்டமூலத்தைச் சபைக்குச் சமர்ப்பித்திருக்கும் மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர் பாட்டளி சம்பிக ரணவக்க அவர்களுக்கு முதற்கண் எனது நன்றிகளைத் தெரிவித்துக்கொள்ள வேண்டும். குறிப்பாக, பல ஆண்டு காலமாக ஹட்டன் நகரில் பாவனையற்றுக் கிடந்த புகையிரத நிலையக் களஞ்சியசாலை அமைந்திருந்திருக்கும் இடத்தை விடுவிக்குமாறு கௌரவ அமைச்சர் திகம்பரம் அவர்களுடன் கௌரவ அமைச்சர் இராதாகிருஷ்ணன் அவர்கள் மற்றும் நான் உள்ளிட்டோர் குழு அறையில் அமைச்சர் அவர்களைச் சந்தித்து நாம் விடுத்த வேண்டுகோளின் அடிப்படையிலே, தற்போது அந்த இடத்தைப் புகையிரதத் திணைக்களத்திடமிருந்து விடுவித்து, அந்தக் கட்டடத்தை மாற்றி வடிவமைத்து, ஒரு பிரதான வர்த்தகக் கேந்திர இடமாக ஹட்டன் நகரத்தை அபிவிருத்தி செய்கின்ற முனைப்புடன் அந்த நகர அபிவிருத்திக்கான ஏற்பாடுகளைச் செய்துகொண்டிருக்கின்றார். அதற்காக அவருக்கு நன்றி தெரிவித்துக்கொள்கின்ற அதே சந்தர்ப்பத்தில், இன்று முன்வைக்கப்பட்டிருக்கும் இந்தக் காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம் தொடர்பாக பெருந் தோட்டத்துறை சார்ந்து ஏற்படக்கூடிய பிரச்சினைகள் அல்லது ஏற்படுத்தவேண்டிய பாதுகாப்பு நடவடிக்கைகள் மற்றும் ஏற்பாடுகள் சம்பந்தமாக இந்தச் சபையிலே சில கருத்துக்களை முன்வைக்கலாமென நினைக்கின்றேன்.

இலங்கைக் காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம் தொடர்பாக ஏற்கெனவே இருந்த சட்டத்தைத் திருத்துவதன்மூலமாக அதனை மேலும் சக்திமயப்படுத்தி, அபிவிருத்தி நடவடிக்கைகளுக்காகக் காணிகளைப் பெற்றுக் கொள்வதற்கான ஏற்பாடுகளைச் செய்வதற்காக இந்தச் சட்டமூலம் தொடர்பாகப் பாராளுமன்றத்திலே இன்று நாங்கள் விவாதித்துக் கொண்டிருக்கின்றோம். 1972ஆம் ஆண்டு முன்வைக்கப்பட்ட காணி மறுசீரமைப்புச் சட்டம், காணி உச்சவரம்புச் சட்டம் மற்றும் காணி மறுசீரமைப்பு ஆணைக்குழு போன்றன பெருந்தோட்டத்துறையில் பாரிய மாற்றங்களைக் கொண்டுவருவதற்கு வித்திட்டன. அதுவரை காலமும் பிரித்தானிய ஆட்சியின்கீழிருந்த இலங்கைக்கு 1948ஆம் ஆண்டு சுதந்திரம் வழங்கப்பட்டு பிரித்தானியர் அவர்களது நாட்டுக்குச் சென்றபோதும்கூட, 1972ஆம் ஆண்டு இலங்கை குடியரசாக மாறுகின்ற காலம் வரைக்கும் அந்தப் பெருந்தோட்டங்களை அவர்களே நிர்வகித்து வந்தார்கள். அன்று கொண்டுவரப்பட்ட காணி உச்சவரம்புச் சட்டம் அவர்களை இந்த நாட்டிலிருந்து முழுமையாக வெளியேற்று வதற்கு ஏதுவாக அமைந்ததுடன், காணி மறுசீரமைப்பு ஆணைக்குழுவினூடாக அந்தக் குறிப்பிட்ட காணிகளை அரசாங்கத்திற்குப் பொறுப்பேற்று அதனூடாகத் தோட்டங் களை அரசாங்கமே நடத்துகின்ற ஒரு நிலைமையும் உருவானது. அதன்போதுதான் 'ஜனவசம', 'உசவசம', மக்கள் பெருந்தோட்ட அபிவிருத்திச் சபை போன்ற சபைகளூடாகப் பெருந்தோட்ட நிர்வாகங்கள் உள்ளீர்க்கப்பட்டன. இருந்த போதும்கூட, அந்த முறைமை 20 வருட காலங்களுக்கு மேலாக நீடிக்கவில்லை.

1992ஆம் ஆண்டு மீளவும் இந்தப் பெருந்தோட்டங்கள் அமைந்திருக்கின்ற காணிகள் தனியார்மயப்படுத்தலுக்குட் பட்ட வகையிலே, தங்கப் பங்குடமையாளர் என்கின்ற வகையிலே காணியின் உரிமையாளராக அரசாங்கம் இருந்தபோதும்கூட, அவை 22 கூட்டிணைக்கப்பட்ட பெருந்தோட்டக் கம்பனிகளுக்கு - RPC என்று சொல்லப் படுகின்ற பிராந்தியக் கம்பனிகளுக்கு வழங்கப்பட்டு, இந்தக் காணிகளிலே தேயிலை, இறப்பர் போன்ற பெருந்தோட்டப் பயிர்ச் செய்கைகளை மேற்கொள்கின்ற ஒரு முறைமைதான் தற்போது காணப்படுகின்றது. 1972ஆம் ஆண்டுக் காணி உச்சவரம்புச் சட்டத்தோடு 50 ஏக்கருக்கு மேற்பட்ட பெருந்தோட்டக் காணிகள் இவ்வாறு அரச கூட்டுத்தாபனங் களுக்குக்கீழாக நிர்வகிக்கப்படுகின்ற பெருந்தோட்ட நிறுவனங்களாக மாற்றப்பட்டபோதும்கூட, 50 ஏக்கருக்குக் குறைவான பரப்பளவைக்கொண்ட பெருந்தோட்டங்கள் சிறுதோட்டங்களாக்கப்பட்டன. அவையும் 50 ஏக்கர் தோட்டங்கள் என்றே சொல்லப்படுகின்றன. அவ்வாறு மாற்றப்பட்டுத் தனியார் தோட்டங்களாக அவை தொடர்ச்சியாக நிர்வகிக்கப்பட்டு வந்ததும் நிர்வகிக்கப்பட்டு வருகின்றமையும் நாம் அறிந்ததே.

இப்பொழுது இந்தப் பெருந்தோட்டத்துறை சார்ந்த அரச கூட்டுத்தாபனங்கள் மற்றும் பிராந்தியக் கம்பனிகளின்கீழ் இயங்குகின்ற தோட்டங்களில் வாழ்கின்ற மக்களின் அபிவிருத்தி நடவடிக்கைகளுக்குக் கிடைக்கப்பெற்றிருக்கின்ற வாய்ப்புப்போல தனியார் தோட்டங்கள் எனப்படுகின்ற தோட்டங்களில் வசிக்கின்ற மக்களுக்குரிய காணி உரிமை களைப் பெற்றுக் கொடுப்பதற்கோ, உரிய வீடமைப்பு அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொள்வதற்கோ சட்டரீதியான பல்வேறு சிக்கல்கள் இருக்கின்றன. அது மாத்திரமல்லாது, இவ்வாறு இந்த 50 ஏக்கர் காணி என்று சொல்லப்படுகின்ற அந்தத் தோட்டங்களின் உரிமையாளர்கள் அங்குள்ள மக்களுக்குத் தெரியாமலேயே அந்தத்

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

தோட்டங்களை வெளியாருக்குப் பகிர்ந்து விற்பனை செய்கின்ற ஒரு நிலைமை சமகாலத்திலே இடம்பெற்றுக் கொண்டு வருகின்றது. இதன் காரணமாக காலங்காலமாக, பரம்பரை பரம்பரையாக அந்தப் பிரதேசத்திலே வாழ்ந்த மக்கள் முதலாவதாக அவர்கள் அதுவரை காலமும் செய்துவந்த தொழிலை இழக்கின்றார்கள்; அடுத்ததாக, அவர்களுக்குரிய அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொள்வதற்கான வாய்ப்பினை ஏற்படுத்திக் கொடுக்கவேண்டுமெனில், காணி உரிமை மறுக்கப்படுவதனூடாக அதற்கான வாய்ப்பு இடைநிறுத்தப்படுகின்றது.

நான் பிரதிநிதித்துவம் செய்கின்ற நுவரெலியா மாவட்டத்தில் லிந்துலை பிரதேசத்திலே ஒடின்ரன் என்கின்ற தோட்டத்துக்குக் கடந்த மாதம் நான் சென்றிருந்தேன். அது 50 ஏக்கர் தோட்டமென்ற வகையிலே தனியாருக்குச் சொந்தமான தோட்டமாகும். அந்தத் தோட்டத்திலே வசிக்கின்ற மக்களுக் குத் தெரியாமலேயே அந்தத் தோட்டம் துண்டு துண்டாகப் பிரிக்கப்பட்டு வெளியாருக்கு விற்கப்பட்டிருக்கின்றது. அந்தத் தோட்டத்தில் காலங்காலமாக வசித்து வந்த மக்கள் இப்போது நிர்க்கதி நிலைக்கு ஆளாகியிருக்கின்றார்கள். நாங்கள் அமைச்சு ரீதியாக அவர்களுக்கான அபிவிருத்தி நடவடிக்கை களை முன்கொண்டு செல்வதென்றாலும்கூட, அங்கே உரிய காணிகளைப் பெற்றுக்கொடுப்பதற்கான வாய்ப்புக் கிடைப்பதில்லை. நுவரெலியா மாவட்டமாக இருக்கலாம் அல்லது வேறு மாவட்டங்களாக இருக்கலாம், ஏதேனும் அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டு மென்றால், பெருந்தோட்டக் கம்பனிகள் நிர்வகிக்கின்ற காணிகளைப் பெற்றுக்கொள்வது சம்பந்தமாக கோரிக்கை முன்வைக்கப்படுகின்றது. குறிப்பாக, இன்று முன்வைக்கப் பட்டிருக்கின்ற இந்தச் சட்டமூலத்திலும்கூட, அத்தகைய ஒரு கோரிக்கை முன்வைக்கப்படலாம். நான் நினைக்கிறேன், இந்தச் சட்டத்திற்குக்கீழாக களுத்துறை மாவட்டத்தின் மில்லாவ போன்ற தோட்டங்களில், ஹொரணை பகுதியிலுள்ள தோட்டங்களில் காணிகள் சுவீகரிக்கப்படுவதற்கான வாய்ப்புக்கள் இருக்கின்றன.

தொழிற்சாலைகளை அமைப்பதாக இருக்கட்டும் அல்லது நகர அபிவிருத்தி என்ற அடிப்படையிலே நகரங்களை அமைப்பதாக இருக்கலாம், அத்தகைய அபிவிருத்திகளை நாங்கள் மறுக்கவில்லை. காரணம், நாடு வளர்ச்சி யடைகின்றபோது இத்தகைய அபிவிருத்திகள் தேவைப் படலாம். ஆனால், அவ்வாறு காணிகள் சுவீகரிக்கப்படுகின்ற போது அதுவரை காலமும் அந்தப் பகுதிகளிலே வாழ்ந்த மக்களின் வாழ்வாதாரங்களோ வாழ்க்கையோ பாதிக்கப்படாத வகையிலே, காலம் காலமாக அந்தந்தப் பிரதேசங்களிலே வாழ்ந்த மக்களின் வாழ்வாதாரங்களை உறுதிப்படுத்துவதற்கும் அவர்களை மாற்று இடங்களிலே குடியிருத்துவதற்கும் அவர்களது தொழிலை உறுதிசெய்வதற்குமான நடவடிக்கை களையும் மேற்கொள்ளும் வகையில் கௌரவ அமைச்சர் பாட்டளி சம்பிக ரணவக்க அவர்கள் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சோடு கலந்துரையாடி, ஓர் அமைச் சரவைப் பத்திரத்தைத் தாக்கல்செய்வதனூடாக இந்தக் காணிச் சுவீகரிப்பு நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென்பதை நான் இங்கு வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். பெருநகர அபிவிருத்தி என்ற வகையிலே, களுத்துறை மாவட்டத்திலும் கொழும்பு மாவட்டத்தின் ஒரு சில பகுதிகளிலும் இந்தப் பிரச்சினை இப்போது எழுந்திருப்பதாக நான் நினைக்கின்றேன். எனவே, அந்தந்தப் பிரதேசத்தில் வாழ்கின்ற மக்களின் வாழ்வாதாரங்கள் தொடர்ச்சியாகப் பாதிக்கப்படாத வகையிலே, இந்தச் சட்டத்தினை அமுல்படுத்துவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்கவேண்டுமென மீண்டும் கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். வணக்கம்.

[பி.ப. 3.59]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனத் திருத்தச் சட்டமூல விவாத்திலே எனக்கும் பேசுவதற்கு நேரம் ஒதுக்கித் தந்தமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். சதுப்புநிலங்கள் அல்லது தாழ்நிலங்களை மீட்டெடுத்தல் என்ற தலைப்பிலே விவாதங்கள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. தமிழ் மக்களைப் பொறுத்தவரை, வடக்கிலும் கிழக்கிலும் அரச படைகளாலும் அரசின் பல்வேறுபட்ட திணைக்களங்களாலும் சுவீகரிக்கப்பட்டிருக்கின்ற காணிகளை மீட்டெடுப்பதற்காகத் தான் இந்த மண்ணிலே நீண்டகாலமாக ஓர் அஹிம்சைப் போராட்டமும் ஓர் ஆயுதப்போராட்டமும் நடைபெற்று முடிந்திருக்கின்றன. இந்தப் போராட்டம் 2009 உடன் நிறைவடைந்தாலுங்கூட, இற்றைவரைக்கும் தமிழ் மக்களுடைய பூர்வீக நிலங்களிலே அவர்கள் மீளக்குடி யேறுவதில் பல்வேறுபட்ட சிக்கல்கள் காணப்படுகின்றன. அரசாங்கத்தினுடைய முப்படையினரும் பல்லாயிரம் ஏக்கர் நிலங்களைக் கையகப்படுத்தியிருக்கின்றார்கள். அதுமாத்திர மன்றி, இந்தக் காணிகளைச் சுவீகரிப்பதற்காக இங்கே பல்வேறுபட்ட திணைக்களங்கள் காணப்படுகின்றன. அந்த வகையில், வனவளத் திணைக்களம், வனஜீவராசிகள் திணைக்களம், தொல்பொருள் திணைக்களம், மகாவலி அபிவிருத்தி அதிகாரசபை போன்ற பல்வேறுபட்ட திணைக்களங்கள் இந்தக் காணிகளைச் சுவீகரிப்பதிலே முக்கியமானதொரு பங்கை வகிக்கின்றன. அதிலும் குறிப்பாக வடக்கு, கிழக்கிலே இந்தத் தொல்பொருள் திணைக்களமானது முழுக்க முழுக்கத் தமிழ் மக்களுடைய நிலங்களைச் சுவீகரிப்பதற்கும் அவர்களுடைய ஆலயக் காணிகளைச் சுவீகரிப்பதற்கும் முழு முயற்சியிலே இறங்கியிருக்கின்றது. இந்தத் தொல்பொருள் திணைக்களத்தினுடைய நிர்வாக சபையிலே 32 சிங்கள உறுப்பினர்கள் அங்கம் வகிக்கின்றார்கள். ஆனால், இந்த நிர்வாக சபையிலே ஒரு தமிழ் உறுப்பினர்கூட அங்கம் வகிக்கவில்லை.

இந்தத் தொல்பொருள் திணைக்களமானது வடக்கு மாகாணத்தில் மட்டும் 337 இடங்களை அடையாளப் படுத்தியிருக்கின்றது. இந்த 337 இடங்களிலும் பௌத்த சின்னங்கள் இருக்கின்றன என்று ஒருதலைபட்சமாக முடிவெடுத்து அடையாளப்படுத்தி இருக்கிறார்கள். குறிப்பாக, முல்லைத்தீவு மாவட்டத்திலே 167 இடங்கள் அடையாளப் படுத்தப்பட்டிருக்கின்றன. அதிலும் 50 இடங்கள் வெலிஓயா பிரதேச செயலகத்திற்குள்ளேயே பெயர் மாற்றம் செய்யப் பட்டுள்ளன. யுத்த காலத்திலும் சரி, யுத்தத்திற்குப் பிற்பட்ட காலத்திலும் சரி, இப்படி வடக்கிலும் கிழக்கிலும் அடையாளப்படுத்தப்பட்ட தமிழ் மக்களின் பூர்வீகக் காணி களை அரச படைகளிடமிருந்தும் அரச திணைக்களங்களி டமிருந்தும் மீட்டெடுக்கவேண்டிய பாரிய பொறுப்பு தமிழ் மக்களால் தெரிவு செய்யப்பட்டிருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களுக்கு இருக்கின்றது. அதிலும் குறிப்பாக, 2015ஆம் ஆண்டு ஆட்சி மாற்றத்திற்குப் பிற்பாடு தமிழ் மக்களுடைய ஆதரவைப் பெற்ற இந்த அரசாங்கத்தை ஆட்சிக்குக் கொண்டுவந்த தமிழ் மக்களும் சரி, தமிழ்ப்

பாராளுமன்ற உறுப்பினர்களும் சரி, தற்போது இந்த அரசாங்கத்தைப் பாதுகாத்துக்கொண்டிருக்கக்கூடிய தமிழ்த் தேசியக் கூட்டமைப்பின் 14 பாராளுமன்ற உறுப்பினர்களும் சரி, தமிழ் மக்களின் நலன் சார்ந்த, அவர்களின் நிலங்களை மீட்பதற்காக அல்லது தமிழ் மக்களுடைய உரிமை சார்ந்த விடயங்களுக்காக அவர்கள் இந்த அரசாங்கத்தோடு பேரம் பேச வேண்டிய நிலைமை இந்த ஆட்சியினுடைய இறுதிக் காலத்திலே ஏற்பட்டிருக்கின்றது. ஆகவே, தமிழ் மக்களினுடைய வாக்குகளைப் பெற்ற இந்தப் பாராளுமன்ற உறுப்பினர்கள் தமிழ் மக்களுடைய நலனுக்காகப் பேரம் பேசவில்லை என்று சொன்னால், நிச்சயமாக இந்த வரலாற்றுத் தவறுக்காகத் தமிழ் மக்கள் எங்களை மன்னிக்கமாட்டார்கள் என்பதை இந்த நேரத்திலே தெரிவித்துக்கொள்கிறேன்.

1949ஆம் ஆண்டின் சேனாநாயக்கவினுடைய கல்லோயா குடியேற்றத்திலிருந்து முல்லைத்தீவின் நீராவியடிப் பிள்ளையார் ஆலயம் வரைக்கும் தமிழ் மக்களுடைய காணிகளைச் சுவீகரிப்பதற்காகவும் அவர்களின் ஆலயங்களைச் சுவீகரிப் பதற்காகவும் இவர்கள் செயற்பட்டுக் கொண்டிருக்கின்றார்கள். இதற்கப்பால் வடக்கு, கிழக்கிலே பல்லாயிரக் கணக்கான குடும்பங்கள் காணியற்ற நிலையில் இருக்கின்றன. இன்று வடக்கு மாகாணத்தில் மட்டும் 35,000க்கும் மேற்பட்ட குடும்பங்கள் குடியிருப்பதற்குக் காணி இல்லாமல் உறவினர்கள், நண்பர்களின் வீடுகளிலும் வாடகை வீடுகளிலும் தற்காலிகமாக இருக்கின்றனர். சகல மாவட்டங்களிலுமுள்ள காணியற்றவர்கள் தங்களுக்குக் காணி வேண்டுமென்று பிரதேச செயலகங்களிலே விண்ணப்பித்திருக்கின்றார்கள். ஆகவே, காணிக் கச்சேரியின்மூலம் இந்த மக்களுக்குக் காணிகளை வழங்குவதற்குரிய நடவடிக்கையை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் 2 நிமிடங்கள் உள்ளன.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

இங்கு ISIS தாக்குதல் நடைபெற்றவுடனே சர்வதேச நாடுகளின் புலனாய்வுத் துறையினர் இங்கே அழைக்கப்பட்டு, இந்தத் தாக்குதலோடு சம்பந்தப்பட்டிருப்போர் பற்றிய விசாரணைகள் தற்சமயம் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. ஆனால், தமிழ் மக்களின்மீது இலங்கை இராணுவத்தினரால் மேற்கொள்ளப்பட்ட இனப்படுகொலை சம்பந்தமான சர்வதேச விசாரணையை விரும்பாத இலங்கை அரசாங்கம், ஐக்கிய நாடுகள் மனித உரிமைப் பேரவையில் இணக்கம் தெரிவித்த கலப்பு விசாரணையைக்கூட செய்வதற்கு இதுவரைக்கும் தயாரில்லை. "நாங்கள் சர்வதேச விசாரணையை விரும்பவில்லை, இராணுவத்தைக் காட்டிக் கொடுக்க மாட்டோம், சர்வதேச நாடுகள் இங்கே தங்களுடைய விசாரணைகளை மேற்கொள்வதால் இலங்கையின் இறைமை மீறப்பட்டுவிடும்" என்று அதற்கு நீங்கள் காரணம் சொல்லிக்கொண்டிருக்கின்றீர்கள். ISIS தாக்குதலுக்குப் பிற்பாடு தற்சமயம் அமெரிக்கா, Britain, இந்தியா, அவுஸ் ரேலியா போன்ற நாடுகளைச் சேர்ந்தவர்கள் இலங்கை யிலிருந்துகொண்டு இந்த விசாரணைகளை மேற்கொள்ள முடியுமாகவிருந்தால், தமிழ் மக்கள்மீது நடாத்தப்பட்ட இனப்படுகொலைக்கான விசாரணையைச் செய்வதற்கு ஏன் நீங்கள் தயங்குகிறீர்கள்? என்பதை இந்த நேரத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

நன்றி!

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

ஒரு நிமிடம் தாருங்கள்!

இந்த அரசாங்கத்தைப் பாதுகாத்துக்கொண்டிருக்கக்கூடிய தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் தேர்தல் காலத்திலே மக்களுக்கு வழங்கிய ஆணையொன்று இருக்கின்றது. அதேபோன்று, இந்த அரசாங்கம் எங்களுக்குக் கொடுத்த வாக்குறுதிகள் இருக்கின்றன. அவை எதையுமே நிறைவேற்றாமல், புதிய அரசியலமைப்பைக் கொண்டுவருவதாகக் கூறிக்கொண்டு 83 தடவை கூட்டங்களைக் கூட்டியிருந்தார்ர்கள். ஆனால், அந்தப் புதிய அரசியலமைப்பைக் கொண்டுவருகின்ற விடயமானது இன்று கிடப்பிலே போடப்பட்டிருக்கின்றது. அதேபோன்று, தமிழ் மக்களுடைய அன்றாடப் பிரச்சினைகளுக்கும் இதுவரை எந்தவிதமான தீர்வும் காணப்படவில்லை. ஆகவே, தமிழ் மக்களுக்கு வழங்கிய வாக்குறுதிகளை நிறைவேற்றவேண்டிய பாரிய பொறுப்பு இந்த அரசாங்கத்தை ஆட்சிக்குக் கொண்டுவந்த தமிழ்த் தேசியக் கூட்டமைப்பினுடைய பாராளுமன்ற உறுப்பினர்களுக்கு இருக்கின்றது. ஏனென்றால், இற்றை வரைக்கும் அவர்கள்தான் இந்த அரசாங்கத்தைப் பாதுகாத்துக்கொண்டிருக்கின்றார்கள். கல்முனை வடக்குப் பிரதேச செயலகம் தரமுயர்த்தப்பட வேண்டுமென்று பௌத்த துறவிகள், இந்து குருமார் மற்றும் பல்வேறுபட்ட மதத் தலைவர்கள் அங்கே உண்ணாவிரதம் மேற்கொண்டிருக்கின்றார்கள். கௌரவ பிரதமர் அவர்களும் அவருடைய கட்சியைச் சார்ந்த கௌரவ அமைச்சர் அவர்களும்தான் இந்த விடயத்தைக் கையாளவேண்டியவர்கள். ஆகவே, பிரதமர் அவர்களையும் இந்த அரசாங்கத்தையும் பாதுகாத்துக் கொண்டிருக்கும் நீங்கள் அரசாங்கத்துடன் பேரம் பேசுங்கள்!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

நன்றி. கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ள வேண்டும்.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

"இந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்தவில்லையென்றால், அரசாங்கத்துக்கு வழங்குகின்ற ஆதரவை விலக்கிக் கொள்ளப்போகிறோம்" என்று அரசாங்கத்துடன் நீங்கள் பேரம் பேசுங்கள்! இதைச் செய்யாதவிடத்து வரலாறு எங்களை மன்னிக்காது என்பதை இந்த நேரத்திலே கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Wijepala Hettiarachchi to the Chair?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development )

Sir, I propose that the Hon. Wijepala Hettiarachchi do now take the Chair.

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - State Minister of Transport and Civil Aviation)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

[பி.ப. 4.08]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1968ஆம் ஆண்டின் 15ஆம் இலக்க, இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனத் திருத்தச் சட்டமூலம் தொடர்பான விவாதத்திலே பேசச் சந்தர்ப்பம் தந்தமையையிட்டு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். இந்தச் சட்டமூலம் தொடர்பான விரிவான விளக்கங்களை அமைச்சினூடாகப் பெறக்கூடிய வாய்ப்பிருந்தாலும், இலங்கைக் காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனத்துக்குத் தமிழ் website ஒன்று இல்லாத விடயத்தை முதலிலே அமைச்சினுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

காணி மீட்பு என்கின்ற அடிப்படையிலே forest மற்றும் පරිසර போன்ற விடயங்களுக்குப் பொறுப்பான திணைக்களங்களுக்கூடாக எங்களுடைய காணிகள் பாரியளவில் அபகரிக்கப்பட்டுக்கொண்டிருக்கின்றது. அதாவது, நாங்கள் ஆண்டுவந்த பூமிகள் அல்லது எங்களுடைய பூமிகள் கபளீகரம் செய்யப்படுவதை நாங்கள் காண்கின்றோம். இந்த நாட்டிலே 1972ஆம் ஆண்டு பெருந்தோட்டத்துறை கொல்வின் ஆர். டி சில்வா அவர்களுக்குக் கீழிருந்தபோது கொண்டுவரப்பட்ட 50 ஏக்கர் நில உச்ச வரம்புச் சட்டத்தினால் சிறிமாவோ பண்டாரநாயக்க அம்மையார் அவர்களும் பாதிக்கப்பட்டார். ஆட்சியாளர்கள் பாதிக்கப்பட்டதன் காரணமாகத்தான் அன்று காணி, விவசாய அமைச்சராக இருந்த கொப்பேகடுவ அவர்களுக்குக்கீழே இந்தப் பெருந்தோட்டத்துறை உள்வாங்கப்பட்டது. அன்று பல்வேறுபட்ட இன்னல்களும் தொல்லைகளும் ஏற்பட்டன.

1947ஆம் ஆண்டுக்குப் பிறகு, கிழக்கு மாகாணத் தேர்தல் தொகுதிகளைப் பொறுத்தவரையிலே மட்டக்களப்பு, பட்டிருப்பு, அம்பாறை என்ற அடிப்படையில் இருந்த பிரதேசம் இரண்டு மாவட்டங்களாகப் பிரிக்கப்பட்டுத் தொகுதிகள் பிரிக்கப்பட்டபோதும், திருகோணமலை மாவட்டத்திலே மூதூர் - திருகோணமலை என்ற தொகுதி 1976ஆம் ஆண்டு சேருவில ஆகப் பிரிக்கப்பட்டபோதும் நாங்கள் பாரிய காணி அபகரிப்புக்கு உள்ளாக்கப்பட்டோம். திருகோணமலை மாவட்டம் 2,727 சதுர கிலோமீற்றர் பரப்பளவைக் கொண்டது. அங்கு காணி குறையவும் இல்லை, கூடவும் இல்லை. கொழும்பு மாவட்டத்திலே துறைமுக நகர உருவாக்கத்தினால் இப்பொழுது காணி அதிகரித்திருக்கலாம். ஆனால், அங்கு அவ்வாறில்லை. அன்று 1,800 சதுர கிலோமீற்றர் பரப்பளவைக்கொண்ட மூதூர் தொகுதி 586 சதுர கிலோமீற்றராகக் குறைக்கப்பட்டபோது, தம்பலகாமம் பிரதேச சபைப் பிரிவிலே Kalmitiyawa South இல் 33.6 சதுர கிலோமீற்றர்களைக் கொண்ட பகுதி ஒரு GN பிரிவாகவும் Kalmitiyawa North இலே 148.63 சதுர கிலோமீற்றர்களைக் கொண்ட பகுதி ஒரு GN பிரிவாகவும் காணப்பட்டது. இப்படிப் பார்க்கின்றபோது, தம்பலகாமத்திலேயிருந்த கோயிலடி மற்றும் கப்பற்துறை போன்ற பிரதேசங்களிலும் ஏறத்தாழ 100 சதுர கிலோமீற்றர் பரப்பளவு அன்று கபளீகரம் செய்யப்பட்டது. மூதூர் தொகுதி கிண்ணியா, மூதூர், தம்பலகாமம் ஆகிய வற்றை உள்ளடக்கியிருந்தாலும்கூட, அங்கு எங்களுடைய மேய்ச்சல் காணிகள் - மேய்ச்சல் தரைகள் இல்லாமற்போயின. இன்று மேய்ச்சல் தரைப் பிரச்சினை பெரிய பிரச்சினையாக மாறியிருக்கின்றது. திருகோணமலை மாவட்டத்திலேயிருக் கின்ற 2,75,000 கால்நடைகளில் 2,50,000 கால்நடைகள் சிறுபான்மை மக்களுக்குரியவை. ஆனால், அங்கு மேய்ச்சல் காணிகள் இல்லை. இந்த நிலைமையிலே, நகர அபிவிருத்தி என்ற அடிப்படையிலே இப்பொழுது நாங்கள் சதுப்பு நிலங்களைக் கபளீகரம் செய்வதாகப் பொய்ப்பிரச்சாரம் செய்யப்படுகின்றது.

அண்மையிலே வடக்குக்கு விஜயம் செய்த அத்துரலியே ரதன தேரர் அவர்கள் "மட்டக்களப்பிலும் திருகோணமலையிலும் அம்பாறை மாவட்டத்திலும் முஸ்லிம்கள் தமிழ் மக்களின் காணிகளை அபகரிக்கின்றார்கள்" என்று ஓர் இனத் துவேஷத்தை - இனக் கலவரத்தை உண்டாக்குகின்ற பேச்சை வடக்கு மக்கள் மத்தியில் பேசினார். ஏன் நான் இதை உங்களுக்குக் கூறுகின்றேன் என்றால், இன்று தமிழ் மக்களுக்கு மத்தியிலும் முஸ்லிம் மக்களுக்கு மத்தியிலும் ஒரு கிளர்ச்சியை ஏற்படுத்துவதற்கு அவர்கள் முயற்சி எடுத்துக் கொண்டிருக்கின்றார்கள். சிங்கள மக்களுக்கு எதிராக முஸ்லிம்களைத் தூண்டுவதற்கு அவர்கள் எடுத்துக்கொண்ட முயற்சி தோல்வியடைந்த நிலையிலே, இப்பொழுது அவர்கள் தமிழ் மக்களைத் தூண்டுகின்ற நிகழ்ச்சிநிரலை முன்னெடுத்துச் செல்கின்றார்கள் என்பதனாலாகும்.

அன்று திருகோணமலை மாவட்டத்திலே இரண்டு தேர்தல் தொகுதிகள் இருந்தன என்பது உங்களுக்குத் தெரியும். திருகோணமலையிலே ஒரு தமிழ் மகனும் மூதூர் தொகுதியிலே ஒரு தமிழ் மகனும் ஒரு முஸ்லிம் மகனும் பாராளுமன்றத்துக்குத் தெரிவாகக்கூடிய சந்தர்ப்பம் இருந்தது. சேருவில தொகுதி உருவாக்கப்பட்ட பிறகும் 1947ஆம் ஆண்டிலிருந்து கடைசியாக நடந்த தேர்தலில்கூட மூதூரிலே ஒரு முஸ்லிம் மகன் தொடர்ச்சியாக இருந்து வந்தார். மூதூர் தொகுதி 1840 சதுர கிலோமீற்றரிலிருந்து 586 சதுர கிலோமீற்றராகக் குறைக்கப்பட்டபோது, 280 சதுர கிலோமீற்றர்கள் திருகோணமலைத் தொகுதியிலும் சேருவில தொகுதியிலும் இருந்த காணிகள்தான் 5 GN Divisions களில் உள்வாங்கப்

பட்டிருக்கின்றன. இதன் காரணமாக நாங்கள் அங்கு வயல் நிலங்களை, மேய்ச்சல் நிலங்களை, காணிகளை இழந்திருக் கின்றோம். இன்று மாவட்ட அபிவிருத்திக் குழுவுடைய தலைமையில் நாங்கள் இருக்கின்றபொழுதும் எத்தனையோ பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றோம். இன்று அங்கிருக் கின்ற சில பௌத்த பிக்குமார் 'பன்சலை'க்கு போதுமான காணியைக் கேட்காமல், 2800 ஏக்கர், 3600 ஏக்கர் வேண்டுமென்று கேட்கிறார்கள். இது அங்கு ஒரு கலவரத்தை அல்லது ஓர் இனவாதத்தை உருவாக்கும் முயற்சியாகும்.

இங்கு எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் பேசுகின்றபோது, நாங்கள் இராஜினாமா செய்தது போலித்தன மானது அல்லது ஓர் அரசியல் தேவைக்காக என்று கூறினார்கள். இல்லை! கடந்த 3ஆம் திகதி நடக்கவிருந்த பாரிய இனக்கலவரத்தைத் தடுக்கின்ற நோக்கத்தோடும் எங்களுடைய அமைச்சர் றிஸாட் பதியுதீன் அவர்களுக்கு எதிரான விசாரணையைத் துரிதப்படுத்துகின்ற நிபந்தனை யோடும்தான் நாங்கள் இராஜினாமாச் செய்தோம். அதே நேரத்தில் எங்களுடைய மத அனுஷ்டானங்களை நாங்கள் பின்பற்ற முடியாத சூழ்நிலையிலே இருந்தோம். கௌரவ அமைச்சர் ரஞ்ஜித் மத்தும பண்டார அவர்களின் அமைச்சினால் பிழையான முறையில் ஒரு சுற்றறிக்கை வெளியிடப் பட்டிருந்தது. இதனால் அரச அலுவலகங்களில் பணிபுரியும் எங்களுடைய உத்தியோகத்தர்கள் தங்களுடைய மதத்தின் அடிப்படையிலே ஆடைகளை அணியமுடியாத சூழ்நிலை உருவாக்கப்பட்டிருக்கின்றது.

அதுமட்டுமல்ல, இன்று இந்த அவசரகாலச் சட்டத்தின்கீழ் முஸ்லிம் தனவந்தர்கள், முஸ்லிம் அப்பாவி மக்கள் மற்றும் உலமாக்கள் கைது செய்யப்பட்டிருக்கின்றார்கள். இவர்களை விடுதலை செய்யவேண்டுமென்ற அடிப்படையிலே நாங்கள் நேற்றைய தினம் கௌரவ பிரதம மந்திரி அவர்களோடும் பொலிஸ் மா அதிபரோடும் ஏனையவர்களோடும் பேசினோம். "அவசரகாலச் சட்டத்துக்குக்கீழ் கைது செய்யப்பட்ட ISIS பயங்கரவாதிகளோடு தொடர்புள்ள யாரையும் விடுதலை செய்ய வேண்டாம்! நீங்கள் அவர்களை விசாரணை செய்யுங்கள். அப்பாவி முஸ்லிம்களை உடனடியாக விடுதலை செய்ய வேண்டும்" என்று கூறினோம். இந்த நிபந்தனைகளின் அடிப்படையிலும்தான் நாங்கள் - 9 அமைச்சர்களும் - எங்களுடைய இராஜினாமாக் கடிதங்களைக் கொடுத்தோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes only.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
Okay.

கௌரவ அப்துல் ஹலீம் அவர்களும் கௌரவ கபீர் ஹாஷிம் அவர்களும், மீண்டும் பதவியை ஏற்றுக்கொண்டது அஸ்கிரிய, மல்வத்து பீடாதிபதிகளுடைய வேண்டுகோளுக் கிணங்க, அவர்களைக் கௌரவிக்க வேண்டும் என்பதற் காகவே. நாங்கள் அனைவரும் ஒன்றுகூடி, என்ன நிபந்தனைகளை விடுத்து இராஜினாமாச் செய்தோமோ அவை அத்தனையையும் துரிதமாக இந்த மாதத்திற்குள் நிறைவேற்றி முடித்து விடுங்கள்! இங்கு இனத் துவேஷம், இனப் பாகுபாடு காட்டப்பட வேண்டிய அவசியமில்லை. இன ஐக்கியம் இந்தப் பாராளுமன்றச் சபையில் மேலோங்கி நிற்க வேண்டுமென்று நாங்கள் விரும்புகின்றோம். 'பொதுஜன பெரமுன'வினுடைய பிரமுகர் முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களும் ஐக்கிய தேசியக் கட்சியினுடைய தலைவர் ரணில் விக்கிரமசிங்க அவர்களும் இன்று இரண்டு பெரிய கட்சிகளுக்குப் பொறுப்பாக இருக்கின்றவர்கள். அவர்கள் மாறி மாறி ஆட்சி செய்தவர்கள். இவர்கள் இந்த இனவாதிகளுக்குப் பின்னால் போய்விடக்கூடாது என்பதிலே நாங்கள் கவனமாக இருக்கின்றோம். இந்த இனவாதிகள் வாக்குகளைப் பெற முடியாதவர்கள்.

இன்று அத்துரலிய ரதன தேரர் அவர்கள் வடக்கிலே தமிழ் மக்களைத் தூண்டிவிட்டு, நாங்கள் காணிகளை அபகரிப்ப தாகச் சொல்லுகின்றார். இந்த நிலையிலே 1827ஆம் ஆண்டிலிருந்து 2012ஆம் ஆண்டுவரை எங்களுடைய விகிதாசாரம் அல்லது எங்களுடைய இன அதிகரிப்புப் பற்றிய விபரங்களைப் பாருங்கள்! குறித்த விபரங்களை இந்தச் சபையில் நான் *சமர்ப்பிக்கின்றேன். தமிழ் மக்களும் சிங்கள மக்களும் யுத்த காலத்திலே இடம்பெயர்ந்திருக்கிறார்கள். தமிழ் மக்கள் இந்தியாவுக்கு அகதிகளாகச் சென்றார்கள். பெரும்பான்மைச் சிங்கள மக்கள் தெற்கை நோக்கி அதாவது மாத்தளை, கண்டி போன்ற அவர்களின் சொந்த இடங்களுக்குச் சென்றார்கள். ஆனால், நாங்கள் திருகோணமலை மாவட்டத்திலோ அம்பாறை மாவட்டத்திலோ மட்டக்களப்பு மாவட்டத்திலோ இருந்து அகதிகளாகச் செல்லவில்லை. அங்குள்ள எங்களுடைய சொந்தக் காணிகளில்தான் இருந்தோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
Please, give me one more minute.

ஆகவே, இந்த நேரத்திலே நாங்கள் இங்கு இனத் துவேஷங்களைப் பேசுவதை விடுத்து, முறையான கோரிக்கை களை முன்வைத்து சமூகத்திற்காகச் செயற்பட வேண்டும். அன்று நாங்கள் இராஜினாமாச் செய்ததன்மூலம் 3ஆம் திகதி 'பொதுபலசேனா' அமைப்பும் அத்துரலியே ரதன தேரர் அவர்களும் தலைமைதாங்கி ஏற்படுத்தவிருந்த ஒரு பாரிய கலவரத்திலிருந்து, பாரிய அனர்த்தத்திலிருந்து நாங்கள் மீண்டிருக்கின்றோம்.

இறுதியாக, காணி மீட்பு அபிவிருத்திக் கூட்டுத்தாபனம் தமிழ் website ஒன்றை ஆரம்பிக்க வேண்டுமென்று மீண்டும் வேண்டிக்கொள்கின்றேன். இதன்மூலமாகத் தேவையான குறித்த விபரங்களைப் பெற்றுக்கொள்ள முடியும் என்று கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු සුසන්ත පුංචිනිලමේ මහතා. ඔබතුමාට විනාඩි හතක පමණ කාලයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 4.17]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය ගැන සඳහන් වුණා කාරණා කීපයක් සම්බන්ධයෙන්. ඊයේත් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය, වරාය, වරාය අවට භූමියේ අක්කර විශාල ප්‍රමාණයක් ඇමෙරිකානු සමාගමකට දෙන්න යන කථාවක් කියැවුණා. ඒ නිසා, ගරු ඇමතිතුමා මේ සභාවේ සිටින වෙලාවේ මට කථා කරන්න ලැබීම ගැන සතුටු වනවා. නාගරික සංවර්ධන අධිකාරිය තිබෙන්නේ ඔබතුමා යටතේ. ඔබතුමාගේ අනුමැතියකින් තොරව මේ කටයුතු එකක්වත් සිද්ධ වෙන්න බැහැ.

ඒ වාගේම, සිංගප්පූරු සමාගමක් යටතේ මුළු ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයම සංවර්ධනය කිරීමේ කටයුතු යනුවෙන් සැලසුමක් හදලා ඒ දර්ශනත් අපට පෙන්නුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඉදලා අම්බලන්ගොඩ වෙරළ තීරය දක්වා විශාල වශයෙන් වටිනාකමින් යුත් ඛනිජ වර්ග විශාල ප්‍රමාණයක් පොළොව යට තැන්පත් වෙලා තිබෙන චිත්තිය වැනි ඉරිදා "ලංකාදීප" පත්‍රයේ සඳහන් වෙනවා. මේක, 2019 ජූනි මාසයේ 16වන දා පත්තරේ. ඒ වාගේම, වෛද්‍ය කේ.එම්. වසන්ත බණ්ඩාර නැමති මහත්මයෙක් ඒ පත්‍රයේම 24 වැනි පිටුවේ ලිපියක් පළකර තිබෙනවා ඇමෙරිකානුවන්, එහෙම නැත්නම් ඇමෙරිකානු සමාගමක් ඕනෑම රටක සිදු කර තිබෙන ක්‍රියාදාම පිළිබඳව. මම එම ලිපිවල තිබෙන කරුණු ටිකක් කියවනවා. අනෙක් ටික සභාගත කරනවා.

2019 ජූනි 16 වන ඉරිදා "ලංකාදීප" පුවත් පතේ 24 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

"දෙවන ලෝක යුද්ධයට පසුව ඇමෙරිකානු හමුදාව විසින් ඍජුවම ආක්‍රමණය කළ රටවල් ප්‍රමාණය 11කි. ඒ සියල්ල සාධාරණීකරණය කරන ලද්දේ එම රටවල මහජනයාගේ ආරක්ෂාව, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම හෝ ත්‍රස්තවාදය මැඩපැවැත්වීම හෙවත් ලෝක සාමය තහවුරු කිරීමේ නාමයෙනි. කෙසේ වෙතත් දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇමෙරිකාව විසින් ස්වෛරී රාජ්‍යයන්ට එරෙහිව සිදු කරනු ලැබූ සමස්ත හමුදාමය මැදිහත්වීම් ප්‍රමාණය 68කි.

ඒ අතරින් හයිටිය වැනි රටක් දෙවරක් ආක්‍රමණය කිරීමේදී ඇමෙරිකාව විසින් පෙන්වූ අත්තනෝමතිකභාවය සුවිශේෂී වේ. පළමුව 1991දී හයිටි රාජ්‍යයේ එවකට සිටි ජනාධිපති කුමන්ත්‍රණකාරී ලෙස බලයෙන් පහකිරීම සඳහා ඇමෙරිකානු හමුදාව මැදිහත් වූ අතර, දෙවනුව 1994 දී පැවති හමුදා රජය පෙරළා හිටපු ජනපති නැවත බලයට පත් කිරීම සඳහා හමුදාව මැදිහත් විය.

එම පර්යේෂණ දත්ත ප්‍රකාශයට පත්කොට ඇත්තේ ගෝලීය ප්‍රතිපත්ති සංසදය විසිනි. (Global Policy Forum - 2005) එම වාර්තාවලට අනුව ඇමෙරිකාව නම් වූ රාජ්‍යය බිහිවීමෙන් පසුව 1798 වසරේ සිට ලෝකයේ විවිධ රටවලට එරෙහිව දියත් කළ ඍජු ආක්‍රමණ සහ හමුදාමය මැදිහත්වීම් ප්‍රමාණය 190කි. යම් රටවලට අවස්ථා කිහිපයකදී හමුදාමය මැදිහත්වීම් සිදුකොට ඇති අතර, එම දත්ත අතරට පළමු සහ දෙවන ලෝක යුද්ධවලදී සිදුකළ හමුදා ක්‍රියාකාරකම් ඇතුළත් කොට නැත.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව සිදුකළ හමුදාමය ආක්‍රමණවලදී ඇමෙරිකාවට තම මූලික අරමුණු ඉටු කර ගැනීමෙන් තොරව පසුබැසීමට සිදු වූයේ 1961දී කියුබාව ආක්‍රමණය කිරීමේදී සහ 1956 ඊජිප්තුව ආක්‍රමණය කිරීමේදීය. ඇමෙරිකානු හමුදාමය මැදිහත්වීම්වලදී ඇමෙරිකානු හමුදාවට අමතරව ඊශ්‍රායල්, ප්‍රංශ, බ්‍රිතාන්‍ය සහ නේටෝ හමුදාවල සහාය ද යම් අවස්ථාවලදී ලබාගෙන ඇති අතර, ඇමෙරිකානු හමුදා වෙනුවට නේටෝ හමුදාව යොදා ගැනීම ද සිදු කර ඇත.

කෙසේ වෙතත්, දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇමෙරිකානු රහස් ඔත්තු සේවා විසින් ලෝකය පුරා අවුළුවන ලද අභ්‍යන්තර ගැටුම් සහ යුද්ධ ප්‍රමාණය 100 ඉක්මවා යයි. එසේ ස්වෛරී රාජ්‍යවල අභ්‍යන්තර ගැටුම් නිර්මාණය කිරීම සඳහා මුල් වූ අන්තවාදී, බෙදුම්වාදී, මූල ධර්මවාදී ආදී විවිධ නම්වලින් හඳුන්වන කැරැළි කණ්ඩායම් බිහි කිරීම, පෝෂණය කිරීම මෙන්ම ආයුධ සහ අරමුදල් සැපයීම සඳහා ඇමෙරිකාව ක්‍රියා කළ ආකාරය පිළිබඳ බොහෝ සාක්ෂි ඇත. ඒ සඳහා ඇමෙරිකානු සෙනෙට් සභාවේ අනුමැතිය යටතේ අරමුදල් පොම්ප කිරීම සඳහා විවිධ රාජ්‍ය අනුබද්ධ සංවිධාන යොදා ගෙන ඇත. ඒ අතුරින් ඇමෙරිකානු ජාත්‍යන්තර සංවර්ධන ආයතන (USAID) සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජාතික ව්‍යාපාරය (NED) වැනි ආයතන බහුලව යොදාගත් බවට බොහෝ සාක්ෂි ඉදිරිපත් වී ඇත......"

මම මේ කරුණු කෙටියෙන් සඳහන් කළේ. එම මම නිසා ඒ ලිපිය **සභාගත*** කරනවා, හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීම සඳහා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව එම පුවත් පතේම 16 වැනි පිටුවේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය පිළිබඳව තවත් ලිපියක් පළ වී තිබෙනවා. ඒ ලිපියේ මේ ආකාරයට සටහන් කර තිබෙනවා:

"කොක්එබෙ කන්ද හා යාන්ඔය ආශ්‍රිත අතීත මානව ජනාවාස සම්බන්ධයෙන් වර්තමානයට විශාල තොරතුරු ප්‍රමාණයක් හෙළිදරව් කිරීමට රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා ජාතික උරුම කළමනාකරණ අංශය පසුගිය වසර කීපය පුරා සමත් විය. ඒ එම අංශ මඟින් ප්‍රාග් ඓතිහාසික ජනාවාස සම්බන්ධයෙන් ආරම්භ කළ පර්යේෂණ මඟිනි. මීට වසර පනහකට පෙර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තහවුරු කර තිබූ තඹ ටොන් මිලියන හතක්, රන්, නිකල්, බිස්මත්, රසදිය හා මැණික් අඩංගුව සේරුවිල සිට අම්බලන්තොට වෙරළ දක්වා විහිදෙන ලෝහ නිධියක් ගැන මෙම පර්යේෂණ අවසානයේ එම අධ්‍යයන අංශය ප්‍රධාන මහාචාර්ය තුසිත මැන්දිස් මෙරටට යළි මතක් කර දුන්නේ ය.

මේ තඹ නිධිය කිලෝමීටර් දහයක් පළලය. කිලෝමීටර් 250ක් දිගය. කැගසන්නට මාතෘකාවක් නැතිව, ආයෝජනයට කර්මාන්ත නැතිව, එමෙන්ම නැගෙනහිර පළාතේ වටිනාකම දන්නේ නැතිව පසුවන මේ රටේ බලධාරීන්ට ඔහු නැවත එම නිධානය මතක්කර දේ. ඒ වෙනත් රටවල අය මේ නිධානය හඳුනාගෙන අපෙන් ඩැහැගන්නට මත්තෙන් ආරක්ෂාකර ගැනීමට හා ප්‍රයෝජනය ගැනීමට ය. මේ ඔහුගෙන් කළ විමසීමයි......"

මම මේ ප්‍රකාශය කරන්නේ මොකද? ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය අවුරුදු 30ක යුද්ධයකට නතු වූ ප්‍රදේශයක්. මෙහි වැඩි වශයෙන් ජීවත් වන්නේ ගොවිතැනින් ජීවත් වන ජනතාවයි. ඉන් පසුව ධීවර කර්මාන්තය -මිරිදිය ධීවර කර්මාන්තය සහ කරදිය කර්මාන්තය- කරන අය ජීවත් වෙනවා. ගරු ඇමතිතුමනි, අද වනට විට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් කරන්නේ මේ රැකියා දෙකයි. ඒ වාගේම මේ දිස්ත්‍රික්කයෙන් සියයට 56ක් වනගහනයෙන් යුක්තයි. මම හිතන විධියට දැනට ලංකාවේ එහෙම දිස්ත්‍රික්කයක් නැහැ. එම නිසා අපේ දිස්ත්‍රික්කය තුළ කරන යුද හෝ නාවික කටයුත්තකට, ඇමෙරිකානු සමාගමකට හෝ වෙන යම් සමාගමකට ඉඩ ලබා දෙනවාට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සිටින මන්ත්‍රීවරයෙක් හැටියට මම විශේෂයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඒ වාගේම TNA එකේ සම්පන්දන් මැතිතුමා, අපේ මහරූෆ් මැතිතුමා ඇතුළු තව මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙක් ඉන්නවා. TNA එකේ තව මන්ත්‍රීවරයෙක් ඉන්නවා. අපි මහජන නියෝජිතයන් හැටියට මෙයට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කළ යුතුයි. සංවර්ධන කටයුතු කරනවා නම්, මහජන නියෝජිතයන් වන අපව දැනුවත් කරන්න ඕනෑ. කොහොමද මේවා කරන්නේ, ගොවි ජනතාවට හානියක් වෙනවාද, ධීවර ජනතාවට හානියක් වෙනවාද, ඒ දිස්ත්‍රික්කයේ වෙසෙන සුළු ජාතියක් වන අපේ සිංහල ජනතාවට හානියක් වෙනවාද කියන එක පිළිබඳව දැනුවත් කරලා මෙය කරන්න කියා අපි ඉල්ලීමක් කරනවා. ඒ වාගේම මෙය කාගේවත් බූදලයක් නොවෙයි.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මෙය අපට අයිති වුණු සම්පතක්. කිසිම රජයකට විකුණන්න, එහෙම නැත්නම් සින්නක්කර දෙන්න අයිතියක් නැති නිසා මහජනතාවගේ කැමැත්ත ඇතිව, පාර්ලිමේන්තුවට සවිස්තරව කරුණු ඉදිරිපත් කර කටයුතු කරන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
කොළඹ සිට ත්‍රිකුණාමලයට නාගරික කොරිඩෝවක් ඉදි වෙනවාය, ඒ නාගරික කොරිඩෝව ඇමෙරිකානු සමාගමට බදු දෙන්න යනවාය කියලා විශාල ප්‍රචාරයක් ගෙනයනවා.

ඒක සම්පූර්ණ අසත්‍යයක්. අපි කවුරුත් දන්නවා, ජාතික භෞතික සැලසුම. එය හැම අවුරුදු දහයකට වරක්ම යාවත්කාලීන කරනවා. 2008 වර්ෂයේදී අවසාන වශයෙන් යාවත්කාලීන කළේ. ඒ අනුව 2018 වර්ෂයේ දී අපි යාවත්කාලීන කර තිබෙනවා. ඔබතුමාටත් මම ආරාධනා කළා. අපි ත්‍රිකුණාමලයේ ඒ පිළිබඳ දැනුවත් කිරීමක් කළා. අතිවිශාල පිරිසක් ඒකට සම්බන්ධ වුණා. ඒ අනුව අපි නාගරික කොරිඩෝ හතරක් හඳුනාගෙන තිබෙනවා. ඉදිරි කාලයේ දී පරිසර සාධකය, ජල සාධකය, ඉඩම් අවශ්‍යතාව, යටිතල පහසුකම් තත්ත්වය සහ ජනතාවගේ අධ්‍යාපන තත්ත්වය කියන කරුණු පදනම් කර ගෙන. එයින් එකක් තමයි කොළඹ ත්‍රිකුණාමල නාගරික කොරිඩෝව. අනෙක තමයි අම්බලන්ගොඩ සිට තිස්සමහාරාමයට තිබෙන නාගරික කොරිඩෝව. අනෙක තමයි වාලච්චේනයේ සිට අම්පාරට තිබෙන කොරිඩෝව. අනෙක යාපනයේ සිට කිලිනොච්චියට. ඒ වාගේම ත්‍රිකුණාමලය සඳහා විශේෂයෙන්ම මහ නගර සැලසුමට අදාළව කොළඹ මහ නගර සැලසුම සකස් කළ සුමන්දිරෝ ආයතනය විධිමත් සැලසුමක් ඉදිරිපත් කර තිබෙනවා. එම සැලසුමට අනුව කලාපකරණයක් තිබෙනවා. ජනතාව කොහේද පදිංචි වෙන්නේ; වන සංරක්ෂිත ප්‍රදේශ කොහේද තිබෙන්නේ; කර්මාන්ත කොතැනද ඇති වෙන්නේ; නාගරික ජනපද ඇති වෙන්නේ කොතැනද කියන එක. ඒ හැරෙන්නට වෙන කිසිම ඇමෙරිකන් සමාගමක හෝ ඒ ඇමෙරිකන් විද්‍යාඥයන්ගේ හෝ ඒ අයගේ කිසිම මැදිහත් වීමක් නැහැ. එවැනි කිසිම ආකාරයක එකඟතාවක්, ගිවිසුමක් නැති බව බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා. මේක ශ්‍රී ලාංකික විද්‍යාඥයින් තුන් දාහක් එකතුවෙලා, අවුරුදු එකහමාරක් තුළ ඇති කළ විධිමත් සැලැසුමක්. ඒක අවුරුදු දහයෙන් දහයට සෑම ආණ්ඩුවක්ම කරපු දෙයක්.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මට පොඩි පැහැදිලි කර ගැනීමක් තිබෙනවා. SOFA ගිවිසුම යටතේ තිබෙන එක කාරණයක් අනුව එම පළාත්වල සිටින අපේ ජනතාවට සම්පූර්ණයෙන්ම ඒ ඉඩමට තමන්ගේම අයිතිය පිළිබඳව ඔප්පුවක් ලැබෙනවා ලු. එම ප්‍රදේශවල දරිද්‍රතාවයෙන් යුතුව ජීවත් වන ජනතාවට එවැනි ඔප්පුවක් එකපාරටම ලැබුණොත්, SOFA ගිවිසුම යටතේ ඔවුන්ට ලැබෙන එම ඉඩම ගැනීමට ඕනෑම පිටරටියෙකුට අවස්ථාවක් ලැබෙනවාය කියා කියනවා. මේක ඇත්තක් ද, නැත්තක්ද කියන එක ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මෙහෙමයි. SOFA කියන ගිවිසුම ඇමෙරිකා එක්සත් ජනපදය විවිධ රාජ්‍යයන් සමඟ අත්සන් කරන ලද ගිවිසුමක්. එවැනි කිසිම ගිවිසුමක් ශ්‍රී ලංකාවේ අපේ කැබිනට් මණ්ඩලයට නම් මේ තාක් ඉදිරිපත් වෙලා නැහැ. 2007 වර්ෂයේ දී ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක අත්සන් කළ ACSA ගිවිසුමේ පිටපත 2017 වර්ෂයේ දි ආවා. හැමෝම කියනවා, ඒ පිටපතේ පිටු අසූතුනක් තිබුණත්, ඇත්තටම ගිවිසුම ඇතුළත් වන්නේ පිටු හයයි. ඉතිරි පිටුවල තිබෙන්නේ එයට අදාළ ආයතනවල ලිපිනයන්, දුරකථන අංක සහ අදාළ නිලධාරීන්ගේ තොරතුරු. එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය නම් ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්. SOFA නමින් කිසිම ගිවිසුමක් කැබිනට් මණ්ඩලයේ හෝ වෙනත් තැන්වල ඇති කර නැහැ. ඔබතුමා කිව්ව වාගේ ප්‍රශ්නය පැන නඟින්නේ SOFA ගිවිසුමෙන් නොවෙයි. ඉඩම් අයිතිය පිළිබඳවයි. මේ රටේ ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණය පිළිබඳ යෝජනාවක් කැබිනට් මණ්ඩලයේ තිබෙනවා. ඒකත් පාර්ලිමේන්තුවට එයි. ඔබතුමන්ලාට පුළුවන් ඒ ගැන වාද විවාද කරන්න. ඒක ජනතාවට ඉඩම්වල අයිතිය ලබා දෙන ක්‍රියාවලියක් මිසක් ජනතාවගේ ඉඩම් අයිතිය විදේශිකයන්ට ලබා දෙන ක්‍රියාවලියක් නම් නොවෙයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ඔබතුමා කියපු පරිදි අපේ දිස්ත්‍රික්කවල අවුරුදු තිහක යුද්ධයක් තිබුණු නිසා සියලු ජනකොටස්වලටම තමන්ගේ ඉඩමට අයිතිය පිළිබඳ බරපතළ ගැටලුවක් තිබෙනවා. මොකද, ඒවා ගොවි ජනපද. ඒවා මිනිස්සු විසින් සංවර්ධනය කළත්, අද ඒ මිනිසුන්ට බලපත්‍රයක්වත් නැහැ. ඒ වතු බදු දෙන්නට හදනවා. මිනිස්සු බදු ගන්නට කැමති නැහැ. ඒ ක්‍රියාදාමය හොඳයි. හැබැයි, මේ ගිවිසුම් පිළිබඳව කථාකරනකොට අපට වඩාත්ම තහවුරු වන්නට ඕනෑ කාරණයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. අපේ ඡන්දදායකයන් විධියට එම දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවට උත්තර බඳින්න අපට වග කීමක් තිබෙනවා. එම නිසා මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර දවසක හෝ දෙකක විවාදයක් පවත්වා, මේ ගිවිසුම ගැන තේරුම් කර දෙන්න, ඔය කියන තරම් යකා කළු නැහැ කියන එක තේරුම් කර දෙන්න අපට අවස්ථාවක් ලබා දෙන්න. මොකද ඒකේ අයිතිය ඔබතුමාගේ අමාත්‍යාංශයට තිබෙන්නේ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ අවසරය නොමැතිව කිසිවක් කරන්න බැහැ නේ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ අවසරයක් නොමැතිව බලපත්‍රයක්, ඔප්පුවක් දෙන්න බැහැනේ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
අපේ අමාත්‍යාංශයේ අවසරයක් එයට අවශ්‍ය නැහැ. රජයේ ඉඩම් පිළිබඳ සියලුම අයිතිය තිබෙන්නේ ඉඩම් අමාත්‍යාංශයේ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට. ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාට.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ඒ ඉදිකිරීම් කටයුතුවලදී නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත පුංචිනිලමේ මැතිතුමා, නියමිත කාලය අවසාන වෙලා තිබෙන්නේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
දැන් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන UDA එක යටතේ ගැසට් කර තිබෙන ස්ථානවලට ඔප්පුවක් දෙන්නට බැහැ. බදු දෙන්නට පුළුවන්. බදු දෙන්නට වෙලා තිබෙන්නේ ගැසට් කරලා තිබෙන නිසා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
නැහැ. අපි නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් හැටියට ගැසට් කළාට පස්සේ යම් ඉදි කිරීමක් කළොත්, එම ඉදි කිරීම පිළිබඳව අපේ අවසරය ගන්න වෙයි. ඉඩම් අයිතිය ඒකට සම්බන්ධ නැහැ. [බාධා කිරීමක්] ඒ බදු බලපත්‍රය දෙන්නේ අපේ අමාත්‍යාංශයෙන් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

ප්‍රාදේශීය ලේකම්ළඟ තමයි රජයේ ඉඩම් සන්තකය තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම්ලා තමයි ඒ කටයුත්ත කරන්නේ. අපි කරන්නේ ඉදිකිරීම් කටයුත්ත බලන එක විතරයි.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
එහෙම කියනවා නම් -

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඉඩම් ඇමතිතුමා, පළාත් පාලන ඇමතිතුමන්ලා තමයි ඒක ගැන බලන්නේ. [බාධා කිරීමක්]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද? [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා, කාලය අවසන් වෙනවා. [බාධා කිරීමක්] ඉතින්, සාකච්ඡාවක් - point of Order එකක් නොවෙයි නේ, මේ. [බාධා කිරීමක්] මීළඟට, ගරු රවුෆ් හකීම් මැතිතුමා. ඔබතුමාට විනාඩි හතක පමණ කාලයක් තමයි වෙන් කර තිබෙන්නේ.

[අ.භා. 4.31]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව පිළිබඳවත්, එම සංස්ථාවෙන් කෙරෙන වැඩ පිළිවෙළ පිළිබඳවත් ඉතාම කෙටියෙන් වචන ස්වල්පයක් කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා. ඇත්තටම මේ සංස්ථාවට පුරෝගාමී සමාගම් හැටියට කැලණිවැලි පහත්බිම් සංස්ථාව, ඒ වාගේම ගල්ඔය පහත්බිම් සංස්ථාව කියා නොයෙකුත් සංස්ථා තිබුණා. ඒ සියල්ල එකතු කරමින් අලුතින් මෙම සංකල්පය හැදුවාට පසුව, මේ හරහා නොයෙක් සංවර්ධන ක්‍රියාදාම කරගෙන යන බවත්, ඒ පිළිබඳව අපේ අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ විශේෂයෙන්ම රට පුරාම අවශ්‍ය පරිදි -ආපදා කළමනාකරණයට පවා උපයෝගී වන- නොයෙක් අලුත් ව්‍යාපෘති රාශියක් කරගෙන යන බවත් අප දන්නා කරුණක්.

මම විශේෂයෙන්ම මතක් කළ යුතුයි, ගල්ඔය මිටියාවතේ ප්‍රශ්න රාශියක් තිබෙන බව. සුනාමියෙන් පසුව අපිට අවශ්‍ය වුණා, මෙම ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව හරහා නැඟෙනහිර පළාතේ තිබෙන පහත්බිම් පිළිබඳව හරියාකාර සිතියම්ගත කිරීමක් කර, ඒක ගැසට් පත්‍රයකින් පළ කර ගැනීමට. එම කාර්ය භාරය දැනට නිමකර තිබෙන බව දැන ගන්නට ලැබුණත්, ඒ සඳහා වූ විධිමත් වැඩ පිළිවෙළක් අපි දියත් කළ යුතුයි කියා මා මතක් කර සිටිනවා. විශේෂයෙන්ම මෝසම් වැසි කාලවලදී ගල්ඔය මිටියාවතේ නිරන්තරයෙන්ම ජල ගැල්මට ලක්වන ප්‍රදේශ රාශියක් තිබෙනවා. එම ප්‍රදේශවල ඉඩම් ගොඩකිරීම පිළිබඳව හරියාකාරව කටයුතු කිරීම සඳහා SLLRDC කියන මේ ආයතනය මැදිහත් විය යුතුයි. නොයෙක් අවස්ථාවලදී මෙම ආයතනයේ විශේෂ දැනුම පාවිච්චි කරගෙන අපට එම තාක්ෂණික උපදෙස් ලබා ගැනීමට පුළුවන්කමක් ලැබී තිබෙනවා. මම යෝජනා කරන්නේ, විශේෂයෙන්ම නැඟෙනහිර පළාතේ පහත්බිම් පිළිබඳව තිබෙන සිතියම්ගත කිරීම් විධිමත්ව කර, දිගින් දිගටම එම පළාත්වල සිදුවන ඉඩම් ගොඩකිරීම් නිත්‍යානුකූලව කිරීමට ඉඩ සලසා දීම සඳහා ඒ පිළිබඳව ඊට වඩා විද්‍යාත්මක වූ මැදිහත්වීමක් කළ යුතු බවයි. විශේෂයෙන්ම කල්මුණේ ප්‍රදේශයේ මෑතකදී අපි hydrological study එකක් කළා.

We had done a hydrological survey of the Gal Oya lower basin, particularly in order to reclaim land from the low-lying areas which had been inundated ever since the Gal Oya Scheme was implemented. It is necessary for us now to make sure that the redevelopment of the area is done in a scientific manner. A hydrological survey had recently been undertaken towards that. From that survey, it transpires that there must be a combined effort between the Urban Development Authority and the SLLRDC as two important entities coming under the Hon. Minister of Megapolis and Western Development and that we should be able to develop a proper township development programme for the Kalmunai and Samanthurai areas.

This matter was undertaken by the Ministry of City Planning, Water Supply and Higher Education when I was in charge of the Ministry a few weeks ago. As I am out of the Ministry now, I request the Hon. Minister to look at this issue and see that this development plan could properly be carried out in the future. We can share the information that we have prepared, particularly pertaining to the Gal Oya lower basin where there is immense flooding potential every time the monsoon rain comes. That is one reason.

The other is that I must bring to the attention of the Hon. Minister regarding his Urban Regeneration Programme that has been successfully implemented in the Colombo Metropolitan Area.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

I must bring to the attention of the Hon. Minister the need for the expansion of this Urban Regeneration Programme into the other cities in the country, particularly to Kandy, being a heavily-congested city, where we have underserved settlements in almost several areas including Mahaiyawa and Deiyannewela. There are about 10 or 12 areas that have been identified as areas with underserved settlements. It is necessary for us to try and introduce vertical living in congested living areas so that we will be able to make maximum use of the land resources that are available within the city. Since sufficient attention has not been paid towards that issue, we would like to invite the Hon. Minister to look at that.

Together with that, the Hon. Minister was good enough to propose the demolition of the Wakanda Flats, because there is a serious issue pertaining to the dilapidated state of the Wakanda flats and that he was planning to relocate the flat dwellers to another area. In that regard, we had made an earnest plea that that should be done with proper concern for the livelihoods of the people who are living in the area and the other issues pertaining to the relocation, particularly, school-going children are there and their livelihoods are connected to the area in which they live. If they are taken away to a far -off area, that would seriously hamper their living condition. I would like to invite the Hon. Minister's attention in that regard as well. With those comments, I conclude my short comments.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you very much. මී ළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කරුණු දැක්වීමේදී මා විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයෙත්, ඒ වාගේම කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙත් ජනතාව මුහුණ දෙන ගැටලු දෙකක් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැරපන් ඇළ මාර්ගය ආශ්‍රිත ප්‍රදේශය කුඩා වැස්සකටත් - විශේෂයෙන්ම මෝසම් වැසි කාලයේදී- යටවනවා. එතකොට ඒ ප්‍රදේශවාසී ජනතාව බරපතළ පීඩාකාරී තත්ත්වයකට මුහුණ දෙනවා. ඒ, එකක්. මේ පිළිබඳව දිගින් දිගටම මේ ගරු සභාවේත්, ඒ වාගේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදීත් හිටපු මහජන නියෝජිතයන් -අපත් ඇතුළුව- දිගින් දිගටම කරුණු දක්වා සිටියත්, ඒ පිළිබඳව සැලසුම් සකස් කරනවාය කිව්වත්, ඇතැම් වෙලාවට සැලසුම් සකස් කර ඒවා පරිපූර්ණත්වයට පත්නොවීම නිසාත් අද වන විටත් මේ ගැටලුවෙන් උග්‍ර පීඩාකාරී තත්ත්වයකට විශේෂයෙන්ම කැරපන් ඇළ ආශ්‍රිතව පානදුර නගරයේ වෙසෙන ජනතාව මුහුණ දී තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා පානදුර නගරය ආශ්‍රිතව ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන නිසා මේ පිළිබඳවත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියා මම ඉල්ලීමක් කරනවා. මේ සංවර්ධන කාර්යය තවම පරිපූර්ණත්වයට පත්වෙලා නැහැ. පසුගිය රජය සමයේ යම් යම් සංවර්ධන කාර්යයන් කර තිබෙනවා. නමුත්, ඒවා අවසානයක් කර නොමැති නිසා ඒ මුදලුත් අපතේ යන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. මම ඒ පිළිබඳවත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා.

ඊ ළඟට විශේෂම කාරණය මෙයයි. පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාද්දුව - තල්පිටියේ සිට කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොහොද්දරමුල්ල දක්වා දිවෙන "බිඳුණු ඇළ" කියන ඇළ මාර්ගය හා සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. මේ ඇළ මාර්ගය වාද්දුව නගරය මධ්‍යයෙන් ගමන් කරන්නේ. අද වාද්දුව නගරය කියන්නේත් බොහෝ ජනාකීර්ණ නගරයක්. වාද්දුව නගරය ආශ්‍රිතව අනවසර ගොඩකිරීම් රාශියක් සිදුවෙලා තිබෙන නිසා මේ බිඳුණු ඇළේ තිබෙන ජලබැස්ම නිසියාකාරව සිද්ධ නොවන නිසාත්, ඒ ඇළ මාර්ගය කාලයකින් සංවර්ධනය කර නැති නිසාත් ඉතාම සුළු වර්ෂාවකදීත් බරපතළ පීඩාකාරී තත්ත්වයකට ඒ ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙනවා.

ගරු ඇමතිතුමනි, මම තමුන්නාන්සේගේ අවධානය තවත් කරුණකට යොමු කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, බිඳුණු ඇළ ආශ්‍රිතව විවේකාරාමය කියා විහාරස්ථානයක් තිබෙනවා. ඒ විහාරස්ථානය පුරාවිද්‍යාත්මක ස්මාරක සහිත විහාරස්ථානයක්. ඒ විහාරස්ථානය එක දිගටම ගංවතුරට යට වෙලා තිබුණු නිසා ඒ විහාරස්ථානයේ චෛත්‍ය පවා දෙදරා ඉරි තළා මුළුමනින්ම ඒ චෛත්‍ය රාජයාණන් වහන්සේ විනාශ වීමේ තර්ජනයකට පවා පසුගිය කාලයේ මුහුණ දුන්නා. මේ පිළිබඳව අපි දිගින් දිගටම කරුණු ඉදිරිපත් කළා. නමුත්, තවමත් මේ පිළිබඳව නිසි අවබෝධයක් සහ මැදිහත්වීමක් සිද්ධ වෙලා නැහැ. මම ඔබතුමාගෙන් මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා යටතේ ඇති ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව සතුව විශාල විශේෂඥතාවක් තිබෙනවා, මෙවැනි කාර්යයන් සාර්ථකත්වයට පත් කරන්න. පළමුවෙනි එක තමයි, මේ සඳහා සැලැස්මක් වුවමනා කර තිබෙනවා. එක එක ගොඩ වෙද්දු ඇවිල්ලා එක එක සැලසුම් දෙනවා, එක එක සැලසුම් ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා. හැබැයි, ඒ සැලසුම්වලින් මේ පීඩාකාරී තත්ත්වයන්ට උත්තරයක් හොයා ගන්න බැහැ. අපි විශ්වාස කරනවා, තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව සතුව වැසි ජල කළමනාකරණයට අවශ්‍ය විශේෂඥතාව තිබෙනවාය කියා. ඒ වාගේම අවුරුදු ගණනාවක් මේ අභියෝගයත් සමඟ ගැටෙමින් සිටින ඉංජිනේරුවන් සතුව මේ සඳහා වන විශේෂඥතාව තිබෙනවා.

කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මම ඉල්ලීමක් කළා, ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් බිඳුණු ඇළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යෝජනාවක් සකස් කර දෙන්න කියලා. දළ යෝජනාවක් සකස් කර දී තිබෙනවා. නමුත්, එය පරිපූර්ණ යෝජනාවක් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. එහි සිටින ඉංජිනේරු මහත්වරුන්ගෙන් ඇහුවාමත් ඔවුන් කිව්වේත්, එම යෝජනාව තව දුරටත් සංවර්ධනය කොට ඉදිරිපත් කරන්න ඕනෑ කියායි. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා. ඔබතුමා එය සටහන් කරගෙන ඒ පිළිබඳව විශේෂ මැදිහත් වීමක් කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

[ගරු ජයන්ත සමරවීර මහතා]

කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයත්, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයත් යා වෙන දූම්මල මෝදර ඇළ -මේකට පරණ ලන්දේසි ඇළ කියලාත් කියනවා.- ආශ්‍රිතව ජීවත් වන පවුල් වැසි කාලයේදී බරපතළ පීඩාකාරී තත්ත්වයකට මුහුණ දෙනවා. අපි මේ පිළිබඳවත් දිගින් දිගටම අවධානයට යොමු කර තිබෙනවා. නමුත්, අවධානය යොමු වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරලා, කළුතර සහ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව තිබෙන දූම්මල මෝදර ඇළ සඳහාත්, විශේෂයෙන්ම පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන බිඳුණු ඇළ සඳහාත් -එය සංවර්ධනය කිරීමේ කාර්යයට තවම අතවත් තියලා නැහැ.- විශේෂඥ කණ්ඩායමක් පත් කරලා සැලැස්මක් සකස් කර දෙන ලෙසත්, ඒ වාගේම කැරපන් ඇළේ ඉතිරි වී තිබෙන සංවර්ධන කාර්යයට මැදිහත් වෙලා එය සම්පූර්ණ කිරීමට අවශ්‍ය මැදිහත් වීම ලබා දීලා ඒ ප්‍රදේශයේ ජනතාව වැසි කාලයේදී මුහුණ දී තිබෙන ගැටලුවලට උත්තරයක් සපයා දෙන ලෙසත් ඔබතුමාගෙන් ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ කොළඹ ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල රාශිකරණය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවට අක්කර 990ක ප්‍රමාණයක් අත් පත් කර ගත් බව අපට දැන ගන්න තිබෙනවා. නමුත්, දැන් දැනගන්න තිබෙන කරුණු අනුව ඒවායේ ජලරාශි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවී තිබෙනවා. පසුගිය කාල වකවානුවේ යම් යම් ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක වුණා. එහෙම නැත්නම් මේ කාලයේදී පාර්ලිමේන්තුවත් යට වෙන්න ඉඩ තිබුණා. විශේෂයෙන්ම හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සමයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඉංජිනේරුවරුන්ගේ සැලසුම් අනුව ක්‍රියාත්මක කළ ඇතැම් විශේෂ ව්‍යාපෘති නිසා කොළඹ ජනයාට වැසි වතුර තර්ජනයෙන් ගැලවීමට මහ පැඳුණු ප්‍රදේශ බොහොමයක් අපට දකින්නට පුළුවන්. කොහොම වුණත්, 2017 විගණකාධිපති වාර්තාවේ සඳහන් වෙනවා, එම අක්කර 990න් අක්කර 72ක් පමණ අවසතු කිරීමේ උත්සාහයක් තිබෙනවා කියලා. කොළඹ නගරයේ වැසි ජල කළමනාකරණය සඳහා අත් පත් කරගත් ඉඩම්වලින් අක්කර 70ක් පමණ අවසතු කළොත්, ඒවායේ විවිධ ඉදි කිරීම් සිදු කළොත්, කොළඹ නගරයේ වැසි ජලය කළමනාකරණය කිරීම සඳහා නැවත ඉඩම් හම්බවෙන්නේ නැහැ. මම දන්නේ නැහැ, විගණකාධිපති වාර්තාවේ තමයි මෙය සඳහන් වෙන්නේ. එහෙම වුණොත්, කොයි කොයි ස්ථානවලින්ද ඒ අවසතු කිරීම සිද්ධ වෙන්නේ, කුමක් හෝ විද්‍යාත්මක සමීක්ෂණයක් ඇසුරෙන්ද ඒ අවසතු කිරීම සිද්ධ වෙන්නේ, එසේ අවසතු කිරීම හරහා ඇති වන ගැටලුවලට උත්තර සෙවීමේ විකල්ප ක්‍රියාමාර්ගයක් සහිතවද ඒ අවසතු කිරීම කරන්නේ කියලා අපි දන්නේ නැහැ. එම නිසා අපි ඒ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය දැන් අවසන්.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ඔබතුමා අද නැවත කථාවක් කරනවා නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරාවි කියා අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව කරුණු කිහිපයක් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා මට තව විනාඩියක කාලයක් දෙන්න.

මම දන්නා විධියට ඔබතුමා යටතේ තිබෙන ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවට අනුබද්ධිතව REDECO කියලා ආයතනයක් තිබෙනවා. මෑතකදී එම ආයතනය, ඉදි කිරීම් කටයුතුවලට යොදා ගැනීම සඳහා මුහුදු වැලි සේදීමේ යන්ත්‍රයක් ආනයනය කර තිබෙනවා. නමුත්, අද එය සුදු අලියෙක් බවට පත්වෙලා තිබෙන බව තමයි වර්තා වෙන්නේ. තමුන්නාන්සේලා බලාපොරොත්තු වුණු ධාරිතාව එම යන්ත්‍රය සතුව ඇත්තේත් නැහැ, ඒ වාගේම බලාපොරොත්තු වුණු කාර්යයන් එම යන්ත්‍රයෙන් ඉෂ්ට කරන්නත් බැහැ කියන කාරණයත් අපට දැන ගන්න ලැබී තිබෙනවා. ඒ සඳහා ආයෝජනය කළ මුදල නාස්තිකාර වියදමක් හැටියට පත් වී තිබෙන බව තමයි වාර්තා වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පිළිබඳව දන්නවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කාලය අවසන්.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ගන්නේ තවත් තත්පර 10යි.

ඇත්තටම එසේ වී තිබෙනවා නම්, සංකල්පයක් හැටියට ගත්තොත් මුහුදු වැලි ලවණතාව අඩු කරලා ඉදි කිරීම් කර්මාන්තය සඳහා යොදා ගත යුතුව තිබෙනවා. කළු ගඟ, කැලණි ගඟ ආදි සියලු ගංගා අද ඉවුරු කඩා වැටීමේ තර්ජන, ගංගා ආශ්‍රිතව ලවණ මිශ්‍ර වීමේ තර්ජන වැනි විශාල තර්ජනවලට මුහුණ දී තිබෙනවා. ඒවා වළක්වන්න නම් මුහුදු වැලි පාවිච්චි කිරීම අත්‍යවශ්‍යයි. ඒ සඳහා නූතන තාක්ෂණය යොදා ගැනීමත් අත්‍යවශ්‍යයි. ඒ ගැන විවාදයක් නැහැ. නමුත්, තමුන්නාන්සේලා ගෙනැවිත් තිබෙන මේ යන්ත්‍රය ඒ සඳහා සුදුසු එකක් ද කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ පිළිබඳවත් ඔබතුමාගේ පැහැදිලි කිරීමක් මා බලාපොරොත්තු වෙනවා.

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර, කළුතර, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව ඇති, මා විසින් කරුණු දක්වන ලද ඇළ මාර්ග තුන කෙරෙ තමුන්නාන්සේගේ අවධානය යොමු වෙලා ඒවා සංවර්ධනය කිරීමට වැඩ සැලැස්මක් සකස් කරාවි කියන විශ්වාසයෙන් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා.4.49]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගරු සභාවේ කතා බහට ලක් කරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නම 'ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව' යනුවෙන් වෙනස් කිරීම ඉතාම කාලෝචිත වැඩක් කියලායි මා හිතන්නේ.

අපේ පළාත ගත්තොත්, පසු ගිය කාලයේ මට ලැබුණු අද්දැකීම අනුව ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව කියන නම ඒ

කාලයට නම් හරි. මොකක්ද ඒකට හේතුව? ඒ කාලයේ ඉඩම් ගොඩ කළා, වැලි හේදුවා. ඒ කාලයේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කිව්වාම, ඒ ජාවාරම්වලට තෝතැන්නක් බවට පත් වෙලා තිබුණු ප්‍රදේශයක්. හැබැයි පසුගිය අවුරුදු 4ක කාලය තුළ ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හැටියට මට තිබෙන අද්දැකීම තමයි, ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවක කාර්ය භාරය අපේ පළාතේ ඉෂ්ට කරලා තිබෙනවා කියන එක. ඒ ආයතනය මඟින් ඉඩම් සංවර්ධනය කිරීමට අමතරව විශාල වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. මේ අවුරුදු 4ක කාලය තුළ, විශේෂයෙන් අපේ පාඨලී චම්පික රණවක ඇමතිතුමාගේ නායකත්වයෙන්, එම ආයතනයේ සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සක්‍රිය දායකත්වයෙන් ඒ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ආයතනය ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව වෙනුවට ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විය යුත්තේ ඇයි කියන එකට කදිම උදාහරණයක් තිබෙන ප්‍රදේශයක් තමයි කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. 2016 වසරේ පැමිණි ගං වතුර නිසා පවුල් 27,000කට ආසන්න ප්‍රමාණයක්, යට වෙච්ච, අවතැන් වෙච්ච, විනාශ වෙච්ච ප්‍රදේශයක් තමයි කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කියන්නේ. එහෙම වුණේ ඇයි? හිටපු ආරක්ෂක ලේකම්තුමාගේ කාලයේදී එතුමා එතුමාගේ කොළොන්නාවේ සුදු පුතා සමඟ එකතු වෙලා වැඩේ හරියට කරලා තිබුණා නම් ඒ ප්‍රදේශයට බලපාන ගං වතුර තත්ත්වය සතියක් විතර තිබෙන්නේ නැහැ. මොකක්ද එහෙම කියන්න හේතුව? ගං වතුරත් එක්ක වැහි වතුරත් එකතු වෙලා තමයි සතියක් විතර වතුර බහින්නේ නැතිව තිබුණේ. ඒකට හේතු වන්නේ, ඇළ මාර්ග ටික ශුද්ධ පවිත්‍ර කරන්නේ නැතිව තිබීම, වතුර රැඳෙන්න තිබෙන ඉඩම් ටික ගොඩ කිරීම, වතුර බැහැලා යන්න තිබුණු කානු පද්ධතිය සම්පූර්ණයෙන්ම වැලි ජාවාරම්කාරයන්ගේ පාරාදීසයක් බවට පත් වෙලා ඒවා block වෙලා තිබීම ආදියයි. ඒ නිසා තමයි එහෙම වුණේ. ඒ විධියටයි හිටපු ආරක්ෂක ලේකම්තුමා සුදු පුතාත් එක්ක එකතු වෙලා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව කොළොන්නාව ප්‍රදේශයේ පාවිච්චි කළේ. නමුත්, අපේ ආණ්ඩුව කාලයේ පාඨලී චම්පික රණවක ඇමතිතුමා පැමිණියාට පසුව හිටපු සභාපතිතුමාත් වර්තමාන සභාපතිතුමාත් එකතු වෙලා මේ වන කොට ප්‍රධාන වශයෙන් කැලණි ගඟට වතුර බැහැලා යන කිත්තම්පහුව ඇළ මාර්ගය රුපියල් කෝටි ගණනක් වියදම් කරලා ශුද්ධ පවිත්‍ර කරලා, ඇළ ඉවුර, බැම්ම හදාගෙන ක්‍රමවත් වතුර බැස යැමේ පද්ධතියක් බවට පත් කර තිබෙනවා. අද මට විශ්වාසයෙන් යුතුව කියන්න පුළුවන්, තවත් අවුරුද්දක විතර කාලයක් යන කොට කොළොන්නාවට ගං වතුරක් ආවත්, පැය 24කින්, එහෙම නැත්නම් පැය 36කින් ඒ වතුර බැහැලා යාවි කියලා. එසේ වතුර බැස යන්න පුළුවන් වන විධියට කිත්තම්පහුව ඇළ මාර්ගය ගොතටුව පැත්තෙන් දියවන්නාව හරහා වැල්ලවත්තෙනුත්, දෙහිවල ප්‍රදේශයෙනුත් ක්‍රමානුකූලව වතුර මුහුදට ගලා බසින වැඩසටහනක් ද මෙයට සමගාමීව ක්‍රියාත්මක වනවා. ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම පමණක් නොවෙයි, ඇළ මාර්ගවල ඉවුරු බැඳීම පමණක් නොවෙයි, ඇළ මාර්ගවල ගල් බැම්ම දැමීම පමණක් නොවෙයි, ඒ ඇළ මාර්ග ඔස්සේ ක්‍රමවත්ව වතුර බැස යැමේ, ගඟට හෝ මුහුදට හෝ දෙපැත්තටම වතුර බැස යැමේ වැඩසටහනකුත් ක්‍රියාත්මක වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම අපි මේ කාරණයත් කියන්න ඕනෑ. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව ඉඩම් සංවර්ධනය කිරීමට අමතරව, ඇළ මාර්ග සංවර්ධනය කිරීමට අමතරව තවත් වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. අපේ ප්‍රදේශය ගත්තාම, ඇළ මාර්ගය අඩි 10ක් පළල නම් බෝක්කුවේ පළල අඩි 6යි. ඒ ඇළ කොච්චර හැදුවත්, ඒ ඇළ කොච්චර පිරිසිදු කළත් හදිසි අවස්ථාවකදී වතුර බැහැලා යැම ඉතාම වේගවත් මට්ටමින් කෙරෙන්නේ නැහැ. එම නිසා එම ආයතනය පසුගිය කාලයේ අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් කුඩා පරිමාණයේ පාලම් බෝක්කු 27ක් හඳුනාගෙන, ඒවායෙන් කීපයක වැඩ ආරම්භ කරලා තිබෙනවා. සමහර ඒවායේ වැඩ දැන් නිම වෙමින් පවතිනවා.

කොලොන්නාව කියන්නේ, පැය 24ක් වැස්සොත් අනිවාර්යයෙන්ම අඩියක්, දෙකක් ජලයෙන් යට වන ප්‍රදේශයක්. අපේ රජය යටතේ මහාමාර්ග අමාත්‍යාංශය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ කිහිපයක් හරහා බිලියන ගණනක් වැය කර අතුරු පාරවල් 300කට වැඩිය අද අපි හදලා තිබෙනවා. හරක් මඩු වාගේ තිබුණු පාරවල් ටික හදලා, වතුර බැහැලා යන පාලම්, බෝක්කු ටික හදන වැඩ කටයුතුත් අපි ආරම්භ කර දැන් කරගෙන යනවා. ඒ නිසා වැඩිපුර ඇසට නොපෙනෙන, පෞද්ගලිකව වැඩිපුර නොදැනෙන, වැසි කාලයට පමණක් දැනෙන සංවර්ධන වැඩසටහනක් මේ ආයතනය හරහා කරගෙන යනවායි කියන එක මම කියන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම සමහර අවස්ථාවලදී හොඳ වාගේම යම් යම් අඩු පාඩුත් සිදු වෙලා තිබෙනවා. සමහර වෙලාවට මේ වැඩ කටයුතු ඉංජිනේරුවන් නිර්මාණය කරලා, සැලසුම් හදලා, ටෙන්ඩර් කැඳවා ඒ අවශ්‍ය කටයුතු සියල්ල හරියාකාරව සිදු කළත්, භාර ගන්න කොන්ත්‍රාත්කරුවා නිසි වේලාවට වැඩේ කරන්නේ නැතිව අදිනවා. දැන් අපේ ආසනයේත් සමහර වැඩකටයුතුවලදී සියයට 98ක් පමණ සාර්ථකව සිදු වෙද්දී, කොන්ත්‍රාත්කරුවාගේ දුර්වලතාව නිසා වැඩ කටයුතු ප්‍රමාද වන, කෙරෙන්නේ නැති අවස්ථා තිබෙනවා. ඒ නිසා ජනතාවට ඒ පිළිබඳව කෝපයක් ඇති වන තත්ත්වයකුත් තිබෙනවා. එවැනි අවස්ථාවලදී සමහර විට ජනතාවගෙන් ඒ ආයතනයට සහ අමාත්‍යාංශයට ලැබෙන්න තිබෙන ප්‍රතිලාභය, ප්‍රශංසාව නොලැබෙන්න පුළුවන්. ඒ වාගේම මේ අමාත්‍යාංශය හරහා මහ කොළඹ ගංවතුර පාලනයට මිලියන 10,900ක මුදලක් අය වැයෙන් මේ අවුරුද්දට වෙන් වෙලා තිබෙනවා. නිර්මාණශීලීව, අලුත් සැලැස්මක් ඇතිව මේ වැඩසටහන් ගෙන යනවා. දැන් දියවන්නාව ජලයෙන් යට නොවුණායි කියලා මුළු කොළඹම බේරෙන්නේ නැහැ. කොළොන්නාව, දෙහිවල ඇතුළුව කොළඹ 1 සිට කොළඹ 15 දක්වා ප්‍රදේශවලට මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා මේ සැලැස්ම හරහා ඉදිරි අවුරුදු තුනක කාලය තුළ සම්පූර්ණයෙන්ම වැසි වතුරෙන් යට වන එක නතර කිරීමටත්, ගංවතුරක් ආවාම ඒ ගංවතුර ඉතා ඉක්මනින් බැහැලා යාම සඳහාත් අවශ්‍ය කටයුතු වේගවත්ව කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

හොඳයි.

මොකද, ගංවතුරක් ඇවිල්ලා සතියක් විතර තිබුණාම, විශාල මුදලක් වැය කරලා වන්දි ගෙවන්න සිදු වෙනවා. 2016 ඇති වූ ගංවතුර නිසා අපි මේ වන කොට කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට රුපියල් මිලියන 2,300ක් විතර වැය කර වන්දි ගෙවා තිබෙනවා. ඊළඟ කැබිනට් මණ්ඩල අනුමැතිය හම්බ වුණාම තවත් රුපියල් මිලියන 400ක් විතර ගෙවන්න තිබෙනවා. ක්‍රමානුකූලව කළමනාකරණය කර මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් මේ ඔක්කෝම නවත්වන්න පුළුවන්. මම නැවත වතාවක් විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

හැටියට, කොලොන්නාව ආසනයේ සංවිධායකවරයා හැටියට ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගේ නිර්මාණශීලීභාවයටත් ඒ හරහා අපේ ජනතාවට ලබා දුන්නු ප්‍රතිලාභවලටත් මගේ ස්තුතිය පුද කරන ගමන් තව එක කාරණයක් කියන්න ඕනෑ.

දැන් අපේ පැත්ත තමයි සාමාන්‍යයෙන් ඉඩම් ගොඩ කරන ජාවාරම්කරුවන්ගේ මධ්‍යස්ථානය; වැලි ජාවාරම්කරුවන්ගේ මධ්‍යස්ථානය. මේවා මේ ආයතනයෙන් හරියට අල්ලනවාද, අල්ලන්න එන මිනිහාට tip එක දෙනවාද කියලා ප්‍රශ්නයකුත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, එවැනි සිද්ධීන් මා ඔබතුමාට කියලාත් තිබෙනවා. ඒ නිසා ඒ tip එක දෙන්නේ කවුද කියලා ඔබතුමන්ලාත් දන්නවා. මේ කරන වැඩකටයුතුවල ප්‍රතිලාභය උපරිම වශයෙන් ජනතාවට ලබා ගැනීම සඳහා ඒ පිළිබඳවත් හොයා බලා, ඒවා පාලනය කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු එස්.සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා. 4.57]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම ගැන. අද ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවක් බවට පරිවර්තනය කරලා ඒ පිළිබඳව විවාදයක් යන අවස්ථාවේ වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන සන්තෝෂ වනවා. මේ ආයතනයට අදාළ අමාත්‍යාංශය පැත්තෙන් ගත්තොත්, එහි ඇමතිවරයාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සන්තෝෂ වෙන්න පුළුවන්. එතුමා සැලසුම්සහගතව, විද්‍යාත්මක දැනුමක් ඇතිව කටයුතු කරගෙන යනවා. වෘත්තියෙන් ඉංජිනේරුවකු වශයෙන් ලත් අත්දැකීම එතුමා රටේ ඉදිරි ගමනට දායක කරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. බේරේ වැව පිරිසිදු කිරීම වාගේම මේ රටේ තිබෙන ප්‍රශ්නයකට විසඳුමක් වශයෙන් මුහුදු වැලි පිරිසිදු කර ගොඩනැඟිලි හැදීමට ජනතාවට බෙදා හැරීමේ වැඩ පිළිවෙළ ඉතා අගය කළ යුතු වැඩ පිළිවෙළක් කියලා අපි මේ අවස්ථාවේ සඳහන් කරනවා.

එතුමා කිව්වා, තවදුරටත් මුහුද ගොඩ කිරීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක්, අනාගත අදහසක්, සැලැස්මක් තිබෙනවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය දෙන දේවල්, එහෙම නැත්නම් ලෝකයේ අත් දැකීම් ඉතා ඉක්මනින් අපි වැලඳ ගන්නවා. කාලයක් යනකොට එහි ප්‍රතිවිපාක බලා, එය හොඳ නැහැයි කියන එක තේරුම්ගෙන, ඊට පස්සේ එය වෙනස් කරන්න උත්සාහ කරනවා. මගේ මතකයේ හැටියට 1960 ගණන්වල වී නිෂ්පාදනය කිරීම සඳහා අපි පොහොර භාවිත කළා. එසේ කළේ අක්කරයකින් වැඩි වී අස්වැන්න ප්‍රමාණයක් ලබා ගැනීම සඳහායි. ඒ අනුව ගොවිතැන් කිරීම සඳහා පොහොර යෙදීමට ගොවියා ක්‍රමානුකූලව පුරුදු වුණා. එහි ප්‍රතිවිපාක ලෙස වකුගඩු රෝගය වැලදෙනකොට, "මේක එච්චර හොඳ නැහැ, මේකෙන් බැහැර වෙන්න ඕනෑ"යි කියලා කල්පනා කළා. ඒ ආකාරයට මුහුද ගොඩ කිරීමේදී සිදුවන පරිසර විනාශය අනාගතයට කොච්චර බලපානවාද කියන කාරණය පිළිබඳවත් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කියලා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නගරය දියුණු කිරීමට තමයි නාගරික සංවර්ධන අධිකාරිය උත්සාහ කරන්නේ. නගරය දියුණු කරන්න අවශ්‍ය වෙන්නේ, නගරයට මිනිසුන් ඇදී එන්නේ, නගරයට අවශ්‍ය පහසුකම් දෙන්න වැඩි මුදලක් වියදම් කරන්න වෙන්නේ ග්‍රාමීය මට්ටමේ දියුණු කිරීමක් නොකළ නිසායි. නගරයේ තිබෙන රාත්‍රියේ වොලිබෝල් ක්‍රීඩාව කරන්න අවශ්‍ය කරන පහසුකම්, පාසල්, වෛද්‍ය පහසුකම් ගමේ තිබෙන්න ඕනෑ. මේ තත්ත්වය ගමේ රඳා පවත්වා ගන්න පුළුවන් වුණොත් මිනිසුන් නගරයට ඇදී ඒම අඩු කරන්න පුළුවන් වෙනවා; නගරයේ තිබෙන තදබදය අඩු කරන්න පුළුවන් වෙනවා. ඒ සඳහාත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලීමක් කරනවා.

ඒ විතරක් නොවෙයි. අපි දකින දෙයක් තමයි, අද සාමාන්‍ය ජනතාවට යම් කටයුත්තක් කරගන්න රජයේ කාර්යාලයකට ගියාම ඒ සඳහා ඔවුන්ගේ කාලය අනවශ්‍ය විධියට කැප කරන්න සිද්ධවන එක. ඒ නිසා සාමාන්‍ය ජනතාව රාජ්‍ය සේවය කෙරෙහි කලකිරිලායි ඉන්නේ. උදාහරණයක් වශයෙන්, යම් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා එනවා නම්, ඒ බලපත්‍රය ඉල්ලුම් කළ දින සිට මෙපමණ කාලයක් තුළ බලපත්‍රය ලබා දිය යුතුයි කියලා යම්කිසි කාල සීමාවක් නියම කරන්න කටයුතු කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාගරික සංවර්ධන අධිකාරිය කිව්වාම, එය හරියට හමුදාව වගෙයි කියන අදහසක් තමයි ජනතාව තුළ තිබෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරිය යම්කිසි ඉඩමක් අත්පත් කරගන්නකොට ඒ අත්පත් කර ගන්නා ඉඩමේ භූමියේ තක්සේරුවට හා සමානව අපේ අවධානය යොමු කරන්න ඕන කාරණයක් තිබෙනවා. ඒ තමයි, ඒ ඉඩම අයිති පුද්ගලයා පරිසරය වෙනස් කරලා ඔහු ඉන්න තැනින් වෙන තැනකට යනවා. ඔහුට තිබෙන සමහර පහසුකම් අඩු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana
ඒ එක්කම ඔහු යම් වෘත්තියක් පුහුණුවෙලා තිබුණා නම් ඒක වෙනස් වෙනවා. ඒ නිසා ඒ සඳහාත් යම්කිසි වන්දියක් ගෙවීමට කටයුතු කරන්න ඔබතුමාගේ අවධානය යොමු කළොත්, මා හිතන හැටියට එය ඉතාමත් වැදගත් වෙනවා.

ඒ විතරක් නොවෙයි. බලපත්‍ර ලබාදීමේදී අපි දකිනවා, ඔවුන් භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය. නගරයේ සමහර ඉඩම් කැඩිලා, කැඩිලා ගිහින් පොඩි කඩ කාමර බවට පත්වෙලා තිබෙනවා. නමුත් අද නාගරික සංවර්ධන අධිකාරිය සීමා කරලා තිබෙනවා, බලපත්‍ර දෙන ප්‍රමාණය. මා ඉල්ලීමක් කරනවා, ඒ නිසා තමන්ගේ බිම් කොටස සංවර්ධනය කරගන්න බැහැ, බැංකු ණයක් ගන්න බැහැ. නාගරික සංවර්ධන අධිකාරියට අයිතිවන නගරවල පුද්ගලයන් භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය අනුව යම් බලපත්‍රයක් දීලා, එහි අයිතිය තහවුරු කරලා, ඔහුට ණයක් අරගෙන එය සංවර්ධන කිරීමට අවස්ථාව සලසා දෙන්නය කියලාත් මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

හොරොව්පතාන, කහටගස්දිගිලිය, ගලෙන්බිඳුනුවැව වැනි නාගරික ප්‍රදේශවල, විශේෂයෙන් හොරොව්පතාන නගරයේ නාගරික සංවර්ධන අධිකාරියේ කටයුතු ක්‍රියාත්මක කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය කියන්න මට පොඩි අවස්ථාවක් දෙන්න.

මම කිරිඇල්ල කැබිනට් ඇමතිතුමාට කියනවා නින්දෙන් අවදිවෙන්න කියලා. මේ වෙලාවේ පාර්ලිමේන්තුවේ ඇමතිවරු නැහැ. මට අපේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්නයක් කථා කරන්න වෙලා තිබෙනවා ඇමතිතුමනි. ඔබතුමා කැබිනට් ඇමතිවරයෙක් වශයෙන් ඉන්නවා. මේ විෂයට සම්බන්ධ නොවුණත්, රජයක් හැටියට මේ පිළිබඳව අවධානය යොමු කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. විනාඩියෙන් අවසන් කරනවා.

අපේ ප්‍රදේශයේ ගොවීන්ගෙන් ගිනි අවි ආපහු ගන්නවා. මේ අවුරුද්දේ ගොවීන්ගේ ජීවිත 12ක්, ගිය අවුරුද්දේ ජීවිත 17ක් අහිමි වෙලා තිබෙනවා. දැන් අලින් පුරුදු වෙලා තිබෙනවා ගෙවල් කඩාගෙන යන්න. අමු දවල් ගිහිල්ලා ගෙවල් කඩනවා, වී පුසුඹට. ගිනි අවියක් තිබුණොත් තමයි ගොවියෙකුට හයියක් තිබෙන්නේ. ඒ නිසා මේ ගිනි අවි ආපහු ලබා ගැනීම නතර කරන්න. ගිනි අවියක් දෙන්න අක්කර පහක බලපත්‍රයක් ඉල්ලනවා. හේන් ගොවීන්ට අක්කර පහක බලපත්‍රයක් දෙන්නේ නැහැ, ඇමතිතුමා. ඒ නිසා මේ ගැන ආණ්ඩුවේ අවධානය යොමු කරලා, මේ ගොවීන්ගේ වගා ආරක්ෂා කිරීමටත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි හතක පමණ කාලයක් තිබෙනවා.

[අ.භා. 5.04]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ආයතනය පිළිබඳව සාකච්ඡා කිරීමේදී, මෙම ආයතනයට ප්‍රධාන වශයෙන් වගකීම් දෙකක් තිබෙනවා. එක වගකීමක් තමයි, පරිසරය ආරක්ෂා කර ගැනීම. අනෙක තමයි, පරිසරය රැක ගැනීම සහ ඒ පරිසරයට හානි නොකර සංවර්ධනය කිරීම. පරිසරයත්, රටේ සංවර්ධනයත් යන කරුණු දෙකටම දායකත්වය ලබා දෙන්නට පුළුවන්කම ලැබෙනවා, මේ ආයතනයට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දැවැන්ත වශයෙන් පහත් බිම් තිබෙනවා. අපි මේ පහත් බිම් පරිසරයට හානියක් නොකොට සංවර්ධනය කරන ක්‍රියාදාමයේ නියැළෙන්නට අවශ්‍යයි. නමුත් අද ප්‍රශ්නය තිබෙන්නේ මේ ආයතනවල තිබෙන නීති පටිපාටින් එක්ක අද මේ බිම් සංවර්ධනය කරන උදවිය නීති විරෝධීව ගොඩකිරීම් කරන්නට පුරුදු වෙලා තිබෙන එකයි. ඇත්ත වශයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මේක ලොකු ප්‍රශ්නයක්. අද කිසිම නීතියකට හිස නමන්නේ නැතුව, නීත්‍යනුකූලව ඒ සංවර්ධන කටයුතු කරන්නේ නැතුව, නීති විරෝධීව ඉඩම් ගොඩ කරනවා. අද ඒක මාෆියාවක් බවට පත් වෙලා තිබෙනවා. පස් කපන කන්දේ සිට, ලොරි අයිතිකාරයන්ගේ සිට, මේ පස් ගෙනැල්ලා පහත් බිම් ගොඩකරන තැන දක්වා කටයුතු සිදු වන්නේ මුදලට. ඒ කටයුතුවලට නීතිය ක්‍රියාත්මක කරන සමහර ආයතන සහ නිලධාරිනුත් සම්බන්ධයි කියන එක අපේ ප්‍රදේශයේ ජනතාව අපට කියන කාරණයක්. එදා මේවාට දේශපාලනඥයෝත් සම්බන්ධ වුණා. දේශපාලනඥයන්ගේ සම්බන්ධතාවක් නැති වුණත් මේ දේවල් අදටත් ක්‍රියාත්මක වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට ආවොත් බලාගන්න පුළුවන්, ජාඇල අධිවේගී මාර්ගයට යාබදව, විශේෂයෙන්ම ජාඇල පොලීසිය ගාවින් හැරිලා පිට්ටනිය පහු කරලා එන කොට දැවැන්ත ගොඩවීමක් වෙන බව. මේ පිළිබඳව අපි ප්‍රාදේශීය ලේකම්වරයාට දැනුම් දුන්නා. ඒ වාගේම ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ ආයතනයට ලිපි දීලා තිබෙනවා; දැනුම් දීලා තිබෙනවා; ඔවුන් දැනුවත් කරලා තිබෙනවා. නමුත් අපි දන්නේ නැහැ, මේවාට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙනවාද කියලා. මුතුරාජවෙල ප්‍රදේශයේත් මෙවැනි නීති විරෝධී ගොඩකිරීම් අපට දකින්න ලැබෙනවා. මේ හරහා සිද්ධ වන්නේ වැසි කාලයේදී මේ ගොඩකරපු ඉඩම්වල එකතුවන වතුර පාර හරහා, කානු හරහා ගිහිල්ලා ගෙවල් දොරවල් යට වෙන තත්ත්වයට පත් වෙන එකයි.

ඒ විතරක් නොවෙයි, වත්තල - මාබෝල ප්‍රදේශයේ අධිවේගී මාර්ගයට යාබදව සිදුවන ගොඩ කිරීම් ගැනත් සඳහන් කරන්න අවශ්‍යයි. මාබෝල දේවස්ථානයේ පූජකතුමාත් ඒ පිළිබඳව නිලධාරින් දැනුවත් කරලා තියෙනවා. මේ පිළිබඳව අපිත් ඒ අදාළ අංශ දැනුවත් කරලා තියෙනවා. නමුත් අපි දන්නේ නැහැ, මේ පිළිබඳව නීතිය ක්‍රියාත්මක වෙනවාද කියලා. ඒ වාගේම, මගේ මීගමුව ආසනය ගත්තාම, විශේෂයෙන්ම කඩොල්කැලේ ප්‍රදේශයේත් මේ ආකාරයෙන් ඉඩම් ගොඩවීම් වෙනවා. අපි දේශපාලනඥයන් හැටියට දන්නේ නැහැ, මේවා නීත්‍යනුකූලවද ක්‍රියාත්මක වෙන්නේ, හරි නීති රාමුව තුළද ක්‍රියාත්මක වෙන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රටේ සංවර්ධනයට විරුද්ධ නැහැ. හැබැයි, සංවර්ධනයේ නාමයෙන් මේ රටේ පරිසරය හානියට ලක්වෙනවා නම්, පරිසර නීති උල්ලංඝනය වෙනවා නම් අපි ඒකට විරුද්ධයි. ඒ නිසා මේ ගොඩකිරීම් සහ සංවර්ධනය කිරීම් කරද්දී, ඒ අදාළ නීති රාමුව තුළ ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මම කලින් කිව්වා වාගේ ඒ වාගේ දෙයක් කරනකොට ආයතන හතකින් නැත්නම් අටකින් අනුමැතිය ගන්න ඕනෑ. ඒ අනුමැතිය ගන්න සමහර අයට ඉතාම අමාරුයි. සමහර වෙලාවට ගන්න බැහැ. එතකොට තමයි මේ අය මේ කටයුතු නීතිවිරෝධීව කරන්නේ. ඒ නිසා මේ රටේ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා නිසි වැඩපිළිවෙළක් අවශ්‍යයි. විශේෂයෙන්ම පහත්බිම් සංවර්ධනය කිරීම සඳහා නිසි වැඩපිළිවෙළක් අවශ්‍යයි. ඒ සඳහා රාජ්‍ය නිලධාරින්, දේශපාලනඥයන් එකතු වෙලා වැඩපිළිවෙළක් නිර්මාණය කරන්න ඕනෑ. ඒ වැඩපිළිවෙළ ප්‍රදේශයෙන් ප්‍රදේශයට ආවේණික වෙච්ච වැඩපිළිවෙළක් වෙන්න ඕනෑ. මොකද, අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන ඉඩම්වල පිහිටීම නොවෙයි සමහර වෙලාවට කළුතර, එහෙම නැත්නම් කොළඹ, එහෙමත් නැත්නම් පුත්තලම් දිස්ත්‍රික්කයේ තිබෙන්නේ. ඒ නිසා ඒ ඒ ප්‍රදේශයට ආවේණික වෙච්ච වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට අවශ්‍යයි කියලා තමයි මා විශ්වාස කරන්නේ. එහෙම නොකළොත් මේ ආකාරයේ නීතිවිරෝධි ගොඩකිරීම් දිනෙන් දින වැඩි වෙනවා. ඒ හරහා දැවැන්ත මුදල් හුවමාරුවක් සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසියෙන් මේ අය අල්ලාගෙන නඩු මාර්ගයට ගියේ නැත්නම්, ඒ අය නිදහස් වෙනවා. එතකොට මේ කටයුතු දිගින් දිගටම වෙනවා.

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

මීට අවුරුදු දෙකකට විතර උඩදී අපි දැක්කා, කොළඹ නගරයේ කුණු ප්‍රශ්නයක් තිබුණු බව. ඒ කුණු ප්‍රශ්නය නිරාකරණය කරන්න, ඒක කළමනාකරණය කරන්න විශේෂයෙන්ම ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා ලොකු වෙහෙසක් ගත්තා. එතුමාට පුළුවන්කම ලැබුණා, කොළඹ නගරයේ කුණු ප්‍රශ්නය අවසන් කරන්න. අද එතුමා මීතොටමුල්ල කුණු කන්ද තිබුණු ප්‍රදේශය උද්‍යානයක් බවට පත් කරලා තිබෙනවා. දක්ෂ ඇමතිවරයකු වන එතුමා මේ පහත්බිම් සංවර්ධනය කිරීමත්, ගොඩකිරීමත් පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් නිර්මාණය කරයි කියලා මා විශ්වාස කරනවා. ඒ හරහා මේ රටේ සංවර්ධනයට දායක වෙන්නට කැමැති ආයෝජකයන් ඉන්නවා නම්, ඒ අයට ඒ දේ කරන්නට පුළුවන්. ඒ වාගේම නීතිවිරෝධි ගොඩකිරීම්, සංවර්ධනය කිරීම් නතර කරන්නටත් පුළුවන් වේවි කියන හැඟීම අපට තියෙනවා.

නමුත් අපි මේ සියල්ලම කළාට වැඩක් නැහැ. මොකද, අද පළාත් පාලන ආයතනවල බලය අප සතුව නොවෙයි තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සංවර්ධන වැඩකටයුතු සියල්ලම කළත්, අන්තිමට කාණු, බෝක්කු ටික සුද්ද කරන්න ඕනෑ පළාත්පාලන ආයතනවලින්; ප්‍රාදේශීය සභාව, නගර සභාව තුළින්. ඔවුන් අද ඒ වැඩ හරියට නොකළොත් නැවත වතාවක් මේ යටවීම්, ගොඩවීම් සිද්ධ වෙනවා. ඒ නිසා ඒ අයටත් ඒ වගකීම තියෙන බව කියමින්, මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.12]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද පරිසරයට බොහොම සංවේදී කාරණාවක් කථාබහට ලක්වෙන මොහොතක. මේ රට තුළ තියෙන තෙත් බිම්වලින් සියයට 60කට වැඩි ප්‍රමාණයක් දැඩි අනතුරකට පත්වෙලා තියෙන මොහොතක, මේ ඉඩම් ගොඩකිරීම සහ සංවර්ධන කිරීම සම්බන්ධයෙන් මෙගාපොලිස් අමාත්‍යාංශයට අදාළව ගෙනෙන මේ පනත් කෙටුම්පත තුළිනුත් සිද්ධ වන්නේ අපි පසුගිය දවස්වල දැක්ක ක්‍රමවේදයම බවයි අපි දකින්නේ.

මේ හදලා දෙන, නිර්මාණය කරලා දෙන, සකස් කරලා දෙන හැම නීතියකම, හැම යෝජනාවකම, හැම සංශෝධනයකම සිදුරකින් කාට හරි රිංගලා ගිහිල්ලා වංචාකාරීව කටයුතු කරන්නට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමක් සිද්ධ වෙනවාය කියලා පැවැති රජයට මෙන්ම, මෙම රජයටත් මා චෝදනා කරනවා. අපේ මන්ත්‍රීතුමන්ලා අදහස් දැක්වීමේ දී කිව්වා ගිය රජයේ දේශපාලනඥයෝ යම් යම් විධියට මේවාට මැදිහත්වෙලා කටයුතු කළාට මේ රජයේ දේශපාලනඥයෝ එහෙම කරන්නේ නැහැයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය රජයට චෝදනා කරන මේ ආණ්ඩුවේ මන්ත්‍රීතුමන්ලා මේ සභාවේ දී කථා කරලා කියනවා අපේ ජා-ඇල ප්‍රදේශයේ, එහෙම නැත්නම් මීගමුව ප්‍රදේශයේ පරිසර විනාශය, කඩොලාන විනාශය, පහත් බිම් ගොඩ කිරීම අපි දන්නේ නැතිව සිද්ධ කරනවා කියලා. එතකොට අපි ආණ්ඩුවෙන් අහනවා, ආණ්ඩුව නියෝජනය කරන මේ මන්ත්‍රීවරුන්, සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් මේවාට ගිහිල්ලා බුදියාගෙනද ඉන්නේ කියලා. ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ මෙගා පොලිස් අමාත්‍යාංශයේ නිලධාරින්ව මාස්පතා තමන්ගේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට, අනෙකුත් කමිටුවලට ගෙනැල්ලා සාකච්ඡා කරන්නට පුළුවන්. ඒ අයව ගෙන්වලා මේ වෙනුවෙන් ගන්න ඕනෑ ක්‍රියාමාර්ගය, මේ වෙනුවෙන් යොදවන්නට ඕනෑ විශේෂඥ දැනුම, මේ වෙනුවෙන් වැඩ කරන්නට ඕනෑ කොහොමද කියලා සාකච්ඡා කරන්නට පුළුවන්. එතෙක් සම්බන්ධීකරණ කමිටුවේ තාවකාලික අත්හිටුවීමක් මොනම බලධාරියෙකුටවත් දෙන්නේ නැහැ, සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාට ඒ අයිතිය තිබෙනවා. ඒ අයිතිය පාර්ලිමේන්තුවෙන් හදලා දීලා තිබෙනවා. මේ වෙනකොට පාර්ලිමේන්තුවෙන් හදලා දීලා තිබෙන ඒ අයිතිය යම්කිසි විධියකට කෙළෙසෙනවා නම් ඒකේ වැරැද්දත් ආණ්ඩුවේ. අපි දන්නවා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සමහර සභාපතිවරුන්ට පළාත් සභා මන්ත්‍රී ධුරයක් නැහැ, ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුරයක් නැහැ. නමුත් රාජ්‍ය මුදල් වෙන් කරලා විධිමත් වැඩසටහනකට යොමු කරන, රාජ්‍ය මුදල්වලට වග කියන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව මේ සම්බන්ධීකරණ කමිටුවලට දාන්නට මේ ආණ්ඩුවට බැරිව ගිහින් තිබෙනවා. අන්න ඒ ගැටලුව ගැන කථා කරන්නට තිබියදී පළාත් පාලන ආයතනවලට ඇඟිල්ල දික් කරනවා. පළාත් පාලන ආයතනවලට ඇඟිල්ල දික් කරන්නට දෙයක් නැහැ.

මීතොටමුල්ලේ කුණු කන්ද දැන් ගොඩ ගැහෙන්නේ නැහැ, ඒක හරි. හැබැයි අපේ කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමාගේ ආසනය මීගමුව වුණාට වත්තල මැතිවරණ කොට්ඨාසයේ මුතුරාජවෙල, කෙරවළපිටියේ තෙත් බිම් තීරුවම යොදාගෙන අද විනාශකාරී ලෙස මීතොටමුල්ල වාගේ කුණු කන්දක් නිර්මාණය කරනවා, මෙගා පොලිස් අමාත්‍යාංශයෙන්. අධිවේගී මාර්ගයේ ගමන් කරන විට වම් පැත්තේ පේන්නේ අති විශාල වාහන ප්‍රමාණයක් යොදාගෙන මීතොටමුල්ලට ගෙනාපු කසළ ටික, එහෙම නැත්නම් පුත්තලමේ අරුවක්කාරුවලට ගෙනියනවා කියපු කසළ ටික කඩිනමින් අහස උසට ගොඩ ගහනවා හදවත වාගේ තිබෙන අර තෙත් බිම් තීරුවේ. එහෙම නැත්නම් මනුෂ්‍ය ජීවිතයට හොඳ හුස්ම ටිකක් ගන්න පුළුවන්කම තිබෙන කඩොලාන තෙත් බිම් තීරුවේ ගොඩ ගහනවා; ගොඩ කරනවා. යම්කිසි භූමි ප්‍රමාණයක් තෝරාගෙන, අවශ්‍ය පරිසරය නිර්මාණය කරලා මෙගා පොලිස් අමාත්‍යාංශය හෝ වෙන ඕනෑම අමාත්‍යාංශයක් ඒ සංවර්ධන කටයුතු කිරීම පිළිබඳව අපේ විරෝධතාවක් නැහැ.

අපි දැක්කා පසුගිය ආණ්ඩු කාලයේ කොළඹ තිබුණු මාළු මාකට් එක පැලියගොඩට ගෙනිහින්, මුතුරාජවෙල ඒ සංවර්ධන කටයුතු කළා. අද ඒ මාළු මාකට් එක පැලියගොඩ තිබෙනවා. ඒක හොඳයි. මිල අධික භූමි ප්‍රදේශය රජයට ලබාගෙන දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් ගෙනයන්නට පුළුවන්. ඒ වාගේම අද මැනිං මාකට් එක එහි ඉදි වෙමින් පවතිනවා. ඒක හොඳයි. හැමිල්ටන් ඇළ සහ ඒ කළපුව කියන්නේ ලංකාවට ආවේණික මත්ස්‍ය වර්ග දෙතුන් සියයක් ඉන්න වටිනාම භූමියක්. ඒ සම්පතයි මේ විධියට විනාශ වෙන්නේ. මේ මැති ඇමතිවරුන්ට අධිවේගී මාර්ගය හරහා කටුනායක ගුවන් තොටුපොළට යනකොට සහ කටුනායක ගුවන් තොටුපොළේ ඉඳලා කොළඹට එනකොට මේක හොඳට පෙනෙනවා ඇති. ඒක රමණීය පරිසරයක් නිර්මාණයවෙලා තිබුණු භූමියක්. අද මෙගා පොලිස් අමාත්‍යාංශය වග කියන්නට ඕනෑ මේකට විතරක් නොවෙයි.

ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට දෝෂාරෝපණය කරන ගමන්, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ඇඟිල්ල දිගු කරන ගමන් කොලොන්නාව, මීතොටමුල්ල කුණු කන්ද ගැන ඇතැමුන් කථා කරනවා.

හැබැයි, මීතොටමුල්ල කුණු කන්ද තවම එහෙම්ම ඒ විදියටම තිබෙනවා. ඒකට තණකොළ පිඩැලි ටිකක් සම්බන්ධ කරලා, තණකොළ පිඩැලි ටිකක් හිටවලා නවත්වන එක ගැන නොවෙයි අපි කථා කළේ. මේක අරුවක්කාලුවට ගෙනියන වැඩ පිළිවෙළ කථා කළේ. අදත් අරුවක්කාලුවල ඒ ඉදිකිරීම් කටයුතු සිද්ධ වෙනවා. හැබැයි, දැන් ගිහිල්ලා මීතොටමුල්ලේ තණකොළ පිඩැලි ගහනවා. මේවා ජාතික අපරාධ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
අනාගතය දකින නායකයෝ විදියට කථා කරනවා නම්, අඩුම තරමේ මේ රටේ ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙන භූමි ප්‍රදේශ අයිති කරලා දීලා තිබෙන අමාත්‍යවරයා විදියට ඒ අමාත්‍යවරයාත් කොළඹ, කළුතර සහ ගම්පහ ඇතුළු මේ නගර සම්බන්ධීකරණ කරමින් මනා වැඩ පිළිවෙළක් ගෙනියන්න ඕනෑ. ඒ වෙනුවට අතන තිබ්බ කුණු ගොඩ මෙතැනට ගෙනැල්ලා, හරියට පුටුව කඩලා අටුව හදනවා වාගේ තාවකාලික පැලැස්තරයයි මේ යොදන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කියන්න ලජ්ජයි. මේ ආණ්ඩුව පටන් ගත්ත දවසේ ඉඳන් හැමදාම කළේ කරන්න අවශ්‍ය දේ නොවෙයි. දැන් මෙතැන වැලිවලින් විශාල මුදලක් උපයනවා කිව්වා. මහා භාණ්ඩාගාරයට විශාල ධනස්කන්ධයක් ලබා දෙනවා කිව්වා. ඒක හොඳයි. මුහුදේ තිබෙන වැලි ටික අරගන්න, ගංගාවලින් වැලි ගොඩ දමන, ඒ වාගේ ජාවාරම් නවත්වන්න පුළුවන් වැඩ පිළිවෙළක් නිර්මාණය කරනවා නම්, අපි එක සිතින් අපේ ප්‍රදේශවල පූර්ණ සහයෝගය එයට ලබා දෙනවා. හැබැයි, සිද්ධ වෙන්නේ එහෙම නොවෙයි.

දැන් දිවුලපිටිය ප්‍රදේශයට මුහුදු වැලි අරගෙන ගිහිල්ලා එහේ ගබඩාවක් හදන්න යනවා. මම සභාපතිවරයාට, උප සභාපතිවරයාට ඊයේ-පෙරේදා කථා කරලා කිව්වා, "මොන මෝඩ වැඩක් ද මේ කරන්නේ" කියලා. ඊට පස්සේ පානදුර ප්‍රදේශයේ වැලි ගබඩාවක් හදන්න හදනවා. හංවැල්ල ප්‍රදේශයේ වැලි ගබඩාවක් හදන්න යනවා. රට ඇතුළේ සිට ඇවිත් මුහුදට ගලා බසින ප්‍රධාන වැලි ලබා ගන්නා වැලි නිධි තුන පවතින කළු ගඟ, කැලණි ගඟ සහ මාඔය කියන තුන ආසන්නයේම මේ වැලි ගබඩා හදන්නේ මොකටද? මේ වැලි ගබඩා හදපුවාම මුහුදු වැලි කියුබ් දෙකක් ගෙනයන මනුස්සයා ගංගා වැලි කියුබ් 50ක් විතර ගොඩ දමාගෙන අර මුහුදු වැලි බලපත්‍රයෙන් ගංගා වැලි මංකොල්ල කනවා. ඒ වැඩ කටයුත්ත සිද්ධ වෙනවා. මේක තමුන් තේරුම් ගන්න ඕනෑ කටයුත්තක්. ගම්පහ දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, තව දිස්ත්‍රික්ක හතර, පහකට ඇති වෙන විදියට මුතුරාජවෙල වැලි නිධිය තිබෙනවා. ඒ නිසා ඒ නිධිය තුළ ඒ කටයුත්ත කළා නම් හොඳයි කියලයි මම හිතන්නේ. මේ ගංගාවලින් වැලි ගොඩදැමීම දැනටමත් තහනම් කරලා තිබෙන්නේ. හරියාකාරව අපේ රටේ ගංගා රැක ගන්න, ආරක්ෂා කරගන්න ආරක්ෂිත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොතින් මේ ගංගාවලින් වැලි හොරකම් කරන අයව නවත්වා ගන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඒ නිසා රටට වග කිවයුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විදියට අපි යෝජනා කරන්නේ, රටට වැදගත් යෝජනා ඉදිරිපත් කරන්න; රටට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරන්න කියලායි. තාවකාලික පැලැස්තර ගෙන එන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුහුදු වැලි ටික ගෙනැල්ලා ගොඩ ගහලා, මුතුරාජවෙල ගංගාශ්‍රිතව තිබෙන වැලි ටික අදින්න ගියොත් මේ වැලි ජාවාරම නැවතත් සිද්ධ වෙන බව සඳහන් කරමින් මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
"ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. WIJEPALA HETTIARACHCHI *left the Chair and* THE HON. ANURA SIDNEY JAYARATHNE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.21]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනිවර කියවීමේ අවස්ථාවේ දී මටත් අදහස් දැක්වීමට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මඟින් කොළඹ නගරය මුල් කරගෙන, ඒ වාගේම බස්නාහිර පළාත මුල් කරගෙන අද කරගෙන යන මේ විශාල සංවර්ධන ක්‍රියා පිළිවෙත ගැන අප සියලුදෙනාම දන්නවා. මෙම අමාත්‍යාංශය යටතේ පවතින නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රියාදාමයන් තුළින් මෙම අමාත්‍යාංශය නව දැක්මක් තිබෙන අමාත්‍යාංශයක් හැටියට අපට හඳුන්වා දෙන්න පුළුවන්. විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කොළඹ නගරය හා ලංකාවේ ප්‍රධාන නගර ටික මේ ලෝකයේ තිබෙන අලුත් තත්ත්වයන්ට අනුව දියුණු කරගෙන යන්න පුළුවන් ක්‍රම සහ ඒ අලුත් වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කරමින් තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රජය කාලයේ නාගරික සංවර්ධන අධිකාරිය තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේයි. එදා ආරක්ෂක ලේකම්වරයා විදියට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පවත්වාගෙන ගිය බව අපි දන්නවා. ඒ වාගේම එදා කොළඹ නගරය සංවර්ධනයේ දීත්, කුණු කසළ බැහැර කිරීමේ දීත් කිසිදු දුර දැක්මක් නැතිව, විද්‍යාත්මක පදනමක් නැතිව සිදු කළ ඒ ක්‍රියා කලාපය ගැනත් අපි දන්නවා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

අද වනවිට ඒ සියලුම දේවල් නිවැරදි විශ්ලේෂණයක් හා නිවැරදි දැක්මක් අනුව කරගෙන යනවා. අද වන විට කුණු කසළ පිළිබඳ ප්‍රශ්නය කොළඹ නගරයට පමණක් නොව මුළු රටටම ජාතික ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. කුණු කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය ජාතික වැඩ පිළිවෙළක් යටතේ විද්‍යාත්මක පදනමක් උඩ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාවට නංවමින් තිබෙනවා. ඒ ක්‍රියා පටිපාටිය මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මඟින්  කරගෙන යනවාය කියන එක අපි සියලු දෙනාම දන්නා කාරණාවක්. මොකද, අද කුණු කසළ පිළිබඳ ප්‍රශ්නය ගත්තොත්, කොළඹ නගරය විතරක් නොව ලංකාවේ ප්‍රධාන නගර සියල්ලම ගත්තත් තවම ඒ කිසිදු නගරයක -බහුතර නගරයක-  එවැනි විද්‍යාත්මක පදනමකින් යුතුව කුණු කසළ බැහැර කිරීමේ වැඩ පිළිවෙළක් පළාත් පාලන ආයතනවලට නැහැ. ඒ වැඩ පිළිවෙළ හඳුන්වා දීමට මූලිකත්වයෙන් කටයුතු කළේ නාගරික සංවර්ධන අධිකාරිය කියා අපට පිළිගන්න වෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කුණු කසළ බැහැර කිරීමේ ජාතික වැඩ පිළිවෙළවල් කිහිපයක් අද රට පුරාම ක්‍රියාත්මක වන බව අපි දන්නවා.  එදා කුණු කසළ බැහැර කිරීමට විද්‍යාත්මක පදනමකින් තොරව කටයුතු කළ නිසා කොළඹ නගරයේ කුණු කඳු ගොඩ නැඟුණා. දීර්ඝ කාලයක් තිස්සේ කුණු කසළ බැහැර කිරීමේ වැරදි ක්‍රම නිසා කොළඹ නගරය තුළ ඩෙංගු, නොයෙකුත් බෝ වෙන රෝග හා ගං වතුර වැනි දේවල්වලට මුහුණ දෙන්න සිදු වුණා. විශේෂයෙන්ම කොළඹ නගරයේ අවිධිමත් සංවර්ධනය, එහෙම නැත්නම් ඒ සංවර්ධනය සැලැස්මක් උඩ නොකරපු නිසා පසු ගිය කාලයේ කුඩා වැස්සකට පවා මුළු කොළඹ නගරයම යට වුණ තත්ත්වයක් අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිට අද වෙනකොට සන්තෝෂ වෙන්න පුළුවන්. විශේෂයෙන්ම යහ පාලන ආණ්ඩුව මේ රටේ බලයට පත් වුණාට පස්සේ ගරු චම්පික රණවක ඇමතිතුමා  මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා හැටියට පත් වුණා. එතුමා කොළඹ නගරය තුළ වැහි වතුර බැස යෑමේ උමං මාර්ග කිහිපයක් අද වෙනකොට තනලා අවසන් කර තිබෙනවා. අපි දැක්කා, කොළඹ-මරදාන, කිංස්ලි පාරේ තිබෙන උමං මාර්ගය අද වෙනකොට සම්පූර්ණයෙන් වැඩ අවසන් කර තිබෙන බව. බොරැල්ලේ දේවි බාලිකා විද්‍යාලය අසල තිබෙන උමං මාර්ගය සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කර තිබෙනවා.  අද වෙනකොට මෝදර ප්‍රදේශයේ වැහි වතුර මුහුදට ගලා බැසීමේ උමං මාර්ගය හැදීමේ කටයුතු කරගෙන යනවා. කොළඹ නගරය කියා කියන්නේ උස් කඳුවලින් එහෙම නැත්නම් විශාල කඳු මාර්ගවලින් තැනුණු නගරයක් නොවෙයි. කොළඹ නගරය මුහුදු මට්ටමත් සමඟ විශාල වෙනසක් නැති තැනිතලා ප්‍රදේශයක පිහිටි නගරයක්. කොළඹ නගරය තුළ වෙසෙන ජන ජීවිතවලට හා පවතින විශාල ගොඩනැඟිලිවලට කිසිදු හානියක් නොවන ආකාරයට උමං මාර්ග තැනීමේ ක්‍රියාවලිය නාගරික සංවර්ධන අධිකාරිය සාර්ථකව කර තිබෙනවා. අපි  පසුගිය ආණ්ඩු කාලයේ දැක්කා, උමා ඔය වතුර ටික හැරවීමට උමං මාර්ග තැනීමේදී කිසිදු ආකාරයේ විද්‍යාත්මක පදනමකින් තොරව, කිසිදු පරීක්ෂණ වාර්තා, ඇගයීම් වාර්තාවලින් තොරව  ක්‍රියාත්මක වුණු බව. බදුල්ල, බණ්ඩාරවෙල ප්‍රදේශයේ උමං මාර්ග හැරීම නිසා ජනතාව විශාල සංඛ්‍යාවකගේ ජීවිත අවදානමකට ලක් වෙලා තිබෙනවා. ඒ කඳුකර ප්‍රදේශය තුළ උමං මාර්ග සෑදීමේ කටයුත්තවත් ඒ ගොල්ලන්ට එදා හරියට කර ගන්න බැරි වුණා. අද වෙනකොට බණ්ඩාරවෙල, බදුල්ල කියන ප්‍රදේශවල ජීවිත හානි පමණක් නොව විශාල වශයෙන් නිවාසවලට හානි සිදු වෙලා අද ඔවුන්ගේ ජීවිත අවදානමකට ලක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වැහි වතුරට යටවන නගරයක් හැටියට තිබුණු කොළඹ වාගේ තැනිතලා ප්‍රදේශයක -කඳුකරයක් නැති ප්‍රදේශවල පවා- නාගරික සංවර්ධන අධිකාරිය උමං මාර්ග කිහිපයක් හරහා මුහුදට ජලය ගලා බැසීමේ වැඩ පිළිවෙළ ඉතා සාර්ථක ලෙස කර තිබෙනවා. කොළඹ නගරයට කොයි තරම් වැස්සත් ගං වතුරක් ඇති වීමේ අවදානම අද වෙනකොට අඩු වෙලා තිබෙනවාය කියන එක අපි පිළිගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළොන්නාව, අඹතලේ ප්‍රදේශයේ පොම්පාගාරයක් ඉදි කර තිබෙනවා.  කැලණි ගඟේ වතුර මට්ටම ඉහළ යාමත් එක්කම කොළොන්නාව, කඩුවෙල වාගේ ප්‍රදේශ නිතරම ගං වතුරට යට වෙනවා.

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ මූලිකත්වයෙන් අද කොළොන්නාව අඹතලේ ප්‍රදේශයේ පොම්පාගාරයක් ඉදි කිරීම නිසා අද ඒ ප්‍රදේශවලටත් ගංවතුර පාලනය කිරීමේ හැකියාව ලැබිලා තිබෙනවා. මේ හරහා කොළඹ නගරයේ සංවර්ධනය -දියුණුව- පමණක් නොව, කොළඹ නගරයේ ජීවත් වන දුප්පත් ජනතාවට නිවාස හැදීම පමණක් නොව, අනික් පැත්තෙන් කොළඹ නගරය හා මේ අවට ප්‍රදේශවල කාලගුණ වෙනස් වීමත් සමඟම අපේ ජීවිතවලට බලපාන නොයෙකුත් දේවල් වෙනුවෙනුත් අද යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මා මේ කාරණයත් කියා මගේ කථාව අවසාන කරන්නම්. ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට වැහැලා, ඒ ප්‍රදේශවල ගංවතුර තත්ත්වයක් ඇති වුණාම, ඒ ගංවතුර මට්ටම දැනගන්න පුළුවන් විධියේ ආයතනයක් අද වනකොට නාරාහේන්පිට කිරිමණ්ඩල මාවතේ ගොඩ නඟන්න හැකියාව ලැබිලා තිබෙනවා. තාක්ෂණය පැත්තෙනුත්, ලෝකයේ කාලගුණ වෙනස් වීම පැත්තෙනුත්, ලෝකයේ තිබෙන අනිකුත් නගර සමඟ දියුණු කිරීමේ පැත්තෙනුත් විශාල වැඩ කොටසක් අද වනකොට මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරනවාය කියන කාරණය අපට පිළිගන්න වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ නගරයේ දියුණුව වෙනුවෙන් කරන්න විශාල වැඩ කොටසක් අපට තිබෙනවාය කියා මා හිතනවා. එක් පැත්තකින් වරාය නගරය ඉදි වෙමින් පවතින බව අපි දන්නවා. වරාය නගරය ඉදි වීමත් සමඟ  කොළඹ නගරයේ පරිසරය හා කාලගුණ විපර්යාසයන් විතරක් නොවෙයි, නොයෙකුත් භෞතික විපර්යාසයන් පවා ඉදිරියේදී ඇති වෙන්න පුළුවන්. ඒවාට මුහුණ දෙන්නත් අපට හැකියාව හා ශක්තිය ලැබෙන්න ඕනෑ. ඒ වෙනස් වීමත් සමඟම ලෝකයේ තිබෙන නොයෙකුත් දියුණු නගරවල  තාක්ෂණය පවා කොළඹ නගරයට ගෙන ඒමේ  මූලික වැඩ කොටස මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මඟින් සිදු කරනවාය කියන කාරණයත් කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට බොහොම ස්තුතියි. මීළඟට, ගරු සීනිතම්බි යෝගේස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.30]

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம் (திருத்தம்) சட்டமூலம்மீதான விவாதத்தில் உரையாற்றுவதையிட்டு மிகுந்த மகிழ்ச்சியடைகின்றேன். உண்மையிலேயே இன்று நகர அபிவிருத்தி சார்பாகப் பார்க்கும்போது பல வேலைத்திட்டங்களுக்குக் காணி அவசியமான ஒன்றாக இருக்கின்றது. காணி என்கின்ற விடயம்தான் எங்களுடைய சமூகத்திற்கும் பாரிய பிரச்சினையாக இருந்துகொண்டிருக்கின்றது. குறிப்பாக வடக்கு, கிழக்கு மண்ணிலே காணிதான் மிக முக்கியமான ஒரு பிரச்சினையாக இடம்பிடித்துக் கொண்டிருக்கின்றது.

இன்று இந்த இடத்திலே உள்நாட்டலுவல்கள் அமைச்சர் அவர்கள் இருக்கும்போது நான் முக்கிய ஒரு விடயத்தைக் கூறவேண்டியவனாக இருக்கின்றேன். அம்பாறை மாவட்டத்திலே, கல்முனை வடக்கு தமிழ்ப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்த வேண்டுமென்று பௌத்த மதகுருமார், இந்து மதகுருமார் மற்றும் சிவில் அமைப்பினர்கள், அரசியல் பிரதிநிதிகள் உட்பட அந்தப் பகுதியில் வாழுகின்ற பலர் கடந்த ஒருசில நாட்களுக்கு முன்னர் உண்ணாவிரதப் போராட்டத்தை ஆரம்பித்து இன்று மிகத் துன்பமான நிலையிலே இருந்துகொண்டிருக்கிறார்கள். ஆனால். அது சார்பாக அரசாங்கம் இதுவரை எந்த நடவடிக்கையும் எடுத்ததாக எங்களுக்குத் தெரியவில்லை. நாங்கள் நீண்ட நாட்களுக்கு முன்னர், இந்த அரசாங்கத்தின் கௌரவ பிரதமர் அவர்களையும் கௌரவ அமைச்சர் அவர்களையும் சந்தித்து கல்முனை வடக்கு தமிழ் பிரதேச செயலகத்தை காணி மற்றும் நிதி விடயத்தை உள்ளடக்கிய வகையில் தரமுயர்த்த வேண்டுமென்ற கோரிக்கையை முன்வைத்துப் பேச்சுவார்த்தை நடாத்தியிருந்தோம். அதைச் செய்து தருவதாக எங்களுக்குக் கூறினார்கள். ஆணி மாதம் 31க்குள்ளே அதைச் செய்து முடிப்போம் என்று கௌரவ பிரதமர் அவர்கள் தெரிவித்திருந்தார். ஆனால், இன்னும் அந்தச் செயற்பாடு நடந்ததாக இல்லை.

1989ஆம் ஆண்டு தொடக்கம் அந்தப் பிரதேச செயலகம் இயங்கிவருகின்றது. அந்தப் பகுதியிலே 98 வீதம் தமிழ் மக்கள் வாழுகின்றார்கள். 29 கிராம அதிகாரி பிரிவுகள் இருக்கின்றன. ஆனால், இன்று அந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்துவதற்கு இஸ்லாமிய அரசியல்வாதிகள் மறுப்புத் தெரிவித்து வருகிறார்கள். இன்று பாருங்கள்! நான் கோரளைப்பற்றுப் பகுதியிலே வாழ்பவன். கோரளைப்பற்று மத்தி என்கின்ற பிரதேச செயலகம் 2003ஆம் ஆண்டுக்குப் பின்னர் 6 கிராம அதிகாரி பிரிவுகளோடு அமைக்கப்பட்டது. பின்னர் அதற்கு வாகரைப் பிரதேசத்தின் கிராம அதிகாரி பிரிவுகளிலுமிருந்து ஒரு சிறு பகுதியை இணைத்து 8 கிராம அதிகாரி பிரிவுகளோடு அந்தப் பிரதேச செயலகத்தை உருவாக்கிக் கொடுத்திருக்கிறார்கள். இந்த நாட்டில் இஸ்லாமிய மக்களுக்கு ஒரு சட்டமும் தமிழ் மக்களுக்கு வேறொரு சட்டமுமா இருக்கின்றது?

தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர்களின் குழுக்கூட்டத்தில் தீர்மானிக்கப்பட்டதன் பிரகாரம், இன்று இலங்கைத் தமிழரசுக் கட்சியின் தலைவர் மாவை சேனாதிராஜா ஐயா அவர்கள் கௌரவ பிரதமர் அவர்களைச் சந்தித்து, "இப்போது உண்ணாவிரதத்தில் இருக்கின்ற பௌத்த பிக்குகள், இந்து மதகுருமார், கிறிஸ்தவ மதகுருமார், சிவில் அமைப்புப் பிரதிநிதிகள், அரசியல் பிரதிநிதிகள் ஆகியோருடன் உடனடியாகத் தொடர்புகொண்டு பேசி, இதற்கு ஒரு தீர்வை அறிவித்து, அவர்களைக் காப்பாற்றுங்கள்" என்று வேண்டியிருக்கின்றார். நாங்கள் முன்பு உங்களிடம் இவ்விடயம் தொடர்பில் பல தடவை பேசியபோது, நீங்கள் எங்களுக்குத் தந்த உறுதிமொழியை இன்னும் நிறைவேற்றவில்லை என்றும் அவரிடம் சொல்லப்பட்டபோது, அவர் அதற்கு "தற்போது அமைச்சர் அவர்கள் இல்லை; அவர் வந்ததும் நாங்கள் ஒரு முடிவை எடுக்கவிருக்கிறோம்; அந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்துவதில் எந்தவிதமான பிரச்சினையும் இல்லை; ஆனால், அதற்கான காணியை எல்லை நிர்ணயம் செய்யவேண்டும்; அதற்காகக் குழுவொன்றை அமைத்து, அதன் நடவடிக்கையின் பிரகாரம், அந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்திக் கொடுப்போம்" என்று கூறியிருக்கிறார். இன்று அவர் இந்த விடயத்தை எங்கள் இலங்கைத் தமிழரசுக் கட்சியின் தலைவருக்குத் தெரிவித்திருக்கிறார். ஆனால், அவர் ஏன், அந்த உண்ணாவிரதம் இருக்கின்றவர்களிடம் இதனைத் தெரிவிக்க முடியாது?

இந்த நாட்டின் பிரதமர் அவர்களுக்கு நாங்கள் ஒன்றைச் சொல்லிக்கொள்ள விரும்புகின்றோம். இந்த அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முட்டுக்கொடுத்தவர்கள் நாங்கள். 2015ஆம் ஆண்டுக்கு முற்பட்ட காலத்தில் ஆட்சி செய்த அரசாங்கங்கள் எங்கள் விடயத்தில் பராமுகமாகத்தான் இருந்தன. ஆனால், அதற்குப் பின்னர் இந்த நாட்டிலே மைத்திரிபால சிறிசேன அவர்கள் ஜனாதிபதியாக வருவதற்கும் ரணில் விக்கிரமசிங்க அவர்கள் பிரதமராக வருவதற்கும் நாங்கள் ஆதரவு கொடுத்திருக்கிறோம். அது குறித்து நீங்கள் இன்னமும் நன்றியுடன் இருக்கின்றீர்களா? என்று நாம் உங்களிடம் கேட்க விரும்புகிறோம். நன்றியிருந்தால், நீங்கள் இதைக் காலதாமதப்படுத்த வேண்டிய அவசியமில்லை. ஆனால், நீங்கள் இஸ்லாமிய மக்களின், இஸ்லாமிய அரசியல்வாதிகளின் தேவைக்காக ஏன் அந்தச் செயற்றிட்டத்தைப் பிற்போட வேண்டும்? உடனடியாகப் பிரதமர் அவர்கள் இதிலே தலையிட வேண்டும். மிக விரைவாக இந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்தித் தருகின்றோம் என்பதைத் திகதி குறிப்பிட்டு அங்கு உண்ணாவிரதம் இருக்கின்ற எங்களுடைய உறவுகளுக்கு உடனடியாக அறிவிக்க வேண்டுமென இந்தச் சபையிலே கேட்டுக்கொள்கிறோம். அவ்வாறு செய்யத் தவறினால், நாங்கள் உங்களுக்குத் தருகின்ற ஆதரவை வாபஸ்பெற வேண்டிவரும். இது குறித்து எச்சரிக்கின்றோம். ஏனென்றால், நாங்கள் இந்த அற்ப விடயத்தைக்கூடச் செய்ய முடியாதவர்களாக இருப்பதாக எங்கள் தமிழ் மக்கள் எங்கள்மீது குற்றம் சுமத்துகின்றார்கள்.

அன்பார்ந்த தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் தமிழ் மக்கள் வடக்கு, கிழக்குப் பகுதியிலே ஓர் அரசியல் தீர்வைப் பெற்றுச் சுதந்திரமாக வாழவேண்டும் என்பதற்காக கடந்த காலங்களிலே சாத்தவீக ரீதியிலும் ஆயுத ரீதியிலும் போராடினார்கள். அதேநேரம், இந்த நாட்டிலே அமைச்சுப் பதவிகளையும் பிரதி அமைச்சுப் பதவிகளையும் இராஜாங்க அமைச்சுப் பதவிகளையும் ஏன், வடக்கு, கிழக்கிலே ஆளுநர் பதவியையும் பெற்று ஆட்சி புரிந்தவர்கள் இஸ்லாமிய அரசியல்வாதிகள்தான். அவர்கள் தங்களது ஆட்சியின்போது, தொழில் ரீதியாகவும் அபிவிருத்தி ரீதியாகவும் தமிழ் மக்களைப் புறந்தள்ளினார்கள். இன்றுவரை அவர்கள் அந்தச் செயற்பாட்டை மேற்கொண்டு வருகிறார்கள்.

[ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා]

ஆனால், இந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்தி வழங்கக்கூடாது என்பதில் முஸ்லிம் காங்கிரஸ் மிகவும் ஆர்வமாக இருக்கிறது. அந்தப் பகுதியைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர் ஹரீஸ் அவர்கள் இந்தத் தமிழ் பிரதேச செயலகத்துக்கு எதிராகச் செயற்படுகிறார். ஆகவே, அவர்களது கருத்துக்குச் செவிமடுக்காது, இந்த நாட்டின் பிரதமர் அவர்கள் உடனடியாக இந்த விடயத்தில் தலையிட்டு, இந்த உண்ணாவிரதப் போராட்டத்தை உடனடியாக நிறுத்தும் வகையில், அந்தப் பிரதேச செயலகத்தைத் தரமுயர்த்தும் உத்தரவைப் பிறப்பிக்கவேண்டுமென்று மீண்டும் மீண்டும் கேட்டுக்கொள்கிறேன்.

அத்தோடு, மட்டக்களப்பு மாவட்டத்தின் கோரளைப்பற்று வடக்குப் பிரதேச செயலாளர் பிரிவிலே கதிரவெளி, குச்சாக்கேணி என்ற பகுதியிலே 2011ஆம் ஆண்டிலிருந்து ஒரு திட்டமிட்ட செயற்பாடு நடந்து வந்திருகின்றது. அதாவது, கதிரவெளி, குச்சாக்கேணிக் கடற்கரைப் பகுதியிலே இல்மனைற் அகழ்வதற்காக நடவடிக்கை எடுத்திருக்கிறார்கள். இந்நடவடிக்கை இரகசியமான முறையிலே மேற்கொள்ளப்பட்டிருக்கிறது. முன்னாள் கிழக்கு மாகாண முதலமைச்சர் சந்திரகாந்தன் என்கின்ற பிள்ளையானைப் பயன்படுத்தி, அவரது பிரதேச சபையைப் பயன்படுத்தி இந்தச் செயற்றிட்டத்தை மேற்கொண்டிருக்கிறார்கள். இதன்மூலம் அந்தப் பகுதி மக்கள் பாதிக்கப்படுகிறார்கள். இரகசியமாக மேற்கொள்ளப்பட்டு வந்த அந்தச் செயற்பாடு இப்போது இல்மனைற் தொழிற்பேட்டையாக வந்து, அங்குள்ள மக்கள் கடல் ரீதியாகப் பாதிக்கப்படுகின்ற ஒரு செயற்பாடாக உருவாக்கப்பட்டிருக்கின்றது. அந்த மக்கள் கவனயீர்ப்புப் போராட்டங்களை நடாத்தியிருக்கின்றார்கள்; தொடர்ந்து நடாத்தி வருகின்றார்கள். அந்த இல்மனைற் தொழிற்சாலையை நடைமுறைப்படுத்தக்கூடாதென்று வாகரைப் பிரதேச அபிவிருத்திக் குழுக்கூட்டத்திலும் தீர்மானம் நிறைவேற்றப்பட்டிருக்கின்றது. எனவே, உடனடியாக அரசாங்கம் அந்த இல்மனைற் தொழிற்சாலையின் செயற்பாட்டினை நிறுத்த வேண்டும். சில அதிகாரிகளையும் அரசியல்வாதிகளையும் பயன்படுத்தி மேற்கொண்ட அந்தச் சதித்திட்டத்தை உடனடியாக நிறுத்துங்கள்! இல்மனைற் தொழிற்சாலை அந்தப் பகுதிக்குத் தேவையில்லை. அந்தப் பகுதியின் வளத்தைச் சுரண்டி அந்த மக்களின் வாழ்வாதாரத்தைப் பாதிக்கவிட வேண்டாமென்று அன்பாகக் கேட்டுக்கொள்கின்றோம்.

மன்னார் மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் சாள்ஸ் நிர்மலநாதன் அவர்கள் தெரிவித்த ஒரு கருத்தையும் இன்றைய விடயத்துக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் சம்பிக ரணவக்க அவர்களின் கவனத்திற்கு முன்வைக்கின்றேன். மன்னாரிலே பள்ளிமுனை விளையாட்டு மைதானத்துக்காக நீங்கள் நிதி ஒதுக்க முன்வந்தமைக்காக அவர் நன்றி தெரிவிக்கின்றார். ஆனால், இன்னும் அந்த வேலைகள் ஆரம்பிக்கப்படவில்லை. ஆகவே, அது விரைவாக ஆரம்பிக்கப்பட வேண்டுமென்று உங்களிடம் கோரிக்கை விடுக்குமாறு என்னிடம் கேட்டுக்கொண்டார்.

அத்தோடு, மட்டக்களப்பு மாவட்டத்திலும் பல அபிவிருத்தித்திட்டங்கள் நகர அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சால் மேற்கொள்ளப்பட வேண்டியிருக்கின்றது. உதாரணமாக, மட்டக்களப்பு மாவட்டத்தில் பண்டித்தீவு என்றொரு தீவு இருக்கின்றது. அந்தத் தீவை இணைக்கின்றதாக ஒரு பாலம் உருவாக்கப்பட வேண்டும்; அங்கு வீதிகள் செப்பனிடப்பட வேண்டும். அதேநேரத்தில், மட்டக்களப்பு சந்தைப் பகுதியையும் மட்டக்களப்பு மாவட்டச் செயலகத்தையும் இணைக்கக்கூடியதாக ஒரு தொங்கு பாலமும் உருவாக்கப்பட வேண்டும். அங்கு பல அபிவிருத்தி வேலைத்திட்டங்கள் நகர அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சின்கீழ் மேற்கொள்ளப்பட வேண்டியிருப்பதனால், கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்திலே கவனம் செலுத்தி அந்தச் செயற்றிட்டங்களைச் மேற்கொண்டுதர வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். அந்தப் பிரதேசத்தில் குப்பைகூளங்களைக் கொட்டுவதற்குப் பொருத்தமான காணிகள் இல்லை. அதனால் பிரதேச சபை ரீதியாக, நகர சபை ரீதியாக, மாநகர சபை ரீதியாகப் பல பிரச்சினைகள் எழுந்துகொண்டிருக்கின்றன. ஆகவே, அதற்கேற்ற காணிகளையும் நீங்கள் ஏற்பாடுசெய்து கொடுப்பதற்கு முன்வரவேண்டுமென்று கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ස්තුතියි.

මීළඟට, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් වෙන් වී තිබෙනවා.

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරනකොට මා කිව යුතුයි, අපේ ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා අද මේ නාගරීකරණයත් එක්ක ජනතාව දියුණුව කරා යනකොට ලෝකයත් එක්ක ගැටෙන්න පුළුවන් විධියට, නූතන තාක්ෂණයත් එක්ක යන්න පුළුවන් නගර නිර්මාණය කිරීම සඳහා වැඩ පිළිවෙළවල් ඇති කරලා තිබෙන බව. එතුමා සෑම විටම කථා කරන දෙයක් තමයි, හතරවන කාර්මික විප්ලවය. එතුමා හතරවන කාර්මික විප්ලවය ඔළුවේ තියාගෙන, තිරසර සංවර්ධනය ඔළුවේ තියාගෙන, මේ සංවර්ධනයන් කොයි විධියටද තමන්ගේ අමාත්‍යාංශය තුළින් ක්‍රියාත්මක කරන්නේ කියලා එතුමාගේ පැහැදිලි ක්‍රියාදාමයන් තුළින් පෙන්වා තිබෙනවා. අපි ඒකට එතුමාට ස්තුතිවන්ත වනවා.

අද ජනගහනය වැඩි වනකොට, ඒ වැඩිවන ජනගහනයට අවශ්‍ය ක්‍රමවේද නාගරීකරණය තුළින් යෙදිය යුතුයි. නගර සංවර්ධනයත් එක්ක අද අපට අවශ්‍ය වනවා, හොඳ නගර නිර්මාණ ශිල්පීන් හෝ එම කාර්යය කරන්න පුළුවන් පුද්ගලයින්. අපි දන්නවා, අණ පනත් හදන්න පුළුවන් පුද්ගලයින් සිටින්න ඕනෑ. එයට අපි කියනවා, strategic planning සහ statutory planning කියලා. නගර නිර්මාණය කරන්න පුළුවන් වාගේම, ඒ සැලසුම් හදන්න පුළුවන් කණ්ඩායම් සිටිය යුතුයි. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල එම විෂයය උගන්වනවා. එම විෂයය තවත් වැඩිදියුණු කරලා උගන්වන්න ඕනෑ. මොකද, එය ඉතා වැදගත්. අද නගර හෝ ප්‍රදේශ සැලැස්මකට අනුව සංවර්ධනය කරනකොට හොරෙන් ඉඩම් ගොඩකිරීම්, එහෙම නැත්නම් සිදු වන අක්‍රමිකතා අවම කර ගන්න පුළුවන් වෙන්නේ ඒ හරහා තමයි. අද සිදුවන සංවර්ධනයන් දිහා බලනකොට අපි දන්නවා අනෙක් රටවලත් සිදු වන දෙයක් තමයි, -මම දන්නවා ලංකාවෙත් ඒ දේ සිදු වෙගෙන යන බව- කලාප, එහෙම නැත්නම් zone system එකක් තිබීම. ඒ

කියන්නේ, නගරයක කර්මාන්ත තිබිය යුත්තේ කොහේද, ව්‍යාපාර ටික තිබිය යුත්තේ කොහේද, නිවාස ටික තිබිය යුත්තේ කොහේද, ජලය තිබෙන්නේ කොහේද කියලා ක්‍රමවේද ඇති වෙලා ඉදිරියට යන බව අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ නගර සංවර්ධනය වුණේ මොන විධියටද කියලා අපි දන්නවා. එදා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා මොනවාද කළේ? Army එක ඇතුළු ත්‍රිවිධ හමුදාවට අණ දුන්නාම ඒ අය ඇවිල්ලා අහිංසක මිනිසුන්ගේ කඩවල් ටික ඩෝසර් කරගෙන ගියා. කිසි කෙනෙකුගෙන් වචනයක්වත් ඇහුවේ නැහැ. අලාභයවත් ගෙව්වේ නැහැ. මගේ දිස්ත්‍රික්කයේත් ඒ දේ සිදු වුණා. අහිංසක මිනිසුන් හයේ නඩුවක්වත් දාන්න ගියේ නැහැ; පාරටවත් බැස්සේ නැහැ. අහිංසක මිනිසුන්ගේ කඩවල් ඔක්කෝම කැඩුවා. වන්දියක්වත් ගෙවන්නේ නැතුව, ඉඩම සුද්ධ කරගෙන ගිහින් නගර නිර්මාණය කළා. එදා ඒ නිර්මාණය කළ නගරවල තිරසර භාවයක් තිබෙනවාද? එදා ඒ දේශපාලනඥයන්ට ඕනෑ විධියටද ඒ නගර නිර්මාණය වුණේ කියන ප්‍රශ්නය තිබෙනවා. එදා නිර්මාණය කරපු නගරවල සංවර්ධන කටයුතු කරනකොට අද ගැටලු මතු වනවා. හොඳම උදාහරණය තමයි, රඹුක්කන ආසනයේ නගර නිර්මාණය. ඒ නගර නිර්මාණය තුළ ප්‍රශ්න ගොඩක් තිබෙන බව අද අපි දකිනවා. කානු පද්ධතිය හරියට හදලා නැහැ. ඒ වාගේම නගර සංවර්ධනයේදී සතිපොළ සංවර්ධනය කරන්න එදා හිටපු මහ ඇමතිවරයා, ඒ පට්ටපල් හොරා ඉඩ දුන්නේ නැහැ.

2016 වර්ෂයේ සංවර්ධන කටයුතු සඳහා මිලියන 30ක මුදලක් වෙන් කළ බව අපි දන්නවා. ඒ අවස්ථාවේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියට කිව්වා මුදල් ලැබීම සම්බන්ධ ලිපිය හංගන්න කියලා. ඒක හැංගුවා. ඊට පසුව ඒ ප්‍රදේශයේ සංවර්ධනයට තවත් මුදලක් වෙන් වුණා. UDA එක තමයි ඒ design එක කරලා දුන්නේ. පටු දේශපාලන ක්‍රමවේදයන් නිසා ඒක කරන්න දෙන්න එපා කියලා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට කිව්වා. ඒක හැංගුවා. මෙන්න මේ වාගේ අක්‍රමිකතා සිදු වුණා. අපි ඒවා නිරාකරණය කරන්න ඕනෑ.

ඊළඟට ගරු ඇමතිතුමාට තව කරුණක් මතක් කරන්න ඕනෑ. තල්දුවේ තිබෙන රගර් ක්‍රීඩාංගණය සංවර්ධනය සඳහා අපි හිටපු ක්‍රීඩා අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මැතිතුමාට කථා කරලා වෙහෙස මහන්සි වෙලා විශාල මුදලක් ලබා ගත්තා. රුපියල් මිලියන 8ක මුදලක් ලබාගෙන ක්‍රීඩාංගණය ලස්සනට සංවර්ධනය කළා. හැබැයි, කියන්න කනගාටුයි. අද ඒ ක්‍රීඩාංගනය නඩත්තු කරන්නේවත් නැහැ. එම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමට යොදවපු මුදල් ටික නාස්ති වෙනවා. මොකද, නාගරික සංවර්ධන අධිකාරියෙන් ඒ ක්‍රීඩාංගණය වෙන වෙන කටයුතුවලට ලබා දෙනවා. Carnival පැවැත්වීම වැනි දේවල් සඳහාත් ලබා දෙනවා. එවැනි නොයෙක් දේවල්වලට ක්‍රීඩාංගණය භාරනවා. එතකොට වළවල් ඇති වෙනවා. රගර් ක්‍රීඩාවට හදපු ඒ ක්‍රීඩාංගණය නාස්ති වෙලා යනවා. ඒ ප්‍රදේශයෙන් -තල්දුව, රුවන්වැල්ල, කෑගල්ල ප්‍රදේශයෙන්- ක්‍රීඩක, ක්‍රීඩිකාවන් විශාල පිරිසක් රගර් ක්‍රීඩාවට එකතු වෙලා තිබෙන බව අපි මතක් කරන්න ඕනෑ. ඒ අය ජාතික කණ්ඩායමටත් ක්‍රීඩා කරලා තිබෙනවා. ඒක ලොකු ගෞරවයක්. එම නිසා ඒ ක්‍රීඩාංගණය සබරගමුව රගර් සංවිධානයට භාර දෙන්න කියා අපි ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න. අපි සියලු දෙනා නගර සංවර්ධනයත් සමඟ තාක්ෂණයත් එක්ක අනුගත වෙන්න ඕනෑ. නගරයට තාක්ෂණය පාවිච්චි කරලා හරියාකාරව ක්‍රමවේදයන් ඇති කළොත්, මේ රටේ තිබෙන අක්‍රමිකතා සහ නගරවල සිදුවෙන අක්‍රමිකතා වළක්වා ගන්න පුළුවන්. මේ නගරවල ගැවසෙන්නේ කවුද, මොකද වෙන්නේ කියන එක පිළිබඳ හරියට සොයා බැලුවොත්, අප්‍රේල් 21වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරය වැනි දේ වළක්වා ගන්න පුළුවන්. එසේ ප්‍රකාශ කරමින් මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට බොහොම ස්තුතියි. ඊළඟට, ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා.5.48]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද දවසේ සාකච්ඡාවට ගැනෙන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. එහි "ඉඩම් ගොඩකිරීමේ" යන වචන ඉවත් කරලා "ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව" යනුවෙන් හඳුන්වා දී තිබෙනවා. ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත සම්බන්ධව අපට විශාල ගැටලුවක් හෝ ප්‍රශ්නයක් නැහැ, අරමුණ පනතේ පැහැදිලිව සඳහන් කර තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි අරමුණ ඉතාම හොඳයි. බොහෝ වේලාවට ඉඩම් කියන දෙය දේශපාලනයත් සමඟ ඇඳීගෙන යන දෙයක්. භූමිය නිසාම අපි අවුරුදු 30ක් තිස්සේ අනවරත අරගලයකට ගොදුරු වුණා. මේ රට, භූමිය නිසා දසදහස් ගණනක් මිනිස් ජීවිත නැති කර ගත්ත රටක්; රුධිර ගංගා, මළමිනි කඳු ගොඩ ගැහුණු රටක්. අපි එවැනි ඉතිහාසයක් තිබෙන රටක්. සංවර්ධනයේ මුවාවෙන් සමහර ආයතන සහ පුද්ගලයින් ඉඩම් ගොඩකිරීම් සහ ඉඩම් අත්පත් කර ගැනීම් නීත්‍යානුකූල නොවන මට්ටම්වලින් කරන බව දැන් අපට පෙනෙනවා. මම ගරු ඇමතිතුමාගේ අවධානයට යම් කරුණක් යොමු කරනවා. පසුගිය කාලයේ තලවතුගොඩ හරහා හෝකන්දරට යන පාරේ - තලවතුගොඩ-හෝකන්දර මාර්ගයේ- ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉඩමක් තිබුණා. මේ ඉඩමේ අනවසර ඉදිකිරීමක් කරලා තිබුණා.

අනවසර ඉදිකිරීමක් හැටියට එය ඉවත් කළා. "නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක්" කියලා බෝඩ් එකකුත් ගහලා, රජය සතු ඉඩමක් හැටියට කම්බි ගහලා, කොටු කරලා තිබුණා. ගරු ඇමතිතුමනි, ඊට පසුව සිදු වුණු ආණ්ඩු පෙරළියත් එක්ක ආපසු වතාවක් ඒ ඉඩමේ අනවසර ඉදිකිරීමක් කරලා, අල්ලාගෙන තිබෙන බව අපි දැක්කා. මෙතැන සම්පූර්ණයෙන් ජලය බැස යන ස්ථානයක්. ජලය බැස යන ස්ථානයක ඉදිකිරීමක් කළාම ගංවතුර තත්ත්වයකදී ඉතාම නරක විධියට ඒ ප්‍රදේශයම යට වෙන්න පුළුවන්. හැම දාම තලවතුගොඩ - හෝකන්දර පාර ගංවතුරට යට වනවා. ඒ බිම් කොටස ආපසු වතාවක් දැන් අල්ලා ගෙන තිබෙනවා. මේ සම්බන්ධව ඔබතුමා නොදන්නවා වෙන්න ඇති. පොඩ්ඩක් ඒ ගැන කරුණු විමසලා බලන්න. එය, ඉතාම වටිනා බිම් කොටසක්. පවතින රජයට හිතවත්කමක් තිබෙන දේශපාලනඥයෙකු විසින් යම් ආකාරයකින් ඒ ඉඩම අත්පත් කරගෙන තිබෙනවා.

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාරිසරික වශයෙන් ඉතාම වැදගත් භූමියක් හැටියට අපි මුතුරාජවෙල පරිසර පද්ධතිය සලකනවා. ඒ ප්‍රදේශයේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන දේශපාලනඥයෙකු විසින් මුතුරාජවෙල පරිසර පද්ධතිය හා සම්බන්ධ ඒ ඉඩම පසුගිය කාලය පුරාවට අනවසරයෙන් ගොඩ කරන්න පටන් අරගෙන තිබෙනවා. එතුමා ඉඩම් කැබලි කරලා, ඒවා බෙදා දීමේ ව්‍යාපෘතියක නිරත වෙලා හිටියා. එක් අවස්ථාවක ගරු ජනාධිපතිතුමාත් ඒ සඳහා මැදිහත් වෙලා, ඒ කටයුත්ත නතර කරන්න උත්සාහ කළ ආකාරය අපි දැක්කා. නමුත් ඉදිකිරීම් සහ ගොඩ කිරීම් කටයුතු ඒ ආකාරයෙන්ම කෙරී ගෙන යනවාය කියා මා හිතනවා. මුතුරාජවෙල පරිසර පද්ධතිය සම්බන්ධවයි මා මේ කිව්වේ.

රට පුරාම බොහෝ තැන්වල රජය සතු ඉඩම් ඇතැම් පුද්ගලයන් විසින් බලහත්කාරයෙන් අල්ලා ගෙන, තමන්ගේ භුක්තියට සවි කරගෙන ජාවාරම් කරන මට්ටමක් තිබෙනවා. ඒ වාගේම අද රටේ තිබෙන සුප්‍රසිද්ධ ඉඩම් විකිණීමේ හා කැබලි කිරීමේ සමාගම් මේ ආකාරයෙන් කටයුතු කරනවා. මේක, මා මේ ආණ්ඩුවට විතරක් කරන චෝදනාවක් නොවෙයි. අපේ ආණ්ඩු තිබුණු පසුගිය කාලය තුළත් එවැනි සිදුවීම් අනන්ත අප්‍රමාණ ප්‍රමාණයක් වාර්තා වුණා. රජයේ ඉඩම් අරගෙන ගොඩ කරලා, බලහත්කාරයෙන් ඔප්පු-තිරප්පු හදා දීලා විකුණලා ව්‍යාපාර කළා. අදටත් ඒ තත්ත්වය තිබෙනවා.

අපි හිතනවා මේවාට යම් ආකාරයකින් මැදිහත් වෙලා, ඒ තත්ත්වය වළක්වන්න ඔබතුමාට පුළුවන් නම් හොඳයි කියලා. මේ පනතේ තිබෙන "ගොඩකිරීමේ" කියන වචනය ඉවත් කළාට පසුව, මෙම පනත් කෙටුම්පතේ අවසානයට කියා තිබෙනවා, "....'ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව' යන්නෙහි අනුප්‍රාප්තිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය." කියලා. එතකොට මේ සියලු බලතල, සියලු නීතිමය ව්‍යූහය මේ නව පනත් කෙටුම්පත තුළත් අඩංගු වෙලා තිබෙන නිසා, ඔබතුමාට ඒ සම්බන්ධ බලතල තිබෙනවාය කියලා අප විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, සමහර විට පළාත් පාලන ආයතන මට්ටමින් ගත්තොත්, ඒ පළාත් පාලන ආයතනවලිනුත් එවැනි දේවල් සිද්ධ වෙන්න පුළුවන්. රජය සතු සමහර බිම් කොටස් යම් යම් ආකාරයට, අවිධිමත් ආකාරයට ගොඩකිරීම, ඒවායේ ජනාවාස ඇති කිරීම, නිවාස ඉදිකිරීම වැනි දේවල් රට පුරා සිද්ධ වෙනවා. ඒ නිසා කාලාන්තරයක් තිස්සේ රට මුහුණ දීලා තිබෙන ගංවතුර තත්ත්වයට ඒ කරුණු බලපානවා. ගංවතුර තත්ත්වය ඇතිවීමටත් ප්‍රධාන හේතුවක් විධියට අපි සලකනවා, රටේ අනවසර ගොඩකිරීම් සහ නීතිවිරෝධී අත්පත් කරගැනීම්. ඒ නිසා මේවා සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරමින් වඩාත් දැඩි ක්‍රියාමාර්ගයක් ගැනීම - ආණ්ඩුව මොකක් වුණත්, ඇමතිතුමා කවුරු වුණත්- රටක් හැටියට, ජාතියක් හැටියට සිදුවිය යුතු දෙයක් සේ අපි සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවට නීත්‍යනුකූලව තව මාස කීපයයි තිබෙන්නේ. මාස කීපයකින් ජනාධිපති මැතිවරණයක් එන්න ඕනෑ. මේ වෙනකොට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා රට පුරාම තිබෙන, තෝරා ගත් සශ්‍රීක වතුයායවල්වල -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
හොඳයි, බොහොම ස්තුතියි.

මේ වෙනකොට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා වතුයායවල්වල ඉඩම් මැනීම් කරගෙන යනවා. හෙක්ටෙයාර සිය ගණන් තමන්ගේ දේශපාලන හිතවතුන්ට බෙදා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න රජය ඒ තුළින් උත්සාහ අරගෙන තිබෙනවා, මැතිවරණය සඳහා ලබා දෙන අල්ලසක් විධියට. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්, රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඉඩම් මේ ආකාරයට බෙදා දීමේ ව්‍යාපෘතියක් දැන් ආරම්භ කරලා ක්‍රියාත්මක කෙරෙනවා. දැනට ඉල්ලුම් පත්‍ර කැඳවා, නාම ලේඛන පවා සකස් කරගෙන යනවා.

මේ දේශපාලන බලය ඉඩම් සමග ගැට ගැසී තිබෙන ආකාරය ගැන මම එක උදාහරණයක් දක්වන්නම්. මම නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන මැතිවරණ කොට්ඨාසයට යාබද, කලවාන මැතිවරණ මැතිවරණ කොට්ඨාසයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු අක්කර 296ක් තිබෙනවා, ඇලින්ටන් වතුයාය කියලා. මේ ඇලින්ටන් වතුයාය නීත්‍යනුකූල නොවන තත්ත්වයක් තුළ අත්පත් කරගෙන තිබෙනවා. සම්පූර්ණයෙන්ම කොමිෂන් සභාව සතු ඉඩමක් එසේ අත්පත් කරගෙන, මොන ආණ්ඩුව බලයට ආවත්, බලයට එන ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන්ට තමන්ගේ පක්ෂපාතීත්වය පෙන්වමින් මෙම ඉඩම් කොටස 1970 ගණන්වල ඉඳලා මේ වෙනතෙක් භුක්ති විඳිනවා. තිබුණු ආණ්ඩු දෙකේ කාටවත්ම ඇලින්ටන් වත්ත සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්න බැරි වුණා. එය, ඉතාම වටිනා සාරවත් තේ ඉඩමක්. ඒ වාගේම මැණික් සම්පත බහුලව තිබෙන ඉඩමක්. එක පුද්ගලයෙක් විසින් එම ඉඩම බලහත්කාරයෙන් අල්ලා ගෙන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරින් එක්කෝ බියවද්දා එහෙම නැත්නම් ඒ නිලධාරින් තමන්ගේ ග්‍රහණයට අරගෙන කටයුතු කරනවා. මෙන්න මේ වාගේ තත්ත්වයක් තුළ රාජ්‍ය වතු, රාජ්‍ය දේපොළ එන්න-එන්නම ක්ෂයවීමක් සිද්ධ වෙනවා; ඒවා පෞද්ගලිකකරණයවීමක් සිද්ධ වෙනවා. මේවාට රාජ්‍ය අනුග්‍රහයත් නිරන්තරයෙන් නොඅඩුව ලැබෙනවා. ඒ නිසා මෙවැනි කරුණු කාරණා පිළිබඳව ගරු ඇමතිතුමා හැටියට ඔබතුමාට දීර්ඝ කාලීන පැවැත්මක් සහිත යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් නම්, ඔබතුමාගේ නම ඉතිහාසයට එකතු වෙනවා.

ඒ වාගේම, සමහර වේලාවට සමහර අය දේශපාලන අධිකාරියේ හයිය-හත්තිය අරගෙන කටයුතු කරන ගමන්, පරිසරය ගැන මහ ලොකුවට කථා කරනවා; පරිසරය ආරක්ෂා කරන්න කථා කරනවා. නමුත් මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ තිබෙන අවුරුදු 200කට වඩා පැරණි කුඹුක් ගසක් කපලා දැන් පටවන්න හදනවා. ප්‍රාදේශීය ලේකම් කියනවා, මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවසරයක් අරගෙන නැහැ කියලා. ගෙවල් දෙකකට යන පාරක් හදන්න කියලා මේ ආකාරයට තමන්ගේ දේශපාලන හයිය මත නිලධාරින් බියවද්දා, ඒ විශාල කුඹක් ගහ කපලා, දැන් කොළඹට පටවන්න සූදානම් කරනවා. හැබැයි, එවැනි දේවල්වලට -

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඔබතුමා පොඩ්ඩක් ඉන්න. මට තව විනාඩියයි තිබෙන්නේ. ඔබතුමා කථා කරන අවස්ථාවේදී කියන්න කෝ. මෙන්න මෙවැනි සිද්ධි යම් යම් ආකාරයේ සම්බන්ධතා මත කරනවා. ඊට පසුව, ඒ උදවියම ඇවිල්ලා, මේක නීත්‍යනුකූල නැහැ; මේක නීතිවිරෝධීයි

යනුවෙන් පරිසරය ආරක්ෂා කරන්න මහ ලොකු දේශන පවත්වනවා, කථා කරනවා. හැබැයි, ඒ ගොල්ලන්ගේ අභ්‍යන්තරය බොහොම අප්‍රසන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි කාරණා අපි ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. රාජ්‍ය දේපොළ, රාජ්‍ය ඉඩම් ආරක්ෂා කිරීමට ඔබතුමන්ලා විසින් යම්කිසි ප්‍රගතිශීලී පියවරක් ගනු ලබන්නේ නම්, විපක්ෂය විධියට ඒ කටයුතුවලට සම්පූර්ණ සහයෝගය ලබා දීමට අපි කිසිසේත්ම, කිසිම අවස්ථාවක පැකිළෙන්නේ නැති බව ප්‍රකාශ කරමින්, මූලාසනයේ ගරු මන්ත්‍රීතුමා දෙතුන් වතාවක් මගේ මුහුණ බලපු නිසා ඔබතුමා අපහසුවට ලක් කරන්නේත් නැතුව, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවසරයක් නැතිව කුඹුක් ගහක් කපාගෙන යනවා කියලා ගරු රංජිත් සොයිසා මන්ත්‍රීතුමා කිව්වා. ඒ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කුමක්ද කියලා කිව්වා නම් හොඳයි. මොකද, දේශපාලනාධිකාරියේ කාගේ හරි හයියක් ඒ සඳහා යොදා ගන්නවා නම්, මාත් ඒ ප්‍රශ්නයට මැදිහත් වනවා. මම ඒ ගැන දන්නේ නැහැ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදම්පේ උතුර වසමේ, නෝක්කාවේ පාලම ළඟ අවුරුදු 200කට වඩා පැරණි කුඹුක් ගහක් කපලා, දැන් පටවනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මී ළඟට, ගරු ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ඉෂාක් රහුමාන් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු කේ. කාදර් මස්තාන් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු රිසාඩ් බදියුදීන් මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා.

[අ.භා. 5.58]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් ඉදිරිපත් කරපු, මෙම සංස්ථාවේ නාමකරණය වෙනස් කිරීමට දායක වූ, ඒ පිළිබඳව අදහස් දැක්වූ සියලුදෙනාටම අපේ ස්තුතිය පිරිනැමෙනවා. විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ප්‍රශ්න කීපයක් නැඟුවා.

ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා කේබල් කාර් ව්‍යාපෘතියක් ගැන ප්‍රකාශ කළා. මම පළමුවෙන්ම කියන්න ඕනෑ, එවැනි කිසිම කේබල් කාර් ව්‍යාපෘතියක් අපේ අමාත්‍යාංශයෙන් දියත් කර නැති බවත්, එම නිසා ඒ සඳහා ඒ ඉඩම් අත්පත් කර ගැනීමක් හෝ වෙනත් කිසිම ක්‍රියාදාමයක් නැති බවත්.

කොළඹ නගරය හා ඒ අවට ප්‍රදේශවලට බලපාන ගංවතුර තත්ත්වය වළක්වාලීම සඳහා අත්පත් කර ගත් ඉඩම් අවසතු කිරීම ගැනත් අද කථා කළා. මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, ඒ ඇතැම් කුඹුරු ඉඩම් අපි අත්පත් කර ගත්තේ, ඒවාට අදාළ ඇළ මාර්ග සංවර්ධනය කිරීමෙන් පස්සේ ඒ ඉඩම් කුඹුරු සඳහා පාවිච්චි කරන පොරොන්දුව මත බව. අපි ප්‍රතිපත්තියක් හැටියට එය ක්‍රියාත්මක කරනවා. ඒ ඇතැම් අයට අපි ඒ අයිතියත් ලබා දීලා තිබෙනවා. නමුත්, කිසිම ඉදිකිරීමකට අපි අවසර ලබා දීලා නැහැ. ඒ වාගේම, REDECO කියන ආයතනයේ වැලි හෝදන යන්ත්‍රයක් වැඩ කරන්නේ නැහැයි කියලා ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා චෝදනා කළා. ඇත්තටම ඒ යන්ත්‍රය දැන් වැඩ කරනවා. එතුමාට අපි ආරාධනා කරනවා, ඒ ආයතනයේ සිටින දෙතුන්දෙනෙකුගේ කථාබහට නොරැවටී ඒ ආයතනයට ඇවිල්ලා ඒ යන්ත්‍රය බලලා, එහි ක්‍රියාකාරිත්වය හඳුනාගන්න කියලා.

විශේෂයෙන්ම අද කෙරවලපිටියේ කසළ කන්දක් ගැනත් කථා කළා. මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, කෙරවලපිටියේ කසළ අංගණය අපි ඇති කළේ කොළඹ නගර සභාවේ සහ ඒ අවට නගර සභාවලින් ගෙන යන කසළ තාවකාලිකව දැමීමට බව; මීතොටමුල්ල කසළ කන්ද කඩා වැටීම නිසා ඇති වූ ඒ මහා ව්‍යසනය අවස්ථාවේ තාවකාලික පිළියමක් හැටියට බව. දැන් ඒක සදාකාලික පිළියමක් කර ගන්න කොළඹ නගර සභාව කටයුතු කිරීම ගැන අපි කනගාටුවනවා. දැනටම අපි අරුවක්කාරුවේ විද්‍යාත්මක කසළ රඳවනයක් හදලා තිබෙනවා. ඒ කසළ රඳවනයට කසළ දමන්න කියලා අපි ගිය අවුරුද්දේ සිට ඒ අයට ලැස්තිවෙන්න කිව්වා. මේ අවුරුද්දේ මාර්තු 16 වෙනිදා සිට ඒ විද්‍යාත්මක කසළ අංගණය විවෘතයි. ඒ අංගණය භාගෙට හදපු එකක් නොවෙයි. එහි පළමුවෙනි පියවර අපි අවසන් කරලා තිබෙනවා. කොළඹ නගරය හා අවට සිටින ඕනෑම කෙනෙකුට එතැනට කසළ භාර දෙන්න පුළුවන්.

මම නැවතත් කියනවා, අපි අඛණ්ඩව මුතුරාජවෙලට කසළ ගෙන ගොස් දැම්මොත් පරිසර අනතුරක් තිබෙන බව. නමුත්, මුතුරාජවෙලට ගෙන යන කසළවලින් සියයට 60කට අධික ප්‍රමාණයක් අපි කොම්පෝස්ට් පොහොර බවටත්, ප්‍රයෝජනවත් දේවල් බවටත් පත් කරනවා. මීතොටමුල්ලේ වාගේ එතැන කුණු ගොඩ ගහන්නේ නැහැ. ඒ වාගේම, මීතොටමුල්ලේ කරන්නේ පස් දමලා පිඩැලි අල්ලන ව්‍යාපෘතියක් නොවෙයි. ඒ අවට පවුල් 325කට අපි නිවාස සපයා තිබෙනවා. අපි අක්කර 35ක් විධිමත් ජල කළමනාකරණයකට යටත් කර තිබෙනවා. ඒ වාගේම මීටර 48ක් උසට තිබුණු කසළ කන්ද අපි මීටර 30කට සීමා කර විශේෂ කලා උද්‍යානයක් හැටියට කොටසකුත්, ඒ වාගේම වාණිජ බල ප්‍රදේශයක් හැටියට තව කොටසකුත් දියුණු කරන්න ඉදිරි කාලයේදී කටයුතු කරනවා. පිඩැලි අල්ලා, පස් කපා, වැලි ඇදලා පුරුදු අයට ඒක එහෙම තේරුණාට, ඒ තුළින් ඊට වඩා බරපතළ විද්‍යාත්මක කාරණයක් අපි ඉෂ්ට කර තිබෙනවා. ඒ කටයුතු කරමින් අපේ මේ ආයතනය මූල්‍යමය වශයෙන් රටට බරක් නොවන, ශක්තිමත් මූල්‍ය ආයතනයක් හැටියට අපි ඉදිරියට ගෙනයනවා. ඒ විතරක් නොවෙයි,

ඉදිරි කාලයේ දී ගොඩනැඟෙන මුහුදු නගරය ඇතුළු ඒ මුහුද ගොඩ කිරීමේ ක්‍රියාදාමයේත් දේශීය හවුල්කාරයා හැටියට මේ ආයතනය ක්‍රියා කරනවා. මේ රටේ ඉංජිනේරුමය ක්ෂේත්‍රයේ බොහෝ රාජ්‍ය ආයතන පාඩු ලබමින්, භාණ්ඩාගාරය මඟින් යැපෙන තත්ත්වයකට පත් කරමින්, ඒ රාජ්‍ය ආයතන තමන්ගේ දේශපාලන හිතවතුන්ට පත්වීම් දෙන තැන් බවට පත් කරගත් අවස්ථාවක, වෘත්තීය මට්ටමෙන් පාලනය කරන ස්ථානයක් හැටියට දිගටම එම ආයතනය පවත්වා ගෙන යෑමට හැකියාව

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

ලැබෙයි කියන බලාපොරොත්තුව අප තුළ තිබෙනවා. මේ සඳහා සියලුම මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය අවසන් වශයෙන් බලාපොරොත්තු වෙමින් මම නිහඬ වනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු පාඨලී චම්පික රණවක මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Patali Champika Ranawaka]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 5 ordered to stand part of the Bill.*

***දීර්ඝ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*விரிவுப்பெயர் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Long Title ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසට ද මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

## හොරණ, මිල්ලෑව වත්ත කම්කරුවන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම
## ஹொரண, மில்லாவ தோட்டத் தொழிலாளர்களின் வாழ்க்கைத் தரத்தைப் பாதுகாத்தல்
## SECURING THE STANDARD OF LIVING OF LABOURERS IN HORANA MILLEWA ESTATE

[අ.භා.6.05]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "කොටගල වතු සමාගම විසින් පාලනය කළ හොරණ මිල්ලෑව වත්ත කර්මාන්ත කලාපයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරා ගෙන ඇත. එම වත්තේ සේවය කළ කම්කරු පවුල් 125කට ඔවුන් කොටගල වතු සමාගම යටතේ සේවය කළ කාලයට හිමි විය යුතු EPF/ETF පවා තවම නොලැබී ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය පවරා ගත් පසු ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 500කට සීමා කර ඇත. වසර ගණනාවක් මිල්ලෑව වත්තේ සේවය කරමින් ජාතික ආර්ථිකයට දායක වූ මෙම කම්කරු පිරිසගේ අනාගත ජීවිත සුරක්ෂිත කිරීමට ස්ථිරසාර පියවර ගන්නා ලෙස ආණ්ඩුවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරණ, මිල්ලෑව වතුයාය,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේ දී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில் பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு அநுர சிட்னி ஜயரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேஷா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ANURA SIDNEY JAYARATHNE *left the Chair, and* THE HON. HESHA WITHANAGE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරණ ප්‍රදේශයේ තිබෙන මිල්ලෑව වතුයාය දැනට රජය විසින් 2017.06.07 දිනැති අංක 2022/23 හා 2017.06.14 දිනැති අංක 2023/36 අතිවිශේෂ ගැසට් නිවේදන මඟින් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගෙන තිබෙනවා. මේ වතු යාය රජයට පවරා ගැනීම නිසා මේ වන විට එම සේවකයන් මුහුණ දෙන ප්‍රශ්න කිහිපයක් පිළිබඳව තමයි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න මේ වෙලාවේ කල්පනා කළේ.

2017.10.26 වැනිදා හොරණ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් උසාවි නියෝගයක් මත මිල්ලෑව වත්ත රජයට පවරා ගෙන තිබෙනවා. ඊට පහුවෙනිදා, එනම් 2017.10.27 වැනි දින එම සේවකයන් විසින් පවත්වන ලද උද්ඝෝෂණයකදී, තාවකාලිකව රබර් කිරි කපාගෙන ආපු කම්කරුවන්ට දිගටම කිරි කපාගන්න ප්‍රාදේශීය ලේකම්තුමා අවසරය ලබා දී තිබෙනවා.

එනමුත්, 2017.10.30වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ සහ හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් නැවත ඇවිල්ලා රබර් වතුයායේ තිබුණු කර්මාන්තශාලාවට මුද්‍රා තබා තිබෙනවා. ඒ මාසයේ 30වැනිදා ඉඳලා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් දිනපතා අත්සන් ලේඛනයක් නිකුත් කරලා, එම සේවක සේවිකාවන්ගෙන් අත්සන් ගන්න කටයුතු කර තිබෙනවා. පසුව, හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2017.11.05 වැනි දින පැවැති සාකච්ඡාවට නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරයෙක්, ප්‍රාදේශීය ලේකම්වරයා, වතු අධිකාරිතුමා, කොටගල වැවිලි සමාගම ඇතුළු පාර්ශ්වයන් ගණනාවක් සහභාගි වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒ සියලු සේවකයන්ට අත්සන් කරන්න අවස්ථාව ලබා දෙන්න ඒ වෙලාවේ එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. කොහොම වුණත්, පැමිණි එකඟතාවන් අනුව අත්සන් කළ සියලු සේවකයන්ට මාසයේ 25වැනි දින අත්තිකාරම් මුදලකුත්, මාසයේ 10වැනි දින වැටුප් ලබා දීමටත් එකඟ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එයින් පසු ඇති වුණු යම් යම් ව්‍යාකූල තත්ත්වයන් හේතු කරගෙන 2017 දෙසැම්බර් මාසයේ 6වැනිදා හොරණ ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ එම වත්තේ වැඩ කළ කාර්ය මණ්ඩලය ඇතුළු සේවකයින් සාකච්ඡාවක් පවත්වා තිබෙනවා. එයිනුත් සහනයක් නොලැබුණු තැන තමයි ඔවුන් එම කර්මාන්තශාලාව ඉදිරිපිට විවිධාකාර උද්ඝෝෂණ දියත් කරලා තිබෙන්නේ. එම සියලු ඉල්ලීම්වල ප්‍රතිඵලයක් හැටියට නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරයා පැමිණ ඔවුන්ට දිගටම වැටුප් ලබා දෙනවාය කියා පොරොන්දු වී තිබෙනවා. ඒ අනුව තමයි 2017.12.15 සිට සියලු සේවකයන්ට ගත වුණු කාල සීමාවට අදාළව වැටුපක් ලබා දී තිබෙන්නේ. ඒ වාගේම සේවකයන් කිහිපදෙනෙක් එම කාලය අතරේ දීත් පැරණි වැඩ කළාය කියා ලේඛන ඉදිරිපත් කළත්, වැටුප් නොලැබීමේ තත්ත්වයකුත් ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම රජයේ නිලධාරින් සහ සේවකයන් කිසිදු පෙර දැනුම් දීමකින් තොරව ඉවත් කිරීම නිසා ඔවුන් ප්‍රශ්නයකට මුහුණ දී සිටිනවා. ඇත්තටම ගත්තොත්, එම වතුයාය රජයේ සංවර්ධන කටයුතු සඳහා පවරා ගැනීම නොවෙයි තිබෙන ප්‍රශ්නය. මම කොටගල වතු සමාගමත් එක්ක සාකච්ඡා කළාට පසුව දැන ගත්තා, එම සේවකයන් කාලයක් තිස්සේ ඉඳලා එම වතුයායේ වැඩ කරලා තිබෙන බව. ඔවුන් සේවයෙන් ඉවත් වන විට යම් වන්දියක්, එහෙම නැත්නම් ඔවුන්ට ජීවත් වීම සඳහා යම් දීමනාවක් ඉදිරි කාලයේ දී ලබා දෙන්නට පුළුවන්ද කියලා සාකච්ඡා කළත්, අදාළ පාර්ශ්වයන් ඒකට සූදානමක් නැහැ. මොකද, ඔවුන් පවත්වාගෙන ගිය වතුයායක් තමයි රජය විසින් හදිසි කටයුත්තක් සඳහා පවරාගෙන තිබෙන්නේ.

නමුත් මෙතැන සිටින කම්කරුවන්ගෙන් සමහර අයට වයස අවුරුදු හැට, හැටපහ වෙලා තිබෙනවා කියා මම හිතනවා. මෙතැන ඉදි කරන කර්මාන්තපුරයක, ආයෝජන කලාපයක නැත්නම් ඒ කර්මාන්තශාලාවක වැඩ කරන්නට ඔවුන්ට වයසක් නැති වේවි. ඒ වාගේම නිවාස සංවර්ධන අධිකාරියෙන් ණය අරගෙනත් ඔවුන් නිවාස හදා තිබෙනවා. ඒ ණය වාරිකත් ගෙවන්නට සිද්ධ වෙනවා. මේ කටයුතු ඉදිරියට කර ගන්නට බැරි වෙනවා. මේ නිවාස විශාල කර ගන්නත් බැහැ, කාමරයක් හදා ගන්නත් බැහැ. ඔවුන්ගේ සමහර පහසුකම් දියුණු කර ගන්නත් බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. කිරි කැපුවාට වෙන දා වාගේ වත්තෙන් ආදායම් ලැබෙනවා වෙනුවට නාගරික සංවර්ධන අධිකාරියෙන් ඔවුන්ට ලබා දෙන දීමනාව ගත්තොත් අනෙක් වතුවලින් ලැබෙනවාට වඩා ඉතාම අඩු මුදලක් තමයි ලැබෙන්නේ. එම නිසා එක පැත්තකින් වැටුප් හා දීමනා ප්‍රශ්නය ඒ වාගේම ඔවුන්ගේ අනාගතයට මොකක්ද වෙන්නේ කියන එක පිළිබඳව අපි යම් සාකච්ඡා මාර්ගයකට ඇවිත් රජය මඟින් යම් විසඳුමක් ලබා දියයුතුය කියා මම හිතනවා. මෙතැන පවුල් ගණන 140ක් විතර ඉන්නවාය කියායි වාර්තා වන්නේ.

කෙසේ වුවත්, මේ අය කාලයක් තිස්සේ වත්තේ වැඩ කර, රබර් කර්මාන්තයෙන් අපේ රටේ ජාතික ආර්ථිකයට දායක වුණු අය. ඔවුන්ගේ ජීවිත කාලයම යම්කිසි ආකාරයකින් වතුවල කැඹුරුවාට පසුව නිකම්ම නිකම් එළවා දමන එක සදාචාරසම්පන්න නැහැ. ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත වෙන ආකාරයකට, එයින් කියන්නේ අනාගතයේ හදන කර්මාන්ත ශාලාවක රැකියාව ලබා දෙනවාය කියන එක නොවෙයි. ඒ වෙනුවට ඔවුන්ගේ ජීවිත පවත්වාගෙන යාම සඳහා මැදිහත් වීමක් රජය කළ යුතුය කියා අවධානය යොමු කරන්නටයි මම මේ කල් තැබීමේ යෝජනාව ගෙනාවේ. එම නිසා මේ සංවර්ධන කටයුත්ත කර ගෙන යන අතරම පොඩි ප්‍රමාණයක් වෙන මේ කම්කරු පවුල්වලට සාධාරණයක් ඉටු කිරීම සඳහා කටයුතු කරයි කියා බලාපොරොත්තු වෙනවා. මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙන එන්නට කලින් දිස්ත්‍රික් කම්කරු කාර්යාලයත් සමඟ විටින් විට සාකච්ඡා කළා. වතු සමාගමත් සමඟ කථා කළාට පස්සේ මේ අයට අදාළ EPF, ETF දෙනවාය කියා ඔවුන් කිව්වාට, තවමත් එය නිසියාකාරව ලැබී නැහැ. දැන් මේ අය වාර ගණනාවක් කම්කරු දෙපාර්තමේන්තුවේ පානදුර කාර්යාලයට, කළුතර දිස්ත්‍රික් කාර්යාලයට ගිහින් සාකච්ඡා කළත්, ඒ සාකච්ඡා ඵල රහිත බවට පත් වෙලා තිබෙනවා. මම කම්කරු ඇමතිතුමාගේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

අවධානයත් යොමු කරන්නට කැමැතියි, යම් කිසි ආකාරයකින් ඔවුන්ට විශ්වාසයක් ඇති වෙන අන්දමින් මැදිහත් වී මේ ප්‍රශ්නය කඩිනමින් නිරාකරණය කරන්න කියා. ඒ අය අහිංසක අසරණ මිනිස්සු. මේ අය වෙනුවෙන් යම් කඩිනම් මැදිහත් වීමක් කරන්නය කියන ඉල්ලීම මේ කල්තැබීමේ යෝජනාව මඟින් මම කරන්නට කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, යෝජනාව ස්ථිර කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මහතා.

[අ.භා. 6.13]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නලින්ද ජයතිස්ස අපේ සහෝදර මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද ඉතාමත්ම ජාතික මට්ටමේ වැදගත්කමකින් යුක්ත, අහිංසක කම්කරුවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ කල් තැබීමේ යෝජනාව ඉතාමත්ම වගකීමකින් යුතුව මේ මොහොතේ මම ස්ථිර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප විශ්වාස කරනවා මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගේ ගැටලුවක් නොවෙයි තිබෙන්නේ කියා. නාගරික සංවර්ධන අධිකාරිය රටපුරාම තිබෙන විවිධ ප්‍රදේශ ඒ අයගේ අයිතියට පවරාගෙන ඉන් පසුව ලොකු අවුල් රාශියක් ඇති කර තිබෙනවා. ඒකේ එක දිගුවක්ය මෙන්න මේ කාරණය කියා මම විශ්වාස කරනවා. මම එහෙම කිව්වේ ඇයි කියන එක මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති මම මීට අවුරුද්දකට අවුරුදු එකහමාරකට ඉස්සෙල්ලා හම්බන්තොට, නගර සභා නිවාස පාරේ ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් වන්දි ප්‍රශ්නයක් මේ වාගේම කල්තැබීමේ යෝජනාවකින් මම ඉදිරිපත් කළ බව. ඉදිරිපත් කළායින් පසුව, මම හිතන විධියට නිලධාරින් විසින් සකස් කර දෙන ලද උත්තරයක් ගරු ඇමතිතුමා ඉදිරිපත් කළා. ඒ ගැන අපි කථා බහ කළා. මම ඒ මොහොතේ කිව්වා, "ගරු ඇමතිතුමනි, මේක මෙහෙම වුණාට මේකේ ඇත්ත මෙහෙම නොවෙයි." කියා. දැන් ඒ ප්‍රශ්නයම 2019 මැයි මාසයේ 22 වැනි දා අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා මේ විධියටම ඇහුවා. එතුමා අහලා, ඒකට උත්තර ලැබී තිබෙනවා. ඒකට ලැබී තිබෙන්නේත් එදා ඒ දීපු උත්තරම තමයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ මොහොතේ කිව්වා, "යම් ප්‍රමාණයකට මුදල් ලැබී තිබෙනවා. නමුත්, අයිතිය තහවුරු කරගන්න බැරි යම් යම් ගැටලු තිබෙන අයට ඒ ඉඩම් වෙනුවෙන් වන්දි ලබා දීමේ කටයුත්ත සම්බන්ධයෙන් සමාලෝචනයක් කර අපි කරනවා." කියා. නමුත්, ගරු අමාත්‍යතුමනි, මේ වනතුරුත් ඒ කටයුත්ත ඒ ආකාරයෙන් සිද්ධ වෙලා නැති නිසා ඒ අය අද බරපතළ ගැටලුවකට මුහුණ දී සිටිනවා. 2004 දෙසැම්බර් මාසයේ 26වන දා ආ සුනාමියෙන් ඒ මිනිසුන්ගේ දේපළ, ජීවිත, ආර්ථිකය ආදි සියලු දේවල් නැති භංගස්ථාන වුණා. අන්තිමට ඒ මිනිසුන්ගේ කෝටි ගණන් වටිනා දේපළ වෙනුවෙන් ඒ මිනිසුන්ට හම්බ වුණේ පර්චස් 8ක, 10ක බිමක තිබෙන හුණ්ඩුවක විතර ගෙයක් පමණයි. ඒ මොහොතේ හදපු ඒ ගෙවල් පවා අද සුනාමියක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට ඔබතුමා වෙනුවෙන් ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා 2019 මැයි 22වන දා උත්තර දුන්නා. එදා දුන් උත්තරය අනුවත් ඒ ගැටලුව තවම ඒ විධියටම තිබෙනවා. එය තවම නිරාකරණය වෙලා නැහැ. මා ඒ මොහොතේ ප්‍රශ්නයක් ඇහුවා. එය 2019 මැයි 22 හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 938හි මෙසේ සඳහන් වෙනවා:

> "ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නයට ඔබතුමා දුන් පිළිතුරේ කොටසක් නිවැරැදියි. නමුත්, වසරකට වඩා වැඩි කාලයකට පෙර -වසර දෙකක් පමණ වෙනවා- මේ සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවාට පසුව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් එයට පිළිතුරක් ලැබුණා. එතුමා කිව්වා වන්දි මුදල් දෙන්නම් කියා. අවුරුදු දෙකක් ගිහිල්ලාත් ඔය කියන්නා වූ ඉඩ කඩම් පිළිබඳව හරියාකාර මැදිහත් වීමක් කරලා තක්සේරු කිරීම ආදි දේවල් තවම කර නැහැ. ඒ නිසා ඔබතුමා දුන් මේ පිළිතුර සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. ඒ කටයුත්ත කොච්චර කාලයකින් අවසන් කරනවා ද?"

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා තමයි එදා ඔබතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නයට උත්තර දුන්නේ. එතැනදී එතුමා මෙසේ උත්තර දෙනවා:

> "ප්‍රාදේශීය ලේකම් විසින් අයිතිය තහවුරු කර ගැනීමෙන් පසුව වන්දි මුදල් ගෙවන්න කටයුතු කරනවා කියා තමයි පිළිතුරේ තිබෙන්නේ."

ගරු ඇමතිතුමනි, ප්‍රාදේශීය ලේකම්තුමියක් තමයි දැන් එහි ඉන්නේ. එතුමිය කියන්නේ, "නාගරික සංවර්ධන අධිකාරිය හරියාකාරව මැදිහත් වෙලා එය නිරවුල් කර දුන්නොත් පමණයි, පැහැදිලි පිළිතුරක් ලබා දෙන්න මට පුළුවන් වන්නේ." කියායි. නමුත් මේ කාරණයට අවුරුදු 2ක් විතර වෙනවා. තවමත් ඒකට හරි උත්තරයක් ලැබිලා නැහැ, ගරු ඇමතිතුමනි. මා කියනවා, මෙය ඔබතුමාගේ වරදක් නොවෙයි කියා.

එදා මම ආපසු මෙසේ කිව්වා:

> "ඔය උත්තරය තමයි මීට අවුරුදු දෙකකට කලින් දුන්නේත්. මේ වනතුරුත් අයිතිය තහවුරු කර ගැනීමේ කටයුත්ත අවසන් කරන්න ප්‍රාදේශීය ලේකම්තුමාට හෝ දිසාපතිතුමාට හෝ බැරි වෙලා තිබෙනවා."

ඊට පසුව ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා මෙසේ කිව්වා:

> "දැනට දී තිබෙන පිළිතුර මේකයි. මා ඒ කාරණය ගරු ඇමතිතුමාට යොමු කරලා ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරක් ලබා දෙන්නම්"

ගරු ඇමතිතුමනි, මේ මාසයේ 24වන දා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව තිබෙනවා. මගේ බලාපොරොත්තුවක් තිබෙනවා මේ දීපු උත්තරය අරගෙන ගිහිල්ලා එහිදී කියවන්න. යම් ප්‍රමාණයකට වන්දි ගෙවා තිබෙනවා. නමුත් අඩු පාඩු සහිතයි. මගේ බලාපොරොත්තුවක් තිබෙනවා මේ උත්තරය අරගෙන ගිහින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී කියවලා එම කමිටුවේ අවධානය ඒ කෙරෙහි යොමු කරවන්න.

ගරු ඇමතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරියේ සිටින ඇතැම් නිලධාරින් ඔබතුමාගේ නියෝග වුණත් හරිහැටි පිළිපදින්නේ නැද්ද කියන ගැටලුව තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති මීට අවුරුදු දෙකකට වාගේ ඉස්සර වෙලා එක අවස්ථාවකදී Consultative Committee එකකදී මා කිව්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල සමුපකාර සංගමය සම්බන්ධ කාරණයක් ගැන. ගරු ඇමතිතුමනි, ඒ සමුපකාර සංගමය සතු, මේ ඉඩම වාගේම ඉඩමක් ඉන්ධන පිරවුම්හල සංවර්ධනය කරන්න පවරා ගත්තා. නාගරික සංවර්ධන අධිකාරිය, bus stand එකත්, පොළත් සංවර්ධනය කිරීම සඳහා ඒ ඉඩම පවරා

ගත්තා. ඉඩම පවරා ගත්තාට පසුව ඒ සංගමය නඩු දැම්මා. නඩු දැම්මාට පසුව නඩුකාරතුමා පැහැදිලිව කිව්වා, "ඔබතුමන්ලා bus stand එකත්, පොළත් ඉදි කිරීම කරනවා නම් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙන්න මේ කියන ඉඩම නිරවුල් කරලා, ඒ වෙනුවෙන් වන්දි ගෙවලා, ඒ වෙනුවට වෙනත් ඉඩමක් -විකල්ප ඉඩමක්- ලබා දීලා තමයි එම කටයුත්ත කරන්න ඕනෑ." කියා.

නමුත්, එදා හම්බන්තොටින් ඒ නිලධාරින් ආපු මොහොතේ මා ඔබතුමා ඉදිරියේ මේ ප්‍රශ්නය මතු කළාම එදාත් ඒ ගොල්ලන් ලිස්සා ගියා. අද වනතුරුත් ඒ වලස්මුල්ල සමුපකාරයට අදාළ ඒ ඉඩම ලබා දීලා නැහැ. නමුත්, bus stand එකයි, පොළයි හදලා පසුගිය දවස්වල නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය, සජිත් ප්‍රේමදාස මැතිතුමා ගිහිල්ලා විවෘත කළා. නමුත්, තවමත් ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. මේවාගේ විවිධාකාරයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ ඇතැම් නිලධාරින් මැදිහත් වෙලා මේ කටයුතු අවුල් කරන ස්වභාවයක් රටේම තිබෙනවා. ඒකෙන් විශාල පිරිසක් අසාධාරණයට, අයුක්තියට පත් වෙලා තිබෙනවා කියන එක මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අන්න ඒ වාගේ නැතිව කොටගල වතු යායේ වැඩ කටයුතු කරපු, රක්ෂාව කරපු ඒ මිනිස්සුන්ට ඔබතුමන්ලා පොරොන්දු වුණු විධියටම ඉතාම කඩිනමින් වන්දි හෝ ඒ අයිතීන් හෝ ලබා දීමට කටයුතු කළොත් එය සමස්ත කම්කරු පන්තියටම කරන උපහාරයක් වේවි කියා මා විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, විශ්වාසයක් තිබෙනවා තමුන්නාන්සේ ඒක කරයි කියා. මේ අසාධාරණයට ලක් වුණු ඒ මිනිසුන්ට යුක්තිය ඉෂ්ට කරන්නය කියන ඒ කාරුණික ඉල්ලීම කරමින් මම නතර වෙනවා. මම ඔබතුමාගේ අවධානයට නැවතත් යොමු කරනවා, මේ කටයුත්ත ඉතාම කඩිනමින් වගකීමෙන් යුතුව කරන්න ඕනෑය කියන කාරණය.

[பி.ப. 6.22]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

